326 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 326 - இல. 11
Volume 326 - No. 11

2026 මැයි 21 වන බ්‍රහස්පතින්දා
2026 மே 21, வியாழக்கிழமை
Thursday, 21st May, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම [තීරුව 1991]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 1992]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1993]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1994-2031]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු [තීරුව 2031]
දේශපාලන සිරකරුවන්ගේ දීර්ඝ කාලීන නඩු කටයුතු කඩිනම් කිරීම [තීරුව 2036]

**වරප්‍රසාද:**
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2026.05.19 දින පාර්ලිමේන්තුවේදී කරන ලද චෝදනාව [තීරුව 2040]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
අල්-හාෂිමි සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු කබීර් හෂීම් මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 2042]

**ආනයන හා අපනයන (පාලන) පනත:**
රෙගුලාසි [තීරු 2043-2121]

**විසර්ජන පනත:**
යෝජනා සම්මත [තීරු 2121-2131]

**කල්තැබීමේ යෝජනාව:**
මලෛයහම් ජනතාව ජාතික ප්‍රවාහයට ඒකාබද්ධ කිරීම [තීරු 2132-2174]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 2174-2178]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
பொதுநலவாய பாராளுமன்ற சங்கம் (இலங்கைக் கிளை), அனைத்து பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம் **[ப:** 1991]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப:** 1992]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப:** 1993]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப:** 1994-2031]

**தனி அறிவித்தல் மூல வினா:**
மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தித்துறை எதிர்கொள்ளும் பிரச்சினைகள் **[ப:** 2031]
நீண்ட காலமாக நிலுவையிலுள்ள அரசியல் கைதிகளின் வழக்கு நடவடிக்கைகளை விரைவுபடுத்தல் **[ப:** 2036]

**சிறப்புரிமை:**
மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவால் 2026.05.19ஆம் திகதி பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு **[ப:** 2040]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
அல்-ஹாஷிமி சங்கம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு கபீர் ஹஷீம்]- முதன்முறை மதிப்பிடப்பட்டது **[ப:** 2042]

**இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்:**
ஒழுங்குவிதிகள் **[ப:** 2043-2121**]**

**ஒதுக்கீட்டுச் சட்டம்:**
தீர்மானங்கள் **[ப:** 2121-2131]

**ஒத்திவைப்புப் பிரேரணை:**
மலையக மக்களை தேசிய நீரோட்டத்துக்குள் உள்வாங்குதல் **[ப:** 2132-2174]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப:** 2174-2178]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Joint Special General Meeting of Commonwealth Parliamentary Association (Sri Lanka Branch), Inter-Parliamentary Union (Sri Lanka Group) and SAARC Parliamentarians' Association (Sri Lanka Branch) [Col. 1991]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1992]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1993]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1994-2031]

QUESTION BY PRIVATE NOTICE:
Issues Faced by Renewable Energy Sector [Col. 2031]
Expedition of Long-Pending Cases of Political Prisoners [Cols. 2036]

PRIVILEGE:
Allegation Made by Hon. (Dr.) Ramanathan Archchuna on 19.05.2026 in Parliament [Col. 2040]

PRIVATE MEMBERS' BILLS:
Al-Hashimi Association (Incorporation) - [The Hon. Kabir Hashim] – Read the First time [Col. 2042]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Cols. 2043-2121]

APPROPRIATION ACT:
Resolutions [Cols. 2121-2131]

ADJOURNMENT MOTION:
Integration of Malaiyagam People into the National Mainstream [Cols. 2132-2174]

WRITTEN ANSWERS TO QUESTIONS
[Cols. 2174-2178]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මැයි 21වන බ්‍රහස්පතින්දා***
*2026 மே 21, வியாழக்கிழமை*
*Thursday, 21st May, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම
### பொதுநலவாய பாராளுமன்ற சங்கம் (இலங்கைக் கிளை), அனைத்து பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம்
### JOINT SPECIAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION (SRI LANKA BRANCH), INTER-PARLIAMENTARY UNION (SRI LANKA GROUP) AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION (SRI LANKA BRANCH)

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 මැයි 21, එනම් අද දින අපර භාග 4.00ට පාර්ලිමේන්තුවේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ සහ 70ඇ වගන්ති සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පනවන ලදුව, 2025 සැප්තැම්බර් 22 දිනැති අංක 2455/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පනවන ලදුව, 2025 සැප්තැම්බර් 22 දිනැති අංක 2455/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ සහ 70ඇ වගන්ති සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 13 දිනැති අංක 2458/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු බිමල් රත්නායක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර 2025 ජූලි මස දී අත්සන් කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ තාවකාලික සභාපති වෙනුවෙන්, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2026 මාර්තු 23 දිනැති අංක 2481/02 දරන, 2026 මාර්තු 31 දිනැති අංක 2482/08 දරන සහ 2026 අප්‍රේල් 02 දිනැති අංක 2482/12 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද); සහ

(ii) 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ නියම

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු කථානායකතුමනි, පිටකෝට්ටේ, තලවතුගොඩ පාර, අංක 108 යන ලිපිනයෙහි පදිංචි වෛද්‍ය ටී.එන්. දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, පිළියන්දල, ජාලියගොඩ, අංක 52 යන ලිපිනයෙහි පදිංචි ජේ.සී.ඩී. ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, பதியதலாவ, பதியதொர வீதி, தலாபிடிஓய வலது, இலக்கம் 325 எனும் முகவரியில் வசிக்கும் கே.பீ. தர்மசேன என்பவரிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, கொழும்பு 08, பொரல்லை, சரணபால ஹிமி மாவத்தை, இலக்கம் 27/சீ எனும் முகவரியில் வசிக்கும் டப்ளியூ.ஜீ.டீ.கே. அமரதாச என்பவரிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මාවතගම, 6 කණුව, මාරලන්ද II පියවර, අංක 45 යන ලිපිනයෙහි පදිංචි එම්.ආර්.කේ.බී. ගොපල්ලව මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

ගරු කථානායකතුමනි, මග්ගොන, මුංහේන, බුබුලලන්ද වත්ත, වෙන්දේසි වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.ඩී. කෝකිලා මධුවන්ති කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -746/2025- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවෙන් විස්තර වාර්තා කැඳවා ඇති අතර, ඒවා තවමත් ලැබී නැහැ. ඒ නිසා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. එතකොට එම තොරතුරු ටික ඔක්කෝම දෙන්න පුළුවන්. ඔක්කෝම තිබෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් කැඳවන්න ඕනෑ ඒවා. සති දෙකකින් එම තොරතුරු ලබා දෙන්නම්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -773/2025- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොළඹ ජාතික කලාභවන: ප්‍රතිසංස්කරණය
கொழும்பு, தேசிய கலாபவனம்: புனரமைப்பு
COLOMBO NATIONAL ART GALLERY: RENOVATION

841/2025

**3. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන කොළඹ, ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසා දමන ලද දිනය කවරේද;

(ii) එම ප්‍රතිසංස්කරණ කටයුතු මේ වනතෙක් අවසන් වී නොමැති බව දන්නේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iv) එහි තැන්පත් කර තිබූ, මිල කළ නොහැකි, පෞරාණික චිත්‍ර 42ක් මේ වන විට අස්ථානගත වී ඇති බව පිළිගන්නේද;

(v) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கலாசார அலுவல்கள் திணைக்களத்தால் நிருவகிக்கப்படும் கொழும்பு, தேசிய கலாபவனம் புனரமைப்புப் பணிகளுக்காக மூடப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி புனரமைப்புப் பணிகள் இதுவரையில் நிறைவடையவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக இதுவரையில் செலவிடப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iv) அங்கு வைக்கப்பட்டிருந்த, விலைமதிக்க முடியாத 42 பழமையான ஓவியங்கள் தற்போது காணாமல் போயுள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) இது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the date of closure of the Colombo National Art Gallery, which is managed by the Department of Cultural Affairs, for renovation;

(ii) whether he is aware that the said renovation activities have not yet been completed;

(iii) the amount of money that has been spent on the said renovation activities so far;

(iv) whether he admits that 42 invaluable ancient paintings which had been kept at the National Art Gallery have disappeared; and

(v) the measures that are to be taken in this regard?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2012 වර්ෂයේ සිට ජාතික කලාභවනේ ප්‍රධාන ගැලරිය, වහලය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වසා තබා ඇති අතර, නියමානුකූලව කලාභවන විවෘතව තිබී නැත. අවසාන වශයෙන් 2020 වර්ෂයේදී නැෙගනහිර ප්‍රදර්ශන ශාලාව තුළ පමණක් චිත්‍ර තබා ඇති අතර, 2020.12.29 දිනෙන් පසු ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසා දමා ඇත.

(ii) ඔව්.

(iii) රුපියල් මිලියන 163.5කි.

(iv) ඔව්. එවකට සිටි සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විසින් 2015 වර්ෂය සඳහා ජාතික කලාභවනේ චිත්‍ර හා මූර්ති සමීක්ෂණය කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව,

තොග පොතෙහි සඳහන්ව ඇති චිත්‍ර සංඛ්‍යාව - 281

කලාභවන තුළ භෞතිකව ඇති චිත්‍ර සංඛ්‍යාව - 239

ඒ අනුව මෙම දෙක අතර වෙනස - 42

ගරු මන්ත්‍රීතුමනි, ඒ තමයි ඔබතුමා විමසන චිත්‍ර 42.

(v) ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග දැනටමත් ගෙන තිබෙනවා.

මෙම සිදුවීම සම්බන්ධයෙන් බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් විසින් මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, කමිටුව විසින් මේ වන විට අදාළ පාර්ශ්වයන්ගෙන් සාක්ෂි සටහන් කර ගනිමින් පවතී. තවද, මේ පිළිබඳව සිදු කෙරෙන පොලිස් විමර්ශන කටයුතුවලට අදාළව කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය විසින් වරින් වර සිදු කරන තොරතුරු කැඳවීම්වලට අනුව අවසාන වශයෙන් එම කාර්යාංශයේ අංක DCDB/CS/OUT/760/2024 සහ 2025.07.14 දිනැති ලිපියෙන් විමසන ලද කරුණු සම්බන්ධයෙන් මගේ අංක DCA/06/10/05 පොදු ගොනුව හා 2025.08.13 දිනැති ලිපිය මඟින් මම තොරතුරු ලබා දීලා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ වාර්තා අනුව 2012දී තමයි අලුත්වැඩියා කටයුතු සඳහා එහි ප්‍රධාන ගැලරිය වසා දමා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, එය වසා දැමීම හේතුවෙන් විශේෂයෙන්ම ජාතික කලාභවන හා සම්බන්ධව වැඩ කරන කලාකරුවන් රාශියකට එය භාවිත කිරීමේ අවස්ථාව අහිමි වීම නිසා ඔවුන්ගේ කලා කටයුතු කර ගැනීමේදී සහ ශාලා වෙන් කරවා ගැනීමේදී ඉහළ මිල ගණන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන බව අපි දන්නවා. ජාතික කලාභවන විවෘත කරන්න තව කොතෙක් කාලයක් යයිද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළේ ඉතාම වටිනා ප්‍රශ්නයක්. ඒක මා මැදිහත් වෙලා තිබෙන මගේත් ප්‍රශ්නයක්. ඒත් එක්කම ඔබතුමා දන්නවා, ජෝන් ද සිල්වා රඟහලත් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මේ වාගේම වසා දමා තිබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, ජෝන් ද සිල්වා රඟහලට අදාළ කටයුතු තව ටිකක් ප්‍රමාද වන නිසා එතැනට වෙන් කර තිබූ මුදලක් පවා මේ අවුරුද්ද තුළ ජාතික කලාභවනේ අලුත්වැඩියා කටයුතු අවසන් කිරීම සඳහා කලාභවනට පවරා ගන්න, මම අන්තිමට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවෙන් අනුමැතිය ගත්තා. මේ සම්බන්ධයෙන් කටයුතු කරන මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශකවරු, ඒ වාගේම මේ කටයුත්තේ නිරත වෙලා සිටි කොන්ත්‍රාත්කරුවන්, ශ්‍රී ලංකා නාවික හමුදාව ඇතුළු ඒ සියලුදෙනා කැඳවමින් රැස්වීම් වාර ගණනාවක් පවත්වා, නිරීක්ෂණ වාර ගණනාවක් කරලා මම ඒ සියලු දේ ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා. අනිවාර්යයෙන්ම මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් -දෙසැම්බර් මාසයට කලින්- ජාතික කලාභවන විවෘත කරගන්න පුළුවන් බව තමයි නිලධාරින්ගේ අදහස වෙලා තිබෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ජාතික කෞතුකාගාරයට - National Museum එකට - සම්බන්ධයි. 1877 ජනවාරි පළමුවැනි දා තමයි මේ කෞතුකාගාරය විවෘත වෙන්නේ. එවකට ආණ්ඩුකාරයා වෙලා හිටපු සර් විලියම් හෙන්රි ග්‍රෙගරි යටතේ තමයි ඒක විවෘත වෙන්නේ. ඒ කාලයේ මේ කෞතුකාගාරයට ඉඩම ලබා දීලා එහි builder හැටියට නායකත්වය අරගෙන වැඩ කළේ වාපිච්චි මරික්කාර් කියන මහත්මයා. ඒ මහත්මයාගේ ඉල්ලීමකට අනුව, එතුමාට ගෞරවයක් - respect එකක් - හැටියට එදා හිටපු ආණ්ඩුකාරතුමා සිකුරාදා දිනවල කෞතුකාගාරය වහලා තිබුණා. ඊට පසුව 2012 හෝ 2013 කාලයේ, ලංකාවේ CHOGM එක පවත්වපු කාලයේ එවකට පැවැති ආණ්ඩුව සිකුරාදා දිනයේ කෞතුකාගාරය වහන එක නවත්වලා විවෘතව තැබුවා. 2025 ජනවාරි මාසයේ ඒ ඉන්න නිලධාරින් නැවත වතාවක් තීන්දුවක් අරගෙන තිබෙනවා, සෑම සඳුදා දිනකම එය වහන්න. ඇත්තටම අවුරුදු 100කට වැඩි කාලයක්, 1877 ජනවාරි 01වැනි දා සිට 2013 වෙනකම් ජාතික කෞතුකාගාරය සිකුරාදා දිනවල වහලා තිබුණේ ඒක ගොඩනඟපු වාපිච්චි මරික්කාර් මහතාගේ ඉල්ලීමකට අනුව එතුමාට ගෞරවයක් හැටියට. නමුත් 2012දී පැවැති ආණ්ඩුව ඒක වෙනස් කළා.

මම ඔබතුමාගෙන් අහන්නේ මේ කාරණයයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් 2025දී තීන්දුවක් අරගෙන තිබෙනවා නැවත වතාවක් සඳුදා දිනවල කෞතුකාගාරය වහන්න. එදා ගත්ත තීන්දුව අනුව එතුමාට කරන ගෞරවයක් හැටියට සිකුරාදා නිවාඩු දිනයක් හැටියට සලකා කෞතුකාගාරය වසා තැබීම ගැන නැවත වතාවක් සලකා බලන්න බැරිද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන ප්‍රශ්නයෙන් විමසා තිබෙන්නේ කලාභවන ගැන. නමුත්, එතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් විමසන්නේ කෞතුකාගාරය ගැන. ඒකට කමක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. කෞතුකාගාරය ගැනයි ඔබතුමා විමසන්නේ. නිලධාරින් මේ ගැන අරගෙන තිබෙන අවසන් තීරණය කුමක්ද කියන එක ගැන මේ මොහොතේ ක්ෂණිකව ඔබතුමාට පිළිතුරු ලබා දෙන්න හැකියාවක් නැහැ, ඒක අනපේක්ෂිත ප්‍රශ්නයක් නිසා. නමුත්, ඔබතුමා පෙන්වා දීපු අදහස යෝජනා කරලා, සාකච්ඡා කරලා බලන්නම්, මම. එතැන කොයි වාගේ පසුබිමක් ද තිබෙන්නේ, ඇයි මේ වාගේ වෙනස් තීරණයක් ගත්තේ, සංචාරකයන්ගේ පැමිණීම සමඟ මේකට සම්බන්ධයක් තිබෙනවාද, අපේ නරඹන්නන්ගේ ඉල්ලුම අනුවද මේ තීරණය අරගෙන තිබෙන්නේ කියලා විමසා නුදුරු දිනකදී වාර්තා කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

## මියගිය හෝ අතුරුදහන් වූ හමුදා නිලධාරින්ගේ වැන්දඹුවන්: විශ්‍රාම වැටුප්/මාසික දීමනා ගෙවීම

## உயிரிழந்த அல்லது காணாமற்போன இராணுவ உறுப்பினர்களின் விதவைகள்: ஓய்வூதியம்/ மாதாந்தக் கொடுப்பனவுகள்

## WIDOWS OF FALLEN OR MISSING MILITARY PERSONNEL: PAYMENT OF PENSION/ MONTHLY ALLLOWANCES

921/2025

**4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යුද්ධයෙන් මිය ගිය හමුදා සාමාජිකයන්ගේ වැන්දඹු භාර්යාවන්ට, එම හමුදා සාමාජිකයා මිය ගිය දිනයේ සිට විශ්‍රාම යෑමට නියමිතව තිබූ දිනය දක්වා විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේද;

(ii) එම විශ්‍රාම දිනයෙන් පසු, එම වැන්දඹු භාර්යාවන්ට මාසික ස්ථාවර දීමනාවක් ගෙවනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) යුද්ධයේදී අතුරුදහන්වූ හමුදා සාමාජිකයන්ගේ වැන්දඹු භාර්යාවන්ට, එම හමුදා සාමාජිකයාගේ විශ්‍රාම දිනය එළඹීමෙන් පසු මාසික ස්ථාවර දීමනාවක් ගෙවනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, මරණ සහතිකයේ සඳහන් "ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් අතුරුදහන්වීම" යන කරුණ පදනම් කරගෙන එම දීමනාව ගෙවනු නොලබන්නේද;

(iii) එසේ නම්, එය රණවිරු වැන්දඹු භාර්යාවන්ට කරනු ලබන අසාධාරණයක් බව දන්නේද;

(iv) අතුරුදහන්ව ඇති කාලය සලකා එම රණවිරු වැන්දඹුවන්ට මාසික ස්ථාවර දීමනාව ගෙවීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලැස්වීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தத்தின்போது உயிரிழந்த இராணுவ உறுப்பினர்களின் விதவைகளுக்கு, அந்த இராணுவ உறுப்பினர் உயிரிழந்த நாளிலிருந்து ஓய்வுபெற வேண்டிய திகதி வரை ஓய்வூதியம் வழங்கப்படுகிறதா;

(ii) மேற்படி ஓய்வுபெறும் திகதிக்குப் பின்னர், அந்த விதவைகளுக்கு மாதாந்த நிலையான கொடுப்பனவு வழங்கப்படுகிறதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) போரின்போது காணாமற்போன இராணுவ உறுப்பினர்களின் விதவைகளுக்கு, அந்த இராணுவ உறுப்பினரின் ஓய்வுபெறும் திகதிக்குப் பின்னர் மாதாந்த நிலையான கொடுப்பனவு வழங்கப்படுகிறதா;

(ii) இல்லையெனில், மரணச் சான்றிதழில் குறிப்பிடப்பட்டுள்ள "பயங்கரவாதத் தாக்குதல் காரணமாக காணாமற்போனமை" என்ற காரணியின் அடிப்படையில் அக்கொடுப்பனவு வழங்கப்படாமல் உள்ளதா;

(iii) அப்படியாயின், அது இராணுவ வீரர்களின் விதவைகளுக்கு இழைக்கப்படும் அநீதி என்பதை அவர் அறிவாரா;

(iv) காணாமற்போயுள்ள காலத்தைக் கருத்திற் கொண்டு, அந்த இராணுவ வீரர்களின் விதவை களுக்கு மாதாந்த நிலையான கொடுப்பனவை வழங்குவதற்கான சட்ட ஏற்பாடுகளைச் செய்வ தற்கான இயலுமை காணப்படுகின்றதா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) whether a pension is paid to the widows of military personnel killed in action, from the date of the death of such military personnel up to the date on which they would have reached retirement; and

(ii) whether a fixed monthly allowance is paid to such widows after the said date of retirement?

(b) Will he also inform this House -

(i) whether a fixed monthly allowance is paid to the widows of military personnel who reported missing during the war, effective from the date on which such personnel would have reached their retirement age;

(ii) if not, whether the payment of such allowance is denied on the grounds of the entry 'missing due to a terrorist attack' in the death certificate;

(iii) if so, whether he admits that it constitutes an injustice to the widows of such war heroes; and

(iv) whether there is a possibility of making legal provision to pay the fixed monthly allowance to the widows of such war heroes, taking into account the period they have been missing?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ත්‍රස්තවාදී හේතු මත මිය ගිය හමුදා පුද්ගලයන්ගේ වැන්දඹු බිරිඳ/යැපෙන්නන් වෙත හමුදා පුද්ගලයා මිය ගිය දින සිට ඔහුගේ වයස අවුරුදු 55 දක්වා මාසික වැටුප් හා දීමනා හිමිගන්වනු ලබන අතර, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප හා යැපෙන්නන්ගේ දීමනාව වැන්දඹුව වෙත හිමිගන්වනු ලබයි. තවද, මිය ගිය හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු වැන්දඹුව වෙත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කර හිමිගන්වනු ලබන අතර, හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනට ලබාගත් වැටුපේ අගය නොවෙනස්ව ස්ථාවර මාසික දීමනාවක් ලෙස ජීවිතාන්තය දක්වා හිමිගන්වනු ලබයි.

ඒ එක්කම, ත්‍රස්තවාදී හේතු මත තුවාල ලබා වෛද්‍ය හේතු මත විශ්‍රාම ගොස් ඇති අවිවාහක හමුදා පුද්ගලයන් විශ්‍රාම යැමෙන් පසුව විවාහයකට ඇතුළත් වුවද, එම අය මියයෑමෙන් අනතුරුව ඔහුගේ කලත්‍රයා හා දරුවන්හට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ඇති වරප්‍රසාද, තිබෙන ප්‍රතිපත්තිය අනුව අහිමි වන නිසා, 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සන්නද්ධ හමුදා පනත සංශෝධන ඇතුළත්ව සහ එහි නියෝග ද, 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු සන්නද්ධ හමුදා පනත සංශෝධන ඇතුළත්ව හා එහි නියෝග සංශෝධනය කිරීම සඳහා කටයුතු කිරීමට ද අනුමැතිය ලැබී තිබෙනවා. ඒ එක්කම, 1970 අංක 18 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අයත් පනතට සංශෝධන ඇතුළත් නොකිරීම හේතුවෙන් විවාහක සිවිල් රජයේ නිලධාරියකුට හිමි විශ්‍රාම වැටුප එම සුදුසුකම සපුරා ඇති ත්‍රිවිධ හමුදා නිත්‍ය/ස්වේච්ඡා බලසේනා නිලධාරින්, ඒ වාගේම සෙසු නිලධාරින්ගේ යැපෙන්නන් වෙත හිමි නොවන හෙයින් ඔවුන් අගතියට පත්වන නිසා 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සන්නද්ධ හමුදා පනතටද සංශෝධන ඇතුළත්ව සහ ඒ යටතේ සාදන ලද නියෝග ද සංශෝධනය කිරීම සඳහාත් අනුමැතිය ලැබිලා තිබෙනවා.

ඊට අමතරව, විවාහක තත්ත්වයේ සිට 2009 මැයි 19 වැනි දිනට පෙර ක්‍රියාන්විත රාජකාරියේ සිටියදී වෛද්‍ය හේතූන් මත, ආබාධිතව, අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව සේවයෙන් ඉවත් වූ නිත්‍ය, ස්වේච්ඡා බලසේනා නිලධාරින්, සෙසු නිලධාරින් එම විවාහය නීත්‍යානුකූලව අවසන් කර ඇත්නම්, නැවත වයස අවුරුදු 55ට පෙර නීත්‍යානුකූලව සිදු කර ගන්නා විවාහයන්ගේ ශේෂ වන කලත්‍රයා, දරුවන් වෙත වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට පවත්නා නෛතික රාමුව තුළ ප්‍රතිපාදන නොමැති හේතුවෙන්, ඒ සඳහා වැටුප් ගෙවීමට ක්‍රියාත්මක කිරීමටද මේ අලුත් පනත් සංශෝධනයෙන් ඉඩ ලැබෙනවා.

(ii) ත්‍රස්තවාදී හේතූන් මත මිය ගිය හමුදා සාමාජිකයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු වැන්දඹුව වෙත අංක MOD/01/2021 හා 2021.05.18 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනට ලබා ගත් වැටුපේ අගය නොවෙනස්ව ස්ථාවර මාසික දීමනාවක් ලෙස ජීවිතාන්තය දක්වා හිමි ගන්වනු ලබයි.

(ආ) (i) යුද්ධයේදී අතුරුදහන් වූ හමුදා සාමාජිකයන් සඳහා 2010 අංක 19 දරන පුද්ගලයන්ගේ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 12 වන වගන්තිය මඟින් යම් පුද්ගලයෙක් අතුරුදහන් වී වර්ෂයකට පසු මරණ සහතිකයක් නිකුත් කිරීම සිදු කරනු ලබන බැවින්, අංක MOD/01/2021 හා 2025.05.18 දිනැති මෙම ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දින සිට ස්ථාවර මාසික දීමනාව හිමි ගන්වනු ලබයි.

(ii) යුද්ධයේදී අතුරුදහන් වූ හමුදා සාමාජිකයන්හට මරණ සහතිකයක් නිකුත් කර ඇත්නම්, අංක MOD/01/2021 හා 2021.05.08 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දින සිට ස්ථාවර මාසික දීමනාව හිමි ගන්වනු ලබයි.

(iii) අදාළ දීමනා හිමි ගන්වනු ලබන බැවින් කිසිදු අසාධාරණයක් සිදු නොවේ.

(iv) ඉහත (අ) (i) හි පිළිතුරෙහි සඳහන් පරිදි වේ.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සතිය, අපි රණවිරුවන් සිහිකරන සතිය. තිස් වසරක් පුරා පැවති යුද්ධය නිසා විවිධාකාර ආබාධවලට ලක්වෙච්ච රණවිරුවන් විශාල සංඛ්‍යාවක් අපේ රටේ ඉන්නවා. ඒ සියලු දෙනා ගැන අපි කථා කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

වයස අවුරුදු 55 සම්පූර්ණ වී වෛද්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් වුණු යුද්ධයෙන් ආබාධිත වූ රණවිරුවන් වෙත දුබලතා විශ්‍රාම වැටුප මෙතෙක් නොගෙවා සිටීම නිසා ඔවුන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කරලා ස්ථාවර දීමනාව ලබා දීම මෙතෙක් සිදුකරලා නැහැ. ඒ පිළිබඳව කඩිනමින් ගත හැකි පියවර මොනවාද කියන එක ගැන ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාව දැනුවත් කරනවාද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමියනි, අපි ඒකට විශේෂ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වාගේම නව කැබිනට් පත්‍රිකාවකුත් අපි සකස් කර තිබෙනවා. ඒකේ කටයුතු සියයට 99ක්ම මේ වෙනකොට අවසන්වෙලා තිබෙනවා.

ඒ කියන්නේ, වයස අවුරුදු 55න් පසුව විශ්‍රාම ගොස් වෛද්‍ය මණ්ඩල වෙතින් දුබලතා ප්‍රතිශත නිර්දේශය ලබා ගත් අයවලුන්, අවුරුදු 55ට පෙර විශ්‍රාම ගිහිල්ලා අවුරුදු 55න් පසුව වෛද්‍ය මණ්ඩලවලට ගිහිල්ලා තමන්ගේ ආබාධිත තත්ත්වයේ ප්‍රතිශතය නිර්දේශ වෙන අයවලුන්, ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වූ, නමුත් සේවා කාලය අවුරුදු 5, 12, 20 සහ 22ක් වූ නිලධාරින් සහ සෙසු නිලධාරින් අස් වෙලා ගිහිල්ලා, එහෙම නැත්නම් අවුරුදු 55 සම්පූර්ණ වෙන්න කලින් විශ්‍රාම ගිහිල්ලා වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් වීමෙන් පසුව ඒකට ලැබෙන ප්‍රතිශතය අනුව දීර්ඝ කාලයකට පසුව වෛද්‍ය මණ්ඩලවලට ඉදිරිපත් වෙන අයවලුන් ඒ ප්‍රතිශතය අනුව අනිවාර්යයෙන් නිර්දේශ වෙනවා. ඒ වාගේම යුදමය වාතාවරණය කාලයේ ආබාධිත වෙලා නිවාඩු නොමැතිව නොපැමිණ - absent without leave - සිටින අයවලුත් ඉන්නවා. ඒ නිසා සේවයෙන් ඉවත් කළා වුණත්, අස් කරලා හිටියත් ඔවුන්වත් මේ අලුත් කැබිනට් පත්‍රිකාවෙන් අපි නිර්දේශ කර තිබෙනවා. ඒ වාගේම 2025 ජූලි 14වැනි දා අපි විශේෂ කැබිනට් මණ්ඩල අනුමැතියක් ලබා ගත්තා, විශේෂ කමිටුවක් පත් කරන්න. ආබාධිත, මිය ගිය, වැන්දඹු, ක්‍රියාන්විත සහ ක්‍රියාන්විත නොවන, නමුත් ත්‍රස්තවාදී ක්‍රියාවලට ඉඳුරාම සම්බන්ධ නැති, එහෙත් ක්‍රියාන්විතවල රාජකාරියට අදාළ අයවලුන්ට තිබෙන සියලුම ගැටලු; ප්‍රශ්න; ආරවුල් විසඳන්න, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ; විශේෂ කාර්ය බලකායේ සිටින සියලුම අයගේ ප්‍රශ්න විසඳන්න පසුගිය මාසයේ 12වැනි දා කමිටුවක් පත් කරන්න කැබිනට් පත්‍රිකාවෙන් අනුමැතිය ලැබුණා. එයිනුත් ඔබතුමිය අහපු ප්‍රශ්නයට පිළිතුරු ලැබෙනවා. මේ අවුරුද්ද ඇතුළත සියලුම රණවිරුවන්ගේ ප්‍රශ්න ටික විසඳන්න තමයි අපි ඒ කමිටුවත් පත් කරගන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ඇත්තටම රටක් හැටියටත්, ශ්‍රී ලාංකීය ජාතිය හැටියටත් අප සියලුදෙනාම දන්නවා, මේ රටේ පැවති තිස් වසරක යුද්ධය නිම කරන්නට කුමන හෝ අවස්ථාවක දිවි දීපු, ඒ වාගේම දුබලතාවට පත් වෙච්ච මේ සියලු රණවිරුවන්ට අපි ණයයි කියන කාරණය. ඒ නිසා මේ පාර්ලිමේන්තුව හැටියට සහ රට හැටියට අපි ඒ අයගේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී ඉන්න ඕනෑය කියා මා විශ්වාස කරනවා. ඒ අනුව මම කියනවා, දුබලතාවන්ට ලක් වෙච්ච රණවිරුවෝ අර කිව්ව ගැටලුව නිසාත් දැඩි ආර්ථික පීඩාවන්ට පත් වෙලා තිබෙන බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ කැබිනට් පත්‍රිකාවෙන් ඒ අයට හැකි ඉක්මනින් සහන ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

යුදමය වාතාවරණය පැවති කාලය තුළදී ක්‍රියාන්විත ප්‍රදේශවල සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා ස්ථිර වෛද්‍ය වර්ග කිරීම මත විශ්‍රාම ගැන්වූ බහුතර ආබාධිත රණවිරු පිරිසක් සඳහා විශ්‍රාම ගැන්වූ දිනයේ සිට වැටුප් හා දීමනා හිමිගැන්වූ අතර, සුළු පිරිසක් සඳහා ගිහ වැටුප් හා දීමනා ගෙවීම් අත්හිටුවා තිබෙනවා, අමාත්‍ය මණ්ඩල අනුකමිටු නිර්දේශ මත. ඒ වාගේම මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටියදී මිය ගිය, අතුරුදහන් වූ, ආබාධිත වූ මෙන්ම වෛද්‍ය හේතු මත විශ්‍රාම ගොස් සිට රණවිරුවා අවුරුදු 55ට පෙර මිය ගියහොත්, සෙබළාට අවුරුදු 55 වන තෙක් ඒ බිරිඳට හෝ බාල වයස්කාර දරුවන්ට වැටුප් හා දීමනා හිමි වුවද, ඉන් පසු හිමි මාසික ස්ථාවර දීමනාව සමහර බිරින්දෑවරුන්ට ගෙවීම අත්හිටුවා තිබෙනවා. ගරු

නියෝජ්‍ය ඇමතිතුමනි, මම හිතන විධියට අර ඔබතුමා කලින් පැහැදිලි කළේ මේක ගැන. ඒ වුණාට මම ඔබතුමාගෙන් අහන්නේ, මේක විසඳලා දෙන්න කොච්චර කාලයක් ගතවනවාද, එහෙම නැත්නම් මේ කටයුතු කඩිනම් කිරීමට ඔබතුමා ගන්නා පියවර මොකක්ද කියන එකයි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමියනි, මම කලින් ඔබතුමිය විසින් අසන ලද අතුරු ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ ඔය සම්බන්ධව තමයි. විශේෂයෙන්ම අතුරු කමිටුව, ඊට අමතරව කැබිනට් පත්‍රිකාවෙන් අපි ඒ සියලු දේවල් සලකා බලා තිබෙනවා. අපිත් ඒ ප්‍රශ්නය දන්නවා. මමත් හමුදාවේ හිටපු නිලධාරියෙක් හැටියට ඒ ආබාධිත, ඒ වාගේම මිය ගිය අයගේ පවුල්, ඒ වැන්දඹු අයගේ ආර්ථික තත්ත්වය, ඔවුන් ඉන්න ප්‍රදේශ ආදී සියලු දේවල් සැලකිල්ලට ගෙන තමයි කටයුතු කරන්නේ. යුද වාතාවරණය පැවති කාලයේ ආබාධිත වෙලා absent වූ, එහෙම නැත්නම් නිවාඩු නොමැතිව නොපැමිණ සිටින අය ගැනත්, හමුදාවෙන් අස් කරපු අය ගැනත් මෙහිදී අපි විශේෂයෙන්ම සැලකිල්ලට භාජන කරනවා. ඔවුන් සම්බන්ධයෙන් ගත හැකි විනයානුකූල පියවර මොකක්ද කියලා විශේෂයෙන් සැලකිල්ලට ගෙන කොහොම හරි අපි මේ ඉදිරි මාස කිහිපය ඇතුළත කැබිනට් ප්‍රතිකාව අනුමත කරගෙන, අදාළ වැන්දඹු අනත්දරු පනත් සංශෝධනයත් ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ සඳහා අනුමැතිය අරගෙන ඒ ගෙවීම් කටයුතු ඉක්මනින් කරන්න තමයි අපේ උත්සාහය සහ රජයේ වගකීම. ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් සාකච්ඡා මාලා පවත්වද්දී ඒ ගැන විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්න කිහිපය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වනවා.

## සයිබර් මූල්‍ය අපරාධ: විස්තර
### நிதி தொடர்பான சைபர் குற்ற வழக்குகள்: விபரம்
### FINANCIAL CYBERCRIME DETAILS

1013/2025

**5. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැනට විභාග කෙරෙමින් පවතින, විමර්ශන සිදු කෙරෙමින් පවතින, නීතිමය පියවර ගනිමින් තිබෙන සහ විසඳා ඇති සයිබර් මූල්‍ය අපරාධ සිද්ධි සංඛ්‍යාව එක් එක් පළාත සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සයිබර් මූල්‍ය අපරාධ සිද්ධි විමර්ශනය කර නඩු පැවරීමට ගතවන සාමාන්‍ය කාලය කොපමණද;

(iii) මූල්‍ය වංචා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත, සයිබර් අපරාධ විමර්ශනය කිරීම සඳහාම වෙන් වූ ඒකක සියලුම පළාත්වල ස්ථාපනය කර තිබේද;

(iv) සයිබර් මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය පාදක කර ගත් වංචා හඳුනාගැනීමේ පද්ධති වැනි උසස් තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ රජයේ ස්ථාවරය කුමක්ද;

(v) මූල්‍ය ආයතන සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කිරීම සහ කෘත්‍රිම බුද්ධිය පාදක කර ගත් වංචා හඳුනාගැනීමේ පද්ධති වැනි උසස් තාක්ෂණය භාවිත කිරීම ඇතුළුව සයිබර් මූල්‍ය අපරාධ වැළැක්වීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது நிலுவையிலுள்ள, விசாரணை யிலுள்ள, சட்ட நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்ற மற்றும் தீர்க்கப்பட்ட நிதி தொடர் பான சைபர் குற்ற வழக்குகளின் எண்ணிக்கை மாகாணம் மற்றும் ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) நிதி தொடர்பான சைபர் குற்ற வழக்குகளை விசாரணை செய்து சட்ட நடவடிக்கை எடுப்பதற்கு எடுக்கின்ற சராசரிக் காலத்தையும்;

(iii) நிதி மோசடி தொடர்பாக நிபுணத்துவம் பெற்ற சைபர் குற்றச்செயல் தொடர்பான தனியான புலனாய்வுப் பிரிவுகள் அனைத்து மாகாணங் களிலும் நிறுவப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) நிதி தொடர்பான சைபர் குற்றச்செயல்களை விசாரணை செய்வதற்குச் செயற்கை நுண்ணறி வைப் பயன்படுத்தி மோசடிகளைக் கண்டு பிடிக்கும் முறைமைகள் போன்ற மேம்பட்ட தொழில்நுட்பங்களைப் பயன்படுத்துவது தொடர்பான அரசாங்கத்தின் நிலைப்பாடு என்ன என்பதையும்;

(v) நிதி நிறுவனங்களுடனான ஒத்துழைப்பு மற்றும் செயற்கை நுண்ணறிவைப் பயன்படுத்தி மோசடி களைக் கண்டுபிடிக்கும் முறைமைகள் போன்ற மேம்பட்ட தொழில்நுட்பங்களைப் பயன் படுத்துதல் உள்ளடங்கலாக, நிதி தொடர்பான சைபர் குற்றச்செயல்களைத் தடுப்பதற்கு அரசாங்கம் எடுத்துள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of financial cybercrime cases currently pending, under investigation, on which legal action is being taken and those that have been resolved, separately by province and year;

(ii) the average time taken to investigate and prosecute financial cybercrime cases;

(iii) whether dedicated cybercrime investigation units with expertise in financial fraud have been established in all provinces;

(iv) the Government's stance on the use of advanced technologies such as AI-based fraud detection systems for investigating financial cybercrimes; and

(v) the steps the Government has taken to prevent financial cybercrimes, including collaboration with financial institutions and the use of advanced technologies such as AI-based fraud detection systems?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| පළාත | අධිකරණයේ විභාග වෙමින් පවතින සයිබර් මූල්‍ය අපරාධ | | | | | | විමර්ශන සිදු කෙරෙමින් පවතින සයිබර් මූල්‍ය අපරාධ | | | | | | විසඳා ඇති සයිබර් මූල්‍ය අපරාධ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026.04.30 දිනට | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026.04.30 දිනට | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026.04.30 දිනට |
| බස්නාහිර | - | 23 | 8 | 3 | 3 | - | 105 | 165 | 295 | 639 | 593 | 107 | 188 | 84 | 66 | 95 | 143 | 29 |
| මධ්‍යම | - | - | - | 2 | 1 | - | 3 | - | - | 2 | - | 6 | 9 | 5 | 4 | 2 | - | 1 |
| දකුණ | - | - | - | 1 | - | 1 | - | 1 | 2 | 3 | 6 | 1 | 17 | 17 | 7 | 10 | 6 | 6 |
| නැගෙනහිර | - | - | 2 | 1 | - | - | - | - | - | 37 | - | 3 | - | - | 2 | - | 2 | - |
| වයඹ | - | - | - | - | - | - | - | - | 1 | 1 | 13 | 7 | - | - | - | - | - | - |
| උතුරු මැද | - | - | - | - | 3 | 1 | - | - | - | - | 35 | 11 | - | - | - | - | 9 | - |
| උතුර | - | - | - | - | - | - | - | - | - | 1 | 33 | 9 | - | - | - | - | - | - |
| එකතුව | - | 23 | 10 | 7 | 7 | 2 | 108 | 166 | 298 | 683 | 680 | 144 | 214 | 106 | 79 | 107 | 160 | 36 |

* ඌව පළාත සහ සබරගමුව පළාත තුළ පරිගණක අපරාධ විමර්ශන උප ඒකක ස්ථාපිත කිරීමට නියමිතය.

(ii) එක් එක් පැමිණිල්ලේ ස්වභාවය අනුවද, තාක්ෂණික දත්ත ලබා දීමේ කාලය අනුව ද නඩු පැවරීමට ගත වන කාලය වෙනස් වනවා.

(iii) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව පරිගණක අපරාධ විමර්ශන උප ඒකක බස්නාහිර, මධ්‍යම, දකුණ, නැගෙනහිර, වයඹ, උතුරු මැද සහ උතුරු පළාත් ආවරණය වන පරිදි ස්ථාපිත කර තිබෙනවා. ඌව පළාත සහ සබරගමුව පළාත තුළ පරිගණක අපරාධ විමර්ශන උප ඒකක ස්ථාපිත කිරීමට නියමිතව තිබෙනවා.

(iv) සයිබර් මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් උසස් තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිත කරන අතර, මෙතෙක් ඒ සඳහා කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීමට කටයුතු කර නොමැත. මෙවැනි අපරාධ හා අනෙකුත් අපරාධ විමර්ශනයේදී කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීමට අදාළව පූර්ණ අධ්‍යයනයක් සිදු කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීමේ හැකියාව ලැබෙනවා.

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය හා සම්බන්ධීකරණය වෙමින් ක්‍රියාත්මක වන අතර, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - Sri Lanka CERT - මඟින් පහත සඳහන් වැඩසටහන් සිදු කරනු ලබනවා.

1. මහජනයා දැනුවත් කිරීම: Phishing links, OTP වංචා සහ ආයෝජන වංචා හඳුනා ගැනීම පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහන් දියත් කිරීම.

2. ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ: ජාතික සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය, සයිබර් ආරක්ෂණ මූලෝපාය (2026-2029), මූලික ආරක්ෂණ ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතිනවා.

3. ධාරිතා වර්ධනය - capacity-building: අපරාධ යුක්තිය පසිඳලීමේ සමස්ත ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් අධිකරණ අපරාධ විද්‍යාව - Digital Forensics, විද්‍යුත් සාක්ෂි හැසිරවීම සහ විශ්ලේෂණය පිළිබඳ අධිකරණ සහ නීති නිලධාරීන්ට මෙන්ම ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය පුහුණුව ලබා දීම.

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

நிதி மோசடிகள் தொடர்பாக தொடர்ச்சியாக எங்களுக்கு முறைப்பாடுகள் வந்துகொண்டு இருக்கின்றன. வங்கிகள் மற்றும் ஏனைய நிறுவனங்களினூடாக நிதியானது மக்களிட மிருந்து பறிபோய்க்கொண்டு இருக்கின்றது. எனினும், அதற்கான தீர்வு நடவடிக்கைகளோ, அவற்றைப் பெறுவதற்

கான நடவடிக்கைகளோ மிகவும் தாமதமாகவே இடம்பெறு கின்றன. இலங்கையில் இணையப் பாதுகாப்பு மற்றும் நிதிப் புலனாய்வானது, பொலிஸ் திணைக்களம், CID, மத்திய வங்கி, CERT எனப் பல்வேறு பிரிவுகளின்கீழ் இடம்பெறுகின்றன. பொது மக்களின் பணம் விரைவாகக் கொள்ளையடிக்கப்படும் நிலையில், மேற்குறித்த நிறுவனங்களுக்கு இடையேயான ஒருங்கிணைப்பு மற்றும் நிதியை உடனடியாக முடக்கும் வேகம் அவசியமாகத் தேவைப் படுகின்றது.

எனது மேலதிக வினா என்னவென்றால், டிஜிட்டல் வங்கி மோசடிகள் மற்றும் அங்கீகாரமற்ற தரவு மீறல்கள் - data bridges - அதிகரித்துவரும் நிலையில், திருடப்பட்ட அல்லது மோசடி செய்யப்பட்ட நிதி உள்நாட்டு வங்கி அமைப்பிலிருந்து வெளியேற்றப்படுவதற்கு அல்லது செலவு செய்யப்படுவதற்கு முன்னர், அவற்றை உடனடியாக முடக்குவதற்கு ஏதுவாக, குற்றப் புலனாய்வுத் திணைக்களத்தின்- CIDஇன் - கணினிக் குற்றப்பிரிவு, இலங்கை கணினி அவசரப் பிரிவு, Sri Lanka CERT மற்றும் இலங்கை மத்திய வங்கியின் நிதிப் புலனாய்வுப் பிரிவு ஆகியவற்றுக்கு இடையே உடனுக்குடன் தகவல்களைப் பரிமாறிக்கொள்ளக்கூடிய real-time intelligence sharing எனும் பொறிமுறைகள் ஏதும் இப்போது உருவாக்கப்பட்டு இருக்கின் றனவா அல்லது எதிர்காலத்தில் உருவாக்கப்படுவதற்கான வாய்ப்புகள் இருக்கின்றனவா? என்பதுதான்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට මා අවධාරණය කරන්න අවශ්‍යයි, සයිබර් අපරාධ දිනෙන් දින වර්ධනය වෙමින් පවතින බව. ඒ පිළිබඳව ලැබෙන පැමිණිලි ප්‍රමාණයත් විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. එම නිසාම සයිබර් අපරාධ සම්බන්ධයෙන් පළාත් අනුව උප විමර්ශන ඒකක ස්ථාපිත කරලා තිබෙනවා. ඉදිරියේදී ඌව පළාත තුළත්, සබරගමුව පළාත තුළත් පරිගණක අපරාධ විමර්ශන ඒකක ස්ථාපිත කරන්න කටයුතු කරනවා. ඒ අනුව සෑම පළාතකම පරිගණක අපරාධ විමර්ශන ඒකකයක් ස්ථාපිත වනවා.

ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම මේකට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, Sri Lanka CERT, ඩිජිටල් අමාත්‍යාංශය කියන සියල්ල ඒකාබද්ධව මේ වනකොටත් වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වෙමින් පවතිනවා. ඒ නිසා අනාගතයේ ඇති වන මෙවැනි සයිබර් අපරාධ සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් ශ්‍රී ලංකා පොලීසිය හැටියටත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැටියටත් මේ වනකොට අපි යොමු කර තිබෙනවා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

நன்றி! என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இலங்கையில் இணையக் குற்றங்கள் தொடர்பான சட்டம் 2007ஆம் ஆண்டைச் சார்ந்ததாகக் காணப்படுகின்றது. தற்போதைய அதிநவீன மற்றும் சிக்கலான டிஜிட்டல் நிதி மோசடிகளை எதிர்கொள்வதற்கு இந்தப் பழைய சட்டம் போதுமானதா? என்ற கேள்வி எழுந்திருக்கின்றது. நவீன AI தொழில்நுட்பம்மூலம் மேற்கொள்ளப்பட்டுவரும் நிதி மோசடிகள், cryptocurrency ஏமாற்று வேலைகள் மற்றும் இலங்கையைச் சேர்ந்த வங்கி வாடிக்கையாளர்களை இலக்கு வைக்கும் சர்வதேச phishing networkஐத் திறம்படக் கையாண்டு, அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்கு 2007ஆம் ஆண்டின் 24ஆம் இலக்க, கணினி குற்றச் சட்டம் - Computer Crime Act - மற்றும் 2006ஆம் ஆண்டின் 30ஆம் இலக்க, கட்டணச் சாதனங்கள் மோசடிகள் சட்டம் - Payment Devices Frauds Act - என்பன தற்போதைய சூழலுக்கு அமைய போதுமானதாக உள்ளனவா? இது சம்பந்தமாக அமைச்சு மேலதிக மதிப்பீடுகளைச் செய்து, எதிர்காலத்தில் புதிய சட்டங்களை உருவாக்குமா? என நான் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවා. මේ පනත් වාගේම විශේෂයෙන් පරිගණක අපරාධ සම්බන්ධයෙන් වාගේම අනෙකුත් අපරාධ සම්බන්ධයෙන් නීතිමය සංශෝධන ගෙන ඒම සඳහා මේ වනකොට අධිකරණ අමාත්‍යාංශයත් සමඟ ඒකාබද්ධ වෙමින් කටයුතු කරමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය පිළිබඳව ද අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ සඳහා අධ්‍යයනයක් සිදු කරමින් පවතිනවා.

## නැඟෙනහිර පළාතේ වැඩබලන ගුරු උපදේශකයින් සහ සම්පත් දායකයින්: ස්ථිර කිරීම

கிழக்கு மாகாணத்திலுள்ள பதில் கடமைபுரியும் ஆசிரிய ஆலோசகர்கள் மற்றும் வளவாளர்கள்: நிரந்தரமாக்குதல்

ACTING TEACHER ADVISERS AND RESOURCE PERSONS IN EASTERN PROVINCE: CONFIRMATION

1303/2025

6. **ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අධ්‍යාපන කලාපවලට අනුයුක්තව වැඩ බැලීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ලෙස සේවය කරනු ලබන නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ අතරින් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්, නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ නැගෙනහිර පළාත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් විසින් වැඩ බැලීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ලෙස පත් කර ඇති නිලධාරීන්ගේ නම් කවරේද;

(iii) දීර්ඝ කාලයක් වැඩ බැලීමේ පදනම මත සේවය කරනු ලබන ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ස්ථිර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கல்வி வலயங்களுக்கு இணைக்கப்பட்டு பதில் கடமை அடிப்படையில் ஆசிரிய ஆலோசகர் களாகவும் வளவாளர்களாகவும் கடமையாற்றி வரும் உத்தியோகத்தர்களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) இந்த உத்தியோகத்தர்களில் கிழக்கு மாகாண கல்விச் செயலாளர், கிழக்கு மாகாண கல்விப் பணிப்பாளர் மற்றும் கிழக்கு மாகாண வலயக் கல்விப் பணிப்பாளர்களால் பதில் கடமை அடிப்படையில் ஆசிரிய ஆலோசகர்களாகவும் வளவாளர்களாகவும் நியமிக்கப்பட்டவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) நீண்ட காலமாக பதில் கடமை அடிப்படையில் கடமையாற்றும் ஆசிரிய ஆலோசகர்கள் மற்றும் வளவாளர்களை நிரந்தரமாக்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) separately, the names of the officers attached to the education zones who are currently serving as In-Service Advisers and Resource Persons on an acting basis;

(ii) the names of the officers who have been appointed as In-Service Advisers and Resource Persons on acting basis by the Secretary to the Provincial Ministry of Education for the Eastern Province, the Provincial Director of Education for the Eastern Province and Zonal Directors of Education for the Eastern Province; and

(iii) whether steps will be taken to confirm the In-Service Advisers and Resource Persons who have been serving in their respective posts on an acting basis for a prolonged period?

(b) If not, why?

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) <u>**ජාතික පාසල් සම්බන්ධව**</u>

ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව අනුව වැඩ බැලීමේ පදනම මත ගුරු උපදේශකවරුන් පත් කිරීම සිදු කර නොමැත.

තවද, ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව අනුව සම්පත් දායක ලෙස තනතුරක් නොමැති අතර, ඒ අනුව සම්පත් දායක ලෙස පත්වීමක් ලබා දීමට ප්‍රතිපාදන නොමැත.

<u>**පළාත් පාසල් සම්බන්ධව**</u>

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වෙතින් ලබා දුන් තොරතුරු අනුව අධ්‍යාපන කලාපවලට අනුයුක්තව වැඩ බැලීමේ පදනම මත, රාජකාරී ආවරණය කිරීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත්දායකයන් ලෙස සේවය කරනු ලබන නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත. එය දීර්ඝ ලේඛනයක්, ගරු මන්ත්‍රීතුමනි.

(ii) ඒ අතරින් නැඟෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්, නැඟෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ නැඟෙනහිර පළාත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් වැඩ බැලීමේ පදනම මත, රාජකාරී ආවරණය කිරීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ලෙස පත් කර ඇති නිලධාරින්ගේ නම් ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කරනවා. ඒකත් ටිකක් ලොකු ලේඛනයක්, ගරු මන්ත්‍රීතුමනි.

(iii) ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීමත් සමඟ පළාත් අධ්‍යාපන ලේකම් විසින් හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත්වීම් ලබා දී දීර්ඝ කාලයක් ගුරු උපදේශක සේවයේ රැඳී සිටි නිලධාරින් හට ඔවුන්ගේ මනාපය පරිදි 2022.01.02 දිනට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට අවස්ථාව සලසා දෙන ලදී. තවද, ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළ කළ අන්තර්ග්‍රහණ ලිපි නිකුත් කරන ලද නිලධාරින් සඳහා එම ලිපි භාර ගැනීමට 2025.02.15 දින දක්වා අවස්ථාව ලබා දී තිබූ අතර, එසේ ලබා දී තිබූ කාලය තුළ ද ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීම ප්‍රකාර රාජකාරී භාර නොගත් නිලධාරින් පෙරළා ගුරු සේවයට යොමු කිරීමට කටයුතු කරන ලෙස පළාත් නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. තවද, ගුරු උපදේශක සේවයට නව බඳවා ගැනීම් සඳහා ගැසට් නිවේදනය මඟින් අයදුම්පත් කැඳවීමට අදාළව අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර එම අනුමැතිය ලද පසු ගුරු උපදේශක සේවයට ගුරු සේවයේ නිලධාරින් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට හැකියාව පවතින බවද වාර්තා කරමි.

මෙම අමාත්‍යාංශය මඟින් සම්පත් දායක ලෙස පත් කිරීම් හෝ වැඩ බැලීම සඳහා පත් කිරීම් සිදු කර නොමැති අතර රාජකාරී ආවරණය සඳහා පමණක් පත් වීම් ලබා දී ඇත. නමුත් එම රාජකාරී ආවරණය කරන ගුරුවරුන් ගුරු උපදේශක සේවයට සෘජුවම ස්ථිර කිරීමක් සිදු නොකරන අතර, ගුරු උපදේශක සේවයට බඳවා ගැනීමේදී ඔවුන්ටද අයදුම් කිරීමේ හැකියාව ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ சபாநாயகர் அவர்களே! கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

2020.07.01ஆம் திகதி ஆசிரிய ஆலோசகர் சேவை பிரமாணக் குறிப்பு அரசால் வெளியிடப்பட்டது. இதன் முதலாவது திருத்தம் 2022.09.04ஆம் திகதியும், இரண்டாவது திருத்தம் 2025.09.18ஆம் திகதியும் வெளியிடப்பட்டது. இத்திருத்தங்களில், எழுத்துப் பரீட்சைமூலம் குறித்த SLTAS சேவைக்கு ஆட்சேர்ப்புச் செய்ய வேண்டுமெனக் குறிப்பிடப்பட்டு இருந்தும், 2020.07.01ஆம் திகதி இதற்கு மாற்றமாக ஏற்கெனவே தற்காலிகமாக ஆசிரிய ஆலோசகர் சேவையில் இருந்தவர்களை இச்சேவைக்கு உள்ளீர்ப்புச் செய்து, அவர்கள் பாதிக்கப்படும் நிலையை நீக்கியதுடன், அவர்களின் கடந்த கால சேவையும் கௌரவிக்கப்பட்டது. இதுபோன்று, தற்போது தற்காலிகமாக ஆசிரிய ஆலோசகர் சேவையில் இருக்கின்ற 4,000க்கும் மேற்பட்டவர்களையும், அதே நடைமுறையைப் பின்பற்றி உள்ளீர்ப்புச் செய்து, அவர்கள் பாதிப்படைவதைத் தவிர்ப்பதற்கான ஏற்பாடுகளை கல்வி மற்றும் உயர் கல்வி அமைச்சு மேற்கொள்ளுமா? எனக் கேட்கின்றேன்.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතිනවා. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබෙනවා. කලින් යම් ප්‍රමාණයක් බඳවා ගත්තා. ඒ බඳවා ගත්ත වෙලාවේදී ඒකට සම්බන්ධ නොවෙච්ච අය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා නැවත කැඳවීමක් කරනවා. ඒ කැඳවීමේදී ඒ අයටත් ඉල්ලීම් කරන්න පුළුවන්. ඒ හරහා ඒ අයව බඳවා ගැනීමේ හැකියාවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நாடு முழுவதும் சுமார் 100 கல்வி வலயங்களில் தற்போது சுமார் 600 ஆசிரியர்கள் பதில் ஆசிரிய ஆலோசகர்களாகப் பணியாற்றி வருகின்றனர். ISAsஇடம் ஒப்படைக்கப்பட்ட அனைத்துக் கடமைகளையும் பொறுப்புக்களையும் விதிவிலக்கான அர்ப்பணிப்புடன் இவர்கள் நிறைவேற்றி வருகின்றனர். பாடத்திட்ட செயற்படுத்தலை எளிதாக்குதல், ஆசிரியர்களுக்குப் பள்ளியிலேயே ஆதரவை வழங்குதல், ஆசிரியர் பயிற்சி அமர்வுகளை நடத்துதல், பொருள் வளர்ச்சி நடவடிக்கைகள், ஆசிரியர் தொழில் வளர்ச்சி, மாணவர் சாதனை மேம்பாடு, தேர்வு வினாத்தாள் தயாரிப்பு, கல்வி நடவடிக்கைகளின் குழு மேற்பார்வை, மண்டல, மாகாண மற்றும் தேசிய அளவிலான போட்டிகளை நடத்துதல் போன்ற செயற்பாடுகளில் இவர்கள் ஈடுபட்டு வருகின்றனர். இவர்களை நிரந்தரமாக்குவதற்கு நீங்கள் நடவடிக்கை எடுப்பீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ පරිදිම ඇත්තටම මේ ගුරුවරුන් විශාල සේවාවක් සිදු කරනවා. ඔබතුමා කියන ලද සේවාවන් ටික ඔවුන් පාසල්වල කරනවා. ඒක අධ්‍යාපන ක්ෂේත්‍රයට කරනු ලබන ලොකු සේවාවක්. ඒ නිසා තමයි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කරලා තිබෙන්නේ, මේ අයත් බඳවා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. මම හිතන විධියට, ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ කටයුත්ත සිදු වෙයි. එතකොට මේ අය බඳවා ගැනීම් සහ ස්ථිර කිරීම කරගන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

## සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන: විස්තර
சுரக்ஷா மாணவர் காப்புறுதித் திட்டம்: விபரம்
SURAKSHA STUDENT INSURANCE SCHEME: DETAILS

1371/2025

7. **ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) එම රක්ෂණාවරණය හඳුන්වා දුන් වර්ෂයේ සිට මේ දක්වා ප්‍රතිලාභ හිමිවූ පාසල් සිසුන් සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) උක්ත රක්ෂණාවරණය ක්‍රියාත්මක කරන රක්ෂණ සමාගමේ නම කවරේද;

(v) එම රක්ෂණාවරණය පිළිබඳ වත්මන් රජයේ ස්ථාවරය කවරේද; යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) சுரக்ஷா மாணவர் காப்புறுதித் திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அதன் ஆரம்பகால நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) இக்காப்புறுதித் திட்டம் அறிமுகப்படுத்தப்பட்ட ஆண்டிலிருந்து இதுவரையில் பயனடைந்த பாடசாலை மாணவர்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி காப்புறுதித் திட்டத்தை நடைமுறைப்படுத்தும் காப்புறுதி நிறுவனத்தின் பெயர் என்ன என்பதையும்;

(v) அக்காப்புறுதித் திட்டம் தொடர்பான தற்போதைய அரசாங்கத்தின் நிலைப்பாடு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) date on which the Suraksha Student Insurance Scheme was launched;

(ii) initial objectives of the said insurance scheme;

(iii) number of school children who have benefited from the said insurance scheme each year separately, since its inception;

(iv) name of the insurance company that implements the said insurance scheme; and

(v) current position of the Government on the said insurance scheme?

(b) If not, why?

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන ආරම්භ කළ දිනය 2017.10.01 වේ.

(ii) පාසල තුළදී හා ඉන් පිටතදී ඇතිවන රෝග, අනතුරු හා ආබාධ සඳහා රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා දීම තුළින් සෞඛ්‍ය හා අධ්‍යාපනය තහවුරු කිරීමේ පියවරක් ලෙස මෙම රක්ෂණාවරණය හඳුන්වා දී ඇති අතර රෝග, අනතුරු හා ආබාධ තත්ත්වවලදී ඉක්මන් සෞඛ්‍ය සේවා සඳහා යොමු කරමින් පාසල් පැමිණීම වැඩි කිරීම, ආබාධ තත්ත්වවලදී අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමුවීමට සහාය වීම යන අරමුණු මෙහි ආරම්භක අරමුණු වේ.

(iii)

| 2017 වර්ෂයේ සිට ප්‍රතිලාභ ගෙවා ඇති සිසුන් සංඛ්‍යාව | |
|---|---|
| **කාල සීමාව** | **ප්‍රතිලාභ හිමි වූ සිසුන්** |
| 2017.10.01 - 2018.11.30 | 40,978 |
| 2018.12.01 - 2019.11.30 | 74,983 |
| 2019.12.01 - 2020.05.30 | 28,431 |
| 2020.05.31 - 2020.12.01 | 30,545 |
| 2020.12.02 - 2021.12.01 | 34,712 |
| 2021.12.02 - 2022.12.01 | 28,968 |
| 2022.12.02 - 2024.06.30 | මෙම රක්ෂණාවරණය ක්‍රියාත්මක නොවුණි. |
| 2024.07.01 - 2025.08.31 | 49,730 |
| 2025.09.01 - 2026.03.31 දින තෙක් | 18,654 |

(iv)

| 2017 වර්ෂයේ සිට රක්ෂණාවරණය සැපයීම සඳහා ගිවිසුම්ගත වී ඇති ආයතන | |
|---|---|
| **කාල සීමාව** | **රක්ෂණය සැපයූ** |
| 2017.10.01 - 2018.11.30 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| 2018.12.01 - 2019.11.30 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් ආයතනය |
| 2019.12.01 - 2020.05.30 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් ආයතනය |
| 2020.05.31 - 2020.12.01 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| 2020.12.02 - 2021.12.01 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| 2021.12.02 -2022.12.01 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| 2022.12.02 - 2024.06.30 | මෙම රක්ෂණාවරණය |
| 2024.07.01 - 2025.08.31 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් |
| 2025.09.01 - 2026.08.31 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් |

(v) මේ වනවිට ක්‍රියාත්මක සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන 2027.08.31 දිනෙන් අවසන් වන අතර, වැඩි පාසල් දරුවන් පිරිසක් සඳහා ප්‍රතිලාභ හිමි වන අයුරින් ඉදිරි වර්ෂවලදීත් මෙම රක්ෂණාවරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මෙම රජයේ ස්ථාවරයයි.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුව කාලයේ - 2017 වසරේ - ඉදිරිපත් කළ මෙම සුරක්ෂා සිසු රක්ෂණ ක්‍රමය මේ රජය විසින් ඉදිරියට ගෙන යාම පිළිබඳව සතුටු වන අතරේ, මා සඳහන් කරන්න කැමැතියි, විශේෂයෙන්ම වර්තමාන කාලයට ගැළපෙන ආකාරයට මෙම සුරක්ෂා සිසු රක්ෂණ ක්‍රමය වෙනස් කිරීමත් අත්‍යවශ්‍ය කාරණයක් බව.

මොකද, සාමාන්‍යයෙන් සුරක්ෂා රක්ෂණ ක්‍රමය යටතේ claim එකක් කරන කොට විදුහල්පතිතුමාගේ අත්සන අවශ්‍ය වෙලා තිබෙනවා. සමහර පාසල්වල, විශේෂයෙන්ම දුෂ්කර පාසල්වල - විදුහල්පතිවරුන්ගේ ගැටලු නිසා, නැවත පත්වීම් දීමේ ගැටලු ආදිය නිසා - මේ සුරක්ෂා රක්ෂණ ක්‍රමයට අදාළව මුදල් ලබා ගැනීමේදී ප්‍රමාදයක් ඇති වෙලා තිබෙනවා. ඒ සඳහා යම්කිසි කාල සීමාවක් ලබා දුන්නොත් හොඳයි කියලා මම හිතනවා.

අද පවතින ඖෂධ මිල ගැනත් මම කථා කළ යුතුයි. සාමාන්‍යයෙන් බාහිර ප්‍රතිකාර ලබන සිසුවෙකුට අවුරුද්දකට රුපියල් 20,000ක් වාගේ මුදලක් තමයි ලැබෙන්නේ. ඖෂධවල දැනට පවතින අධික මිල නිසා ඒ රුපියල් 20,000ක මුදල වැඩි කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ. එක සැරයක්, දෙසැරයක් ප්‍රතිකාර ලබා ගත්තොත් ඒ රුපියල් 20,000 අවසන් වෙනවා. මොකද, ඇමෙරිකානු ඩොලරයේ අගය අනුව ඖෂධ මිල වෙනස් වෙනවා. එම නිසා, බාහිර ඖෂධ ලබා ගැනීමට දෙන රුපියල් 20,000ක මුදල වැඩි කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේ ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නේ.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමියනි, මෙම සිසු රක්ෂණාවරණය කොයි කාලයේ ආරම්භ කළත් එය ඉතාම හොඳ දෙයක්. ඒකෙන් පාසල් දරුවන්ට

විශාල පිටුවහලක් ලැබී තිබෙනවා. එහි තිබෙන අඩුපාඩු සම්බන්ධයෙනුත් රජය දැන් අවධානය යොමු කර තිබෙනවා. අප ඒ පිළිබඳව අධ්‍යයනයක් කරමිනුයි යන්නේ. ඒ පිළිබඳව කැබිනට් මණ්ඩලයට විශේෂ වාර්තාවක් නිකුත් කරන්නත් අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවා. එය ඉදිරිපත් කිරීමේදී ඔබතුමියගේ යෝජනාවත් අපගේ සැලකිල්ලට ගන්න පුළුවන්.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම පාසල් ළමුන් සම්බන්ධයෙන් කථා කරන කොට ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබුණා සෑම දරුවෙකුගේම නිවසේ ඉඳන් කිලෝමීටර 3ක් දුරින් රජයේ ප්‍රාථමික පාසල් ස්ථාපිත කරනවා කියලා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, දළ වශයෙන් මේ ආකාරයට පාසල් කීයක් අලුතින් පටන් ගෙන තිබෙනවාද කියලා.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ඔබතුමිය අහපු මුල් ප්‍රශ්නයට ඍජුවම සම්බන්ධයක් නැති වුණත් ඔබතුමියගේ ප්‍රශ්නය වැදගත් නිසා මම පිළිතුරු ලබා දෙන්නම්. විශේෂයෙන්ම අපි අදහස් කර තිබෙනවා දරුවන්ට ඉතා ආසන්නයෙන්ම පාසලක් ලබා දෙන්න ඕනෑ කියලා. මොකද, දරුවන් මේ වනකොටත් කිලෝමීටර ගණනක් දුර ගෙවාගෙන පාසල් එනවා; මා දන්නා පරිදි දරුවන් ඇල්පිටිය ප්‍රදේශයේ ඉඳලා කොළඹටත් එනවා. කිලෝමීටර 60ක, 70ක දුරක් ගෙවලායි ඒ අය එන්නේ. මේ හේතුවෙන් දරුවන්ගේ අනාගතය පිළිබඳ දැවැන්ත ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. අපි ඡන්ද කාලයේත් මේ ගැන විශේෂයෙන්ම සාකච්ඡා කළා. ජපානයේ ඉතාම ළඟින් හොඳ පාසල් නිර්මාණය කරලා තිබෙනවා. ඒවාට තමයි එහේ දරුවන් යන්නේ.

අපගේ දරුවන්ගේ කාලය ඉතිරි කර ගන්නත්, දරුවන්ට නිදහසේ හොඳ පාසලක ඉගෙනීමේ ඉඩ ප්‍රස්තාව හදන්නත් අපි මේ වනකොට යම් යම් පාසල් වැඩි දියුණු කරමින් යනවා. ඔබතුමිය දන්නවා, පසුගිය අය වැය දෙකෙන්ම රුපියල් කෝටි 17,000ක වාගේ මුදල් ප්‍රමාණයක් රාජ්‍ය අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ බව. අපි ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ සම්පත් යොදවා ගමේ පාසල් පද්ධතිය දියුණු කරනවා. දරුවාට ගමේ පාසලට යන්න කිව්වාට වැඩක් නැහැ, ඒ පාසලේ භෞතික සහ මානව සම්පත් නැත්නම්. ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් මේ වනකොටත් ඒ පාසල් අන්තර්ග්‍රහණය කරන්න, merge කරන්න කටයුතු කරමින් පවතිනවා. අපි හිතනවා, ඊට පස්සේ හොඳ පාසල් පද්ධතියක් දරුවන්ට තමන්ගේ ගෙදර කිට්ටුවෙන්ම ලබා දීමේ හැකියාව ලැබෙයි කියලා.

## ගාල්ල, බෙලිගහ නව අධිකරණ සංකීර්ණය: නීති කටයුතු ආරම්භ කිරීම

காலி, பெலிகஹ, புதிய நீதிமன்றக் கட்டிடத்தொகுதி: வழக்கு நடவடிக்கைகளை ஆரம்பித்தல்
NEW COURT COMPLEX IN BELIGAHA, GALLE: COMMENCEMENT OF LEGAL PROCEEDINGS

1469/2025

**8. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල, බෙලිගහ, නව අධිකරණ සංකීර්ණය 2024 ජූලි 19 දින විවෘත කරන ලද නමුත් මේ වනතෙක් එහි නීති කෘත්‍යයන් ආරම්භ නොකිරීමට හේතුව කවරේද;

(ii) එම අධිකරණ සංකීර්ණයේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) ඉහත සඳහන් නව සංකීර්ණයේ රාජකාරි කටයුතු ආරම්භ කිරීමෙන් පසු මේ වන විට අධිකරණ කටයුතු පවත්වාගෙන යනු ලබන ගාල්ල කොටුව පෞරාණික ගොඩනැඟිලි හා එම පරිශ්‍රය භාවිත කිරීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(iv) ගාල්ල, බෙලිගහ, නව අධිකරණ සංකීර්ණයේ ගොඩනැඟිලි සහ භූමිය මේ වනතෙක් භාවිතයට නොගැනීමෙන් සිදු වී ඇති අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி, பெலிகஹ, புதிய நீதிமன்றக் கட்டிடத்தொகுதி 2024 யூலை 19ஆம் திகதி திறந்துவைக்கப்பட்டபோதிலும், இதுவரை அங்கு வழக்கு நடவடிக்கைகள் ஆரம்பிக்கப்படாமைக்கான காரணம் யாது;

(ii) மேற்படி நீதிமன்றக் கட்டிடத்தொகுதியில் வழக்கு நடவடிக்கைகளை ஆரம்பிப்பதற்கான உத்தேசக் காலப்பகுதி யாது;

(iii) மேலே குறிப்பிடப்பட்டுள்ள புதிய கட்டிடத்தொகுதியில் நடவடிக்கைகளை ஆரம்பித்ததன் பின்னர், தற்போது நீதிமன்ற நடவடிக்கைகள் பேணிவரப்படுகின்ற காலி கோட்டை பண்டைய கட்டிடங்களையும் மேற்படி வளவையும் பயன்படுத்துவதற்கு எதிர்பார்க்கும் நோக்கங்கள் யாவை;

(iv) காலி, பெலிகஹ, புதிய நீதிமன்றக் கட்டிடத்தொகுதியின் கட்டிடங்களையும் காணியையும் இதுவரை பயன்படுத்தாமல் இருப்பதன் காரணமாக ஏற்பட்டுள்ள நட்டம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) reason for not hitherto commencing legal proceedings in the new court complex in Beligaha, Galle, in spite of the fact that it was declared open on 19th July, 2024;

(ii) expected dates for the commencement of legal proceedings in the said court complex;

(iii) purposes for which the ancient buildings and premises of the Galle Fort Courts Complex, where judicial proceedings are currently being conducted, are expected to be used, after the commencement of duties at the aforesaid new complex; and

[ගරු චානක මාදුගොඩ මහතා]

(iv) loss incurred by not making use of the buildings and land of the new court complex in Beligaha, Galle to date?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගාල්ල, බෙලිගහ නව අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු ලෙස කටයුතු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වේ. එම ආයතනය වසර කිහිපයක සිට දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව තිබීම හේතුවෙන් එම සංකීර්ණයේ විදුලි හා යාන්ත්‍රික පද්ධතිවල වැඩ කටයුතු තවදුරටත් නිම කිරීමට ඇත. අධිකරණ කොටස් වශයෙන් විතැන් කිරීමේ ප්‍රායෝගික හැකියාවක් නොමැති බැවින් අධිකරණ සංකීර්ණයේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කිරීමෙන් තොරව නව අධිකරණ සංකීර්ණය වෙත අධිකරණ විතැන් කළ නොහැක. එබැවින් මේ දක්වා එහි නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

(ii) සියලු වැඩ 2026 වසරේ ජූනි මස මුල් සතිය පමණ වන විට අවසන් කර, නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට ගොඩනැඟිලි අධිකරණය වෙත භාර දීමට සැලසුම් කර ඇත.

(iii) මේ වන විට ගාල්ල කොටුවේ අධිකරණ ස්ථාපිත කර ඇති ගොඩනැඟිලි මෙම අමාත්‍යාංශය වෙත පවරා දීමක් සිදු කර නොමැති අතර එම ගොඩනැඟිලිවල අයිතිය මෙම අමාත්‍යාංශය සතු නොවේ. ගාල්ල නව අධිකරණ සංකීර්ණය වෙත ගාල්ල කොටුවේ පිහිටා ඇති අධිකරණ සියල්ල විතැන් කිරීමෙන් පසුව එම ගොඩනැඟිලි, නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දෙන මෙන් එම අධිකාරිය මෙම අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. නමුත් ඉහත සඳහන් කළ පරිදි එම ගොඩනැඟිලිවල අයිතිය මෙම අමාත්‍යාංශය සතු නොවන බැවින් සුදුසු කටයුත්තක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිදහස් කිරීමට හැකියාවක් පවතින බවත්, එම දේපළ පවරා දීම සම්බන්ධව එකඟතාව අදාළ ඉඩම් සතු ආයතනවලින් ලබා ගැනීමට සිදු වන බවත් නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනටමත් මෙම අමාත්‍යාංශය මඟින් දැනුවත් කර ඇත.

එමෙන්ම, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ගාල්ල කොටුව තුළ ක්‍රියාත්මක අධිකරණ කටයුතු ගාල්ල බෙලිගහ ප්‍රදේශයේ ඉදි කර ඇති ගොඩනැඟිල්ලේ ස්ථාපිත කිරීම, ගාල්ල කොටුවේ පවතින පැරණි උසාවි සංකීර්ණ ගොඩනැඟිලි (මහාධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැඟිලි) නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම සහ අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් යටතේ සංචාරක භාවිතය සඳහා යොදා ගැනීම යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අංක අමප/26/0624/809/071 හා 2026.04.06 දිනැති තීරණය අනුව මහාධිකරණ ගොඩනැඟිල්ල සහ මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැඟිලි ඇතුළු ඉඩම්, රජයේ ඉඩම් ආඥා පනතේ 6වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන පරිදි නිදහස් දීමනාවක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා අනුමැතිය ලබා දී ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

(iv) මෙම අධිකරණ සංකීර්ණයේ ඉඩ පහසුකම් සපයා ඇති අධිකරණ කිසිවක් කුලී ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු නොලබන බැවින්, මේ වනතෙක් අධිකරණ සංකීර්ණය භාවිතයට නොගැනීම හේතුවෙන් රජයට අලාභයක් සිදුව නොමැත. ගාල්ල බෙලිගහ නව අධිකරණ සංකීර්ණයේ සමහර කොටස්වල ඉදිකිරීම් කටයුතු තවදුරටත් සිදු වන බැවින්, එම ගොඩනැඟිලි අධිකරණ අමාත්‍යාංශය වෙත භාරගෙන නොමැත. එබැවින්, එම ගොඩනැඟිලි හා භූමිය නඩත්තු කර පවත්වා ගෙන යැමට අමාත්‍යාංශය මඟින් වියදම් දරනු නොලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
බෙහෙවින් ස්තුතියි පිළිතුර ලබා දුන්නාට, ගරු ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ලෝක උරුමයක් වන, විශේෂයෙන්ම අපේ ගාලු කොටුව ආශ්‍රිතව තිබෙන අධිකරණ සංකීර්ණය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ අවධියේදී බෙලිගහ ප්‍රදේශයට ගේන්න හේතුවක් වුණා, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම. එම කටයුත්ත ආරම්භ කළේ, ලෝක උරුමයක් වන ගාලු කොටුව සංචාරක ආකර්ෂණය ඇති කරන ස්ථානයක් බවට පත් කිරීම වෙනුවෙන් බව අපට මතකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදීත් ඒක සඳහන් වුණා.

එම අධිකරණ සංකීර්ණය 2024 ජූලි 19වන දා විවෘත කළා. එය විවෘත කරලා මේ අවුරුද්දේ ජූලි මාසය වනකොට අවුරුදු දෙකකට ආසන්න කාලයක් සම්පූර්ණ වෙනවා. *[බාධා කිරීමක්]* බෙලිගහ අධිකරණ සංකීර්ණය 2024 ජූලි 19වන දා විවෘත කළා. ඇත්තටම, එය විවෘත කරලාත් දැන් අවුරුදු දෙකක කාලයක් ගතවෙලා තිබෙනවා. ඔබතුමන්ලා එම බෙලිගහ අධිකරණ සංකීර්ණය අලුතින් ආරම්භ කරන විට නවීන ලෝකය භාවිත කරන ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේද මේ අධිකරණ පද්ධතියට - අලුතින් ඉදි කරපු බෙලිගහ අධිකරණ සංකීර්ණයටත් - ගෙනෙනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට, ඔබතුමාගේ ප්‍රශ්නයේ පොඩි වැරැදි දෙයක් තිබෙනවා. මම ඊට අදාළ තොරතුරු දෙන්නම්. බෙලිගහ අධිකරණ සංකීර්ණය තවම විවෘත කරලා නැහැ. මම එතැනට ගිහිල්ලා බැලුවා. ඔබතුමා කිව්වා, 2024දී ඒක විවෘත කළා කියලා. නමුත්, තවම එය විවෘත කරලා නැහැ. 2011දී තමයි එය හදන්න පටන් ගත්තේ. 2011 ඉඳන් මේ දක්වා කාලයක් ගත වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු එකහමාරක් යන තැන, මේ ජූනි මාසයේ පළමුවැනි සුමානයේ ඒක පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ බෙලිගහ අධිකරණය කවදාවත්; පැයකටවත් විවෘත කළේ නැහැ. ඒ, පළමු කාරණාව.

ඔබතුමා අහපු දෙවැනි කාරණාවට පිළිතුර තමයි ඕච් කියන එක. අපි අලුතින් අධිකරණ ශාලා හදලා තිබෙනවා. තෝරා ගත් උසාවිවල අධිකරණ ශාලාවලට තිර සහ ඩිජිටල් යන්ත්‍ර ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේදී එම ස්ථානවලටත්

ඩිජිටල් තාක්ෂණය ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඕක තමයි පිළිතුර. එය විවෘත කළා කියා ඔබතුමා කියපු කාරණය නිවැරැදි කරන්න ඕනෑ. මොකද, බෙලිගහ අධිකරණ සංකීර්ණය විවෘත කරලා තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම මම මේ ගරු ඇමතිතුමා සමඟ වාදයකට යනවා නොවෙයි. එම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන නිසා මම එම ස්ථානයට නිතර නිතර ගිහිල්ලා තිබෙනවා. මා දැකපු විධියට නම් එහි කටයුතු සියයට 95ක්, 99ක් විතර අවසන් වෙලායි තිබුණේ. එහි ඇතුළාන්ත කථාව මම දන්නේ නැහැ. කොහොම වුණත්, ඔබතුමා දුන් පිළිතුරෙන් මම සෑහීමට පත් වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, එම නව අධිකරණ සංකීර්ණය ඉතාම නුදුරේදී පටන් ගන්නවා කියලා. එසේ නව අධිකරණ සංකීර්ණයට එන විට විට මහ ජනතාවට සහ නීතිඥ මහත්වරුන්ට අවශ්‍ය සහායක රාජ්‍ය සේවා ලබා ගන්න රාජ්‍ය ආයතන එම සංකීර්ණය ආශ්‍රිත භූමියට හෝ ඒ ආසන්නයට ගේන්න යම් සැලසුමක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මමත් මෑතකදී එම අධිකරණ සංකීර්ණය නිරීක්ෂණය කළා. දැන් තමයි ඔය කියන සියයට 95 වැඩ ඉවර වෙලා තිබෙන්නේ. පසුගිය අවුරුදු එකහමාර තුළ අපි ඒ කටයුත්ත වේගවත් කළා. 2011 සිට හදපු එක complete වෙලා තිබුණේ නැහැ නේ. දැන් තමයි complete වෙන්නේ. ඒ කාරණය හරි. අපි ඒක කරනවා. ඒ වාගේම අපේ මැදිහත් වීමෙන් ඒ ආශ්‍රිතව නීතිඥවරුන්ට ඔවුන්ගේ නිල මැදිරි හදා ගන්න සහාය වෙලා ඒ දේ කරලා තිබෙනවා. ඊට අමතරව, අප හැම විටම අධිකරණයක් විතැන් කරන කොට එතැනට අවශ්‍ය වන තැපැල් කාර්යාල වැනි අවශ්‍ය සහායක සේවා ඒ පැත්තට ගේනවා. මේ අවස්ථාවේ මා ළඟ ඒ සියලු ලැයිස්තු නැහැ. නමුත් අනිවාර්යයෙන් ඒවා ටික ටික හරි ඉක්මනටම ගේන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1770/2025- (1), ගරු ලාල් ප්‍රේමනාත් මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

## ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති: මඩකලපුව, මුරුත්තානෙ ග්‍රා.නි. කොට්ඨාසය

கிராமிய அபிவிருத்திப் பணியகத்தால் செயற்படுத்தப்படும் கருத்திட்டங்கள்: மட்டக்களப்பு, முறுத்தானை கிராம அலுவலர் பிரிவு

PROJECTS IMPLEMENTED BY RURAL DEVELOPMENT BUREAU: MURUTHTHANAI GN DIVISION, BATTICALOA

1771/2025

**10. ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලෙපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුරුත්තානෙ ග්‍රාම නිලධාරි වසමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(iv) මේ වන විට එම ව්‍යාපෘතිවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிராமிய அபிவிருத்திப் பணியகத்தின்மூலம் மட்டக்களப்பு மாவட்டத்தின் கோரளைப்பற்று தெற்கு பிரதேச செயலாளர் பிரிவுக்குரிய, முறுத்தானை கிராம அலுவலர் பிரிவில் அபிவிருத்திக் கருத்திட்டங்கள் செயற்படுத்தப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அவை யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்களுக்காக ஒதுக்கப்பட்டுள்ள மொத்த நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iv) தற்போது அக்கருத்திட்டங்களின் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) whether the Rural Development Bureau is implementing development projects in the Muruththanai Grama Niladhari Division of the Koralaipattu South Divisional Secretariat Division in the Batticaloa District;

(ii) if so, the names of the aforesaid projects;

(iii) the total amount allocated for the said projects; and

(iv) the current progress of the said projects?

(b) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

(ii) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ ආයතන තුනක් මඟින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

1. ප්‍රතිලාභී පවුල් 273ක පුද්ගලයන් 909කට අදාළ සමාජයීය ගැටලු විසඳීම සඳහා එක්දින ජංගම සේවයක් පැවැත්වීම
2. මිනුමිනිත්තවේලි සහ අකුරනෙයි ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම දෙකක්
3. ප්‍රදේශයේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට වැසිකිළි 150ක් ඉදි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති
4. ඒ ගමේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා නව නිවාස 8ක් ඉදිකිරීම
5. සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6. කල්ලාඩිවෙඩ්ඩෙ ග්‍රාමීය මාර්ගය සංවර්ධනය කිරීම
7. අකුරනෙයි ග්‍රාමීය මාර්ගය සංවර්ධනය කිරීම
8. මිනුමිනිත්තවේලි ග්‍රාමීය මාර්ගය සංවර්ධනය කිරීම
9. අකුරනෙයි-මුරුත්තානෙ පාරේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම
10. මුරුත්තානෙ ප්‍රධාන පාර කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීම

(iii) ඒ සඳහා රුපියල් 51,677,296.34ක් වැය වෙලා තිබෙනවා.

(iv)

| අනු අංකය | ව්‍යාපෘතියෙහි නම | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|---|
| 1 | ප්‍රතිලාභී පවුල් 273ක පුද්ගලයින් 909කට අදාළ සමාජීය ගැටලු විසඳීම සඳහා 2025.07.15 එක්දින ජංගම සේවයක් පැවැත්වීම<br>*වැඩිහිටි හැඳුනුම්පත් නොමැති වැඩිහිටියන් 28 දෙනෙකු සඳහා වැඩිහිටි හැඳුනුම්පත් ලබා දීම<br>*විවාහ සහතික නොමැති පුද්ගලයින් 21 දෙනෙකු සඳහා විවාහ සහතික ලබා දීම<br>*උප්පැන්න සහතික හා හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් 15 දෙනෙකුගෙන් එම ලේඛන ලබා දීමට අවශ්‍ය මූලික තොරතුරු ලබා ගැනීම<br>*ආයුර්වේද වෛද්‍ය කඳවුරක් පැවැත්වීම<br>*මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් අඩු වයස් විවාහ සම්බන්ධව පාසල් දරුවන් (75 දෙනෙකු පමණ) දැනුවත් කිරීම | - | 100% | 2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇත. |
| 2 | මිනුමිනිත්තවේලි සහ අකුරනෙයි ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය | 23,089,512.35 | 100% | |
| 3 | වැසිකිළි (150) ඉදිකිරීම් හා අලුත්වැඩියා ව්‍යාපෘති නව ඉදිකිරීම් - 96 අලුත්වැඩියා කිරීම් - 54 | 7,094,073.76 | 100% | |
| 4 | සායන මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 1,556,073.80 | 100% | |
| 5 | කල්ලාඩිවෙඩ්ඩෙ පාර බොරලු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 555,131.00 | 100% | |
| 6 | අකුරනෙයි පාර බොරලු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 555,131.00 | 100% | |
| 7 | මිනුමිනිත්තවේලි පාර බොරලු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 555,131.00 | 100% | |
| 8 | අකුරනෙයි-මුරුත්තානෙ පාරේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම | 1,646,380.23 | 100% | |
| 9 | මුරුත්තානෙ ප්‍රධාන පාර කොන්ක්‍රීට් කිරීම | 3,288,780.05 | 100% | |

නිවාස සංවර්ධන වැඩසටහන

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදන | මූල්‍ය ප්‍රගතිය රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| නිවාස ඉදිකිරීම් 08 | 7,500,000.00 | 4,400,000.00 | 55% |

(ආ) අදාළ නැත.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මීට වසර කිහිපයකට පෙර අපි අත්දුටු දේ තමයි, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ජාතික අවශ්‍යතාව නොසලකා හරිමින්, අදාළ අමාත්‍යවරයා නියෝජනය කරන දිස්ත්‍රික්කයට පමණක් ඒ සංවර්ධන ව්‍යාපෘති කේන්ද්‍ර වුණු එක. රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී වැඩි ප්‍රමුඛතාව තමන් නියෝජනය කරන දිස්ත්‍රික්කයට ලබා දුන්නා. ඒ නිසා අද රාජ්‍ය සේවයේ විවිධ ගැටලු පැන නැඟී තිබෙනවා. සංවර්ධන ව්‍යාපෘති විශාල වශයෙන් ඵලදායිතාවකින් තොර තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

මම ගරු අමාත්‍යතුමාගෙන් අහන පළමු අතුරු ප්‍රශ්නය තමයි, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගම්මානය තෝරා ගැනීමේ පදනම මොකක්ද කියන එක.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, මේක එතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයට ආසන්න ගම්මානයක්. මෙය මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන ගම්මානයක්. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ 2025 වසරේ දුෂ්කර ගම්මාන නඟා සිටුවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක

වුණා, ගරු කථානායකතුමනි. ඒ වැඩ පිළිවෙළ යටතේ අපි සෑම දිස්ත්‍රික්කයකම දුෂ්කර ගම්මාන නිර්දේශ කර එවන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටියා. ඒ අනුව, එවකට මඩකලපුව දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් තමයි මේ ගම්මානය තෝරා ගෙන නිර්දේශ කර එවා තිබෙන්නේ. එතුමිය සඳහන් කරන දත්ත අනුව බැලුවාම, ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය අනුව ඉතාම පහළ මට්ටමක තිබෙන ග්‍රාම නිලධාරි වසමක් තමයි මේ කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුරුත්තානෙ ග්‍රාම නිලධාරි වසම.

විශේෂයෙන්ම 2025 ජනවාරි මාසය වන විට මේ ගම තිබුණු තත්ත්වය පිළිබඳව යම් දත්ත ටිකක් මම ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. එතකොට මේ ගම පිළිබඳව ඔබට යම් අදහසක් ගන්න පුළුවන් වෙයි, ගරු මන්ත්‍රීතුමනි. 2025 ජනවාරි මාසය වෙනකොට මේ ගමේ පවුල් 273ක, පුද්ගලයන් 909 දෙනෙක් හිටියා. ඔවුන් දෙවතාවක් පැවති යුද්ධයේ බලපෑමට ලක් වුණා. පළමුවෙන්ම ඒ අය 1990දී අවතැන් වුණා. ඊට පස්සේ නැවත පදිංචි කළා. නමුත්, නැවත වතාවක් 2007දීත් අවතැන් වුණා. මේ ගම්මානය දෙවතාවක්ම යුද්ධයෙන් අවතැන් වෙච්ච ගම්මානයක්. ගරු මන්ත්‍රීතුමනි, මේක ඇහුවොත් ඔබතුමාත් පුදුම වෙයි. මේ ග්‍රාම නිලධාරි වසම තුළ රජයේ කිසිම සේවකයෙක් නැහැ; අර්ධ රාජ්‍ය සේවකයෙක් නැහැ. පෞද්ගලික අංශයේ විධිමත් ලෙස සේවයේ නියුතු එකදු පුද්ගලයෙක්වත් මේ ගමේ 2025 ජනවාරි මාසය වෙනකොට හිටියේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, යුද්ධයේ හේතුව නිසා කාන්තා ගෘහ මූලික පවුල් 67ක් වාගේම ආබාධිත තත්ත්වයට පත් වෙච්ච පුද්ගලයන් 7දෙනෙක් ජීවත් වෙනවා. මේ ගම්මානයේ බහුතර ජනතාවගේ මාසික ආදායම දළ වශයෙන් රුපියල් 30,000ට අඩුයි. මාසික ආදායම රුපියල් 60,000වැඩි කිසිම පවුලක් මේ ගමේ ජීවත් වුණේ නැහැ. ඒ වාගේම, නිවාස 273න්, 130ක්ම තාවකාලික නිවාස. මේ ආකාරයට මේ ගමේ තිබිච්ච සමාජ ආර්ථික තත්ත්වය නිසා තමයි මේ ගම්මානය තෝරා ගැනීම සඳහා මඩකලපුවේ එවකට සේවය කරපු දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් මේ ගම්මානය අපට තෝරා දුන්නේ. ඒ අනුව තමයි විශේෂයෙන්ම දුෂ්කර ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අපේ අමාත්‍යාංශය මේ ගම්මානය තෝරාගෙන මේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේ, ගරු කථානායකතුමනි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ග්‍රාමීය දිළිඳු බවේ, දරිද්‍රතාව පත්ළේ තිබෙන ග්‍රාම නිලධාරි වසමක් මේ විධියට තෝරා ගැනීම ගැන ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි.

1989 ඉඳලා 1995 දක්වා ග්‍රාමීය දිළිඳු බව පිටුදැකීම සඳහා "ජනසවිය" වැඩසටහන ක්‍රියාත්මක වුණා. 1995 ඉඳලා අද දක්වාම "සමෘද්ධිය" වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, 2012 ඉඳලා 2016 දක්වා "දිවිනැගුම" වැඩසටහන ක්‍රියාත්මක වුණා. ගරු කථානායකතුමනි, ඒ වාගේම 2023දී ආරම්භ කළ "අස්වැසුම" වැඩසටහන අද දක්වාම ක්‍රියාත්මක වෙනවා. නමුත් ගරු කථානායකතුමනි, ග්‍රාමීය වශයෙන් අත්පත් වෙලා තිබෙන දිළිඳු බව දිනෙන් දින වර්ධනය වුණා මිසක්, තවමත් අපට සාධනීය ලෙස මේ ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් හොයා ගන්න බැරිවෙලා තිබෙනවා.

ඒ නිසා මගේ ප්‍රශ්නය වෙන්නේ ගරු අමාත්‍යතුමනි, ප්‍රජා සංවර්ධන සහා අපේ රටේ ග්‍රාමීය දිළිඳු බව පිටුදැකීම සඳහා කවර ආකාරයේ ප්‍රවේශයක් ලබා ගනීද, එහෙම නැත්නම් මේ වැඩසටහනත් අර පැරණි යල් පැනපු වැඩසටහන් ගොන්නට කාලයත් එක්ක එකතු වෙයිද කියන එක.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය මෙතෙක් අහපු ප්‍රශ්නවලට වඩා ටිකක් පුළුල් විධියට තමයි ඇහුවේ. කෙසේ වෙතත්, ඔබතුමා සඳහන් කළා වාගේම ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා අපේ රටේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම අපි බලයට පත් වුණාට පස්සේත් ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම ප්‍රමුඛතම කාර්යයක් විධියට සලකනවා. ඒ අනුව තමයි අපි 2025 වර්ෂයේදී ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයක් ආරම්භ කරලා, ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්නේ. ඒ සඳහා අපි 2025 වර්ෂයේදී ඇත්තටම වෙන් කළේ රුපියල් බිලියනයක මුදලක්. නමුත් ඒ වැඩසටහන තවදුරටත් ඉදිරියට ගෙනිහිල්ලා, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරයක් විධියට අපි "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපාරය ආරම්භ කළා. ඇත්තටම මෙතෙක් අපේ රටේ ග්‍රාම සංවර්ධන වැඩසටහන්වල තිබුණු නිෂේධනීය ලක්ෂණ ඉවත් කරලා, ඒවායේ සාධනීය ලක්ෂණ උකහාගෙන තමයි අපි මේ වැඩසටහන සැලසුම් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිතව, යැපුම් මානසිකත්වයෙන් ප්‍රජාව මුදාගෙන, ඒ අය සවිබලගැන්වීමේ වැඩසටහනක් විධියට තමයි "ප්‍රජා ශක්ති" දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය අපි ක්‍රියාත්මක කරන්නේ. ඒ අනුව මෙවර ගිය වරට වඩා 25 ගුණයක්, ඒ කියන්නේ රුපියල් මිලියන 25,000ක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම වෙනත් අමාත්‍යාංශත්, පළාත් සභා සහ පළාත් පාලන ආයතනත් ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් අපි මෙහෙයවමින් ඉන්නවා. ඒ නිසා මෙතෙක් ග්‍රාම සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන් වාගේ නොවෙයි, යැපුම් මානසිකත්වයෙන් ප්‍රජාව මුදාගෙන, ඔවුන් සැබෑ ලෙසම සවිබලගන්වලා, ඔවුන් ආර්ථික වශයෙනුත්, සමාජයීය වශයෙනුත්, මානසික වශයෙනුත් සවිබලගැන්වීම සඳහා තමයි අපි මේ වැඩසටහන් දියත් කරමින් තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## පීඩාවලට ලක් වූ විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්: ගත් පියවර

### இன்னல்களை எதிர்கொண்ட இலங்கை புலம்பெயர் ஊழியர்கள்: நடவடிக்கை

### SRI LANKAN MIGRANT WORKERS SUBJECTED TO HARASSMENT: MEASURES TAKEN

773/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හෙක්ටර් අප්පුහාමි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියා සඳහා ගොස් විවිධ පීඩාවලට ලක්වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් මේ වනවිට මෙරටට නැවත ගෙන්වා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) එලෙස පීඩාවලට ලක්වන ශ්‍රමිකයන් වෙනුවෙන් සිදුකරන මැදිහත්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை, வெளிநாடுகளுக்கு தொழில் நிமித்தம் சென்று பல்வேறு இன்னல்களை எதிர்கொண்ட இலங்கை ஊழியர்களின் எண்ணிக்கை நாடுவாரி யாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அவர்களில் தற்போது நாட்டுக்கு மீண்டும் அழைத்து வரப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவ்வாறு இன்னல்களை எதிர்கொள்ளும் ஊழியர்களுக்காகச் செய்யப்படுகின்ற இடை யீடுகள் மற்றும் எடுக்கப்படுகின்ற நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) number of Sri Lankan workers who have gone abroad for employment and suffered various forms of harassment since 2015 to date, separately for each country;

(ii) number of persons among them who have been repatriated to Sri Lanka by now; and

(iii) interventions and measures being taken for the workers who are subjected to such harassment?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | පීඩාවට පත් වූ විගමනික ශ්‍රමිකයන්ගෙන් ලද පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| 2015 | 10,503 |
| 2016 | 8,486 |
| 2017 | 6,239 |
| 2018 | 5,019 |
| 2019 | 4,914 |
| 2020 | 5,130 |
| 2021 | 4,185 |
| 2022 | 4,500 |
| 2023 | 7,534 |
| 2024 | 7,448 |
| 2025 | 8,323 |
| 2026.05.12 දින දක්වා | 2,781 |
| එකතුව | 75,062 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක දත්ත පද්ධතියට අනුව 2015 වර්ෂයේ සිට මේ දක්වා විගමනික ශ්‍රමිකයන් මුහුණපාන ලද විවිධ ආකාරයේ ගැටලු සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි එක් එක් වර්ෂය අනුව ඉහත සඳහන් කර ඇත.

තවද, ඉහත පැමිණිලි සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම 01හි** දක්වා ඇත.

Annex 01

Statistics on Received Complaints Country wise - from 2015 to 2026

| | Country | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 (Up to 12.05.2026) | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Saudi Arabia | 5,667 | 4,653 | 2,955 | 2,081 | 1,729 | 1,460 | 1,470 | 1,522 | 3,179 | 3,003 | 2,288 | 666 | 30,672 |
| 2 | Kuwait | 1,901 | 1,351 | 1,192 | 1,188 | 1,564 | 1,374 | 1,451 | 1,278 | 2,198 | 2,592 | 3,378 | 1,196 | 20,663 |
| 3 | U A E | 964 | 699 | 539 | 462 | 471 | 729 | 431 | 756 | 752 | 754 | 1,169 | 495 | 8,221 |
| 4 | Qatar | 724 | 773 | 516 | 448 | 283 | 506 | 206 | 121 | 267 | 221 | 186 | 66 | 4,317 |
| 5 | Oman | 210 | 344 | 496 | 390 | 363 | 394 | 245 | 457 | 354 | 281 | 463 | 95 | 4,092 |
| 6 | Jordan | 366 | 191 | 136 | 156 | 94 | 111 | 75 | 75 | 123 | 67 | 59 | 14 | 1,467 |
| 7 | Malaysia | 241 | 245 | 142 | 78 | 119 | 95 | 36 | 19 | 112 | 81 | 62 | 12 | 1,242 |
| 8 | Romania | 39 | 16 | 20 | 22 | 48 | 144 | 59 | 17 | 91 | 103 | 158 | 66 | 783 |
| 9 | Russia | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 110 | 205 | 85 | 201 | 50 | 653 |
| 10 | Bahrain | 79 | 29 | 24 | 32 | 32 | 31 | 34 | 39 | 65 | 56 | 34 | 17 | 472 |
| 11 | Lebanon | 73 | 47 | 58 | 34 | 52 | 58 | 60 | 11 | 32 | 25 | 14 | 8 | 472 |
| 12 | Maldives | 13 | 8 | 19 | 18 | 23 | 115 | 49 | 24 | 44 | 55 | 62 | 16 | 446 |
| 13 | South Korea | 88 | 44 | 41 | 37 | 31 | 26 | 8 | 9 | 6 | 18 | 14 | 2 | 324 |
| 14 | Cyprus | 17 | 20 | 30 | 24 | 35 | 15 | 16 | 13 | 16 | 12 | 15 | 3 | 216 |
| 15 | Turkey | 0 | 5 | 15 | 19 | 9 | 4 | 3 | 30 | 35 | 23 | 35 | 5 | 183 |
| 16 | Israel | 16 | 12 | 8 | 3 | 9 | 10 | 10 | 5 | 4 | 9 | 36 | 24 | 146 |
| 17 | Kurdistan | 42 | 8 | 6 | 2 | 18 | 6 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 85 |
| 18 | Singapore | 8 | 7 | 6 | 5 | 14 | 4 | 2 | 5 | 10 | 6 | 3 | 0 | 70 |
| 19 | Japan | 0 | 2 | 1 | 3 | 2 | 2 | 2 | 5 | 4 | 5 | 22 | 6 | 54 |
| 20 | Serbia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 16 | 27 | 10 | 53 |
| 21 | Lithuania | 21 | 4 | 2 | 0 | 2 | 5 | 1 | 0 | 0 | 14 | 1 | 1 | 51 |

| | Country | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 (Up to 12.05.2026) | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 22 | Moldova | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 41 | 9 | 50 |
| 23 | Seychelles | 0 | 2 | 20 | 1 | 3 | 10 | 5 | 0 | 3 | 1 | 3 | 2 | 50 |
| 24 | Hong Kong | 5 | 4 | 7 | 7 | 7 | 7 | 2 | 0 | 3 | 0 | 1 | 0 | 43 |
| 25 | Mauritius | 6 | 1 | 1 | 4 | 1 | 2 | 3 | 0 | 1 | 2 | 9 | 0 | 30 |
| 26 | Kyrgyzstan | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 19 | 0 | 27 |
| 27 | Ethiopia | 0 | 0 | 0 | 0 | 3 | 12 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 18 |
| 28 | Sudan | 3 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 16 |
| 29 | Georgia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 10 | 11 |
| 30 | Pakistan | 1 | 1 | 3 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 5 | 0 | 0 | 11 |
| 31 | Albania | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 8 | 0 | 0 | 0 | 10 |
| 32 | Iraq | 0 | 0 | 0 | 0 | 0 | 3 | 4 | 1 | 1 | 0 | 0 | 0 | 9 |
| 33 | Hungary | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 4 | 2 | 8 |
| 34 | Papua New Guinea | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 7 | 0 | 8 |
| 35 | Uganda | 0 | 7 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 |
| 36 | Kenya | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 4 | 7 |
| 37 | North Cyprus | 6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 7 |
| 38 | Egypt | 2 | 1 | 0 | 0 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 6 |
| 39 | Libya | 0 | 4 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 |
| 40 | Malta | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 1 | 1 | 5 |
| 41 | Afghanistan | 2 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| 42 | Bangladesh | 0 | 0 | 1 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| 43 | Belarus | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| 44 | Gabon | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 4 |
| 45 | Cambodia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 2 | 0 | 0 | 3 |
| 46 | Comoros | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 |
| 47 | Indonesia | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 3 |
| 48 | Canada | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| 49 | Ireland | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 2 |
| 50 | New Zealand | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| 51 | Nigeria | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 52 | United Kingdom | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 2 |
| 53 | Yemen | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 54 | Australia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| 55 | Congo | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 56 | Croatia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 57 | Djibouti | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| 58 | Fiji | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 59 | Greece | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 60 | India | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 61 | Italy | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 62 | Kazakhstan | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 63 | Malawi | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 64 | Myanmar | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 65 | North Yemen | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 66 | Syria | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| | Total | 10,503 | 8,486 | 6,239 | 5,019 | 4,914 | 5,130 | 4,185 | 4,500 | 7,534 | 7,448 | 8,323 | 2,781 | 75,061 |

එම පැමිණිලිවලට අදාළ ගැටලුවල ස්වභාවයන් පිළිබඳ තොරතුරු **ඇමුණුම 02හි**** දක්වා ඇත.

(ii)

| වර්ෂය | මෙරටට නැවත ගෙන්වාගෙන ඇති සංඛ්‍යාව |
|---|---|
| 2015 | 3,272 |
| 2016 | 3,901 |
| 2017 | 3,846 |
| 2018 | 2,716 |
| 2019 | 2,494 |
| 2020 | 1,554 |
| 2021 | 3,764 |
| 2022 | 2,386 |
| 2023 | 3,147 |
| 2024 | 3,784 |
| 2025 | 4,124 |
| 2026.05.12 දින දක්වා | 1,071 |
| එකතුව | 36,059 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක දත්ත පද්ධතියට අනුව එම පිරිස අතරින් මේ වන විට මෙරටට නැවත ගෙන්වා ගෙන ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව ඉහත දක්වා ඇති අතර, එම සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම 03****හි දක්වා ඇත.

(iii)

- 1994 අංක 4 සහ 2009 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත මඟින් සංස්ථාපිත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය සැලසීමටත්, ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත්, සත්කාරක රටවල් 13ක පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල 15ක් තුළ රැකියා හා සුබසාධන අංශ පිහිටුවා ඇත.
- මෙම රැකියා සහ සුබසාධන අංශ මඟින් විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් එතෙරදී මුහුණපාන ගැටලු විසඳීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කඩිනමින් සිදු කරන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී නීති ආධාර ලබා දීමට මැදිහත් වේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

- තවද, ගමනාන්ත රටවල පවතින නීති රීති මත පදනම්ව විගමනික ශ්‍රමිකයන් බහුලව සේවය කරන රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩලවල, ගැටලුවලට මුහුණපාන කාන්තා ශ්‍රමිකයන් සඳහා නේවාසික පහසුකම් ලබා දෙන සුරක්ෂා නිවාසද පවත්වාගෙන යනු ලැබේ.
- විගමනික ශ්‍රමිකයන් -රැකියා නියෝජිත ආයතන මඟින් විදේශගත වූ- රැකියාවේ නියුක්තව සිටියදී මුහුණ දෙන ගැටලු සඳහා ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානවල සමථ අංශ පිහිටුවා ඇති අතර, එමඟින් අවශ්‍ය විසඳුම් ලබා දීම සිදු කරනු ලබයි. එසේම ස්වයං මාර්ගයෙන් ශ්‍රමිකයන් මුහුණ දෙන ගැටලු සඳහා ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට විදේශ සම්බන්ධතා II අංශය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ ස්ථාපිත කර ඇත.
- 2015 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් විදේශගතව පීඩාවට පත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඉදිරිපත් කර ඇති පැමිණිලි සංඛ්‍යාවෙන් විසඳා ඇති සංඛ්‍යාව හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 44 වගන්තිය ප්‍රකාරව සමථ අංශය විසින් ප්‍රදානයන් - awards - ලබා දී විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් අය කර පැමිණිලිවලට අදාළව ලබා දී ඇති මුදල් **ඇමුණුම 04****හි දක්වා ඇත.
- තානාපති කාර්යාල මඟින් පවත්වාගෙන යනු ලබන සුරක්ෂා නිවාස වෙත පීඩාවට පත් කාන්තා ශ්‍රමිකයන් යොමු කිරීම හා ඔවුන් වෙත ආහාරපාන, නේවාසික පහසුකම් හා අනෙකුත් අවශ්‍යතා ලබා දීම.
- විවිධ අසනීප හා අනතුරු හේතුවෙන් රෝහල්ගතව සිටින විගමනික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව දූත මණ්ඩල මඟින් තොරතුරු ලබා ගැනීම හා ඊට අදාළ පහසුකම් සැපයීමට කටයුතු කිරීම.
- විදේශ දූත මණ්ඩල මඟින් ගුවන් ටිකට්පත්, රෝහල් ගාස්තු හා විගමනික ශ්‍රමියන්ගේ වෙනත් අවශ්‍යතා සඳහා මූල්‍යමය ඉල්ලීම් කරන ලද අවස්ථාවලදී ඒවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉහළ කළමනාකාරිත්වයෙන් අනුමැතින් ලබාගෙන විදේශීය සේවක සුභසාධන අරමුදල මඟින් එම ඉල්ලීම් ඉටු කිරීමට කටයුතු කිරීම.
- කරදරයට පත් විගමනික ශ්‍රමිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා ඥාතීන් විසින් ගුවන් ටිකට්පත් සඳහා වියදම් දරා ඇති අවස්ථාවලදී එසේ වියදම් කරන ලද මුදල් රක්ෂණ ආවරණ මඟින් ප්‍රතිපූර්ණය කරගත හැකි අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය ලියවිලි දූත මණ්ඩල මඟින් ලබාගෙන සුභසාධන අංශය වෙත යොමු කිරීම.
- අසනීප තත්ත්ව මත රෝහල්ගතව සිටින විගමනික ශ්‍රමිකයන් පිළිබඳව සොයා බැලීම හා ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා තානාපති කාර්යාලයන් මැදිහත්වීම. තවද, එකී විගමනික ශ්‍රමිකයන් පත්ව ඇති තත්ත්වය හා ඔවුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන රෝහල් ගාස්තු, ගුවන් ප්‍රවේශපත් ගාස්තු හා අනෙකුත් වියදම් සඳහා කාර්යාංශය මඟින් පිරිවැය දැරීම.
- සිර ගෙවල්වල හා රෝහල්ගතව සිටින විගමනික ශ්‍රමිකයන් මෙරටට පැමිණෙන අවස්ථාවලදී ඊට අදාළ ගුවන් ගමන් විස්තර දූත මණ්ඩල හරහා ලබාගෙන ඔවුන්ගේ භාරකරුවන්ට හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ගුවන් තොටුපොළ ඒකකය වෙත දන්වා අවශ්‍ය සහාය ලබා දීම හා රෝහල්ගතව සිට නැවත ශ්‍රී ලංකාවට ගෙන්වන ලද විගමනික ශ්‍රමිකයන් වැඩි දුර ප්‍රතිකාර සඳහා මීගමුව මහ රෝහල වෙත යොමු කිරීම හා ඒ සඳහා ගුවන් තොටුපොළ පරිශ්‍රයේ සිට රෝහල දක්වා ගිලන් රථ පහසුකම් ලබා දීම.

---
*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- සිරගතව සිටින රැඳවියන්ගේ නම් හා ගමන් බලපත්‍ර අංක / රඳවා ඇති ස්ථානය / කාලය හා නඩු තීන්දු ආදී සියලු තොරතුරු දූත මණ්ඩල මඟින් ලබා ගැනීමට කටයුතු සිදු කිරීම හා ඒ සම්බන්ධ තොරතුරු ලිපි හෝ දුරකථන ඇමතුම් මඟින් පැමිණිලිකරුවන් හෝ ඔවුන්ගේ ඥාතීන් වෙත දැනුම් දීම.
- යුද්මය වාතාවරණයන්, ස්වාභාවික ආපදා සහ ගෝලීය වසංගත තත්ත්වයන් වැනි හදිසි තත්ත්වයන් හමුවේ විපතට පත්ව සිටින ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් එරට දූත මණ්ඩල විසින් විගමනිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන, රතු කුරුස සංවිධානය සහ අදාළ වෙනත් ආයතන NGOs සමඟ සම්බන්ධ වී අදාළ තොරතුරු ලබා ගැනීම හා ඔවුන් වෙත සේවා සැපයීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී, ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් නැවත මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නිරතව සිටියදී මිය ගිය අයගේ අවමංගල්‍ය කටයුතු සිදු කර ගැනීම සඳහා මෙතෙක් ලබා දුන් රුපියල් 40,000.00ක මුදල 2026 වර්ෂයේ සිට රුපියල් 100,000.00ක් දක්වා වැඩි කර ලබා දීමට මේ වන විට කටයුතු කර ඇත. 2015 වර්ෂයේ සිට 2026.04.30 දක්වා ලබා දුන් අවමංගල්‍යාධාර වියදම් **ඇමුණුම 05**** යටතේ දක්වා ඇත.

* ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයන්ට එහෙරදී මුහුණ පෑමට සිදු වන කරදර හා හිරිහැර, හදිසි අනතුරු, ලෙඩ රෝග ආදිය හේතුවෙන් ලංකාවට පැමිණීමට සිදු වන අවස්ථාවන්හිදී විගමනික ශ්‍රමිකයන්ට හා විගමනික ශ්‍රමිකයන්ගේ මරණය සිදුවීම හේතු කොටගෙන ඔවුන්ගේ යැපෙන්නන්ට රක්ෂණාවරණයෙන් හා සේවක සුභසාධන අරමුදලෙන් සහන සලසනු ලබයි.

| වර්ෂය | ගෙවීම් සිදු කළ සංඛ්‍යාව | ගෙවූ මුදල (රුපියල් මිලියන |
|---|---|---|
| 2019 | 2,690 | 216.487 |
| 2020 | 1,503 | 116.581 |
| 2021 | 802 | 172.04 |
| 2022 | 571 | 98.086 |
| 2023 | 944 | 152.427 |
| 2024 | 1,160 | 219.709 |
| 2025 | 1,125 | 278.419 |
| 2026.03.31 දින දක්වා | 202 | 57.365 |

- රෝහල්ගතව ප්‍රතිකාර ලබන විගමනික ශ්‍රමිකයන්ට වෛද්‍ය උපදෙස් මත අවශ්‍ය ඖෂධ හා අනෙකුත් අවශ්‍යතා ද්‍රව්‍ය හා මූල්‍යාධාර ලබා දීම.

| වර්ෂය | ගෙවීම් සිදු කළ සංඛ්‍යාව | ගෙවූ මුදල (රුපියල් මිලියන) |
|---|---|---|
| 2019 | 4 | 0.439 |
| 2020 | 3 | 0.2 |
| 2021 | 6 | 0.233 |
| 2022 | 25 | 0.376 |
| 2023 | 22 | 1.217 |
| 2024 | 53 | 5.528 |
| 2025 | 81 | 4.251 |
| 2026.03.31 දින දක්වා | 24 | 0.577 |

(ආ) අදාළ නොවේ.

---
*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1770/2025- (1), ගරු ලාල් ප්‍රේමනාත් මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශය දන්වා ඇති පරිදි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

### පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු
மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தித்துறை எதிர்கொள்ளும் பிரச்சினைகள்
ISSUES FACED BY RENEWABLE ENERGY SECTOR

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

බලශක්ති සුරක්ෂිතතාව, විදේශ විනිමය සංරක්ෂණය සහ පිරිසිදු බලශක්ති සංක්‍රාන්තිය පිළිබඳව නැවත නැවතත් ලබා දී ඇති ජාතික පොරොන්දු මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය මුහුණ දෙන අඛණ්ඩ පිරිහීම සහ පෙනෙන්නට තිබෙන වෙනස්කම් කිරීම පිළිබඳව දැඩි ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධයෙන් මම රජයෙන් විමසා සිටිමි.

ඉන්ධන මූලාශ්‍රය සහ හදිසි උත්පාදන අවශ්‍යතා මත පදනම්ව, තාප විදුලි උත්පාදන පිරිවැය ඒකකයට රුපියල් 85 සිට රුපියල් 175 දක්වා ඉහළ අගයක පවතින බව වාර්තා වන අතර, ආර්ථික වශයෙන් අවදානම් සහගත කාලයක මෙලෙස විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටින් බැහැරට ගලා යයි.

ගරු කථානායකතුමනි, මෙතැනදී මම පොඩි වෙනස්කමක් කරන්න ඕනෑ. මම මේ ප්‍රශ්නය හදනකොට ඩොලරය තිබුණේ රුපියල් 323ට. මේ මොහොත වනවිට එය රුපියල් 355යි. ඒ නිසා ඒකකයක උත්පාදන පිරිවැය රුපියල් 100ත්, 225ත් අතර දෝලනය වෙනවා කියලායි මට නිවැරදි කරන්න අවශ්‍ය වන්නේ.

එසේ වුවද, ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාව, විදුලිය කපා හැරීමේ - curtailment - පිළිවෙත්, ප්‍රමුඛතා ප්‍රමාදයන්, තරගකාරී නොවන ගාස්තු ව්‍යුහයන්, දුර්වල බැටරි බලශක්ති ගබඩා පද්ධති - Battery Energy Storage System - BESS - දිරිගැන්වීම් සහ ජාතික පද්ධතියට දැනටමත් සපයා ඇති විදුලිය සඳහා ගෙවීම් දීර්ඝ කාලයක් ප්‍රමාද කිරීම හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙයි.

ගරු කථානායකතුමනි, මේ කථා කරන්නේ පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන්. මොකද, අද වෙනකොට පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 2,300ක් පද්ධතියට එකතුවෙලා තිබෙනවා. ඒ වාගේම මම මතක් කරන්න අවශ්‍යයි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කටයුතු කරපු කාලයේ සහ මුදල් ඇමතිවරයා වශයෙන් මම කටයුතු කරපු කාලයේ ඇති කරපු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලින් එය මෙගාවොට් 2,500කට වැඩිවෙලා තිබෙන බව.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්ගේ සම්මේලනයට - FRED - අනුව, 2025 දෙසැම්බර් මාසයේ සිට පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරුවන් සඳහා වන ගෙවීම් අත්හිටුවා ඇති අතර, අද වන විට හිඟ මුදල රුපියල් බිලියන 15 ඉක්මවයි. දැන් වෙනකොට එය මිලියන 15,800යි.

මෙයින් සංවර්ධකයින් 400කට ආසන්න පිරිසකට සහ මෙගාවොට් 1,000කට වැඩි ස්ථාපිත ධාරිතාවකට බලපෑම් එල්ල වී ඇත.

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් පහත ප්‍රශ්න විමසා සිටිනවා.

1. පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින් වෙත දැනට ගෙවීමට ඇති මුළු හිඟ මුදල එක් එක් අංශ - sectors - අනුව වෙන් වෙන්ව ප්‍රකාශ කරන්නේද?
2. ඉහත සඳහන් කළ පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්ට මාස ගණනාවක් තිස්සේ ගෙවීම් නොකර තිබියදී, තාප විදුලි සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත්තේ ඇයි? තාප විදුලි උත්පාදනයේ වත්මන් සාමාන්‍ය ඒකක පිරිවැය කොපමණද?
3. 2024, 2025 සහ 2026 දක්වා කාලය තුළ තාප විදුලිය සහ පුනර්ජනනීය බලශක්තිය අතර සාපේක්ෂ සාමාන්‍ය ඒකක උත්පාදන පිරිවැය රජය විසින් ඉදිරිපත් කරන්නේද?

   ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලය අද මේ තෙල් ගන්න මිල සහ අපේක්ෂිත මිල කීයද කියන එක ගැන දැනුවත් කරන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.
4. ගබඩා කිරීමේ - storage - සහ පද්ධති නවීකරණ විසඳුම් අනුගමනය කරනවා වෙනුවට සති අන්ත සහ විදුලි ඉල්ලුම අඩු කාල සීමාවන්හිදී පුනර්ජනනීය බලශක්ති උත්පාදනය

[ගරු රවි කරුණානායක මහතා]

කපා හැරීමට - curtail කිරීමට - ලංකා විදුලිබල මණ්ඩලය දිගින් දිගටම කටයුතු කරන්නේ කුමන තාක්ෂණික හෝ ප්‍රතිපත්තිමය පදනමක් මතද?

5. කර්මාන්ත අංශයේ නැවත නැවතත් කරන ලද ඉල්ලීම් මධ්‍යයේ වුවද - Battery Energy Storage System, BESS - ගාස්තු සහ දිරිගැන්වීමේ ව්‍යුහයන් වාණිජමය වශයෙන් ආකර්ෂණීය නොවන මට්ටමක පවතින්නේ ඇයි?

That is, non-commercial feasibility.

6. මේ වන විට පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්, ව්‍යාපෘති සහ සේවකයින් කී දෙනෙකුට මෙයින් බලපෑම් එල්ල වී තිබේද? පුනර්ජනනීය බලශක්ති ණය හේතුවෙන් බැංකු ක්ෂේත්‍රයට ඇති වී තිබෙන අවදානම - exposure - කෙබඳුද?

7. රුපියල් බිලියන 15 ඉක්මවන හිඟ මුදල් පියවීමට සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යවසායන් කඩා වැටීම වැළැක්වීමට රජය ගන්නා කඩිනම් පියවර මොනවාද?

8. ගාස්තු, ගෙවීම් සහතික, ගබඩා ප්‍රතිපත්ති, පද්ධති ඒකාබද්ධතාව සහ දිගුකාලීන බලශක්ති සුරක්ෂිතතා ඉලක්ක ඇතුළත් පුළුල් පුනර්ජනනීය බලශක්ති මාර්ග සිතියමක් - road map - රජය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද?

ස්තුතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

Hon. Speaker, the Answer to the Questions raised by Hon. Ravi Karunanayake is as follows:

1. Total outstanding payments presently due to renewable energy developers is, Rs. 8,057,852,888.35.

   The breakdown of the average cost per unit is as follows:

| Energy Source | Average cost per unit (Rs.) |
|---|---|
| Major hydro | 2.05 |
| Mini hydro | 14.67 |
| Solar (Rooftop and ground-mounted solar) | 25.13 |
| Wind | 17.40 |
| Biomass | 38.70 |
| Waste to energy | 36.20 |

2. Payments to thermal power suppliers have been prioritized is a wrong interpretation. We have not prioritized the thermal power supply. Our priority is always to maintain stability of the powe supply. The National System Operator's priority has been to ensure a continuous electricity supply despite the record-high electricity demand, increased fuel prices and low hydro conditions. So, no priority has been given to thermal power plants, as the question states. Priority has been given to ensure a continuous supply of fuel to power plants. So, the cash flow was managed to achieve that objective.

   The average unit cost for thermal power generation projected for 2026 from interim tariff filing is, Rs. 31.99.

3. Only energy costs are provided and capacity costs have been excluded.

| Year | Thermal | Renewables (excl. EGL Hydro) |
|---|---|---|
| 2024 | 29.86 | 19.98 |
| 2025 | 28.11 | 21.92 |
| 2026 (from tariff filing) | 31.99 | 23.38 |

4. Again, what is given in the question is a wrong interpretation. There is no policy basis for continuously curtailing renewable energy generation. Any curtailment has been purely due to technical reasons. The system stability is at risk when there is a low demand and a high renewable energy generation, especially during weekends and holidays.

   The utility successfully maintained the grid despite an approximately 800 MW additional renewable energy penetration, mainly from rooftop solar, in the last 15 months. Several technical solutions were implemented during that time. As an additional measure, tenders for Battery Energy Storage Systems of a capacity of 160 MW have been awarded and contracts have been signed. Another tender for batteries of a capacity of 300 MW will be floated in the near future. The procurement of a 100 MW frequency control BESS is ongoing as well.

   So, with these statistics, we can clearly see that the Government has focused on increasing the renewable energy supply. At the same time, I would like to mention that up to 2024, we had only a percentage of 6.2 of rooftop solar. However, by 2025, it had been increased to 10.7 per cent and as of April, 2026, it is 13.3 per cent. So, you can clearly see that rooftop solar has doubled during the past one-and-a-half years. And, that clearly indicates that, as a Government, we have given priority to increase the renewable energy component of our power generation.

5. What is mentioned in the question is, again, based on wrong information. There is no evidence that BESS tariff and incentive structures have been unattractive because the recent tender attracted 153 bids from 38 bidders and very competitive prices were achieved. So, that means there is no question of BESS being attractive.

6. The total number of renewable energy developers affected by delayed payments is, 386. The other information is not available at the moment. Once I get it, I will let you know, Hon. Member.

7. The NSO made a payment of Rs. 2 billion on 19th May, 2026, a few days ago. Another Rs. 1 billion will be paid to renewable energy plants next week. So, we are optimistic to fully settle the outstanding balance before the end of June.

8. The Cabinet has approved the National Electricity Policy and the National Tariff Policy that will ensure long-term energy security targets. The policies include measures for a comprehensive renewable energy road map covering tariffs, storage policy, grid integration and safeguards to electricity consumers.

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම ප්‍රථමයෙන්ම අගය කරනවා, ගරු ඇමතිතුමා බොහොම ඕනෑකමින් සම්පූර්ණ උත්තරය ලබා දෙන්න උත්සාහ කිරීම පිළිබඳව. නමුත්, ඒකේ දෝෂ ටිකක් තිබෙනවා. දැන් Battery Energy Storage System - BESS - එකේ pricing ගැන බැලුවොත්, මට ආරංචියි ජූනි 6වෙනි දායින් පසුව මහජන උපයෝගිතා කොමිසම තුළින් තමයි මේ prices දෙන්නේ, CEB එක නොවෙයි කියලා. ඒක හරිද කියලා ඇහුවාට පස්සේ ඒකට උත්තර දෙනකොට අපට පෙනෙන්නේ, 2025 පෙබරවාරි මාසයේදී වුණා වාගේ අර පානදුරේ වඳුරාගේ ප්‍රශ්නයට පසුව මේ curtailment එක තිබෙනවා වාගෙයි. මේක නැහැයි කියන එක ලොකු ප්‍රශ්නයක්. මොකද, සෙනසුරාදා, ඉරිදා මේ grid එකෙන් ගන්න බැරි තත්ත්වයක් අනුව, දැන් වෙනතුරුත් හැම සුමානේම curtailments ඇති වනවා. ඒක තුළ මේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා; මේක bankable නොවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරය අනුවම ගත්තොත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් මත පිරිවැය පරාවර්තක - cost-reflective - ගමනක් ඇති කරගෙන යන නිසාත්, ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඩොලර් මිලියන 350 tranche එකත් බලාපොරොත්තුවෙන් ඉන්න නිසාත් විදුලි බිල වැඩි කිරීම සම්බන්ධව නැවත යම් විධියක එකඟතාවක් තිබෙනවාද? මොකද, ගිය සුමානයේත් විදුලි බිල සියයට 18කින් වැඩි කළා. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වුණා, රුපියල් 300 ඉඳන් රුපියල් 312 වෙනකම්. දැන් එය රුපියල් 312 ඉඳන් රුපියල් 355 වුණාම තව සියයට 21කින් විදුලි බිල වැඩි කරන්න වෙච්ද, මේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙන මුදල් ලබා ගැනීමට පෙර? මේ ඔක්කෝම වෙන්නේ අද මහ බැංකුවට රුපියල ආරක්ෂා කිරීමට බැරි ප්‍රශ්නය නිසායි. අද සියලු ජනතාව මේ පීඩනයට ලක් වෙලා තිබෙනවා. එදා කිව්වේ, රුපියල ශක්තිමත් කිරීමෙන් ජනතාව ආරක්ෂා කරනවා කියලා. ඉතින්, මම ජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නය අහනවා. ඔබතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඔතරම් බය වෙන්න එපා. අපේ ජනතාව ආරක්ෂා කරන්න අවශ්‍යයි. ඒ නිසා ඩොලර් මිලියන 350ට වැඩිය අපේ මිලියන 22ක ජනතාව ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යයි කියන එක කියමින් මම මේ අවස්ථාවේදී ජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නය අහනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ කාරණයේ අවසාන comment එකෙන් පටන් ගත්තොත්, ඔබතුමා උපකල්පනයක ඉන්නවා, ආණ්ඩුව IMF එකට බයයි කියලා. ඒ වැරදි උපකල්පනය මත ඉඳගෙන තමයි බොහෝ comments කරන්නේ. ඒ නිසා ඒ වැරදි උපකල්පනය අයින් කර ගත්තොත් බොහෝ ප්‍රශ්නවලට උත්තර එනවා.

ඊළඟට, තාක්ෂණික කරුණුවලදී මම පැහැදිලිව කිව්වා, curtailment එකක් වෙනවා නම්, ඒක සිද්ධ වෙන්නේ තාක්ෂණික අවශ්‍යතාව මතයි කියලා. එහෙම නැතුව, renewable energy අඩු කර ගැනීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි. විශේෂයෙන් ඔබතුමාත් හොඳින්ම දන්නවා, අපි renewable energy එකතු කරනකොට විශේෂ අවශ්‍යතාවක් තමයි, චාලක ශක්තිය මත පදනම් වෙච්ච renewable energy යම් ප්‍රමාණයක component එකක් තිබුණොත් තමයි අපට පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යන්න පුළුවන්කම තිබෙන්නේ කියන එක. එහෙම නැතුව සම්පූර්ණයෙන් solarවලට ගියොත් හරි, solarවලින් වැඩි component එකක් ගත්තොත්, ඒ කියන්නේ solarවල demand එකට වඩා supply එක වැඩි වුණොත්, අපට පද්ධති පාලනය කර ගන්න බැරි වනවා. ඒ නිසා මම කලින් 4වැනි ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරේදී සඳහන් කළා වාගේ, අපට අවශ්‍යතාව තිබෙන්නේ ground-mounted solarවල, solar farmsවල curtailment එකක් කරන එක. හැබැයි, අපි ගෘහස්ථ - rooftop - solarවල, ඒ curtailment එක කරන්නේ නැහැ. ඇත්තටම එහෙම කරන්න තාක්ෂණික හැකියාවක් ඇත්තේත් නැහැ.

දැන් ඔබතුමා විශේෂයෙන් අහන්නේ, මේ ඩොලරයේ මිල ඉහළ යෑමත්, මැද පෙරදිග අර්බුදයත් එක්ක ඇති වෙච්ච තත්ත්වයත් එක්ක තවදුරටත් electricity bill එක ඉහළ යෑමක් සිද්ධ වෙයිද කියන එක නේ. නමුත්, මෙවර විදුලි බිල ඉහළ යනකොට අපි ඉතා පැහැදිලිව සඳහන් කළා, මේ ඉහළ යෑමේ සෘජු බලපෑම තිබෙන්නේ ඒකක 180ට වැඩියෙන් භාවිත කරන විදුලි පාරිභෝගිකයින්ට පමණයි කියන එක. රජය විසින් රුපියල් බිලියන 15ක් NSO එකට දීලා අනෙක් අයගේ බර දරාගෙන තිබෙනවා. ඒ නිසා මට සෘජු පිළිතුරක් හැටියට කියන්න පුළුවන්, සැප්තැම්බර් මාසය වනතුරු විදුලි බිලේ ඉහළ යෑමක් සම්බන්ධයෙන් අපි PUCSL එකෙන් ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වන්නේ නැති බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## II

## දේශපාලන සිරකරුවන්ගේ දීර්ඝ කාලීන නඩු කටයුතු කඩිනම් කිරීම

நீண்ட காலமாக நிலுவையிலுள்ள அரசியல் கைதிகளின் வழக்கு நடவடிக்கைகளை விரைவுபடுத்தல்

EXPEDITION OF LONG-PENDING CASES OF POLITICAL PRISONERS

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, I would like to raise the following Question under Standing Order No. 27(2).

A widely accepted principle in many countries is that individuals engaged in political struggles or protests should not be treated as ordinary criminals, but as political prisoners.

In line with internationally recognized standards, including those of the Council of Europe, a "political prisoner" may be understood as a person whose detention

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

arises primarily from political beliefs, actions or identity, particularly where such detention violates fundamental rights or results from disproportionate punishment or unfair or politically influenced legal processes.

Sri Lanka itself provides a clear precedent. Following past insurrections, individuals associated with the Janatha Vimukthi Peramuna - the JVP - were granted amnesty, released and reintegrated into democratic political life with many, today, holding positions of public office. Sir, most Members across the aisle, if pardon had not been given, cannot even hold those positions today.

This demonstrates that political conflicts have previously been addressed through political and restorative measures rather than prolonged punitive detention.

However, a disparity appears to exist in the continued detention and legal treatment of individuals connected to the Tamil political struggle, many of whom have been held for prolonged periods, often under the Prevention of Terrorism Act, PTA, which this Government also promised to repeal and which they have not done to date, with significant delays in indictments and trials. This raises serious concerns regarding consistency, proportionality and equality before the law.

Sir, there are some individuals who have been in prisons for 15, 20 or 30 years. I have the whole list of names and the number of years they have been detained.

It is also pertinent that the National People’s Power - the NPP - pledged in its election Manifesto to address the issue of political prisoners.

Sir, in light of the above, I raise the following questions:

1. Will the Ministry of Justice and National Integration provide a list of individuals who have been in prolonged detention, including those held under the PTA, together with the current status of proceedings in each case?
2. What steps has the Attorney-General’s Department taken to expedite indictments and prosecutions in long-pending cases?
3. What measures are being implemented to reduce delays within the court system in such cases?
4. Are there any mechanisms in place to review cases of prolonged detention to ensure compliance with principles of fairness, proportionality and non-discrimination?
5. What role has the Ministry of Justice and National Integration played in facilitating or recommending Presidential pardons for those serving long-term or life sentences?
6. What concrete steps have been taken to implement the commitments made in the NPP election Manifesto regarding political prisoners?

Sir, முள்ளிவாய்க்கால் நினைவேந்தல் வாரத்துக்குப் பின்னர், முதலாவது சந்தர்ப்பத்தில் இந்தக் கேள்வியை இச்சபையில் எழுப்புகின்றேன். இந்த நாட்டில் தமிழ் மக்கள் இலட்சக்கணக்கில் கொல்லப்பட்டு 17 ஆண்டுகள் கடந்தும், இன்றுவரை நீதி கிடைக்காத நிலையில் அவர்கள் நீதிக்காகப் போராட்டங்களை நடத்திக்கொண்டு இருக்கின்றார்கள். கடந்த வாரம் முழுவதும் வடக்கு, கிழக்கில் முள்ளிவாய்க்கால் நினைவேந்தல்கள் நடைபெற்றன; கொழும்பில் இராணுவ வீரர்கள் தின கொண்டாட்டம் நடைபெற்றது.

கௌரவ சபாநாயகர் அவர்களே! நான் நினைக்கின்றேன், நீங்கள் ஒரு பொது மகனாக இருந்து அரசியலுக்கு வந்தவர் என்று. ஆனால், மக்கள் விடுதலை முன்னணியைச் சேர்ந்தவர்களில் பலர், இன்று ஆளுந்தரப்பில் பதவிகளில் இருக்கின்றார்கள். அவர்களுக்குப் பொது மன்னிப்பு வழங்கப்பட்டு இருக்காவிட்டால், இந்தப் பதவிகளில் இருந்திருக்க முடியாது. தமிழ் அரசியல் கைதிகளுக்கு மாத்திரம் ஏன் இந்த அநீதி? இதனை நாங்கள் ஒருபோதும் ஏற்றுக்கொள்ள முடியாது. அவர்கள் ஆயுதம் ஏந்திப் போராடியது, அவர்கள் நம்பிக்கை வைத்த ஓர் அரசியல் காரணத்துக்காக. ஆகவே, அவர்களைச் சாதாரண குற்றவாளிகளைப் போன்று பார்க்க முடியாது. இது சம்பந்தமாக நாங்கள் ஏற்கெனவே கேள்வி எழுப்பியபோது, இந்த நாட்டில் அரசியல் கைதிகள் என்ற பெயரில் எவருமே இல்லையெனச் சொல்லப்பட்டது. ஆனால், அரசியல் கைதிகள் தொடர்பில் தேசிய மக்கள் சக்தியின் தேர்தல் விஞ்ஞாபனத்தில் சொல்லப்பட்டுள்ளது. நாட்டின் கௌரவ சனாதிபதி அவர்கள் அரசியல் கைதிகள் தொடர்பில் கரிசனையெடுக்க வேண்டும்.

நாங்கள் நேற்றைய தினம் மட்டக்களப்பு மாவட்ட பொது நூலகத்தைத் திறந்து வைப்பதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களை விசேடமாக அழைத்ததன் நோக்கம் என்னவெனில், அந்த நூலகத்தின் கட்டுமானப் பணிகளை நிறைவுசெய்வதற்கு 300 மில்லியன் ரூபாய்க்கும் அதிகமான நிதி தேவை. தமிழ் மக்களும் வரி செலுத்துகின்ற மக்கள். அந்த மக்களால் செலுத்தப்படுகின்ற வரிப் பணத்தை மீண்டும் எடுத்து மக்கள் மயமாக்க வேண்டும் என்பதுதான் எமது நோக்கம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now, you have completed raising your Question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I am explaining why I am raising this Question. I am winding up.

அதனடிப்படையில்தான் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களை அழைத்திருந்தோம். முக்கியமான விடயங்கள் சம்பந்தமாக அரசாங்கம் தன்னுடைய நிலைப்பாட்டைச் சொல்ல வேண்டும். 'ஈஸ்டர்' ஞாயிறு குண்டுத் தாக்குதல்கள் தொடர்பாக சுரேஷ் சலேயைக் கைதுசெய்து இருக்கின்றார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have completed raising the Question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, give me just 30 seconds, Sir.

சுரேஷ் சலேயைக் கைதுசெய்திருப்பதை வரவேற்கின்றோம். அது நல்ல விடயம். ஆனால், நாங்கள் எத்தனையோ ஆண்டுகளுக்கு முன்னர் சொன்னோம், பிள்ளையானை அழைத்து விசாரித்தால் உண்மை வெளிவரும் என்று. கௌரவ அமைச்சர் அவர்களே, அரசியல் கைதிகள் விடயம் மற்றும் பொறுப்புகூறல் விடயம் தொடர்பில் உங்களுடைய அரசாங்கத்தின் தீர்வை நாங்கள் எதிர்பார்க்கின்றோம். அந்தத் தீர்வுக்காக நாங்கள் காத்திருக்கின்றோம். 30 ஆண்டுகளாக 8-10 அரசியல் கைதிகள் சிறையில் இருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இதை விடவும் அவர்கள் தண்டனை அனுபவிக்க வேண்டு மென்று சொல்ல வேண்டாம். அவர்களை உடனடியாகப் பொது மன்னிப்பின்கீழ் விடுதலை செய்ய வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Hon. Speaker, the information and the data sought have to be collected from the TID, the Attorney-General as well as from the Prison Headquarters. So, to give a proper Answer, please grant me two weeks' time. I will make sure that I give a full and a comprehensive Answer to the Question raised by the Hon. Member on a day he is present in Parliament.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Rasamanickam, what is your point of Order?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, it is about this matter. ස්ථාවර නියෝග 27 (2) යටතේ තමයි මම මේ ගැටලුව මතු කරන්නේ. ගරු සභානායකතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා; ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඉන්නවා; මහ ලේකම්තුමියත් ඉන්නවා. අපි Parliamentary Business Committee එකේදී සාකච්ඡා කළාම කිව්වා, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන වැදගත් ප්‍රශ්නවලට ඊළඟ දවසේ උත්තර දෙන්න කියලා. ඒ ප්‍රශ්න අමාත්‍යාංශ තුන හතරකට අදාළව ඉදිරිපත් කරන්න එපා කියපු නිසා දැන් අපි එක අමාත්‍යාංශයකට අදාළව පමණක් ඒවා ඉදිරිපත් කරනවා. ගරු අධිකරණ ඇමතිතුමාගේ ඉල්ලීම මම පිළිගන්නවා. හැබැයි, මම අප්‍රේල් 04වැනි දා කෘෂිකර්ම අමාත්‍යවරයාගෙන් අහපු ප්‍රශ්නයට තවම උත්තරය ලබා දුන්නේ නැහැ. පසුගිය පාර්ලිමේන්තු සතියේදී අහපු ප්‍රශ්නයට තවම උත්තරය නැහැ. මේ කන්නයේ ගොවීන්ගේ පොහොර පිළිබඳ ගැටලුවක් තමයි එයින් මම මතු කළේ. ඒ නිසා මේ කාරණා ගරු කථානායකතුමාගේ අවධානයට මම යොමු කරනවා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න සම්බන්ධයෙන් සභානායකතුමා සහ ඔබතුමා ඉල්ලපු ක්‍රමවේදය අනුව එක අමාත්‍යාංශයකට අදාළව ඉතා කෙටි ප්‍රශ්න තමයි අපි අහලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ කාරණය පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් සහ සභානායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, we will discuss this matter at the Parliamentary Business Committee.

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2026.05.19 දින පාර්ලිමේන්තුවේදී කරන ලද චෝදනාව
## சிறப்புரிமை: மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவால் 2026.05.19ஆம் திகதி பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு
## PRIVILEGE: ALLEGATION MADE BY HON. (DR.) RAMANATHAN ARCHCHUNA ON 19.05.2026 IN PARLIAMENT

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, on the 19th of May, 2026, Ramanathan Archchuna had spoken in the House referring to me, stating that I had, in the Library of Parliament, in a "disgusting and disrespectful" manner abused one Ms. Kowshalya Narendran.

Sir, this statement by the said Member is completely false. I never met, spoke to or even came face to face with the said individual in Parliament on the 19th of May. Further, I can state categorically that, even prior to the 19th of May or thereafter, I had never spoken to the said person or even come into contact with such person.

The false claim by the said Member of Parliament, accusing me of behaving in an abusive manner to a person in the Parliamentary complex and that, too, to a female has the clear intention of falsely making allegations and bringing disrepute to my credibility and my work as a Member of Parliament.

I, therefore, strongly urge you to safeguard my Privileges as a Member of Parliament and maintain the basic ethics in the way the Members must behave, by not speaking falsehood and misleading this House and the public as a whole, by taking appropriate disciplinary action against the said Member. I also seek a formal apology from him for uttering blatant falsehoods against me.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, 19වන ස්ථාවර නියෝගය යටතේ විපක්ෂය අද උදේ ලිඛිතව ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, අපේ රටේ ආර්ථිකයට සුවිශේෂ දායකත්වයක් සපයන වතුකරයේ ජීවත් වන මලෛයහම් ජනතාවට බලපාන ගැටලු ගැන කථා කරන්න හදිසි විවාදයක් ලබා දෙන්න කියලා. අපි ඉල්ලා සිටිනවා, අද හදිසි විවාදයක් හැටියට පස් වරු 3.30 සිට 5.30 දක්වා ඒ විවාදය ලබා දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඒ සම්බන්ධයෙන් සභාවේ එකඟතාව ලබා දෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාත්, අනෙක් මන්ත්‍රීතුමන්ලාත් අපට ඒ ඉල්ලීම යොමු කරලා තිබෙනවා. මේ පිළිබඳව මීට කලින් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී කරුණු ඉදිරිපත් කළ වෙලාවේදී අපි පොරොන්දු වුණා, එතුමන්ලාට ඒ සම්බන්ධයෙන් විවාදයක් ලබා දීමට සූදානම් කියලා. ඒ මන්ත්‍රීතුමන්ලා දැන් ඒක හදිසි විවාදයක් ලෙස ඉල්ලනවා නම් අද දින ප්‍රධාන වැඩකටයුතු පස් වරු 3.30ට නතර කරලා, පස් වරු 3.30 සිට 5.30 දක්වා කාලය ඒ සඳහා වෙන් කර දීමට අපි එකඟයි. නමුත් අපට ගැටලුවක් තිබෙනවා. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා රාජකාරි කටයුත්තකට විදේශගත වෙලා සිටින නිසා එතුමාට සභාවට අද දිනයේදී එන්න වෙන්නේ නැහැ, ඔබතුමන්ලාට පිළිතුරු ලබා දෙන්නට. නියෝජ්‍ය අමාත්‍යවරයා තමයි සම්බන්ධ වෙන්නේ. අනෙක් ඇමතිවරු හා මන්ත්‍රීවරු සම්බන්ධ වනවා. ඒ වාගේම අද දිනට නියමිත විවාදයට ලැහැස්ති වෙලා සිටි මන්ත්‍රීතුමන්ලාට යම් අසාධාරණයකුත් වනවා. නමුත්, අපි එම යෝජනාව පිළිඅරගෙන අපර භාග 3.30ට එම යෝජනාව debate කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අනුව, මලෛයහම් ජනතාවට බලපාන ගැටලු සම්බන්ධයෙන් වන විවාදය අපර භාග 3.30 සිට 5.30 දක්වා පැවැත්වෙනු ඇත.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### අල්-හාෂිමි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### அல் - ஹாஷிமி சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### AL-HASHIMI ASSOCIATION (INCORPORATION) BILL

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Al-Hashimi Association."

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Rural Development, Social Security and Community Empowerment for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 12 දක්වා අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. You have 18 minutes, Hon. Minister.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

[පූ.භා. 11.06]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 23 දිනැති අංක 2481/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.05 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2) සහ විෂය අංක 3 - ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3) සහ විෂය අංක 4 සිට 12 දක්වා වන යෝජනා - විසර්ජන පනත යටතේ යෝජනා සම්මතයන් - ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ආනයන අපනයන පාලනය සම්බන්ධයෙන් 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද, 2026 අංක 01, 02 හා 03 දරන ආනයන අපනයන (පාලන) රෙගුලාසි ද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා අද ඉදිරිපත් වෙනවා. මෙහිදී රෙගුලාසි තුනක් ඉදිරිපත් වනවා. එකක්, 2481/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 2026 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි. එහිදී අවධානය යොමු කරන්නේ, ආනයනය කිරීමේදී අපි යොදා ගනු ලබන සංයෝජිත වර්ගීකරණ කේත තවත් විධිමත් කරමින් ආනයන කටයුතු පහසු කිරීම හා රේගු දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු පහසු කිරීම සම්බන්ධවයි. විශේෂයෙන්ම අධිය පුරවන ලද ටයර් ආනයනය කිරීමේදී සියලු වර්ගයේ ටයර් එක කේතයක් යටතේ ගෙනැල්ලා තිබුණේ. නමුත්, සුවිශේෂී තත්ත්වයන් යටතේ, විශේෂයෙන්ම ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාවිච්චි කරන ටයර් ඊට වඩා වෙනස් වන නිසා විශේෂ කේත අංකයක් එතැන සකස් කර දී තිබෙනවා.

දෙවැනි එක, අංක 2482/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 2026 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි. මෙම රෙගුලාසිවලින් භාණ්ඩ වර්ග කිහිපයක් අනුසංකේතවලට වර්ගීකරණය කිරීමක් වාගේම ඒ භාණ්ඩ වර්ග අතරේ ආනයන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබුණු දේවල් පිළිබඳ ගැටලු ටිකක් නිරාකරණය කෙරෙනවා. විශේෂයෙන් කලින් ගම්මිරිස් සහ ආයුර්වේද නිෂ්පාදනවලට යොදා ගන්නා තිප්පිලි දෙකම එකම කේතයක් යටතේ ගෙනැල්ලා තිබුණා. එය වෙනස් කර, ආයුර්වේද නිෂ්පාදන සඳහා යොදා ගන්න තිප්පිලි සම්බන්ධයෙන් ආනයන පාලන සීමාව ඉවත් කරලා ආනයනය කරන්න ඉඩ ලබා දෙන අතරේ, අනෙක් භාණ්ඩවලට - ලුණු සහ මුද්‍රණ යන්ත්‍රවලට - නිසි පරිදි කේත අංක ලබා දීලා ආනයනය කිරීමේ කටයුත්ත සිදු කරනවා.

ඊළඟට තිබෙන්නේ, 2482/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2026 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි. සහල් ආනයනය සඳහා වන බලපත්‍ර සම්බන්ධයෙන් වන රෙගුලාසි. සහල් ආනයනය තහනම් කරලා තිබුණා. නමුත්, නිශ්චිත අවශ්‍යතාවකදී නිශ්චිත සහල් ප්‍රමාණයක් ආනයනය කරගැනීම සඳහා ආනයනය කිරීමේ කාල පරිච්ඡේදයත්, ඒවා ලංකාවට ළඟා විය යුතු කාල පරිච්ඡේදයත් ඇතුළත් කරන රෙගුලාසි ටිකක් තමයි එහි තිබෙන්නේ. ඒ කාරණා තමයි අද අනුමත කරගන්න යෝජනා කර කරන්නේ.

ඊට අමතරව අපි විශේෂයෙන් කථා කළ යුතු කාරණයක් තිබෙනවා. මේ ආනයන අපනයන පාලනය ගැට ගැහෙනවා, විශේෂයෙන් අපේ රේගු දෙපාර්තමේන්තුවත් එක්ක. ඒ ආනයන කාර්යයන්වලදී පරිපාලනය පහසු කරගැනීමට යොදා ගන්න ජාත්‍යන්තර මට්ටමේ කේත තිබෙනවා. ඒවාට ලංකාවේ අවශ්‍යතාව අනුව උප කේත ඉදිරිපත් කිරීමට අපි කටයුතු කරනවා. ප්‍රධාන වශයෙන් අපි HS - Harmonized System - codes කියලා හඳුන්වන කේත විධිමත්ව, ක්‍රමවත්ව අපේ බදු අය කරගැනීමේ පහසුවත්, පරිපාලන පහසුවත් වැඩි වෙන විධියට සංශෝධනය කරමින් තිබෙනවා.

ඊට අමතරව අපට මෙතැනදී පුළුවන්කම ලැබෙනවා, රේගු බදු තක්සේරු කරගැනීම තුළින් රේගු බදු අය කරගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කරගන්න. ඒ වාගේම රෙගුලාසිවල අනුකූලතාව වැඩි කර ගන්න පුළුවන් වනවා. ආනයනය කරනකොට අපට ගොඩක් විවේචන එනවා, ඒවා පිට පාරෙන් ආනයනය වෙනවා, බදු අය කරගන්නේ නැහැ කියලා. එම නිසා මේ ක්‍රමවේද හරහා රේගු කටයුතුවලදී ඒ රෙගුලාසිවල අනුකූලතාව වැඩි කරගන්න පුළුවන් වෙනවා වාගේම භාණ්ඩ ආනයනයේදී සිදු වන අවදානම් කළමනාකරණය කරලා අවදානම් අඩු කරගන්න අපට පුළුවන් වෙනවා. ඒ අනුව එතැනදී අපි තාක්ෂණය කැඳවීමටත් බලාපොරොත්තු වෙනවා.

සති කිහිපයකට උඩදී රේගු දෙපාර්තමේන්තුවේ තාක්ෂණය කැඳවීම වැඩිදියුණු කරන්න පද්ධති තුනක් ඉදිරිපත් කළා. එකක් තමයි, cargo flow system කියන එක. සමහර අවස්ථාවලදී චෝදනා කරනවා, කන්ටේනර් ඇවිල්ලා පරීක්ෂාවට ගන්නකොට මුදල් ගෙවීම් කරමින් පසුව එන ඒවා ඉස්සරහට අරගෙන පමා කිරීම් කරනවා; මේ වාගේ ගැටලු නිර්මාණය වෙනවා කියලා. දැන් ඒක සම්පූර්ණයෙන්ම ඉවත් වෙන විධියට ස්වයංක්‍රීයව මේ cargo flow system එක manage කරනවා. එම නිසා එන දින වකවානු අනුව; කාලයට අනුව තමයි කන්ටේනර් පරීක්ෂණ තත්ත්වයට දියත් කරනු ලබන්නේ.

ඒ වාගේම ඔබතුමන්ලාට මතක ඇති, විපක්ෂයෙන් අපේ ආණ්ඩුවට චෝදනාවක් ගෙනාවා, කන්ටේනර් 323ක් පිළිබඳව. ඒවායේ වැරදි භාණ්ඩ ගෙනැල්ලා තිබෙනවා, දේශපාලනය සම්බන්ධ වෙලා දූෂණයක් කළාය කියලා. නමුත්, අපි ඉතා පැහැදිලිව කිව්වා, කිසිදු ආකාරයකින් දේශපාලන යන්ත්‍රණය එවැනි දේකට සම්බන්ධ වෙලාත් නැහැ, මොනවා හෝ අකටයුත්තක්, ගැටලුවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි පරීක්ෂණ කරලා ඉදිරියට කටයුතු කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කළා. ඒ වාගේම විශේෂ කාරක සභාවක් පත් කළා. ඉතාම වැදගත් වෙන දේ තමයි, එහෙම කටයුතු කරද්දී විධිමත්ව ඔප්පු කරගත හැකි කිසිදු

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

සාක්ෂියක් ඇවිල්ලා නැහැ. එහෙම තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරලා, සාකච්ඡා කරන්නයි කියන එක තමයි යෝජනා කරන්නේ. අපේ අරමුණ වන්නේ වඩාත් විධිමත් විධියට මේ කටයුතු කාර්යක්ෂම කරගැනීමයි. ඒක තමයි cargo flow system එකෙනුත් අපි බලාපොරොත්තු වෙන්නේ. ඉතාම කෙටි කාලයක් ඇතුළත වේගවත්ව අපේ සහාය අපි ඒ ආයතනවලට ලබා දෙනවා.

ඒකේ දෙවැනි කොටස විධියට තිබුණා, e-recovery of vessel service charges. ඒ කියන්නේ, භාණ්ඩ ආනයනය කරලා රේගුවෙන් නිදහස් කරගන්න යනකොට ගෙවිය යුතු විවිධ ගාස්තු; පුංචි පුංචි ගාස්තු වර්ග ගොඩක් තිබෙනවා. ඒවා ගෙවන්න වැඩිපුර කාල වේලාවක් යනවා, ස්ථාන ගණනාවකට යන්න සිද්ධ වෙනවා. දැන් ඒ සම්පූර්ණ තත්ත්වය අයින් කරලා, cargo සම්බන්ධයෙන්, vessel management සම්බන්ධයෙන් කළ යුතු සියලු ගෙවීම් එකම ස්ථානයකදී ගෙවීමේ පහසුව අපි සකස් කරලා දීලා තිබෙනවා.

ඒ වාගේම remittance portal එකක් හදලා දීලා තිබෙනවා. අතීතයේදී ආනයනය කරනකොට ප්‍රශ්නයක් පැන නැඟී තිබුණා. ආනයනය කරන ප්‍රමාණය, ඒ කියන්නේ ඩොලර් මිලියන 100ක ආනයනය කරනවා නම් ඇත්තටම ඩොලර් මිලියන 100ක් එළියට යනවාද, කොහෙන්ද යන්නේ, මොන ක්ෂේත්‍රවලටද යන්නේ, කොහෙන්ද හොයා ගත්තේ කියන මේ කියන කරුණු කාරණා එකකට එකක් සංසන්දනය කරගැනීමේ නොහැකියාව නිසා ගැටලු ගණනාවක් තිබුණා. ඒකත් අයින් කරලා, ඒ අදාළ ආයතනත් එක්ක තොරතුරු හුවමාරු කරගැනීම මෙන්ම නීතිමය බාධාවක් තිබෙනවා නම් ඒවා ඉවත් කර ඒ කටයුතුත් අපි පහසු කරලා දීලා තිබෙනවා.

ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි අපි මේ වෙනකොට ලබා ගත් ආර්ථික ස්ථාවරත්වය ගැන. ඒ ස්ථාවරත්වයෙන් ඉදිරියට යනකොට රේගු දෙපාර්තමේන්තුවේ ආනයන අපනයනයට සම්බන්ධ බදු එකතු කරගැනීම බැලුවොත්, මේ වෙනකොටත් - පසුගිය මාස හතර තුළ - සැලකිය යුතු මට්ටමක් තිබෙනවා. මා ළඟ දත්ත තිබෙනවා. 2026 සමස්ත වර්ෂයටම රේගු දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ ආදායම් ඉලක්කය වුණේ රුපියල් බිලියන 2206.1ක්. 2026 මැයි 18වැනි දා වෙනකොට බිලියන 1020.5ක් අය කරගෙන තිබෙනවා. ඒ කියන්නේ, සමස්ත අගයෙන් සියයට 46.2ක් අයකරගෙන තිබෙනවා. ඉලක්කයක් විධියට ගත්තාම, මේ මැයි 18වැනි දා තිබෙන ඉලක්කය අනුව සියයට 120ක ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම අපි ආණ්ඩුවක් විධියට බලාපොරොත්තු වනවා, මේ ඉදිරිපත් කරන ලද රෙගුලාසිවලින් රේගු කටයුතු, ආනයන අපනයන කටයුතු පහසු කිරීමට හා කාර්යක්ෂම කරන්න.

පසුගිය දවස්වල විවාදයට තුඩු දුන් කාරණා අතරේ අපි ඊයෙත් විවාද කළා, 2025 වර්ෂයේ ආර්ථික ප්‍රගතිය ගැන. හැබැයි, නිරන්තරයෙන්ම ඒ ප්‍රගතිය හෝ අත්පත් කරගත් ආර්ථික දර්ශකවල තිබෙන ගැටලු සාකච්ඡා කරනවා වෙනුවට මේ මොහොත වනකොට විදේශ විනිමය අනුපාතය ඉහළ යෑම ඉලක්ක කරගෙන, එය කේන්ද්‍ර කරගෙන, සියලුම දේවල් ඒ හරහා ගොනු කරගෙන, වාද විවාද කරමින් ආර්ථික අර්බුදයකට යන තත්ත්වයක් හුවා දක්වමින් කටයුතු කරන ආකාරයක් තිබෙන්නේ. මම කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්නම්. ඉන් ප්‍රධානම එකක් තමයි, විදේශ විනිමය අනුපාතය ඉහළ යෑම සමස්ත ආර්ථික අර්බුදයක් විධියට පෙන්වීමට උත්සාහ කිරීම. විදේශ විනිමය අනුපාතය කියන්නේ, ආර්ථිකයක් ඇතුළේ එක් දර්ශකයක් පමණයි. තව දර්ශක ගණනාවක් තිබෙනවා. ඒ සියලු දර්ශකවල අපේ තිබෙන්නේ සුබ දිශාවක්. මේ නිශ්චිත දර්ශකයේදී පවා අපි නිසි පරිදි විදේශ විනිමය පාලනය කරලා, සංචිත ගොඩ නඟාගෙන ආර්ථික කටයුතු සිද්ධ කරමින් ආවා. මේ ඉහළ යෑමටත් බලපෑ හේතු මම පසුව පැහැදිලි කරන්නම්. ඒ රට ඇතුළෙන් අපි ගත් තීන්දු තීරණ නිසා නොවෙයි, බාහිර සාධක නිසා.

ඒ වාගේම විපක්ෂයෙන් උත්සාහයක් දැරුවා, මෙය 2022 වසර සමඟ සන්සන්දනය කරන්න. එහිදී ඩොලරයක විදේශ විනිමය අනුපාතය රුපියල් 370 වාගේ අගයකට ගියා, තව ටිකයි යන්න තිබෙන්නේ,- දැනට අපි පිළිගන්නවා, විදේශ විනිමය අනුපාතය යම් ප්‍රමාණයකට ඉහළට යමින් තිබෙනවා කියලා. ඩොලරයක විදේශ විනිමය අනුපාතය රුපියල් 370ට ආවාට පස්සේ න්‍යායක් වාගේ කියන්න උත්සාහ කළා, "2022දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේත් ඩොලරය රුපියල් 370 අගයක තිබුණේ. ඔන්න ආර්ථිකය බිඳ වැටෙනවා; ඔන්න බිඳ වැටීමේ ලකුණු; ආණ්ඩුව වැටෙනවා, ඒ නිසා ආණ්ඩුව ගෙදර යන්න ලැහැස්ති වෙන්න, අපි - විපක්ෂය - ආණ්ඩුව භාර ගන්නම්" වාගේ අදහසක්. ඔබ ඒ සිහිනය දැක්කාට කමක් නැහැ, ඔබ ඒ තර්කනය ඉදිරිපත් කළාට කමක් නැහැ. හැබැයි, හොඳට විශ්ලේෂණය කරලා බලන්න, 2022දී ඩොලරයක වටිනාකම රුපියල් 370ට ගිය නිසා හෝ විදේශ විනිමය අනුපාතය පාලනය කර ගන්න බැරි වීම නිසා ආණ්ඩුව බිඳ වැටුණා නොවෙයි. ආර්ථිකමය වශයෙන් සියල්ල බිඳ වට්ටලා, වැරදි තීන්දු අරගෙන, රජය මූල්‍ය කළමනාකරණය සිදු නොකළ නිසා තමයි ඒ බිඳ වැටීම සිද්ධ වුණේ. ඒ කියන්නේ, වැරදි ප්‍රතිපත්ති, වැරදි කළමනාකරණය, ආර්ථිකය බිඳ වට්ටලා, ඒ වාගේම ආර්ථිකය හිර කරලා, ආනයන සියල්ල තහනම් කරලා, ණය ගෙවන්නේ නැතිව, කිසි දෙයක් කරන්නේ නැතිව සංචිත ප්‍රමාණය ඉතුරු කරගෙන ඉන්න එක. ඒ අර්බුදයේ ප්‍රතිඵලයක් විධියට විදේශ විනිමය අනුපාතය ඉහළට යනවා. ඒ ඉහළට යාමෙන් නිර්මාණය කරන අර්බුදය නැවත කැරකිලා ආර්ථික අර්බුදයක් විධියට එනවා. මේක චක්‍රයක් විධියට සිදු වන්නේ. ඒගොල්ලන් හිර වෙලා තිබුණු එකක් දැන් අපට පෙන්නුම් කරන්න උත්සාහ කරනවා, දැන් මේ විදේශ විනිමය අනුපාතය ඉහළ ගියාට පස්සේ ආර්ථික අර්බුදයක් එනවා කියලා. එහෙම නැහැ.

මේ අවස්ථාවේදී මේ කාරණය විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ. විදේශ විනිමය අනුපාතය ඉහළ ගිය තත්ත්වයකදී ආර්ථික අර්බුදයක් නිර්මාණය වෙන්න විශේෂයෙන් බලපාන කාරණා සැලකිල්ලට භාජන කළොත්, කොච්චර දුරට අපේ රට ඇතුළේ තිබෙන ආර්ථික ස්ථාවරත්වය වැදගත්ද කියන කාරණය අපට ගන්න පුළුවන්. ඒක තමයි අපි ඊයෙත් විවාද කළේ, 2025 වර්ෂයේදී අත්පත් කර ගත් මූල්‍ය ස්ථාවරත්වය, ආණ්ඩුවේ ආදායම් එකතු කිරීමේ ස්ථාවරත්වය, අතිරික්ත ධනය පිළිබඳව. ඒ නිසාම තමයි අපට විශේෂ සහන ලබා දෙන්නත් පුළුවන් වෙන්නේ. කිසිදු ආකාරයකට මෙතැනදී තර්කනයක් හෝ සම්බන්ධතාවක් ගොඩ නැඟෙන්නේ නැහැ, විදේශ විනිමය අනුපාතය ඉහළ ගියා කියලා ආර්ථිකය පල්ලෙහාට යනවා කියලා. ඒ විදේශ විනිමය ඉහළ යෑම කළමනාකරණය කර ගන්න අපට සිදු වෙනවා. ඒ වාගේම, විදේශ විනිමය ඉහළ යෑමේ, පහළ යෑමේ ප්‍රතිඵලවල වාසි සහ අවාසි විවිධ තත්ත්වයන් යටතේ තිබෙනවා.

අපට කරුණු කාරණා ගණනාවකට අදාළව කටයුතු කරන්න තිබෙනවා, අත්පත් කර ගත්තු මූල්‍ය ස්ථාවරත්වයත්, ඒ වැඩ පිළිවෙළත් ඉදිරියට ගෙන යෑම සඳහා. ඒ වාගේම, එයට අවශ්‍ය කරන විදේශ විනිමය ලබා ගැනීම වැනි දේවල් අප කළ යුතු වෙනවා. මේ වර්ෂය ඇතුළතදී අපනයනවලට අමතරව, විදේශ ප්‍රේෂණවලට අමතරව මේ මාසයේ 27වන දා අපි බොහෝදුරට බලාපොරොත්තු වෙනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමිත ඩොලර් මිලියන 700 අපට ලබා දේවි කියලා. මේ වර්ෂය ඇතුළත ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 480ක් දක්වා ලබා ගැනීමේ ඉඩ කඩ අපට තිබෙනවා. ඒ වාගේම, ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන

150කුත්, ඊට ආනුෂංගික ආයතනයකින් ඩොලර් මිලියන 50කුත් ලබා ගැනීමේ අවස්ථාව අපට තිබෙනවා. ඒ තත්ත්වය යටතේ අපට කිසිදු ගැටලුවක් නිර්මාණය වෙන්නේ නැහැ, මෙය කළමනාකරණය කර ගන්න. නමුත් අපි දන්නවා, විදේශ විනිමය අනුපාතයක් එකවර; දවසින්, දෙකෙන් මේ විධියට උච්චාවචනය වන විට - ඉහළ පහළ යන විට - පාලනය කර ගන්න බැරි වෙනවා කියලා. එය හුදෙක් අනවශ්‍ය නීතියක්, රීතියක් දාලා පාලනය කිරීමෙන් ආර්ථිකය හකුළුවාලීමක් සිද්ධ වෙනවා. අපේ ක්‍රියාමාර්ගය ආර්ථිකය හකුළුවා, නවත්වා උත්තර සොයන එක නොවෙයි. ක්‍රියාත්මක වන ආර්ථිකය ඇතුළේම මේ කටයුත්ත කරන්න ඕනෑ. ආර්ථිකය හකුළුවා උත්තර සොයන්න ගියොත් අර්බුදයකට යනවා. සමහර රටවල් එහෙම අර්බුදයකට ගිහින් තිබෙනවා. ආර්ථික විද්‍යාවේදී අපි මේකට කියනවා, "stagflation" කියලා. ඒ කියන්නේ, ආර්ථිකයේ stagflation එකක්, එක තැන නැවතීමක්, පල් වීමක් වෙනවා. එතකොට උද්ධමනය ඉහළ යනවා. මේ තත්ත්වය සැලකිල්ලට භාජන කළත් තවම stagflation එකක් නැහැ; ආර්ථිකය එක තැන හිර වෙලා නැහැ, දුවවනවා. ඒ නිසා තමයි අපි සියලු උපාය මාර්ග අනුගමනය කරන්නේ ආර්ථිකය දුවවමින්. ආර්ථිකය නවත්වා නොවෙයි අප එය කරන්නේ.

ඒ වාගේම, අපි උද්ධමනය පාලනය කර තිබෙනවා. උද්ධමනයේදී යම් යම් භාණ්ඩවල මිල ගණන් වැඩි වෙනවා. අපි පිළිගන්නවා, විදේශ විනිමය අනුපාතයේ බලපෑමෙන් ආනයන භාණ්ඩවල මිල ගණන් ඉහළ යන බව. එතකොට යම් තෙරපුමක් එනවා. වැදගත් වන්නේ ඒ තෙරපුම; උද්ධමනය පාලනය කරන්න පුළුවන්ද කියන එකයි. ඔව්, ඒක පාලනය කරන්න පුළුවන්. දැනටමත් එය පාලනය කර තිබෙනවා. අපේ විචලා උද්ධමනය පාලනය කිරීමේ රාමුව තුළ තමයි තවමත් තිබෙන්නේ. අපි විශ්වාස කරනවා, එය පාලනය කරන්න පුළුවන් කියලා.

ආසියාවේ අනෙකුත් රටවල් එක්ක සංසන්දනය කරමින් අපේ විදේශ විනිමය අවප්‍රමාණය වීම - අඩු වැඩි වීම - ගැනත් විපක්ෂය කථා කළා. මා පෙන්නුම් කරන්න හදන්නේ මෙය අපට බාහිරින් තිබිච්ච සාධකයක් කියන එක සහ අපේ ආර්ථිකය ස්ථාවරව තිබෙනවා කියන එකයි. ඒ වාගේම, විදේශ විනිමය අනුපාතය අභ්‍යන්තර හේතුවක් නිසා නොව බාහිර හේතුවක් නිසා අවප්‍රමාණය වීම ආර්ථික වර්ධනයට හෝ ආර්ථිකය කඩා වැටීමට බලපාන්නේ නැහැ. ඒකට හොඳම උදාහරණ දෙක තමයි ඉන්දියාව සහ ඉන්දුනීසියාව. ඉන්දියාවේ මුදල් ඒකකය ඉතිහාසයේ වැඩිම අගයකින් අවප්‍රමාණය වෙලායි තිබෙන්නේ. එය ඉතිහාසගත ලෙස, වාර්තාගත ලෙස අඩුම මට්ටමකට වැටිලා තිබෙනවා. ඒ කියන්නේ, ඉන්දියාවේ රුපියල වැඩිම අවප්‍රමාණය වීම දැන් වාර්තා වෙලා තිබෙනවා. හැබැයි ඔවුන්ගේ ආර්ථික වර්ධන වේගය සියයට 6.5ක් ලෙස පවත්වාගෙන යමින් තිබෙනවා. ඉන්දුනීසියාවේත් දේශීය මුදල් ඒකකය ඉතිහාසයේ වැඩිම අගයකින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. හැබැයි, ඔවුනුත් සියයට 7ක ආර්ථික වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ කරුණුවලින් පෙන්නුම් කරන්නේ ආර්ථිකයට පිටින් තිබෙන සාධකයක් නිසා විදේශ විනිමය ක්‍රියාත්මක වුණාට ගැටලුවක් වෙන්නේ නැහැ කියන කාරණයයි. එම නිසා අපේ රට මේ හේතුවෙන් ආර්ථික අර්බුදයකට කිසිදු ආකාරයකින් ගමන් කරන්නේ නැහැ.

ඒ වාගේම අපට වැදගත් වෙනවා, අපි රට ඇතුළේ කොච්චර දුරට රාජ්‍ය ණය කළමනාකරණය කර තිබෙනවාද කියන එක. ණය වැඩි කරලා විවිධ ප්‍රශ්න එනවා කියලා අපට චෝදනා ඉදිරිපත් කළාට අපි ණය තිරසරභාවය අත්පත් කරගෙන තිබෙනවා. ණය තිරසරභාවය පිළිබඳ සැලැස්ම යටතේ අපි 2032 ඉලක්කය 2026දීම අත්පත් කර ගන්නවා. ඒ වාගේම අපි ණය ප්‍රමාණය ක්‍රමිකව අඩු කර ගන්නවා. රටක් පාලනය කරන කොට ගැටලුවක් නැතුව තිරසරව ණය ලබා ගන්න පුළුවන් නම්, ඒක තමයි වඩාත් හොඳ. නමුත් සමාජගත කර තිබෙනවා මතයක්, ණය ලබා ගන්නා එක වැරදි වැඩක්, ණය වැඩි වන කොට ආර්ථිකය බිඳ වැටෙනවා කියලා. කලින් ආණ්ඩු ණය ලබාගෙන ඒවා අවභාවිත කරලා ඒවායේ ප්‍රතිඵල ආපු නැති නිසා ණය ප්‍රශ්නයක් වුණා; ණය ව්‍යසනයක් වුණා; ණය අවභාවිත වුණා. ඒ නිසාම සමාජය මතයක් හැදුවා, ආණ්ඩුව ණය ගන්නවා නම් වැරැදියි, ණය අරගෙන ආර්ථිකය කළමනාකරණය කිරීම වැරැදියි කියලා. එය සම්පූර්ණ වැරැදි අදහසක්. ණය ගැනීම, ණය කළමනාකරණය කිරීම, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අදාළ අවසරය ලබා ගැනීම ආදිය කළ යුතුයි. ඒ ආකාරයට තිරසර විධියට ණය පවත්වාගෙන යනවා නම් තමයි ආර්ථිකයක් හරියාකාරව හැසිරෙන්නේ. ඊට හොඳම උදාහරණය, ලෝකයේ දියුණු රටක් හැටියට අප කවුරුත් පිළිගන්නා ජපානය. ජපානය තමයි ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව වැඩිම ණය ප්‍රතිශතය වාර්තා කරන්නේ. ඒ, සියයට 254ක අගය. එහෙම නම් එහි අර්ථික අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙන්න ඕනෑ ණය නිසා. වෙන වෙන ප්‍රශ්න එන්න පුළුවන්. හුදෙක්ම ණය ගැනීම කියන තනි කාරණය නිසාම ඒ ආර්ථිකය අර්බුදයකට ගිහිල්ලා නැහැ. එහෙම අර්බුදයකට යනවා නම්, එහෙම වෙන්නේ ණය හරියාකාරව කළමනාකරණය නොකිරීම නිසායි. කලින් ආණ්ඩු ණය කළමනාකරණය හරියාකාරව නොකළ පලියට අපට චෝදනා කරන්න එපා, ණය ප්‍රමාණය ඉහළ පහළ යෑම සම්බන්ධයෙන්. මේ ණය ප්‍රමාණය ඉහළ පහළ යෑම්, ණය ගැනීම් සිද්ධ කරන්නේ යම් වැඩ පිළිවෙළක් අනුව උපායමාර්ගිකව කළමනාකරණය කරලායි. 2030න්, 2035න් පසු අපට පුළුවන් නම් අපි තවත් ණය අරගෙන මේ රට දියුණු කරනවා. දැනට අපි ගමන් කරන්නේ මෙන්න මේ තිරසර පාලන ව්‍යුහය ඇතුළේ. ඒ වාගේම, ව්‍යාපාරික අවිනිශ්චිතතාව අයින් කරලා අපි ඔවුන්ගේ විශ්වාසය දිනා ගන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා මෙය කිසිදු ආකාරයකට ගැටලුවක් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මම තවත් පොඩි වෙලාවක් අර ගන්නවා, වාහන ආනයනය ගැන කියන්න. මේ මොහොත වන විට අපි යම් තීන්දුවක් ගෙන තිබෙනවා, පෞද්ගලික වාහන ආනයනය කිරීම පොඩ්ඩක් කල් දමා ගැනීමට. ඒ, එක කෙටි උත්තරයක්. තව උත්තර ගණනාවක් මේ තුළ තිබෙනවා. අපි තොරතුරු අධ්‍යයනය කරමින් පියවරෙන් පියවර, ක්‍රමිකවයි එතැනට එන්නේ. ඒ සම්බන්ධයෙන් විපක්ෂය ඉදිරිපත් කරපු තර්කයක් තිබෙනවා. ඒ තමයි, හරියටම මේ තීන්දුව ගත්තු මැයි මාසයේ 15වන දා වාහන 4,000ක් ගෙන්නුවා; ඒවායෙන් 3,500ක් එක සමාගමක් සහ අනෙක් 500 තවත් සමාගමක් ගෙන්වා තිබෙනවා; තොරතුරු එළියට ගිහින් තිබෙනවා; හොරකමක්, වංචාවක් කර තිබෙනවා කියන එක. එසේ සම්පූර්ණයෙන්ම මිථ්‍යාවක්, වැරැදි තොරතුරක් සමාජගත කළා. එක එක කණ්ඩායම් එකට එකතු වෙලා කරන්න පුළුවන්. මම කලිනුත් තොරතුරු ඉදිරිපත් කළා. මැයි මාසයේ 15වන දා ලංකාවට ආවේ වාහන 1,782යි. ඒ වාහන 1,782 ඇතුළේ තනි තනි ඒකක වශයෙන් ගත්තාම, වාහනය, දෙක, තුන ආනයනය කළ අය ඉන්නවා; වාහන 147ක්, 150ක් ආනයනය කළ අයත් ඉන්නවා. ඒවාත් මෝටර් සයිකල්. නමුත් ඒ තුළ වැරැදි චිත්‍රයක් මවන්න හැදුවා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ඒ විස්තර ඉදිරිපත් කරන්නම්. මැයි 15වන දා වාහන 1,782ක් ආනයනය කළා. මැයි 18වන දා, ඒ කියන්නේ බදු වැඩි වුණාට පසුව - බදු පනවා තිබියදීත් - වාහන 9,429ක් ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් පෙනී යනවා, තොරතුරු කිසිදු ආකාරයකින් එළියට ගිහින් නැහැ කියලා; එවැනි ගැටලුවක් නිර්මාණය වෙලා නැහැ කියලා. හැබැයි, විපක්ෂය විසින් හෝ සමාජය විසින් හෝ ඇති කරනු ලබන ඒ බිය

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

සහ සමපේක්ෂණය - speculation - නිසා මිනිස්සු බය වෙනවා, වාහන ගෙන්වීම නවත්වයි, ඒ නිසා මෙය බාධකයක් කියලා. නමුත් එහි කිසිදු ආකාරයක නතර කිරීමක් කරන්නේ නැහැ. මේ ආකාරයට තමයි අපි ඉදිරියට ගමන් කරන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම එක ඉල්ලීමක් කරනවා, රටේ සමස්ත ජනතාව වෙනුවෙන්. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන දේ පිළිගන්නවා වාගේම -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, සභාවේ - [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, social mediaවල කිය කියා යන ඒවාට investigations කරන්න වුණොත්, ඔක්කෝම වැඩ පැත්තක තියලා investigations කර කරම ඉන්න වෙනවා. මා කියන්නේ මේකයි. Investigation එකක් කරන්න නම්, ඒ කරුණු ඉදිරිපත් කරන්න. දැන් මම මෙතැනදී ඉතාම පැහැදිලිව ඉදිරිපත් කළා නේ, එදා ආනයනය කර තිබෙන්නේ වාහන 1,782ක් බව. නමුත් කවුරු හරි කෙනෙක් චෝදනාවක් කරනවා නම් වාහන 4,000ක් ආනයනය කළා කියලා, ඒ කරුණු ඉදිරිපත් කරන්න. එහෙම නැතුව ඒ සම්බන්ධව investigate කරන්න මතු පිටින්, *prima facie* evidence නැහැ නේ. මොනවාද මේ කියන කාරණා? මට තේරෙන්නේ නැහැ. ඒ කරුණු ඉදිරිපත් කරන්න. අපි ඒ අනුව කටයුතු කරනවා. මේ දත්ත අප සතුව තිබෙනවා. මැයි 15වන දා කොච්චර බැංකු ප්‍රමාණයක් මේ සඳහා ණයවර ලිපි නිකුත් කර තිබෙනවාද බලමු. පෞද්ගලික සහ රාජ්‍ය බැංකු 13ක්. ඒ වාගේම 18වන දා වනකොට, ඒ කියන්නේ බදු වැඩිපුර ගෙවන තත්ත්වය තුළත් බැංකු 16ක් LC විවෘත කර තිබෙනවා. අප ජනතාවට කියන්නේ, ආණ්ඩුව මේ කාරණය හරියාකාරව, ක්‍රමිකව පාලනය කරනවා කියන කාරණය කෙරෙහි ඔබ විශ්වාසය ඇති කර ගන්න කියලායි.

මම දත්ත කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්නම්. මැයි 15වන දා වන විට ඇති කරපු ඒ අනවශ්‍ය බිය නිසා, ඒ කියන්නේ වාහන ආනයනය කිරීම තහනම් කරාවි කියලා මිනිසුන් තුළ ඇති කළ බිය නිසා මොකක්ද වුණේ? ජනතාව හිතුවා, ආනයනය කළ වාහනවලට වැඩිපුර බදු ගෙවන්න සිද්ධ වේවි, වෙළෙඳ පොළේ අවස්ථාවාදී හැසිරීම නිසා තමන්ට පාඩු ලබන්න සිද්ධ වේවි, ව්‍යාපාරිකයන් අධික ලෙස මිල ඉහළ දමාවි කියලා. ඒවාට හසු වෙන්න එපා. මම ජනතාවට කියනවා, ඔබ හොඳින් කරුණු සොයා බලන්න කියලා. මේ හැසිරීම ඇතුළේ මේවා එකවර පාලනය වෙන්නේ නැහැ. ඒ සඳහා යම් දින ගණනක් - කාල වකවානුවක් - යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is up.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

මැයි මාසයේ 15වන දා, ඒ කියන්නේ cut-off date එක වනවිට වාහන ආනයනය සඳහා LC විවෘත කර තිබුණේ ඩොලර් මිලියන 23.71කට විතරයි. ඒ, අර බියක් හදා තිබුණු නිසා. අපි තීන්දුවක් ගත්තා. හැබැයි, තීන්දුවක් ගත්තත් මොකද වෙන්නේ? මැයි 18වන දා ඩොලර් මිලියන 17.9යි. පෙරට වඩා අඩු වෙනවා. යම් පාලනයක් සිද්ධ වෙලා තිබෙනවා. මේ පාලනය ක්‍රමිකව සිද්ධ වෙන්නේ. 19වන දාත් පාලනයක් සිද්ධ වෙලා තිබෙනවා. මෙහිදී අපට වැදගත් වන්නේ එළියට යන ඩොලර් ප්‍රමාණයයි. අපට අවශ්‍ය වන්නේ ඒක සියයට 100කින් නැවැත්වීම නොවෙයි. 19වන දා ඩොලර් මිලියන 14.98යි. 20වන දා සහ 21වන දා යනාදි වශයෙනුත් අපට බලන්න පුළුවන්. මේ විදේශ විනිමය කියන කාරණය ස්වයංක්‍රියව වෙළෙඳ පොළ බලවේග විසින්, ඉල්ලුම සැපයුම විසින් පාලනය කරනවා. ආණ්ඩුව විසින් ප්‍රතිපත්තිමය තීන්දු ගන්නවා. මේක එක තීන්දුවක්. සමහර විට අපි ලබන සතියේ තව තීන්දුක් ඉදිරිපත් කරාවි, ආණ්ඩුව පැත්තෙන්. ඒ වාගේම මහ බැංකුව මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කර ගැනීම සඳහා අනුගමනය කරන තවත් උපක්‍රම - tools - ගණනාවක් තිබෙනවා. ඒවා එකින් එක තමයි අප ඉදිරිපත් කරන්නේ, ආර්ථිකයට කිසිදු ආකාරයක හානියක් වෙන්න දෙන්නේ නැතිව.

මම තව එක උදාහරණයක් කියන්නම්. විපක්ෂයේ අය කියන විදියට, විදේශ විනිමය පිළිබඳ කාරණය නිසා ආර්ථිකය බිඳ වැටෙනවා නම් කොටස් වෙළෙඳ පොළේ විදේශ ආයෝජකයන් පැනලා යන්නට ඕනෑ. සමහර අවස්ථාවලදී විකිණීම්, මිල දී ගැනීම් සිදු වෙන්න පුළුවන්. විශේෂයෙන්ම රුපියල අවප්‍රමාණය වනකොට විදේශිකයා කොටස් වෙළෙඳ පොළේ උපයන ආදායම පහළට යනවා. හැබැයි, ඊයේ - 20වන දා - කොටස් වෙළෙඳ පොළ තුළ විදේශිකයන්ගේ කොටස් මිල දී ගැනීම් රුපියල් මිලියන 38කින් වැඩි වෙනවා; ශුද්ධ මිල දී ගැනීම් වැඩි වෙනවා. මිලදී ගැනීම් මිලියන 77යි; විකිණීම් මිලියන 39යි. මොකක්ද ඒකෙන් කියන්නේ? ඔවුන්ට දරන්න පුළුවන් සංඥාවක් දෙනවා. ඔවුන් මේ විනිමය අවප්‍රමාණ වෙනකොට, ඔවුන්ගේ ආයෝජනය අහිමි වෙන ප්‍රතිලාභයට වඩා වැඩි ප්‍රතිලාභයක් ආයෝජනය කිරීමෙන් ලබා ගන්න පුළුවන් කියන සංඥාව තමයි ඒකෙන් ඉදිරිපත් කරන්නේ. ඒ නිසා කිසිදු ආකාරයකට කලබල වෙලා - panic වෙලා - තීන්දු තීරණ ගන්න එපා කියන කාරණයට හොඳම උදාහරණයක් තමයි මේ කොටස් වෙළෙඳ පොළේ තිබෙන්නේ. ඉතාම වැදගත් වෙන්නේ මේ මොහොතේදී මේ ස්ථාවරත්වය රැකීම සඳහා අපේ විදේශ අංශයේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ස්ථාවරත්වය පවත්වා ගෙන යැමයි. 2025දී මේ ස්ථාවරත්වය බිලියන 1.73ක් අපි අත්පත් කර ගත්තා. පළමුවෙනි මාස 4දීත් ක්‍රමිකව ධන අගයක් පවත්වා ගත්තා. ඔව්, අපි පිළිගන්නවා, මේ තිබෙන තත්ත්වයේ දී ජංගම ගිණුමේ යම් ඍණ ශේෂයක් ඉදිරි මාස කිහිපයේදී ලැබෙන්න පුළුවන් වෙයි. නමුත්, අපි මේ වර්ෂයේ දී කළමනාකරණය කරගෙන යනවා, කිසිදු ආකාරයක ගෙවුම් ශේෂ අර්බුදයකට යන්නේ නැතිවෙන්නත්, ආර්ථික අර්බුදයකට යන්නේ නැතිවෙන්නත්. ඒ නිසා මේ

මොහොතේදී පුරවැසියාගේ කාර්යභාරය වන්නේ, ඔබ හදා ගත්ත මේ ආණ්ඩුවේ කාර්යභාරය වෙන්නේ සමස්ත ආර්ථිකය ස්ථාවර කරලා ඉදිරියට යන ගමනේ දී සාමූහිකව තීන්දු තීරණ ගැනීමට, නිවැරදි තොරතුරු මත තීන්දු තීරණ ගැනීමට සහයෝගය ලබා දීම මිසක්, නොමඟ ගිහිල්ලා අනවශ්‍ය ආකාරයේ කලබලයක් රට ඇතුළේ නිර්මාණය කිරීම නොවෙයි කියන කාරණය කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මෙවැනි අර්බුදයකදී විශේෂයෙන්ම අපි හිතන්න ඕනෑ. අපට පාලනය කරන්න බැරි තත්ත්වයකදී අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා නම් රටක් විධියට අපි තීන්දු ගන්න ඕනෑ කොහොමද? සාමූහිකව. අපට විදේශ විනිමය පාලනය කරන්න ඕනෑ නම් ඒක ප්‍රමුඛතාගත කර ගන්න වෙනවා. එවැනි තත්ත්වයකදී ඒ තීන්දු තීරණ සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරද්දී ඒවාට සහයෝගය දෙනවා වෙනුවට, තම තමන්ට හිතුමතේ විවිධ දේවල් කිරීමත්, කඩාකප්පල් කිරීමට උත්සාහ දැරීමත් මම හිතන්නේ රටක් වශයෙන් ගත්තාම ඉතාම වැරදි තීන්දුවක්. මොන ආකාරයේ අභියෝග ආවත් - දේශීයව හෝ විදේශීය - අපට නොසැලී ඉදිරියට යන්න පුළුවන් මට්ටමට අපි ආර්ථිකය සවිමත් කරලා තිබෙනවා, තාක්ෂණය කැඳවලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය නිලධාරින් ඇතුළු සියලු කණ්ඩායම් මේ වෙනුවෙන් මැදිහත් වෙමින් වැඩ කටයුතු කරනවා. ඒ නිසා නියත වශයෙන්ම මේ අභියෝගයත් අපි කෙටි කාලයකදී ජයග්‍රහණය කරමින් අපේ ගමන් මාර්ගය ස්ථාවරත්වයෙන් ඔබ්බට අරගෙන ගිහිල්ලා සංවර්ධන ගමන් මාර්ගයට යනවාය කියන කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Mujibur Rahuman. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.30]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේ දී කිව්වා, "අර්බුදයක් නැහැ, ප්‍රශ්නයක් නැහැ, ඔක්කෝම හොඳට යනවා" කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අද වෙනකොට ඩොලරය නිල වශයෙන් බැලුවොත් රුපියල් 346කට, 348කට ඉහළ ගිහිල්ලා තිබෙනවා. එළියේ ඩොලර් එක යන්නේ රුපියල් 355කට. ඒ කියන්නේ ජනාධිපතිතුමාගේ කථා වාගේම ඩොලර් එකත් විටින් විට වෙනස් වෙනවා. ටක්, ටක් ගාලා වෙනස් වෙනවා, ඩොලර් එක. උදේ තිබෙන ගණන නොවෙයි, දවල් තිබෙන්නේ. බැංකුවෙන්, බැංකුවට ඩොලර් එක වෙනස් වෙනවා. DFCC එකේ එක ගණනක්, BOC එකේ එක ගණනක්, HNB එකේ එක ගණනක්. කොමර්ෂල් බැංකුවේ එක ගණනක්. ඒ සත 5න්, සත 10න් නොවෙයි. රුපියල් දෙක, තුනක වෙනසක් තිබෙනවා, පැයෙන් පැයට. ඉතින් එතුමා කියනවා, අර්බුදයක් නැහැ කියලා. අර්බුදයක් තිබෙනවා. මාර්කට් එකේ ඩොලර් නැහැ. ඒකයි ඩොලර් එක වැඩි වෙන්නේ. ඔබතුමා කියනවා අර්බුදයක් නැහැ කියලා. දැන් ආනයන භාණ්ඩ ඔක්කෝම මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. දැන් කිරිපිටි කිලෝවක් රුපියල් 125කින් වැඩි කළා. දැන් කිරිපිටි කිලෝවක් කීයද? රුපියල් 3,000යි. ග්‍රෑම් 400 වැඩි කළා රුපියල් 50කින්. දැන් ආනයන භාණ්ඩ හැම එකක්ම ඉහළ ගිහිල්ලා, උද්ධමනය වැඩි වෙලා මිනිස්සුන්ට අද ජීවත් වෙන්න බැහැ. නමුත් එතුමා කියනවා අර්බුදයක් නැහැ කියලා. අර්බුදය නැත්තේ මොකද? පාරට බැහැලා බැලුවා නම් අර්බුදය පෙනෙනවා. එතුමන්ලා ඉස්සර බලයේ හිටපු අයට නම් කිව්වා, සීතල කාමරවල ඉන්නවා කියලා. ඒ සීතල කාමරවල හිටපු අයත් මේ වාගේ බරක් දැම්මේ නැහැ. සීතල කාමරේ නොවෙයි ඔබතුමන්ලා ඉන්නේ අහහරු ලෝකේ. ඒ නිසා අපි කියනවා අහහරු ලෝකෙන් බැහැලා තත්ත්වය මොකක්ද කියලා බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් වාහන ගැන කිව්වා. මැයි මාසයේ 16වන දා ජනාධිපතිතුමා රෙගුලාසියක් ගහනවා වාහන ගෙනෙන එකට අධිභාරයක් ගහලා. මැයි 15වන දා වාහන 1,782කට LCs open කරලා තිබෙනවා. ඒකයි අපි කිව්වේ. එක දවසකට වාහන 1,782ක්! ජනාධිපතිතුමා පසුගිය 16වන දා - සෙනසුරාදා - ගැසට් එක ගහනකොට, සිකුරාදා කොහොමද වාහන 1,782කට LCs open වෙන්නේ? කාගේද ඒ bulk වාහන? ඒවා brand new වාහන. කාගේ ඒවාද? ජනාධිපතිතුමාගේ "Rebuilding Sri Lanka" එකේ ඉන්න ක්‍රිෂාන් බාලේන්ද්‍රගෙයි, ජනාධිපතිතුමාගේ දකුණු අත වන ධම්මික පෙරේරාගෙයි, ඉෂාර නානායක්කාරගෙයි වාහන.

කොහොමද ඒ news එක ගියේ? ඒක වංචාවක් නොවෙයිද? ඒක ප්‍රෝඩාවක් නොවෙයිද? ඒගොල්ලන් කොහොමද දැන ගත්තේ ජනාධිපතිතුමා සෙනසුරාදා ගැසට් එක ගහනවා කියලා. මේවාත් සංවිධානාත්මක අපරාධ. මේවාටත් කියන්නේ organized crimes කියලා. ජනාධිපතිතුමා ගැසට් එක ගහන්න කලින් එයාගේ වටේ ඉන්න කාර් සේල්කාරයෝ ටික ගිහිල්ලා LCs open කරනවා. මේ ඇමතිතුමා කිව්වේ බොරු. 4,000ක් නැහැ කිව්වා. මැයි මාසයේ අන්තිම සතිය අරගෙන බලන්න, වාහන 4,000කට LCs open කරලා තිබෙනවා. ඉතින් මොකක්ද නැහැ කියලා කියන්නේ? අනෙක් එක, මේවා brand new වාහන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහන සම්බන්ධ නීතියක් ගන්නවා නම් හැම කෙනාටම බලපාන විධියට ඒ නීතිය ගන්න ඕනෑ. දැන් used වාහන ගෙන්වන කට්ටියට මොකද වෙලා තිබෙන්නේ? ඒගොල්ලන්ට ගේන්න බැහැ. ඒගොල්ලන් LC open කරලා chassis number එක වැරදි නම් වාහනය ගෙනෙන්න බැහැ. ජෝන් කීල්ස්ලටයි, ධම්මික පෙරේරාටයි, ඉෂාර නානායක්කාරලාටයි ඒ නීතිය නැහැ. ජනාධිපතිතුමා කියනවා, නීතිය හැමදෙනාටම එකයි කියලා. නමුත් ධම්මිකට, ක්‍රිෂාන් බාලේන්ද්‍රන්ට, ඉෂාර නානායක්කාරට එක නීතියක්. මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න කඩේ ගිය කාර් සේල්කාරයන්ට තව නීතියක්. ජනාධිපතිතුමාට කඩේ ගිය කට්ටියට තමයි ගහන්නේ. ඒගොල්ලන්ට එක නීතියක්. නීතිය එක නම් ඔක්කෝටම එක වෙන්න ඕනෑ. ඔය ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඉන්නකොට හැම දාම කිව්වා, "ගජමිතුරු ආර්ථිකය" කියලා. අනුර කුමාර

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

දිසානායක හදන්නේත් ගජමිතුරු ආර්ථිකයක්. එයාගේ වටේ ඉන්න කට්ටියට හම්බ කරන්න පුළුවන් නීති-රීති ගෙනැල්ලා ඒගොල්ලන්ට ඕනෑ විධියට හම්බ කරන්න ඉඩ දීලා තිබෙනවා. ඒකට තමයි ගජමිතුරු ආර්ථිකය කියන්නේ. අනුර ඇවිල්ලා කියන්නේත් ඒක තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමා ඊයේ පෙරේදා දවසක ඇවිල්ලා කිව්වා, ජීවත් වෙන්න රුපියල් 16,571ක් යනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 16,571යි කියන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව දරිද්‍රතා රේඛාවේ අන්තිම කොනේ ඉන්න කෙනාට යන මුදල. ලෙඩ ඇඳේ ඉන්න මිනිස්සු ඉන්නවා නේ. ඒ ඇඳේ ඉන්න මිනිහාට කැලරි ටිකක් දෙන්න තමයි රුපියල් 16,571ක් වැය වෙන්නේ, මැරෙන්නේ නැතුව ඉන්න. නැතුව සාමාන්‍ය මිනිහෙකුට නොවෙයි. ලෝක බැංකුව මොකක්ද කියන්නේ? ලෝක බැංකුව කියනවා, දරිද්‍රතා රේඛාව අවසන් වෙන්නේ ඩොලර් 4.65කින් කියලා. ලෝක බැංකුවට අනුව අපි බැලුවොත්, මාසයකට අවශ්‍ය වෙනවා, රුපියල් 40,950ක්. සාමාන්‍ය මිනිහෙකුට ජීවත් වෙන්න රුපියල් 40,950ක් ඕනෑ. එතුමා රූපවාහිනියටත් ඇවිල්ලා කියනවා, 16,571යි අවශ්‍ය කියලා. මම දන්නේ නැහැ, එතුමාගේ කෝට් එකයි, ටයි එකයි dry clean කරන්න කීයක් යනවාද කියලා. ඒවා කරලා පුළුවන්ද රුපියල් 16,571කින් ජීවත් වෙන්න?

දැන් ප්ලේන්ටී එකක් කීයද? ප්ලේන්ටී එකක් රුපියල් 50යි. සීනි නැතුව බොනවා නම් 30යි. උදේට බත් පීරිසියකට හාල්මැස්සෝ ටිකයි, පරිප්පු ටිකයි අරගෙන කෑවාම රුපියල් 150ක් යනවා. ඒ කාලාත් මදි. ඊට පස්සේ ලොකු අශෝක ග්ලාස් එකෙන් වතුර එකක් බිව්වොත් තමයි බඩ පිරෙන්නේ. සිගරැට් එකක් බොන මිනිහෙක් නම්, රුපියල් 160ක් ඕනෑ. ඔයගොල්ලන් වාගේ ගමේ බුලත්විට කනවා නම්, බුලත් විටක් රුපියල් 70යි. අපි 16,571 දින 30න් බෙදුවාම දවසකට රුපියල් 550ක් ඕනෑ. රුපියල් 550න් මිනිහෙකුට තුන් වේල කන්න පුළුවන්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? බැහැ නේ. ඔබතුමා හිනා වෙනවා. ඉතින් මොකක්ද මේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමා කියන්නේ? පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමා අහපු වෙලාවේ උත්තරයක් දෙනවා, රුපියල් 16,571න් ජීවත් වෙන්න පුළුවන් කියලා. දවල් කෑම එකක් ගත්තොත්, එළවලු කෑම එකක් රුපියල් 280යි. මාලු කෑම එකක සාමාන්‍ය ගණන රුපියල් 400යි. කුකුළු මස් කෑම එකක් ගත්තොත් රුපියල් 500යි. ඔබතුමා රැවුලයි, කොණ්ඩයයි කපන්න ගියොත් රුපියල් දාහක් ගන්නවා. රැවුල කපන්න රුපියල් 500යි, කොණ්ඩය කපන්න රුපියල් 700යි. ඇයි ඒ? පසුගිය සතියේ electricity bill එක වැඩි කළා, units 180ට වැඩි නම්. දැන් බාබර් සාප්පුවල electricity bill එකත් වැඩි වෙලා තිබෙන්නේ. එතකොට දැන් රුපියල් 500න් ජීවත් වෙන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපට පෙනෙනවා මිනිස්සුන්ට අද වනකොට ජීවත් වෙන්න බැහැ කියලා. ලෝක බැංකුවේ නිර්ණායක අනුව හතර දෙනෙක් ඉන්න පවුලකට රුපියල් 163,000ක් ඕනෑ. අද වෙනකොට හැම දෙයක්ම වැඩි වෙලා තිබෙන්නේ. ඩොලර් එක වැඩි වීම උඩ අත්‍යවශ්‍ය භාණ්ඩ හැම එකකම මිල වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට කියනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී තිබෙනවා කියලා. ප්‍රාථමික Account එක plus වෙලා තිබෙනවා කියනවා. එහෙම නම් සහන දෙන්නකෝ. සහන නොදී ඉන්නේ ඇයි? මිනිස්සු දැන් අමාරුවෙන් ජීවත් වෙන්නේ. කිරි පිටි කිලෝග්‍රෑම් එකේ පැකට් එක දැන් රුපියල් 3,000 දක්වා වැඩිවෙලා තිබෙනවා. ළමයින්ට දෙන කිරි පිටි සඳහා දැන් සහන දෙන්න පුළුවන් නේ. නමුත්, එහෙම සහන දෙන්නේ නැහැ.

ඊළඟට, තමුන්නාන්සේලා ඡන්දය කාලයේ කියපු ඩොලර් පිළිබඳ කථාවත් අපට මතකයි. කවුද ඒක කිව්වේ? ඔබතුමන්ලාගේ ආධ්‍යාත්මික නායකතුමා, ටිල්වින් සිල්වා මහත්මයා කිව්වේ කොහොමද? "අපට කිසි ප්‍රශ්නයක් නැහැ. ලෝකය පුරාම අපේ පක්ෂයට සම්බන්ධ යන්ත්‍රණයක් තිබෙනවා. අපේ රටට ඩොලර් අර්බුදයක් ආවොත්, ඒ පිළිබඳව අපේ සාමාජිකයන්ට කියපු ගමන් ඒ ඔක්කෝම අය ඩොලර් එවනවා" කිව්වා. දැන් ඒ යන්ත්‍රණය කෝ? මලකඩ කාලාද? දැන් කියන්නකෝ ඩොලර් එවන්න කියලා. දැන් ඇමෙරිකානු ඩොලර් එක රුපියල් 355යි. මේ සතියේ විතරක් සියයට 20කින් වැඩිවෙලා. අද උදේ තිබෙන ගණන නොවෙයි, දවල් වෙනකොට තිබෙන්නේ. ත්‍රී-වීලර්වල මීටරය - ටැක්සි මීටරය - වැඩිවෙනවා වාගේ විනාඩියෙන් විනාඩිය ඩොලරයේ මිල වැඩි වෙනවා. දැන් මේ මගේ කථාව පටන් ගන්නකොට ඩොලරය තිබුණේ රුපියල් 355ට. කථාව ඉවර වෙනකොට ඩොලරය රුපියල් 365ක් වේවි. ඔබතුමන්ලාගේ පක්ෂයේ ලේකම්තුමාට කියන්න, එතුමාගේ යන්ත්‍රණය කරකවලා දැන් මේ රටට ඩොලර් එවන ලෙස ලෝකය පුරාම සිටින ඔබතුමන්ලාගේ සාමාජිකයන්ට කියන්න කියලා. මොකද, මිනිස්සු ඒවා විශ්වාස කරලා තමයි ඡන්දය දුන්නේ. මිනිස්සු තමුන්නාන්සේලාගේ කථා විශ්වාස කළා.

ඊළඟට, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කිව්වා, මේ ආණ්ඩුව ආවාම ඩොලර් මිලියනයක් දෙනවා කියලා එතුමාගේ telephone එකට නොදන්නා අංකයකින් පණිවුඩයක් ආවා කියලා. ඒ ඩොලර් මිලියනය ආවාද කියලා අපි අහන්න කැමැතියි. ඒ ඩොලර් මිලියනය ආවාද? එහෙම නැත්නම්, ඒ ඩොලර් මිලියනය ආවාට පස්සේ පැලවත්තේ හැකර්ලා ඒ සල්ලි hack කළාද කියලා කියන්න. ඒ ඩොලර් මිලියනය කාගේ account එකටද ගියේ? ඒ සල්ලි පැලවත්තෙන් hack කරලාද? ඒ ගැන කියන්න. මේ, ඔබතුමන්ලා ඡන්ද වේදිකාවල කියපු දේවල්. නොදන්නා කට්ටිය telephone එකෙන් කථා කරලා කියලා තිබුණා නේ, "අපි ඩොලර් එවන්නම්, ඔබතුමන්ලා ආණ්ඩුව ගන්න" කියලා. මේ වෙනකොට ආණ්ඩුව අරගෙන අවුරුදු එකහමාරක් ගතවෙලා තිබෙනවා. එවනවා කියපු ඒ ඩොලර් ටික කෝ කියලා ජනතාව දැන් බලාගෙන ඉන්නවා. ඒ ඩොලර් ටික ආවාද, ඒවා කාගේ accountsවලටද ගියේ කියලා දැන් ඒ ජනතාව අහනවා. නමුත්, ඒවා එන්නේ නැහැ, තිබෙන ඩොලර් ටික හොරකම් කරගෙන වෙන වෙන accountsවලට යවනවා. එහෙම නේද?

ඉස්සර තමුන්නාන්සේලා ඒ ආණ්ඩුවෙන් ඇහුවා, "උගන්ඩාවේ තිබෙන තමුන්නාන්සේලාගේ සල්ලි ගේන්නද, එපාද?" කියලා. දැන් අපට අහන්න තිබෙන්නේ මොකක්ද? " ඕස්ට්‍රේලියාවේ තිබෙන තමුන්නාන්සේලාගේ සල්ලි ගේන්නද, එපාද?" කියලා තමයි දැන් අපට අහන්න තිබෙන්නේ. අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආර්ථිකය ක්‍රමක්‍රමයෙන් නරක අතට ගමන් කරමින් තිබෙනවා. ඒක පිළිගන්න. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කියනවා වාගේ දේවල්ම තමයි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ බැසිල් රාජපක්ෂ මහත්මයාත් මේ සභාවට ඇවිල්ලා කිව්වේ. ඔකම තමයි කිව්වේ. කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා. ශත 5කට ගණන් ගත්තේ නැහැ. ඔකම තමයි කිව්වේ. පරණ හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න, 2022 වර්ෂයේ බැසිල් රාජපක්ෂ මහත්මයා මුදල් ඇමතිවරයා හැටියට කරපු කථා ටික. ඔය විධියටම තමයි කිව්වේ. පට්ට පල් බොරු ටිකක් කිව්වා. අන්තිමට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

යනකල් දන්නේ නැහැ. ඔක්කෝටම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අනුර කුමාරට ඡන්දය දුන් අයටත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක තමයි වෙන්නේ. ඒ නිසා තමයි අපි මේවා කියන්නේ. ඔබතුමන්ලාට විතරක් නොවෙයි අපටත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක නිසා තමයි අපි කියන්නේ, මේ ප්‍රශ්නය ඉතාම බැරෑරුම් ලෙස සලකන්න කියලා.

අපි දන්නවා, මහ බැංකුව දැන් ඩොලර් release කරන්නේ නැති බව. ඒ නිසා දැන් මාර්කට් එකේ ඩොලර් හිඟයක් තිබෙනවා. ඒකයි ඩොලර් එක මේ විධියට ඉහළට යන්නේ. මහ බැංකුව ඒක කරන්නේ නැත්තේ තමුන්නාන්සේලා IMF එකට එකඟ වුණු කොන්දේසි අනුව දැනට තිබෙන ඩොලර් ටික release කර ගන්න බැරි නිසා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා අද අපි හිතනවාට වැඩිය ආර්ථිකය ක්‍රමක්‍රමයෙන්, ක්‍රමක්‍රමයෙන් නරක අතට ගමන් කරමින් තිබෙනවාය කියන එක අපි කියන්න ඕනෑ. අද වෙනකොට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල දවස ගණනේ ඉතා ශීඝ්‍රයෙන් වැඩි වීගෙන යනවා. ඒ තත්ත්වය පාලනය කරන්න බැරිවෙලා තිබෙනවා. සහල් මිල වෙන්න පුළුවන්, හැම භාණ්ඩයකම මිල ඉහළ යනවා. ඒක පාලනය කර ගන්න බැහැ. එසේ පාලනය කර ගන්න බැරි වීමේ ප්‍රතිඵලය ඉතාම ඉදිරියේදී අපි සියලුදෙනාටම භයානක වෙන්න පුළුවන්. මේ පිළිබඳව ආණ්ඩුව දැනුවත් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Kumara Gamage. You have 12 minutes.

[පූ.භා. 11.41]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතට අදාළ රෙගුලාසි කිහිපයක් සම්බන්ධයෙනුත් අද අපි සාකච්ඡා කරනවා. ආනයන සහ අපනයන අපට මොන තරම් වැදගත් වෙනවාද කියන කාරණය සම්බන්ධව තමයි අද දවසේ අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ඊට ඉස්සෙල්ලා මේ කාරණයත් මම මතක් කරන්නට ඕනෑ. අපි ආණ්ඩුව ගන්න ඉස්සෙල්ලා අපේ රටේ ආර්ථිකය තිබුණේ කොතැනද කියන කාරණය මම මතක් කරන්නම්. මේක අපි හැම දාම කියනවා; හැම තිස්සේම කියනවා. මේක මතක් කරන්නේ නැතිව ගියාම තමයි මේ කැගහන අවුල හැදෙන්නේ. අපි දන්නවා, අපි මේ රට භාර ගන්නකොට ආර්ථිකය හකුළවලායි තිබුණේ කියන එක. ආර්ථිකය හකුළවලා දීර්ඝ කාලයක් ගෙනියන්න බැහැ. හැබැයි, කෙටි කාලයකට පුළුවන්. හකුළපු ආර්ථිකයේ ප්‍රතිඵල ඊට පස්සේ එන කට්ටියට භුක්ති විඳින්න වෙනවා. මම උදාහරණයක් කියන්නම්. අපි ආණ්ඩුව ගන්නකොට අපේ රටේ වාහන ආනයනය සම්පූර්ණයෙන් නවත්වලායි තිබුණේ කියන එක මෙතැන සිටින විදේශ විනිමය ගැන කැගහන කට්ටියත් දන්නවා. ඒවාගේම සමහර ආනයන භාණ්ඩත් ඒ වෙනකොට නවත්වලායි තිබුණේ. ණය ගෙවන එක සම්පූර්ණයෙන් නවත්වලා තිබුණා, යම් කිසි කොන්දේසි කිහිපයකට යටත්ව. සරලව කිව්වොත්, ණය ගෙවන එක නවත්වලා තිබුණා. ආනයන සීමා කරලා, ණය ගෙවන එක නවත්වලා, "අපි බංකොලොත්. අපට ගෙවාගන්න බැහැ" කියලා ඉතිරි කරගත්ත ඩොලර් ටිකෙන් තමයි අපේ ආර්ථිකය අරගෙන ගියේ. එහෙම තමයි ඒ ආර්ථිකය අරගෙන ගියේ. අපි ආවාට පස්සේ මේ කථාව සම්පූර්ණයෙන් වෙනස් කරලා අපි ණය ගෙවන්න පටන් ගත්තා. අපි වාහන ආනයනය කරන්න පටන් ගත්තා. සීමා පනවලා තිබුණු ආනයන භාණ්ඩ නැවත ආනයනය කරන්න පටන් ගත්තා. ආර්ථික කළමනාකරණය ගැන දන්න "මාර පොරවල්" කියලා කියපු අය කළේ, අපේ රටේ ආර්ථිකය හකුළවපු එකයි. අපි ඇවිල්ලා හකුළවපු ආර්ථිකය දිග හැරලා ආර්ථිකය ස්ථාවර කළා. ආර්ථිකය ස්ථාවර කරපු එක සම්බන්ධයෙන් තිබෙන සංඛ්‍යා දත්ත අපි පසුගිය අවුරුද්ද ඇතුළත මේ සභාවේ ඕනෑ තරම් කියලා තිබෙනවා; ඒවා සභාගත කරලා තිබෙනවා. ඒක නිසා මම ආර්ථිකය ස්ථාවර කිරීම ගැන මෙතැන සාකච්ඡා කරන්නේ නැහැ. මොකද, විදේශ රටවල්, ජාත්‍යන්තර ආයතන පවා පිළිගන්නවා, මේ අවුරුද්ද ඇතුළේ අපි අර බංකොලොත් ආර්ථිකය ස්ථාවර කළා කියන එක. අපි හැමෝම එය දන්නවා. හැබැයි, විපක්ෂයේ කට්ටියට මේක චුට්ටක් තේරෙන්නේ නැහැ. එක්කෝ තේරෙනවා, තේරුම් ගන්නේ නැහැ. නැත්නම් තේරෙන එක කියන්නේ නැහැ. නැත්නම් තේරෙන්නේ නැහැ.

දැන් මෙතැන කැගහනවා, ඩොලර් එක කීයද කියලා අහමින්. රුපියල් 340යි කියනවා, රුපියල් 330යි කියනවා. දැන් ඩොලර් එකේ ඉහළ පහළ යාම ගැන තමයි මෙතැන දිගටම සාකච්ඡා වෙන්නේ. ඩොලර් එක ඉහළ පහළ යෑම, විදේශ විනිමය උච්චාවචනය වීම ආර්ථික අර්බුදයක් කියලා විග්‍රහ කරගෙනත් යනවා. අපි ඒක තමයි කලින් කථාවෙත් දැක්කේ. දැන් ඩොලර් එක උච්චාවචනය වෙනවා. ඒක ආර්ථික අර්බුදය. අපි මෙතැන කථා කරන්න ඕනෑ ආර්ථික අර්බුදයක් කියන්නේ මොකක්ද, ආර්ථික අර්බුදයක් එන්නේ කොහොමද, ඩොලරය හිටිය ගමන් තාවකාලිකව ඉහළ පහළ යන එක ආර්ථික අර්බුදයක්ද කියන කාරණා ගැනයි. මේ සාකච්ඡාව අපට හරි වැදගත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මේ පාර්ලිමේන්තුව නොමඟ යවන්න කරන කථා, ජනතාව නොමඟ යවන්න කරන කථා අපට සැහෙන්න ඇහෙන නිසා.

දැන් අපි බලමු, ඩොලරය ඉහළ පහළ යන්නේ ඇයි කියලා. අපි දන්නවා, ඕනෑම රටක විදේශ විනිමය අනුපාතය තීරණය වෙන්නේ ඒ රටේ විදේශ විනිමයට තිබෙන ඉල්ලුම සහ සැපයුම අනුව බව. යම් කිසි වෙලාවක, හිටි ගමන් ඉල්ලුමේ සාධකය වෙනස් වෙන්න පුළුවන්. ඩොලරය ගත්තොත්, ඩොලරයේ ඉල්ලුම එක වෙලාවක වැඩි වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සැපයුම වැඩි වෙන්න පුළුවන්. මේ කාරණා දෙක මත තමයි ඒ විනිමය අනුපාතය තීරණය වෙන්නේ. අද දවසේ අපේ රටේ ඩොලර් එක

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

තීරණය වෙන්නේ කොහොමද? අපට භාණ්ඩ ආනයනය කරන්න ඩොලර් ඕනෑ. එතකොට ඩොලර් එළියට යනවා. අපි අපනයන කළාම අපට ඩොලර් ලැබෙනවා. ඒවාගේම සංචාරක ව්‍යාපාරයෙන්, විදේශ ප්‍රේෂණ ආදියෙන් අපට ඩොලර් ලැබෙනවා. මෙන්න මේ ලැබීම සහ ගෙවීම, එහෙම නැත්නම් ඉල්ලුම සහ සැපයුම මත තමයි ඩොලරයේ මේ කෙටි කාලීන වෙනස ඇති වෙලා තිබෙන්නේ. මේක ආර්ථික අර්බුදයක්ද? අපෙන් බාහිරව යුද්ධයක් තිබෙනවා කියලා විපක්ෂයට අමතකයි. විපක්ෂයට මතක් වෙන්නේ ඩොලර් එක අඩු වැඩි වෙන එක විතරයි. එතැනින් එහා මොකක්වත් මතක නැහැ. යුද්ධය ගැන අදහසක් නැහැ. එහෙම යුද්ධයක් තිබෙනවාද කියලා දන්නෙත් නැහැ වාගේ තමයි මෙතැන කථා කරන්නේ. එතකොට, "දිට්වා" සුළි කුණාටුව ආපු එක අදාළම නැහැ; මතක නැහැ. දැන් ආපු ගමන් ඩොලර් එක, ඩොලර් එක, ඩොලර් එක කියලා කෑ ගහනවා. ඛනිජ තෙල් ආනයනයට යන වියදම ජනවාරිවල ඉඳලා මේ වනකොට ගත්තොත්, තිබුණාට වඩා පස් ගුණයකින් වැඩිවෙලා තිබෙනවා. එතකොට අපට ඒ සඳහා ඩොලර් ඕනෑ වනවා. ඒක අපට වළක්වන්න පුළුවන්ද? ඒ සඳහා ඩොලර් ඕනෑ වනකොට අන්න ඩොලර් ඉල්ලුම ඉහළ යනවා. මේ වන විට ලෝකයේ යුදමය තත්ත්වයක් තිබෙනවා; තෙල් සම්බන්ධයෙන් ලෝක ආර්ථිකයේ වෙනම ප්‍රශ්නයක් තිබෙනවා; ඒකත් එක්ක තෙල් මිල ඉහළ යනවා; ඒක අපට කළමනාකරණය කරගන්න බැරි වෙනවා; ඒ නිසා ඩොලරයේ අගය ඉහළ යනවා කියන කාරණය විපක්ෂය හංගනවා. එතුමන්ලාට පෙන්වන්න ඕනෑකම තිබෙන්නේ ඩොලර් එකේ අගය ඉහළ යනවා, එතකොට මේක ආර්ථික අර්බුදයක් බවට පත් වනවා කියලායි. එහෙම හිතාගෙන තමයි විපක්ෂය දැන් කථා කරන්නේ.

දැන් අපි බලමු, ආර්ථික අර්බුදයක් ඇති වෙන්නේ කොහොමද, දැන් තිබෙන තත්ත්වය ආර්ථික අර්බුදයක් ද කියලා. මොකද, අපේ ඇමතිතුමා සාකච්ඡාවේදීත් කිව්වේ, විනිමය අනුපාත සම්බන්ධයෙන් අර්බුදයක් තිබෙනවා, ඒ අර්බුදය අපි කළමනාකරණය කර ගනිමින් යනවා කියලායි. හැබැයි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ඒක ඇහෙන්නේ, ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලායි. එහෙම තමයි මේක විග්‍රහ වෙන්නේ. මම දන්නේ නැහැ, ඒක ඇහෙන විධියේ ප්‍රශ්නයක් ද, නැත්නම් තේරෙන්නේ නැති එකේ ප්‍රශ්නයක් ද කියලා.

ආර්ථික අර්බුදයක් කියන්නේ මොකක්ද? දැන් අපේ රටේ තිබෙන්නේ ආර්ථික අර්බුදයක් ද - economic crisis එකක්ද - ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ වෙලාවේ විදේශ විනිමය අර්බුදයක් තිබෙනවා කියන එක අපි පිළිගන්නවා. අපි ඒක කළමනාකරණය කරමින් ඉන්නවා. ඒක අපෙන් එළියේ තිබෙන ප්‍රශ්නයක්. මේ වන විට අපේ ආනයන වියදම වැඩි වෙලා තිබෙනවා. ඒවා අපි දන්නවා. හැබැයි, මේක ආර්ථික අර්බුදයක් වෙන්නේ කොහොමද?

අපි දන්නවා, රටකට ආර්ථික අර්බුදයක් එන්න නම් ලක්ෂණ කිහිපයක් තිබෙන්න ඕනෑ බව. මම ගොඩක් කියන්නේ නැහැ, එයින් එකක්, දෙකක් කියන්නම්. එහෙම වෙන්න නම් රැකියා වියුක්තිය - unemployment - ඉහළ යන්න ඕනෑ; මිනිස්සුන්ට රැකියා නැති වෙන්න ඕනෑ. අපි පසුගිය අවුරුද්දේ අපේ රට ස්ථාවර කරලා, ආර්ථිකය කළමනාකරණය කරලා, අපේ රටේ සේවා වියුක්ති අනුපාතය 3.9ට අඩු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2019දී unemployment rate එක සියයට 4.8යි; 2020දී සියයට 5.5යි; 2021දී සියයට 5.1යි. හැබැයි, 2025 වනකොට මේක සියයට 3.9ට අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ, දැන් මේකෙන් ආර්ථික අර්බුදයක ලක්ෂණ පෙනෙනවාද? Unemployment rate එක ඉහළ ගිහින් තිබෙනවාද? ඒකෙන් අපට තේරෙන කථාව තමයි, රටේ නිෂ්පාදනය වැඩි වෙනවා, ව්‍යාපාර වර්ධනය වෙනවා, එතකොට unemployment rate එක අඩු වෙනවා කියන එක. තව කාරණයක් තමයි, business closing කියන එක. ආර්ථික අර්බුදයක් තිබෙනවා නම් ව්‍යාපාර කඩා වැටෙනවා; business වැහෙනවා; මිනිස්සුන්ට රස්සා නැති වෙනවා. දැන් අපේ රටේ business වැහීගෙන යනවාද? 2022දී නම් අපි එහෙම තත්ත්වයක් දැක්කා. 2022දී කර්මාන්තශාලා වැහුණා; ව්‍යාපාර වැහුණා; රස්සා නැතිවුණා. ඒවා අපි දැක්කා. හැබැයි, දැන් එහෙම වෙලා තිබෙනවාද? දැන් ව්‍යාපාර වැහෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට අපේ රටේ GDP එක වැඩි වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට අපි GDP per capita income එක ඇමෙරිකානු ඩොලර් 5,000 ඉක්මවා ගිහින් තිබෙනවා. දැන් අපේ ආර්ථිකයේ වර්ධනයක් තිබෙනවා. දැන් අපේ රටේ ව්‍යාපාර වැහෙනවාද? ව්‍යාපාර කඩා වැටෙනවාද? නිෂ්පාදනය කඩා වැටිලාද? ආර්ථික අර්බුදයක් කියන්නේ මොකක්ද කියලා දන්නේ නැතිව, බාහිර සාධකයක් නිසා ඩොලරයේ අගය ඉහළ පහළ යනකොට මෙතැනට ප්‍රශ්නයක් උස්සාගෙන එනවා, "අපට ආර්ථික අර්බුදයක්, දැන් මාර ප්‍රශ්නයක්, මැයි වෙනකොට ආණ්ඩුව ඉවරයි, ඊළඟ මාසයේ ඉවරයි" කියලා. මේ වාගේ හීන දැක දැක ඉන්න පුළුවන්. හීන දකින්න මිනිස්සුන්ට අයිතියක් තිබෙනවා. හැබැයි, ඒ හීන යථාර්ථයක් වෙනවාද, නැද්ද කියන එක තමයි අපට බලන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මේ අර්බුදයට බලපාන කාරණා අතර අපි කිව්වා වාගේ අභ්‍යන්තර සාධක සහ බාහිර සාධක කියා කාරණා දෙකක් තිබෙනවා. මේක බාහිර සාධකයක්. බාහිර සාධකයක් අපට ඒ විධියටම කළමනාකරණය කරන්න බැහැ. යුද්ධය අපේ එකක් නොවෙයි. ඒ තුළ තමයි මේ විදේශ විනිමය ප්‍රශ්නය අපට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, අපි ඒවාට දීර්ඝ කාලීන විසඳුම් හොයන්න ඕනෑ. ඩොලර් ප්‍රශ්නයට උත්තර හොයන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විදේශ වෙළෙඳාම ගත්තාම, භාණ්ඩ සංකේන්ද්‍රණයක් තිබෙනවා. අපේ වෙළෙඳ පොළ සංකේන්ද්‍රණයක් තිබෙනවා. අපි අපනයන භාණ්ඩ වර්ග එකකට දෙකකට විශාල ලෙස කොටු වෙලා තිබෙනවා. වෙළෙඳ පොළ එකකට දෙකකට අපි සීමා වෙලා තිබෙනවා. ඒ නිසා අපේ විදේශ වෙළෙඳාමේ, අපනයන වෙළෙඳාමේ ප්‍රශ්න තිබෙනවා. ඒවා බේරාගෙන තමයි අපට විදේශ විනිමය ප්‍රශ්නය බේරා ගන්න වෙන්නේ. උදාහරණයක් විධියට කිව්වොත්, රෙදිපිළි හා ඇඟලුම් අපනයනය අපේ භාණ්ඩ අපනයනයෙන් සියයට 39ක්. ඒ ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් කර ගන්නේ නැතුව, අලුත් වෙළෙඳ පොළ හොයා ගන්නේ නැතුව, අලුත් නිෂ්පාදනවලට යන්නේ නැතුව මේ වාගේ අර්බුදයකදී අපට අපේ විදේශ ආදායම, ඩොලර් ආදායම එක සැරේ කළමනාකරණය කරන්න බැහැ. ඒ නිසා කෙටි කාලීනව මේ අර්බුදය කළමනාකරණය කරන්න උත්සාහ ගන්නා ගමන් මේ සඳහා අපි දිගු කාලීන විසඳුම් හොයන්න ඕනෑ, ඒ සඳහා මේ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Kumara Gamage, your time is up.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ඉතින් මේ මොහොතේ ඇතිවෙලා තිබෙන මේ තත්ත්වය, විශේෂයෙන්ම යුද්මය තත්ත්වය අපේ රටේ ජනතාවට තේරෙනවා. ඒ තත්ත්වය තේරුම් අරගෙන, මේ විනිමය අනුපාතවල සිද්ධ වන කෙටි කාලීන වෙනස්කම් අපි කළමනාකරණය කර ගනිමු. ඒ වාගේම අපේ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් කරලා, අපේ රටේ ආර්ථික සංවර්ධනය අත්පත් කර ගන්න අපේ රජය මැදිහත් වෙනවා; ඒ වෙනුවෙන් අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Sajith Premadasa, Leader of the Opposition. You have eight minutes.

[පූ.භා. 11.54]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු ඇමතිතුමා ඇහුවා, රස්සා නැති වෙන්නේ කොහේද කියලා. ඒ ගැන පොඩ්ඩක් අහන්න, හයිඩ්‍රාමනී එකෙන්, බ්‍රැන්ඩික්ස් එකෙන් සහ මාස් හෝල්ඩින්ස් එකෙන්. එදා ඇඟලුම් කම්හල් 200 වැඩසටහන යටතේ විවෘත වුණු කර්මාන්තශාලා වහලා, ඒවා පිට රට ගිහිල්ලා ස්ථාපනය කරනවා. මම කනගාටු වෙනවා, මුදල් නියෝජ්‍ය ඇමතිවරයාවත් මේ අවස්ථාවේදී ගරු සභාවේ නොසිටීම ගැන.

මම කැමැතියි, මේ අවස්ථාවේදී වැදගත් යෝජනාවක් කරන්න. කරුණාකරලා ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය වහාම ක්‍රියාත්මක වන පරිදි අනුප්‍රාප්තික වැඩසටහනකට - IMF successor programme එකකට - යොමු වෙන්න. මම පෙන්වා දෙන්නම්, අද මේ රුපියල අවප්‍රමාණය වීමත් සමඟ අපේ රටට දැවැන්ත අභියෝග රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ ඇයි කියන කාරණය පිළිබඳව. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ, IMF වැඩසටහන 2027 මාර්තු මාසය වනවිට අවසන් වෙනවාය කියලා. එතකොට අපට ලැබෙන විස්තීර්ණ අරමුදල් පහසුකම - Extended Fund Facility එක - ඉවත් වනවා. IMF target එක තමයි, අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 14.2ක විදේශ සංචිත පවත්වාගෙන යන්න ඕනෑ කියන එක. හැබැයි, අද වෙනකොට තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7යි. ඒ කියන්නේ, සියයට 50යි. මේ වාගේ තත්ත්වයක් තුළ ඒක අපි ගණිතමය පැත්තෙන් බැලුවොත් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 14 ලබා ගැනීමේ chance එක තිබෙන්නේ සියයට 0.001යි. ඒ නිසා අන්තිම මොහොතේ රට අමාරුවේ වැටුණාට පස්සේ IMF එකට ගිහිල්ලා රටට අහිතකර ගිවිසුමකට ප්‍රවේශ වෙනවා වෙනුවට දැන්මම අනුප්‍රාප්තික වැඩසටහනක් - successor programme එකක් - ක්‍රියාත්මක කරන්න. මොකද, කනගාටුයි කියන්න, 2028 අවුරුද්දේ ඉඳලා අපට දැන් ගෙවන පොලියට අමතරව ප්‍රාග්ධනයත් ගෙවන්න සිද්ධ වෙනවා; ණය කන්දකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා; ණය සේවාකරණයේ බරපතළ අභියෝග රැසක් නිර්මාණය වෙනවා. අපි මේ ඉදිරිපත් කරන යෝජනාව, දේශපාලන යෝජනාවක් නොවෙයි. මේක සංඛ්‍යාත්මක යෝජනාවක්. Successor programme එකකට ගිහිල්ලා IMF ක්‍රියාවලිය 2027 මාර්තු මාසයෙන් අවසන් වන්නට නොදී එය තවදුරටත් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මම සංඛ්‍යාත්මකව පැහැදිලි කර දෙන්නම්.

පළමුවැනි කාරණාව මෙයයි. මම පෙර කිව්ව ආකාරයට අපේ විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 14.2ක් තිබිය යුතු වුවත් අද වනකොට තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7යි. ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 7ත් තිබෙනවා, non-convertible yuan currency swap එකක්. එතකොට අපේ real reserves ප්‍රමාණය, ඇත්තවශයෙන්ම පාවිච්චි කරන්න පුළුවන් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 7 නොවෙයි, ඊටත් වඩා අඩු ප්‍රමාණයක්. එතකොට ඇත්තවශයෙන්ම අපට ඒ ඉලක්කය කරා යන්නට නම්; විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 14.2 දක්වා ගෙනියන්න නම් හැම මාසයකම ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් එකතු කරන්න ඕනෑ. හැබැයි, මෙතෙක් කල් අපට පුළුවන්කම ලැබිලා තිබුණේ මාසයට ඇමෙරිකානු ඩොලර් මිලියන 60 ගණනේ ලබා ගන්නයි. ඒ නිසා අපි මේ ඉදිරිපත් කරන යෝජනාව අනුව අනිවාර්යයෙන්ම IMF අනුප්‍රාප්තික වැඩසටහනකට - successor programme එකකට - යන්නට ඕනෑ.

ඒ වාගේම ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල සියයට 39කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා, මේ මාස හතර ඇතුළත. බංකොලොත් වුණු 2022 අවුරුද්දේදී ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 470යි. අද රුපියල් 410යි. ඒ කියන්නේ, එදා තිබුණු ප්‍රමාණයට යන්න නම් තව වැඩි වෙන්න තිබෙන්නේ සියයට 15යි. ඒ නිසා අපි බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙමින් සිටිනවා. පසුගිය මාස 12ට රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා, සියයට 9.2කින්. ඒ වාගේම year-on-year සංචාරක ආදායම සියයට 17කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම අපි සතුටු වනවා, විදේශ ප්‍රේෂණ - foreign remittances - ඩොලර් බිලියන 8 ඉක්මවා යෑම පිළිබඳව. හැබැයි මතක තබා ගන්න, මේ විදේශ ප්‍රේෂණවලින් සියයට 60ක් එන්නේ මැද පෙරදිග රටවලින් - Gulf Corporation Council රටවලින් - බව. ඒ කියන්නේ, කුවේටයෙන්, සවුදියෙන්, United Arabs Emirates රාජ්‍යයෙන්.

විශේෂයෙන්ම මේ යුද්මය තත්ත්වය නිසා ඒ රටවල ඉදිකිරීම් කර්මාන්තය බරපතළ කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. එයින් විරැකියාව නිර්මාණය වීමේ බරපතළ තත්ත්වයක් මතු වෙනවා. 2027 අවුරුද්දේ මාර්තු වනවිට මහා ණය කන්දක් නිර්මාණය වෙනකොට කොහොමද ඔබ එයට මුහුණ දෙන්නේ? IMF එක ඉවත් වෙනකොට Special Drawing Rights කියන ඒ අමතර ප්‍රතිපාදන ලබා ගැනීමේ අයිතිය expire වෙනවා. IMF අධීක්ෂණය අවසන් වෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකාව ණය සේවාකරණ චක්‍රයකට ඇතුළත් වෙලා, IMF Agreement එක ක්‍රියාත්මක වෙනකොට තිබුණු ඒ යම්කිසි ණය නිදහස් කාලය - grace period එක - සහමුලින්ම ඉවත් වෙනවා. ඒ නිසා මතක තබා ගන්න, 2028 අවුරුද්දේ ඉඳලා වාර්ෂිකව අපට පොලියට අමතරව ප්‍රාග්ධනයත් ගෙවන්න සිද්ධ වෙනවාය කියන එක. විශේෂයෙන්ම ඩොලර් බිලියන 3 සිට ඩොලර් බිලියන 4 දක්වා ප්‍රමාණයක් වාර්ෂිකව ගෙවන්න තිබෙන මොහොතක, අපේ සංචිත තිබෙන්නේ ඩොලර් බිලියන 7යි, එහෙම නැත්නම් ඩොලර් බිලියන 8යි. IMF වැඩසටහනක් නැහැ. නිදිමරගාතේම රට මහා මර උගුලකට පත් වෙනවා. ඒ නිසා නැවත නැවතත් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයට අපි කියනවා, කරුණාකරලා successor Extended Fund Facility එකක් සහිත අලුත් IMF programme එකකට දැන් ඉඳලාම යන්න කියලා. දැන් ඉඳලාම ඒ ගැන සාකච්ඡා කරන්න. 2027 මාර්තු මාසයේ IMF එක ඉවත් වෙනකම් ඉන්න එපා. ඇයි, අපි එහෙම කියන්නේ? මේ වෙලාවේදී ඒ අලුත් negotiation එකකට ගියොත් අපට පුළුවන්, වාසිදායක කොන්දේසි මත IMF එකඟතාවකට එන්න. ඒ වාගේම, අපට පුළුවන්, මේ timeline එක දිගු කර ගන්න. ඒ වාගේම, රටේ සිටින ලක්ෂ 220ක් පමණ වන ජනතාවට නිසි ආරක්ෂාව ලබා දීලා, ඒ IMF Agreement එකත් එක්ක බොහොම ශක්තිමත් ස්ථාවරයක ඉඳගෙන අපට පුළුවන්, ඇත්තවශයෙන්ම ඒ සාකච්ඡාවට ප්‍රවේශ වෙන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අද නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රමුඛ ඇමතිවරු ගණනාවක් ආර්ථික අර්බුදයක් නැහැ කියලා කිව්වා. අපට දැනගන්නට ඕනෑ, ඔබ ඉන්නේ මහ පොළොවට පය ගහලාද, එහෙම නැත්නම් කෙඳි වලාකුළුවලද, කැටි වලාකුළුවලද කියලා.

ඊයේ දවසේ ඩොලරය අළෙවි වුණේ රුපියල් 346කට. එක දවසක් ඇතුළත - අද දවසේදී - ඩොලරය රුපියල් 354ක් දක්වා අවප්‍රමාණය වෙලා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ ජනතාව ඉදිරියේදීවත් තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල ළතැවෙනවාට අපි කැමැති නැහැ. මේ රටේ ජනතාව ඖෂධ හිඟයක් හරහා ඉතාම අසරණභාවයට පත් වෙනවාට අපි කැමති නැහැ. පොහොර හිඟයක් තුළින් මේ රටේ ගොවි ජනතාවගේ වගා කටයුතු විනාශ වෙනවා දකින්න අපි කැමති නැහැ. අපි මේ සත්‍ය තමයි පහදා දුන්නේ. ඇති තතුවල ඉඳගෙන තමයි අපි මේ යෝජනාව කරන්නේ.

විශේෂයෙන්ම මම මේ කාරණයත් රජයෙන් අහන්න කැමැතියි. මේ මොහොත වනවිට ඉන්ධන මිලට මොකක්ද වෙන්නේ? ඉන්ධන මිල එන්න එන්න වැඩි වෙනවා. ඉන්ධන මිල එන්න එන්න වැඩි වෙනකොට මොකක්ද වෙන්නේ? ඉන්ධන මිලදී ගන්න අපේ සංචිත පාවිච්චි කරන්න වෙනවා. ඒ වාගේම, ඖෂධ මිලදී ගන්න අපේ සංචිත පාවිච්චි කරන්න වෙනවා. ඒ වාගේම, කර්මාන්ත භාණ්ඩ - industrial products - මිලදී ගන්න අපේ සංචිත පාවිච්චි කරන්න වෙනවා. මේ තත්ත්වය තුළ ඩොලර් හිඟතාවක් - dollar distress එකක් - නිර්මාණය වෙනවා.

ඒ වාගේම, මම මේ කාරණයත් අහන්න කැමැතියි. අද ඔබ කියන්න පුළුවන්, අපට ආනයන ආවරණය මාස 3කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා කියලා. හැබැයි මතක තබා ගන්න, බොර තෙල් බැරලයේ මිල වැඩි වෙන්න, වැඩි වෙන්න ආනයන ආවරණය මාස 3ට වැඩිය අඩු වෙන බව. එතකොට මහා ඛේදවාචකයක් නිර්මාණය වීමේ ඉඩක් තිබෙනවා. ඒ නිසායි අපි කියන්නේ, කරුණාකරලා IMF එකට දැන් ඉඳලාම කථා කරලා successor agreement එකකට යන්න කියලා.

විශේෂයෙන්ම මම මෙන්න මේ සංඛ්‍යාලේඛනත් කියන්න කැමැතියි. මෙන්න මේක හොඳට අහගන්න. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා කාලය තුළ තෙල් මිල සියයට 39කින් වැඩි වෙලා තිබෙනවා. 2022 අවුරුද්දේ මොකක්ද වුණේ?

2022 මාර්තු මාසයේ සිට ජුනි මාසය දක්වා කාලය තුළ ඉන්ධන මිල සියයට 44කින් වැඩි වුණා. සාමාන්‍යයෙන් විශේෂඥයින් පිළිගන්න න්‍යායක් තමයි, තෙල් මිල සියයට 25කින් ඉහළ යනකොට අනිවාර්යයෙන්ම මාස 6ත්, 9ත් අතර කාලයක් තුළ ගෙවුම් ශේෂ ගැටලුවක් - balance of payment crisis එකක් - නිර්මාණය වෙනවාය කියන එක. මේක අපේ theory එකක් නොවෙයි, 1930දී ඇති වූ ලෝක ආර්ථික අවපාතය, 1980 හා 1990 දශකයේ ඇති වූ Asian financial crisis එක ආදිය පිළිබඳව අධ්‍යයනය කරපු ආර්ථික විශේෂඥයින් ඉදිරිපත් කරන විශ්ලේෂණ, ඒ අය ඉදිරිපත් කරන නිගමන.

දැන් ඔබතුමන්ලා කියනවා, ඩොලර් බිලියන 7ක, 8ක සංචිත ප්‍රමාණයක් තිබෙනවා කියලා. හැබැයි ඕක ඇතුළේ තිබෙනවා, People's Bank of China වෙතින් ලැබුණු පාවිච්චි කරන්න බැරි සංචිත - non-usable reserves. ඇත්තටම, අපි ජනතාවට කියන්න ඕනෑ අපේ සැබෑ සංචිත ප්‍රමාණය කොපමණද කියන කාරණාව. විශේෂයෙන්ම ප්‍රේෂණ - remittances - සම්බන්ධයෙන් ගත්තොත්, අපි අපේ රට හොඳ තත්ත්වයක තියාගන්න නම් අඩුම ගණනේ මාස් පතා ඇමෙරිකානු ඩොලර් මිලියන 768ත්, 815ත් අතර ප්‍රමාණයක් අපි ලබා ගන්න ඕනෑ. ඊට වඩා පහළ ගියොත් අපි අනිවාර්ය ගැටලුවකට මුහුණ දෙනවා.

දැන් මම මෙහෙම කියන්නම්. තෙල් බැරලයක මිල ඩොලර් 60ත්, 70ත් අතර වුණොත්, අන්න එතැනදී අපට සතුටු වෙන්න පුළුවන්. එහෙම වුණොත් අනතුරුදායක තත්ත්වයක් නිර්මාණය වීමේ ඉඩ කඩ අඩුයි. හැබැයි, ඒක ඩොලර් 75, 85 වෙලා මේ මොහොත වන විට ඩොලර් 110ටත් වැඩි ප්‍රමාණයක් දක්වා ඉහළ යනකොට අනිවාර්යයෙන්ම ඒක අපේ සංචිතවලට බලපානවා. ඒක අපේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳ පොළට ප්‍රවේශ වීමට බලපානවා. මොකද, IMF programme එක ලබන අවුරුද්දේ මාර්තු මාසය වෙනකොට අනිවාර්යයෙන්ම අවසන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. පසුගිය මාස කිහිපය තුළ NDB එකේ සිදු වුණු රුපියල් බිලියන 13.2ක මහා වංචාව, විදේශීය ණය වාරිකයක් - ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක් - වෙනත් හොර ගිණුමකට හොර ආකාරයෙන් transfer කිරීම, අස්වැසුම දෙනකොට double payment එකක් හරහා, duplicate payment system එකකින් මිලියන 248.79ක් අහිමි වීම, Sri Lanka Postsහි US Dollars 625,000ක missing payment එකක් තිබීම, ඒ වාගේම SriLankan Airlines එකේ Indian rupees මිලියන 22ක fraud case එකක් තිබීම, People's Bank එකේ මිලියන 656ක remittance error එකක් තිබීම යන වංචාකාරී සිදුවීම් ගත්තාම නිකමට හෝ හිතෙනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Fitch Ratings, Moody's, Standard & Poor's ශ්‍රේණිගත කිරීම අතින් අපේ රට ඉහළ දමාවි කියලා? ඇත්ත වශයෙන්ම, ඒ දේ සිද්ධ වෙන්නේ නැහැ. රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව අද බරපතළ අවිනිශ්චිතතාවක් තිබෙනවා. එක පැත්තකින් ඩොලරයට සාපේක්ෂව රුපියල දිනපතාම අවප්‍රමාණය වෙනවා. මේ තත්ත්වය තවත් වර්ධනය විය හැකි යැයි ජනාධිපතිවරයාත් ප්‍රකාශ කර තිබෙනවා. තවත් පැත්තකින් මහ බැංකු අධිපතිවරයා මාධ්‍යයට කියා තිබෙනවා, රටේ ආර්ථිකයේ ඉදිරි තත්ත්වය අවිනිශ්චිතයි කියන කාරණාව. නිකමට හිතලා බලන්න, මහ බැංකු අධිපතිවරයා එහෙම කිව්වාම අපේ රටට ආයෝජකයන් එයිද? සෘජු විදේශ ආයෝජන අපේ රටට එයිද? මේ තත්ත්වය පිළිබඳව බරපතළ සහ ගැඹුරු විමසීමක් සිදු කළ යුතුයි කියලා විපක්ෂයේ ප්‍රධාන පක්ෂය හැටියට අපි විශ්වාස කරනවා. ඒ නිසාම මේ තත්ත්වය පිළිබඳව සියලු stakeholdersලා - සම්බන්ධීකාරකයින් - සම්බන්ධ කරගෙන සාකච්ඡා කිරීමට අපි අදහස් කරනවා. ඒකේ පළමුවෙනි පියවර අද දින ක්‍රියාත්මක කරන්න අපි සැදී පැහැදී සිටිනවා. රජයටත් අපි කියන්න කැමැතියි, මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාම කැඳවලා, මේ ගැන සාකච්ඡා කරන්න කියලා. මේක ඇතුළට ඇවිල්ලා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, ඔක්කොම හරි, ඔක්කොම හොඳයි, කිසිම ගැටලුවක් නැහැ" කියලා කිව්වාට අවසානයේ සිද්ධ වෙන්නේ මේ යන නිදිමත ගමනේම මහා ඛේදවාචකයකට මුහුණ දෙන්නයි. ඒ නිසා අපි හැමෝම අත්වැල් බැඳගෙන රටේ ලක්ෂ 220 වෙනුවෙන් අපේ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑ; ඇත්ත කථා කරලා, පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ඒ වාගේම බල බලා ඉන්නේ නැතුව අදම IMF එකට කථා කරලා අනුප්‍රාප්තික වැඩසටහනක් - successor programme එකක් - ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. ලබන වසරේ මාර්තු මාසයේ මේ විස්තීර්ණ ණය වැඩසටහන අවසන් වෙනකොට අප්‍රේල් මාසයේ ඉඳලා ඉදිරියට ක්‍රියාත්මක කරන්නට පුළුවන් successor IMF programme එකක් අත්‍යවශ්‍යමයි. මේක අද

කිව්වා කියලා හොඳට හිතේ තියා ගන්න. මොකද, අපි මේවා කියනකොට මේවාට හා! හා! කියනවා, හිනා වෙනවා, මේවා විවේචනය කරනවා. මම යෝජනා කරනවා, ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන දිහා හොඳ ගැඹුරින් හිතලා බලලා අපේ මේ යෝජනාව පිළිගන්න කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rohitha Abeygunawardhana. You have 12 minutes.

[අ.භා. 12.10]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද දවසේ - පස්වෙනි මාසයේ 21වෙනි දා - මේ පාර්ලිමේන්තුව රැස් වෙන වෙලාවේදී මම උදේ ප්‍රවෘත්ති බැලුවා. ඒ බලනකොට මොකක්ද අපි දකින්නේ? "මේ මාසයේ ආසියාවේ වේගයෙන්ම පිරිහෙන මුදල් ඒකකය අපේ රුපියල" යනුවෙන් ප්‍රවෘත්තියක් තිබෙනවා. මේ, අද උදේ news බලනකොට දැකපු දේ. මේ මාසයේ ආසියාවේ,- *[බාධා කිරීම්]* නැහැ, මේක "හිරු" එකේ ගියේ. *[බාධා කිරීම්]* මේක "හිරු" එකේ කිව්වා කියලා "හිරු" එකේ බෙල්ල මිරිකන්න එපා. "හිරු" එකේ බෙල්ල මිරිකන්නත් එපා, "දෙරණ" නාළිකාවේ ගියත්, ඒකේ බෙල්ල මිරිකන්නත් එපා. ඒ මාධ්‍ය. ඒ මිනිස්සු දාලා තියෙන එක මම මේ කියන්නේ සාක්ෂි ඇතුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ලේඛනය **සභාගත*** කරනවා. මේ, දාලා තිබෙන දේ. *[බාධා කිරීමක්]* මට කියන්න කියලා ඒකේ කවුරුත් කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. අහගෙන ඉන්න.

බොහොම පැහැදිලිව මම කාරණයක් කියන්න ඕනෑ. දැන් ඩොලරය උඩ යනවා, රොකට් එක යනවා වාගේ. ඩොලරය රොකට් එක වාගේ උඩ යනවා. ඩොලරය උඩ යනකොට රුපියල බාල්දු වෙනවා. දැන් මස්තබාල්දු වෙලා තිබෙන්නේ. රුපියල මස්තබාල්දු වෙලා තිබෙන කොට, රොකට් එක වාගේ ඩොලරය උඩ යනකොට "හිරු" එකේයි, "දෙරණෙයි" බෙල්ල මිරිකන්න හදනවා. එතකොට මොකක්ද සිද්ධ වෙන්නේ? ඒවා කරලා හරියන්නේ නැහැ. තමුන්නාන්සේලාට මෙතැනට එන්න, ඔය කියූ මාධ්‍ය ඔක්කෝම ආණ්ඩුවක් හදන්න උදවු කරපු අය. ඔය මාධ්‍ය උදවු කළා, තමුන්නාන්සේලාට ආණ්ඩු හදා ගන්න. *[බාධා කිරීමක්]* අහගන්න.

මොකක්ද, ඊළඟ news එක. "අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක මිල ඉහළ යයි; බස් ගාස්තුවත් වැඩිවන ලකුණු" යනුවෙන් ප්‍රවෘත්තියක් තිබෙනවා. බස් ගාස්තු වැඩි වෙලා තිබුණේ, ඩීසල් මිල ඉහළ යනකොට. තෙල් මිල ඉහළ යනකොට බස් ගාස්තුව වැඩි වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද දවස වෙනකොට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යනවා. පිටි පැකට් එක, පරිප්පු ටික, සීනි ටික, හාල් ටික කියන ඔක්කෝම ඒවායේ මිල ඉහළ යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි ඇත්ත කථාව. මොකද, හේතුව මේ වෙනකොට ඩොලරය ඉහළට යාමේ වෙනස රුපියල් 49ක්. එදා ඉඳන් මේ වෙනකොට රුපියල් 49කින් වැඩි වෙලා තිබෙනවා. එතකොට මෙය රුපියල්වලට හරවා ගන්නකොට මේ රටට ආනයනය කරන හැම භාණ්ඩයකම මිල ඉහළ යනවා. මේකයි ඇත්ත. හැබැයි, මේක තිත්තයි. ඒක තමයි පැහැදිලිව කියන්න තිබෙන්නේ.

තමුන්නාන්සේලා එදා ආණ්ඩුව භාර ගන්නකොට ඩොලරයේ අගය රුපියල් 295යි. අද උදේ මම කථාවට ලැහැස්ති වෙනකොට එහි අගය රුපියල් 344යි. දැන් එහි අගය රුපියල් 356යි, මේ පැය ගාණට. අද තව පැය ගාණක් යනකොට මේක තව ඉහළ යනවා; ටැක්සි මීටර් එක වාගේ මේක යනවා, නවත්වන්න බැහැ. මේකෙදි එකපාරටම කැ කෝ ගහලා, අපි මෙතැන ඉඳන් "තමුන්නාන්සේලා මේකට සියයට සියයක් වගකියන්න ඕනෑ" කියලා කියන්නේ නැහැ. මේකයි යථාර්ථය. ඩොලරය ඉහළ යනකොට ආර්ථික වශයෙන් රටක මිනිස්සු ඉතාම අසීරුතාවට පත් වෙනවා කියන එක හෘදය සාක්ෂියෙන් අහන්න. අන්න එතැනින් ඇහුවාම තමුන්නාන්සේලාට තේරෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ආණ්ඩුවට අවුරුදු දෙකකට ආසන්න වෙනවා, සැප්තැම්බර් මාසයේ 21වැනි දා වෙනකොට; අවුරුද්දයි මාස අටක් විතර වෙනවා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ කිව්වේ, 76 වසරක්ම ආණ්ඩු කරපු ඔක්කෝම දූෂණය, වංචාව, හොරකම් කරලා, හොරා කාලා කටයුතු කළා කියලායි. තමුන්නාන්සේලා කියන විධියට දැන් මේ අවුරුද්දයි මාස අට තුළ ඒවා සිද්ධ වෙන්නේ නැහැ. දූෂණයක් නැහැ. වංචාවක් නැහැ. ඒ වාගේම ආර්ථිකය ඉතාම හොඳින් කළමනාකරණය වෙනවා. දූෂණයක් නැත්නම්, වංචාවක් නැත්නම්, 76 වසරක් හිටපු ආණ්ඩු ඔක්කොම දූෂිතයි නම්, මේ අවුරුදු දෙකකට ආසන්න කාලය ඇතුළත වංචාව, දූෂණය නැති වුණා නම්, සල්ලි ඉතිරි වෙන්න එපායැ දෙවියනේ. ඒවා නැති වුණා නම් සල්ලි ඉතිරි වෙන්න ඕනෑ. එහෙම නම් බස් ගාස්තු ඉහළ දමන්න ඕනෑ නැහැ, ලයිට් බිල ඉහළ දමන්න ඕනෑ නැහැ, ඩීසල්වල මිල ඉහළ දමන්න ඕනෑ නැහැ, කිරිපිටි පැකට් එකේ මිල ඉහළ දමන්න ඕනෑ නැහැ, පරිප්පු මිල ඉහළ දමන්න ඕනෑ නැහැ. වංචාව, දූෂණය නැති වෙලා තිබෙනවා නම් ඒ ඉතුරු වෙච්ච මුදල්වලින් මිනිසුන්ට ඒ කියපු මිල ගණන් අඩු කරන්න පුළුවන් නේ, දෙවි හාමුදුරුවනේ.

දැන් ඇහුවොත් ඔබතුමන්ලා කියනවා, "අපේ ආර්ථිකය ඉතා හොඳයි, භාණ්ඩාගාරය පිරිලා" කියලා. භාණ්ඩාගාරය පිරිලා, ඉතිරිලා යනවා; මිනිසුන්ට කෙළවෙලා යනවා. භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යද්දී මිනිසුන්ට කෙළවුණාම හරියයිද? එහෙම හරියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. භාණ්ඩාගාරය පුරවලා තියා ගන්න. හැබැයි, මීයෝ කාලා යයි කොයි වෙලාවක හරි ඇවිල්ලා. භාණ්ඩාගාරය හොඳට පුරවාගෙන ඉඳලා හරියන්නේ නැහැ, මිනිසුන් ගැන බලන්න ඕනෑ. මිනිසුන් ගැන බැලුවේ නැත්නම් මොකක්ද සිද්ධ වෙන්නේ? තමුන්නාන්සේලාට ජනතාවගෙන් ලැබුණු ප්‍රසාදය, එදා 2024 සැප්තැම්බර් 21වන දා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට ලැබුණු ප්‍රසාදය වාගේම තමයි, ජනතාවට කෙළවුණොත් ඊළඟට ඇති වෙන්නේ අප්‍රසාදය. ඊළඟට ජනතාවට ඇති වෙන්නේ අප්‍රසාදයයි කියන එක බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආකාරයට මුදල් ඉතිරි කරලා තිබෙනවා කියනවා නේ. මුදල් ඉතිරි කරනවා වාගේම තමුන්නාන්සේලාගෙන් දැන් දූෂණ, වංචා මොකුත් සිද්ධ වෙන්නේ නැහැ කියනවා නේ. ඒවා සිද්ධ වෙන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා කියනවා. හැබැයි දැන් මොකක්ද සිද්ධ වෙන්නේ? මහජන බැංකුවේ විනිමය අනුපාත දෝෂයකින් රුපියල් මිලියන 656ක් වැඩිපුර ගෙවලා. මහජන බැංකුව ඒක නැවත අය කර ගන්න ලැහැස්ති වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බැංකුව රුපියල් මිලියන 656ක් වැඩිපුර ගෙවලා, ගරු නියෝජ්‍ය

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

කථානායකතුමනි. මළකෙළියයි නේ! මාර කෙළියක් නේ, මිලියන 656ක් මහජන බැංකුවෙන් වැඩිපුර යනවා. දැන් ඒක අය කර ගන්න හදනවා.

භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5කට මොකද වුණේ? හැකර්ලා අතට ගිහිල්ලා. දැන් හැකර්ලාත් නැහැ, ඩොලර් මිලියන 2.5ත් නැහැ. දැන් ඒවාට මොකද කියන්නේ? ඊළඟට, රුපියල් කෝටි 8ක් හැකර්වරුන් අතට ගිය බව පිළිගන්නා ගමන්, එහි වගකීම භාර නොගන්නා බව SriLankan Airlines එක කියනවා. SriLankan Airlines එක කියනවා, "කෝටි 8ක් අපෙන් ගිහිල්ලා තිබෙනවා, හැබැයි වගකීම භාර ගන්නේ නැහැ, ඒකත් හැකර්ලා අතට ගිහිල්ලා" කියලා. මරු නේ අප්පා! කොහෙන්ද මේ අයව අපට මෙච්චර කල් miss වුණේ. අවුරුදු 76ක් කොහෙන්ද මේ අයව අපි miss කර ගත්තේ. මේ වාගේ ඓතිහාසික මොළකරුවන් ටිකක්, ආර්ථික විශේෂඥයන් ටිකක් අපි මොකද අප්පා miss කර ගත්තේ. එහෙම miss කර ගත්තේ නැත්නම් අපේ රටත් අද සිංගප්පූරුවක්, ඇමෙරිකාවක්, කැනඩාවක්. ඒ අය miss කරගෙන දැනුයි අපට හමු වුණේ. හැබැයි, ඒ අය හමු වුණාම තමයි, හැකර්ලා අතට බඩු ගිහිල්ලා තිබෙන්නේ. දෙවියන්ගේම පිහිටයි! දෙවියන්ගේම පිහිටයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙහෙම යනකොට දෙවියන්ට තමයි කියන්න වෙන්නේ. මිනිසුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා අද උදේ හොඳ කථාවක් කළා. අපි ඒක අහගෙන හිටියා. එතුමා බොහොම facts සහිතව ඒ දේවල් කථා කළා. ඒක හරි. හැබැයි, එතුමා මීට ඉස්සර දවසක - ඊයේද කොහේදෝ - කිව්වා, එක්කෙනෙකුට මාසයක් ජීවත් වීම සඳහා රුපියල් 16,690ක් ඇති කියලා. එක්කෙනෙකුට ජීවත් වීම සඳහා රුපියල් 16,690ක් මාසයකට ඇති කියලා අපේ ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා වාර්තාවක් තිබ්බා. මොකක්ද තබපු වාර්තාව? එතුමා අපේ බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමාගේ වාර්තාව කැඩුවා. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා තමයි, රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන් කියලා කිව්වේ. එතුමා අපේ පැත්තේ හිටපු කෙනෙකු වුණත් කොන්ද කෙළින් තියාගෙන ඒ බව කියන්න එපායැ. රුපියල් 2,500න් ජීවත් වෙන්න බැහැ නේ. ඒ නිසා නේ අපි ඔක්කොටම ගෙදර යන්නත් සිද්ධ වුණේ. වත්මන් මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, රුපියල් 16,690කින් ජීවත් වෙන්න පුළුවන් කියලා. හැබැයි, මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට ආධුනිකයි. මම ඔබතුමාට අවවාදයක් දෙනවා. මොකක්ද අවවාදය? ඔබතුමා අපේ හොඳ මිත්‍රයෙක්; හොඳ කෙනෙක්. අවවාදය තමයි, නිලධාරීන් දෙන දෙන ගුළි ගිලින්න එපා, නිලධාරීන් දෙන දෙන ලුණු කන්න එපා කියන එක. මොකද, ඒ ලුණු කෑවාම දිරවා ගන්න අමාරුයි. ගල් අඟුරු වාගේ නොවෙයි; දිරවා ගන්න අමාරුයි. ඒ වාගේ ලුණු කන්න එපා. ඒ වාගේ ලුණු කාලා අපේ අමාත්‍යවරු, මන්ත්‍රීවරු, ජනාධිපතිවරු ගෙදර ගියා. ඒ ලුණු කන්න එපා. දෙවරක් හොයලා බලන්න, ඒක හරිද කියලා. රුපියල් 16,690කින් කන්න නොවෙයි පුළුවන්, ලෙව කන්න. ලෙව කන්නයි, උලා කන්නයි තමයි පුළුවන් වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් අපේ ගම්වල මිනිසුන්ට මාළු කන්න බැහැ. මාළු කන්නේ කොහොමද? මාළුන්ගේ ගණන ඇහුවාම ඇඟේ මාළු නටනවා. මාළු කන්න බැහැ. එතකොට මොකක්ද දැන් කරන්න තිබෙන්නේ? ඉඳලා හිටලා කරවල කනවා. දැන් ගේන්නේ කරවල කුරියෙක්. කිලෝ එකක විතර කට්ට කරවල කුරියෙක් ගෙනැල්ලා, ඒක ළිප උඩින් තිබෙන දුමේ එල්ලනවා. දුමේ එල්ලලා හොද්ද ටිකක් රත් වෙනකොට, කරවල කුරියා බානවා හොද්දට. කරවල කුරියා හොද්දට බාලා ආයෙත් රත් වෙනකොට උඩට අදිනවා, මස් ටික දිය වෙන්න ඉස්සෙල්ලා. එතකොට කරවල සුවඳ එනවා නේ. කරවල සුවඳ එක්ක තමයි බත් ටික කන්න වෙලා තිබෙන්නේ. මොකද, කරවල දැම්මොත්, කරවල කෑල්ල එක දවසින් කාලා ඉවර කළොත් කෙළවෙනවා. දැන් කරවල සුවඳ එක්ක පුළුවන්, සතියේ දවස් තුනක් විතර balance කර ගන්න. ජනතාව කන විධිය මම ඒ කිව්වේ. රුපියල් 16,690කින් අන්න එහෙම ලෙව කන්න නම් පුළුවන්. කන්න නොවෙයි, ලෙව කන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two minutes left.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, ඉස්සර තිබුණු ආණ්ඩු ගැන කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හරි සුන්දර මනුස්සයෙක්. ඔබතුමා ඔය ආසනයේ ඉන්න කොට මම නම් හරි ආසයි කථා කරන්න. කථානායකතුමා නොවෙයි, ඔබතුමා ඉන්න කොට. මම ඔබතුමාට කියන්න ඕනෑ, පසුගිය ආණ්ඩු ගැන. ඉතිහාසයේ ආණ්ඩු තිබුණා නේ. අපි ගනිමු, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව. මිනිස්සු සිරිමාවෝ මැතිනියගේ ආණ්ඩුව අර්ථකථනය කරලා තිබෙන්නේ කොහොමද? එය අර්ථකථනය කරලා තිබෙනවා, දේශීය ආර්ථිකයක් ගෙනාපු ආණ්ඩුව කියලා. මැතිනිය ඇත්තටම දේශීය ආර්ථිකයක් හදන්න කටයුතු කළා. ඒත් ඒ ආණ්ඩුවත් පරද්දලා දැම්මා නේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඇවිල්ලා කිව්වා "ඇට අටක් දෙන්නම්, හඳෙන් හරි හාල් ගෙනත් දෙන්නම්" කියලා. එහෙම කියලා මැතිනියගේ ආණ්ඩුව පැරැද්දුවා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට මිනිස්සු මොකක්ද කියන්නේ? ඒ ආණ්ඩුව මහවැලිය හැදුවා, විවෘත ආර්ථිකය ගෙනාවා කියලායි කියන්නේ. කළ වැඩ අනුව එක එක ආණ්ඩු එහෙම හැඳින්වූවා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මොනවාද කළේ? "ගම් උදාව" හරහා ගෙවල් හැදුවා. ඊළඟට බලයට ආවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය. එතුමිය යුද්ධය අවසන් කරන්න "සුදු නෙළුම් ව්‍යාපාරය" අරගෙන ගියා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියත් යම් වැඩ කොටසක් කළා. ඊළඟට, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ආවා. ඒ කාලයේ රටේ යුද්ධයත් තිබුණා. එතුමා මොකක්ද කළේ? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ අභියෝගය බාරගෙන වීරෝදාර රණ විරුවන් එක්ක එකතු වෙලා අවුරුදු 30ක් තිස්සේ පැවැති ඒ කුරිරු යුද්ධය සහමුලින් අවසන් කළා. අපි ඊයේ පෙරේදා වීරෝදාර රණ විරුවන් සහ ඒ යුද්ධ ජයග්‍රහණය සැමරුවා. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට සංවර්ධනය කළා; අධිවේගී මාර්ග හැදුවා, විදුලි බලාගාර හැදුවා, වරායවල් හැදුවා, රට හැදුවා. මහින්ද රාජපක්ෂ යුගය ස්වර්ණමය යුගයක් වුණා. ඊට පස්සේ බලයට ආවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ යුගය. මොකක්ද මිනිස්සු ඒ ආණ්ඩුව ගැන කිව්වේ? "ගහපු පදයකුත් නැහැ - බෙරේ පළුවකුත් නැහැ" කිව්වා. ඇත්තම තමයි, මොන මඟුලක්වත් කළේ නැහැ නේ. ගහපු පදයකුත් නැහැ; බෙරේ පළුවකුත් නැහැ. ඊළඟට බලයට ආවේ කවුද? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා. අනේ! එතුමාට කොවිඩ් වසංගත අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වුණා; ධුරය දාලා යන්නත් සිද්ධ වුණා. දැන් මේ ආණ්ඩුවට, එනම් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට දැන් ගමේ මිනිස්සු කියන්නේ මොකක්ද? ඉස්සර "මුළු රටම මාලිමාවට" කියලා ත්‍රිරෝද රථවල ගහගෙන ගිය අය දැන් කියන්නේ මොකක්ද? "මේක බොනිකරම තරුව" ලු. මම ඇහුවා මොකක්ද ඒ කියලා. "බොනිකරම තරුව" ලු. කිව්වා, ඒක අනෙක් පැත්ත හරවා ගන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, "තනිකරම බොරුව". දැන් මේ ආණ්ඩුව තනිකරම බොරුවද? තනිකරම බොරුවෙන්ද මේ යන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම කථාව අවසන් කරන්නයි යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොරුවෙන් යන්න බැහැ. ලුණු හැදෙන්නේ වතුරෙන්, ලුණු දිය වෙන්නේත් වතුරෙන්. ඒක මතක තියා ගන්න. බොරුවෙන් යන්න බැහැ. කරුණාකරලා යථාර්ථය තේරුම් ගන්න. එළියට ගිහිල්ලා බලන්න රටේ තත්ත්වය මොකද්ද කියලා. තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු 159ක් ඉන්නවා. හෙට ඡන්දයක් පැවැත්වුවත් තමුන්නාන්සේලා දිනුම්. හැබැයි එළියේ පළාත් සභා ඡන්දය තියන්නේ නැහැ. මම අභියෝග කරනවා, පුළුවන් නම් පළාත් සභා ඡන්දය තියන්න කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හොඳද නැද්ද කියලා ජනතාව පෙන්වයි.

මට වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Prof.) L.M. Abeywickrama. You have ten minutes.

[අ.භා. 12.22]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි කිහිපයක් ද අනුමත කර ගැනීම සඳහා පවත්වනු ලබන විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වෙනවා.

අපි මේ වෙලාවේ කථා කිහිපයකට සවන් දුන්නා. කරවල මිල, අප ආනයනය කරන ආහාරවල මිල, කිරි පිටිවල මිල ගැන කිව්වා. විපක්ෂයේ අයගේ මේ ඔක්කොම කථා අහද්දී අපට මතක් වෙන කාරණය තමයි, මේ තත්ත්වයට මේ රට ඇදලා දාපු අයම නේද ඒ සම්බන්ධව විවේචනය කරන්නේ කියන එක. ඇත්ත වශයෙන්ම රට වටේම මුහුද තියාගෙන, අභ්‍යන්තර ජලාශ විශාල ප්‍රමාණයක් තියාගෙන එක පැත්තක විතරක් මුහුද පිහිටා තිබෙන රටවලින් කරවල ආනයනය කරන ආර්ථිකයක් ඇති රටක් බවට මේ රට පත් කර දමා තිබුණා. ඒ වාගේම තමයි මේ රටේ කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැට්ටුවා, 2010න් පසුව. කිසිම විද්‍යාත්මක පදනමක් නැතිව වුවමනාවෙන්ම කෘෂි රසායනික තහනම් කළා. අනෙක් පැත්තෙන්, රසායනික පොහොර නතර කිරීම හරහා කෘෂි කර්මාන්තය කඩා වැට්ටුවා.

අපට ඉන්ධන ආනයනය කරන්න වෙනවා තමයි. නමුත්, අපේ දේශයේ වගා කරන්න පුළුවන්, නිෂ්පාදනය කරන්න පුළුවන් ආහාර බොහෝ ප්‍රමාණයක් ඩොලර් දීලා පිට රටවලින් ආනයනය කරන යැපුම් මට්ටමකට අපේ ආර්ථිකය ඇද දමලායි තිබුණේ. ඒ වාගේම තමයි අපේ රටේ තිබුණු කර්මාන්ත විශාල ප්‍රමාණයක් අපට අහිමි කරලා තිබෙනවා. අපි කාලයක් සිමෙන්තිවලින් ස්වයංපෝෂිත වෙලා තිබුණා. නමුත් අප අද වනකොට ගොඩනැඟිලි ඉදි කිරීම්වලට අවශ්‍ය සිමෙන්ති වාගේ අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඩොලර් වියදම් කරලා ගේන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ විධියට ධීවර කර්මාන්තය, කෘෂි කර්මාන්තය ඇතුළු කර්මාන්ත ඉතා විශාල වශයෙන් අඩපණ කරලා කඩා වට්ටපු ආර්ථිකයක් තමයි අපි භාර ගත්තේ.

අපි මේ ආර්ථිකය ක්‍රමානුකූලව ස්වයංපෝෂිත එකක් කරන්න, එහෙම නැත්නම් අපේ රට නිෂ්පාදන ආර්ථිකයක් බවට පරිවර්තනය කරන්න උත්සාහ දරන අවස්ථාවක තමයි මැද පෙරදිග යුද්ධය ඇවිල්ලා විදේශ වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ ගිහිල්ලා මේ ආර්ථිකයට යම් යම් ගැටලුකාරී තත්ත්වයන් ඇති වෙලා තිබෙන්නේ. ඒ මොන ප්‍රශ්න තිබුණත් අපේ රටේ ආහාර සුරක්ෂිතතාව, මිල ස්ථාවරභාවය සහ විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා යම් යම් රෙගුලාසි පනවන්න සිද්ධ වුණා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, අපට කීරි සම්බා ආනයනය කරන්න සිද්ධ වුණා. පසුගිය අප්‍රේල් මාසය වනකොට - අවුරුදු කාලයේ - කීරි සම්බාවල හිඟයක් ආවා. කීරි සම්බාවල හිඟය ඇති වෙන්න හේතුව තමයි, නිෂ්පාදනය කඩා වැටීම. කීරි සම්බා ගැන කථා කරනකොට මම විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. හරිත විප්ලවයෙන් පස්සේ අපේ රටේ කෘෂි කර්මාන්තයේ විශාල පරිවර්තනයක් සිදු වුණා. වැඩි අස්වනු භෝග, යෙදවුම් වැඩි කිරීම හරහා ඒකක නිෂ්පාදනය - ඒ කියන්නේ, එක බිමකින් ලැබෙන නිෂ්පාදනය - වැඩි කරන්න අපි ඒ කාලයේ ලොකු පරිවර්තනයක් කළා. ඒකෙන් ලොකු ප්‍රගතියක් අත්පත් කර ගත්තා. දැන් අපි කීරි සම්බා කෑවාට කීරි සම්බා නිෂ්පාදනය කරන්න මූලික වුණේ, අපේ ආචාර්ය තිස්ස රාජපක්ෂ විද්‍යාඥයා බව මම විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. ඒ, 1980 දශකයේදී. බතලගොඩ වී පර්යේෂණ ආයතනය තමයි Bg 360 කියන වී ප්‍රභේදය හඳුන්වා දුන්නේ. එතුමා අවුරුදු 10ක් වැනි විශාල කාලයක් කළ පර්යේෂණ හා අභිජනන programme එකක ප්‍රතිඵලයක් මත තමයි අපට 1999දී Bg 360 කියන වී ප්‍රභේදය - කීරි සම්බා - කෘෂි කර්මාන්තයට හඳුන්වා දී අපේ වෙළෙඳ පොළට ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ. එය ලොකු පරිවර්තනයක් වුණා. ඇත්ත වශයෙන්ම ඒ කාලයේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදුණු අය මහන්සි ගත්තේ අස්වැන්න වැඩි කර ගන්න. නමුත්, ආචාර්ය තිස්ස රාජපක්ෂ මැතිතුමා උත්සාහ ගත්තේ ගුණාත්මකභාවයෙන් වැඩි සහල් නිෂ්පාදනයට. එම නිසා කීරි සම්බා ලොකු පෙරළියක් ඇති කළා.

කීරි සම්බා වගා කිරීමේදී තිබෙන ගැටලු තමයි, අනෙක් සම්බාවලට සාපේක්ෂව අස්වැන්න අඩු වීම. අනෙක් එක තමයි, කීරි සම්බා රෝගවලට දක්වන ප්‍රතිරෝධතාව අඩුයි. එම නිසා සමහර රෝග - කොළපාලුව වාගේ රෝග - වැඩිපුර හැදෙනවා. එම නිසා කීරි සම්බාවල නිෂ්පාදන වියදම සාමාන්‍ය වී වර්ගවලට සහ සම්බා වී වර්ගවලට වඩා වැඩියි. අපි ඒ නිසාම කීරි සම්බාවලට වැඩි මිලක් නියම කරලා තිබෙනවා. අනෙක් සම්බා වී කිලෝවකට අපි රුපියල් 130ක් දෙද්දී, කීරි සම්බා වී කිලෝ එකකට රුපියල් 140ක මිලක් දෙනවා. නමුත්, ඒ මිලත් සෑහෙන්නේ නැහැ. කීරි සම්බාවල නිෂ්පාදන පිරිවැය වැඩිකමත්, වගා කරන්න තිබෙන අපහසුතාවත් සලකලා ඊට වඩා වැඩි මිලක් අත්පත් කරලා දෙන්න අවශ්‍යයි. අපි අපේක්ෂා කරනවා ඉදිරි කාලයේදී කීරි සම්බා වගා කරන ගොවීන්ට වැඩි මිලක් ලබා දෙන්න. නමුත්, මේ වෙලාවේ ඊට හැකියාවක් නැහැ. අපි ආණ්ඩුව භාර ගන්න වෙලාවේ කැකුළු

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

හාල් තිබුණේ නැහැ. රතු කැකුළු හාල්වල හිඟයක් තිබුණා. ඒ වාගේම සම්බා හාල්වල හිඟයක් තිබුණා. කෘෂි කර්මාන්තයේ ඒ තිබුණු කඩා වැටීම අනෙක් පැත්තට හරවන්න ඕනෑ නිසාම අපි වාරි මාර්ග ක්ෂේත්‍රයට විශාල මුදලක් වෙන් කරලා ගොවියාට සහනාධාර, ගොවියාට තිබෙන සහන විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. මේ වනකොට අපට පුළුවන් වෙලා තිබෙනවා වී මිල උච්චාවචනය වීම අවම කරලා, සහල් මිලත් අවම කරන්න. රුපියල් 220ට පමණ තිබුණු රතු කැකුළු හාල් කිලෝවක මිල අද වනකොට අපි අඩු කරලා තිබෙනවා. එහි මිල රුපියල් 165, රුපියල් 170 කියන ස්ථාවර තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ මිල වෙනස් වෙන්නේ නැහැ. ඒ වාගේම අනෙක් ආහාර වර්ග විශාල ප්‍රමාණයක මිල ස්ථාවර කර තිබෙනවා. අර්තාපල් ද, ලූනු ද, එළවලු වර්ගවලද මිල ස්ථාවර කර තිබෙනවා. කලකට රුපියල් 3,000 සහ රුපියල් 4,000 දක්වා මිල ඉහළ යන, තවත් කලකට රුපියල් 25, රුපියල් 30 දක්වා මිල පහළ බසින භෝග වර්ග තිබෙනවා. ඒ මිල උච්චාවචනය අඩු කරලා අපි ගොවියාට ස්ථාවර මිලක් ලබා ගන්න පුළුවන් ආකාරයට කෘෂි කාර්මික ආහාර භෝගවල මිල ස්ථාවර කරලා තිබෙනවා. ඒ ගමන අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ පරිවර්තනය අපි ඉතාම හෙමින් ඉටු කරමින් පවතිනවා.

කීරි සම්බා හිඟයත් එක්ක ආහාර පාලන රෙගුලාසි අපට වෙනස් කරන්න සිද්ධ වුණා. මොකද, කීරි සම්බා වෙන රටවලින් ගෙනෙන්න බැහැ. ඊට සමාන, ඊට ආදේශක වශයෙන් භාවිත කරන සහල් යම්කිසි ප්‍රමාණයක් ආනයනය කරන්න අපට සිදු වුණා. ඉන්දියාවේ ආන්ද්‍රා සහ තමිල්නාඩු ප්‍රදේශවල නිෂ්පාදනය කරන GR 11 කියන පොන්නි සම්බා ප්‍රභේදය මැයි මාසය වන කල් ගෙන්වන්න අපි ආනයන බලපත්‍ර ලබා දුන්නා. අපි ඒ අවස්ථාව ලබා දුන්නේ, එක පැත්තකින් වෙළෙඳ පොළේ සහල් සුලබතාව සහ ආහාර සුරක්ෂිතතාව ඇති කරන්නයි. අනෙක් පැත්තෙන්, මිලෙහි ඉහළ පහළ යෑම පාලනය කරලා මිල ස්ථාවර කරන්නයි. අපි ඒ කටයුතු සිදු කරලා තිබෙනවා.

මේ වෙලාවේ මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි කටයුතු කළේ පසුගිය ආණ්ඩු වාගේ නොවන බව. 2010න් පසු කාලයේ විශේෂයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රය නොසලකා හැරීම හරහා කෘෂි කර්මාන්තයේ කඩා වැටුණා. වගා නොකළ කුඹුරු, පුරන් කුඹුරු බවට පත් වෙලා තිබුණා. අපි මේ වනකොට ඒ සඳහා විශාල වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. මම පාර්ලිමේන්තුවට පත් වුණේ මාතර දිස්ත්‍රික්කයෙන්. 2019 අවුරුද්දේ නිල්වලා ගඟේ ලවණ බාධකයක් ඉදි කිරීම නිසා අක්කර 12,000ක විතර විශාල කුඹුර ප්‍රමාණයක් වගා කරන්න බැරි මට්ටමට පත් කරලා තිබුණේ. අවුරුදු 25කින්, 30කින් පමණ ඇළවල් සුද්ද කරලා තිබුණේ නැහැ. අපි පසුගිය අවුරුද්ද ඇතුළත ඒ ඇළවල් සුද්ද කරවන්න කටයුතු කළා. ලවණ බාධකය ඉදි කිරීම නිසා කුඹුරුවල ජලය පිරීමෙන් ගොවීන් විශාල ප්‍රමාණයකට අවුරුදු තුන හතරක් තිස්සේ වගා කරන්න බැරි වුණා. ඒ වගා කරන්න බැරි වුණු ගොවීන්ට වන්දි ගෙවීමට එකඟතාවක් තිබුණා. මේ වන්දි ප්‍රමාණය සඳහා මුදල් අනුමත කරලා තිබුණේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව ඒ යෝජනා ඉදිරිපත් කළ වෙලාවේ නියෝග කළා, මෙය විශාල මුදලක් නිසා එය ගෙවන්නේ නැතිව එකවර මුදල් ගෙවලා කුඹුරු ටික රජයට අත්පත් කරගන්න කියලා. නමුත්, ඒ වෙලාවේ ඒක කෙරුණේ නැහැ.

නමුත්, අපේ ආණ්ඩුව ඇවිල්ලා ඉතා කෙටි කාලයක් ඇතුළත ගිය වතාවේ අය වැයෙන් ඒ ප්‍රදේශයේ කෘෂිකර්මයේ නිරත වෙලා ඉන්න ගොවි මහත්වරුන්ට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කළා. රුපියල් මිලියන 1,200ක මුදල් ප්‍රමාණයක් වෙන් කළා. මේ මාසයේ 27වැනි දා අපි ඒ මුදල් ප්‍රමාණය ඒ ගොවීන්ට වන්දි වශයෙන් ලබා දෙනවා, ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්.

ඇත්ත වශයෙන්ම ගොවීන්ට අවශ්‍ය සහන ලබා දීම හරහා, ඒ ප්‍රතිපාදන ලබා දීම හරහා, ඒ පහසුකම් සැපයීම හරහා අපි ඉදිරි කාලයේදී බලාපොරොත්තු වෙනවා විදේශ රටවලින් කරන ආනයන අවම කරන්න. මොකද, අපට නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් ආනයනය කිරීම හරහා ඩොලර් විශාල ප්‍රමාණයක් වැය වනවා. කිරි ආහාර, කෘෂිකාර්මික නිෂ්පාදන විශාල ප්‍රමාණයක් අපි ආනයනය කරනවා. තෙල්, ඒ වාගේ සමහර නිෂ්පාදන ආනයනය කරන්න අපට සිද්ධ වනවා. නමුත්, අපට නිෂ්පාදනය කරන්න පුළුවන් කිරි ආහාර, සහල් ඇතුළු අනෙකුත් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම අවම කරන්න පුළුවන් විධියට රටේ කෘෂි කර්මාන්තය වැඩිදියුණු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ගොවීන්ගේ ආර්ථිකය හොඳ මට්ටමකට ගෙනෙන්න පුළුවන් පරිවර්තනයක් කිරීම සඳහා මූලික අඩිතාලම අපි දමලා තිබෙන්නේ. මේ හරහා අපේ ආර්ථික අර්බුදය අවම කර ගන්න, ආහාර ආනයනය කිරීමට යන විශාල ඩොලර් ප්‍රමාණය අවම කරන්න අපට පුළුවන් කියලා විශ්වාස කරනවා. අපි විශ්වාස කරනවා මෙතැන අර්බුදයක් නැහැ කියලා. කොහොමටත් අපට මේක විසඳාගෙන ඉදිරි ගමනක් යන්න පුළුවන් බව අපි විශ්වාස කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Elayathamby Srinath. You have eight minutes.

[பி.ப. 1.01]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வணக்கம்! இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். மிக முக்கியமாக, அரிசி இறக்குமதி சம்பந்தமாகக் கொண்டுவரப்பட்ட இந்தப் பிரேரணை தொடர்பாக நாங்கள் சற்றுச் சிந்திக்க வேண்டிய தேவையுள்ளது. நாட்டில் அரிசி உற்பத்தி செய்யக்கூடிய நிலைமை இருக்கின்றது. நெல் சந்தைப்படுத்தும் சபையின் களஞ்சியங்களில் நெல் சேமிக்கப்பட்டு இருக்கின்றது. விவசாயிகளுக்குப் போதிய விலையைப் பெற்றுக்கொடுக்க முடியாமல் இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், தனிநபர் ஒருவருக்கு 1,040 மெற்றிக்தொன் 'பொன்னி' அரிசியை இறக்குமதி செய்ய அனுமதி கொடுத்திருப்பது, விவசாயிகள் மத்தியில் நெருக்கடி நிலைமையை ஏற்படுத்தக்கூடிய ஒரு

சந்தர்ப்பமாக அமையும். ஏனென்றால், இப்போதைய நிலையில் உரம் பாரிய நெருக்கடியாகவும் அதை அதிக விலை கொடுத்து வாங்க வேண்டியும் உள்ளது. எரிபொருள் விலை அதிகரிப்பால் உழுதல் மற்றும் தொழில்களுக்கான கூலி அதிகரிப்பின்மூலம் விவசாயிகள் நெருக்கடியை எதிர்கொண்டுள்ள சந்தர்ப்பத்திலும், அரிசிக்கு நிலையான விலை இல்லாமல் நெல் சந்தைப்படுத்தும் சபையினூடாக அதனைக் கொள்வனவு செய்வதில் பாரிய நெருக்கடி காணப்படுகின்றது. அரிசி இறக்குமதியானது எந்தளவுக்கு இந்த நாட்டிலுள்ள விவசாயிகளுக்கு ஒரு நிவாரணத்தைத் தரும் என்பது கேள்விக்குறியாக இருக்கின்றது.

மக்களைப் பொறுத்தவரை, உண்மையாகவே அரிசிக்கான தேவைப்பாடு ஏற்படுகின்ற சூழ்நிலையில் அரிசி இறக்குமதி யைச் செய்யவேண்டி இருந்தாலும்கூட, அரசாங்கம் அதனைச் சரியான முகாமைத்துவ நிலைப்பாட்டில் முன்னெடுத்துச் செல்லவேண்டிய தேவையிருக்கின்றது. குறிப்பாக, மட்டக் களப்பு மாவட்டத்தில் 8 நெற்களஞ்சியங்கள் உள்ளன. அவற்றில் 4 களஞ்சியங்களில் ஏற்கெனவே கொள்வனவு செய்யப்பட்ட நெல் தேங்கிய நிலையில் காணப்படுகின்றது. எதிர்காலத்தில் நெல் அறுவடை செய்கின்றபொழுது, நெல் சந்தைப்படுத்தும் சபையால் அதனைக் கொள்வனவு செய்வதில் அல்லது விவசாயிகளுடைய நெல்லுக்கு உரிய விலையைக் கொடுக்க முடியாத பட்சத்தில் விவசாயத்தைக் கைவிட வேண்டிய ஒரு நெருக்கடியான சூழ்நிலைக்கு விவசாயிகள் தள்ளப்படுவார்கள்.

இவ்வாறான நிலையில், அரசாங்கம் ஒரு சிறந்த முகாமைத்துவத்தின்மூலம் உள்நாட்டு உற்பத்தியை ஊக்குவித்து, விவசாயிகளுக்கு வாய்ப்பை வழங்க வேண்டும். ஏனென்றால், இறக்குமதி செய்வதற்காக நாம் பாரிய நிதியை வெளிநாடுகளுக்குச் செலுத்தவேண்டிய நிலை ஏற்படுகின்றது. இன்று இந்தச் சபையில் பேசிய எல்லோரும் டொலரின் பெறுமதி அதிகரிப்பு மற்றும் நாட்டில் ஏற்பட்ட விலை அதிகரிப்பு பற்றி பேசினார்கள். இன்று டொலரின் பெறுமதி 354 ரூபாயாக இருக்கின்றது. இந்த நிலைமையை முகாமைத்துவம் செய்யத் தவறினால், எதிர்காலத்தில் பாரிய நெருக்கடியைச் சந்திக்கவேண்டிய நிலை விவசாயத்தை நம்பி இருக்கின்ற எங்களுடைய விவசாயிகளுக்கு ஏற்படும். அரசாங்கம் தனிப்பட்ட ஒருவருக்கு 1,040 மெற்றிக்தொன் 'பொன்னி' அரிசியை இறக்குமதி செய்ய அனுமதி வழங்குவதன்மூலம், கீரி சம்பா, சம்பா ஆகியவற்றுக்கு ஈடாக உள்நாட்டு அரிசி வர்த்தகம் பாதிக்கப்படுமென்பது தெட்டத்தெளிவாக இருக்கின்றது.

அடுத்து, நான் இங்கே சில விடயங்களைச் சொல்ல வேண்டும். கடந்த வாரம் எங்களுடைய மாவீர்களுக்கான முள்ளிவாய்க்கால் நினைவு தினம் அனுஷ்டிக்கப்பட்டது. கடந்த கால அரசாங்கங்களோடு ஒப்பிடுகையில் இம்முறை ஒரு வகையான தளர்வுப் போக்கு இந்த விடயத்தில் செய்யப்பட்டு இருந்தாலும், பல இடங்களில் நெருக்கடிகள் காணப்பட்டதை அவதானிக்கக் கூடியதாக இருந்தது. முள்ளிவாய்க்காலில் கொல்லப்பட்ட மக்கள் தொடர்பில் அவர்களுடைய உறவுகளுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. இந்தப் போராட்டம் என்ன காரணத்துக்காக ஆரம்பிக்கப்பட்டதோ, அதற்கான அரசியல் தீர்வு சம்பந்தமான எந்த முன்முயற்சி களும் இல்லை. இந்த விடயங்களை எதிர்காலத்தில் அரசு கவனத்திற்கொள்ள வேண்டுமென்ற செய்தியைச் சொல்லிக்கொள்கிறேன்.

நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகை தந்திருந்தார். அந்த வருகையின்போது பல அபிவிருத்தித் திட்டங்களுக்கான அனுமதிகள் வழங்கப்பட்டன. உண்மை யிலேயே அந்த விடயத்துக்கு நான் நன்றி கூறுகின்றேன். குறிப்பாக, மாந்தீவைச் சிறைச்சாலைக்கு எடுப்பதற்கான திட்டத்தைக் கைவிட்டதோடு, பல அபிவிருத்தித் திட்டங்களுக்கான உடனடி உத்தரவுகளும் கொடுக்கப்பட்டன. ஆனாலும், மிக முக்கியமாக தமிழ் மக்கள் எதிர்பார்க்கின்ற அரசியல் தீர்வு சம்பந்தமாகவோ, மாகாண சபைத் தேர்தல் சம்பந்தமாகவோ அல்லது தமிழ் மக்களுக்கான நீதி கோருதல் சம்பந்தமாகவோ எந்த விடயங்களும் சொல்லப்படவில்லை என்பது அவர்களைப் பொறுத்தவரையில் மிகவும் ஏமாற்றமான விடயமாக இருக்கிறது. நாட்டின் பொருளாதார நிலைமைகளைச் சமப்படுத்துவதற்கான செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டிய தேவை அரசுக்கு இருக்கின்றது. இத்தகைய பொருளாதார நெருக்கடிகள் கடந்த காலங்களில் எவ்வாறான நிலைமைகளை இந்த நாட்டில் உருவாக்கியது என்பதைப் புரிந்துகொள்ள வேண்டும். கடந்த கால யுத்தம் காரணமாக தமிழ் மக்கள் ஈடுபாட்டுடன் தங்களுடைய வர்த்தக நடவடிக்கைகளிலும் பொருளாதார நடவடிக்கைகளிலும் பங்கேற்க முடியாத சூழ்நிலைகள் காணப்பட்டன. நீண்டகால பொருளாதார நெருக்கடிக்குக் காரணமாக அரசியல் ஸ்திரத்தன்மையின்மை இருந்து வருகின்றது. எனவே, இவற்றுக்குத் தீர்வு காணவேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. ஊழலுக்கு எதிரான, இலஞ்சத்துக்கு எதிரான, போதை ஒழிப்புக்கான செயற் றிட்டங்களை அரசாங்கம் செய்திருந்தாலும்கூட, இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற தமிழ் மக்களுடைய பிரச்சினைக் கான நியாயமான தீர்வு விடயத்தில் இன்னும் கண்டுங் காணாமல் இருப்பது உண்மையிலேயே மனவருத்தத்தை ஏற்படுத்துகின்றது.

எமது மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் கௌரவ சுனில் ஹந்துன்னெத்தி அவர்கள் ஏற்பாடு செய்த சனாதிபதி அவர்களின் வருகையின் ஊடாக பல திட்டங்களுக்கு அனுமதியளிக்கப்பட்டது. நாங்கள் நிறையத் திட்டங்களை முன்வைத்திருந்தோம். கிரான் பால திட்டம் சம்பந்தமாக, படுவான்கரையையும் எழுவான் கரையையும் இணைக்கின்ற பாலங்களின் புனரமைப்புத் தொடர்பாக, சிறைச்சாலையை இடம் மாற்றுவதன்மூலம் மட்டக்களப்பு போதனா வைத்திய சாலைக்குக் காணி கொடுப்பது தொடர்பாக, எங்களுடைய மாந்தீவை சிறைச்சாலைக்கு எடுக்காதிருப்பது தொடர்பாக என பல விடயங்களுக்கு சாதகமான பதில்கள் கிடைத்தன.

இதற்கு அப்பால் பல விடயங்கள் இருக்கின்றன. தாண்டியடியில் இருக்கின்ற STF முகாமை அகற்றி மாவீரர் துயிலும் இல்லமாக அந்தப் பிரதேசத்தை மக்களின் பயன்பாட்டுக்காக - போராளிகளுக்கு அஞ்சலி செலுத்து வதற்காக - கொடுக்கின்ற விடயத்துக்குப் பதில் சொல்லப் படவில்லை. நெடியகல்மலையில் தொல்பொருளியல் திணைக்களத்தால் நெருக்கடியான நிலை ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. அதற்கான தீர்வு கிட்டவில்லை. மயிலத்தமடு, மாதவனையை மேய்ச்சல் தரைக்குக் கொடுப்பதில் மிக அலட்சியமான ஒரு பதிலை வன இலாகா கூறியிருந்தது. எனவே, இந்த விடயங்களில் மிக உறுதியான முடிவுகள் எடுக்கப்பட வேண்டும். மட்டக்களப்பின் பொருளாதாரத்துக்கு மிக அத்தியாவசியமாக விவசாயம் மற்றும் மீன்பிடித் துறையோடு கால்நடை வளர்ப்பும் இருக்கின்றது. அந்த வகையில், கால்நடைகளைப் பராமரிப்பதற்காக கிட்டத்தட்ட 1,500 ஏக்கர் மேய்ச்சல் தரையை மிக விரைவாக விடுவிப்பது தொடர்பாக உத்தரவொன்றை வழங்கியிருந்தார். அதனை நான் பாராட்டுகின்றேன். ஆனால், அங்கிருக்கின்ற மொத்தக் கால்நடைகளுக்கு அந்த நிலம் போதாது. மகாவலி அபிவிருத்தி அதிகாரசபை ஊடாக 3,000 ஏக்கர் காணியும், வன இலாகா

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

ஊடாக 3,500 ஏக்கர் காணியும் விடுவிப்பதாக இருந்தது. இன்று 1,500 ஏக்கர் மட்டும்தான் விடுவிப்பதாக இருக்கின்றது. ஆகவே, இந்த விடயத்தில் அவர் எடுக்கும் நடவடிக்கையைப் பாராட்டுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Elayathamby Srinath, your time is up.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Sir, please give me half a minute.

அத்தோடு, மேய்ச்சல் தரை விடயத்தில் கரிசனையோடு செயற்பட்டு வன இலாகாவின் அலட்சியத்தைப் புறக்கணித்து, இதற்கு மேலதிகமாக காணிகளை விடுவிப்பதற்கான ஏற்பாடு களையும் அவர் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொண்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dinesh Hemantha. You have ten minutes.

[අ.භා. 1.08]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසිද අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, දවස් දෙකක් පුරාවට ජාතික ජන බලවේගය ආණ්ඩුව ගත්ත ආර්ථික ක්‍රියාමාර්ග, එම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල සම්බන්ධයෙන් සැකයන් උත්පාදනය කරන්න යම් යම් අය උත්සාහ දරන වෙලාවක, වසර එකහමාරකට ආසන්න කාලයක් තිස්සේ අපි ආණ්ඩුවක් විධියට ගත්ත ආර්ථික තීන්දු තීරණ සම්බන්ධයෙන් කෙටි විග්‍රහයක් කරන්න මම කැමැතියි.

ඕනෑම රටක් තමන්ගේ ආර්ථිකය සම්බන්ධයෙන් සැලසුම් සකස් කරන්නේ අනාගතය ගැන පුරෝකථනය කරලා. රටක අභ්‍යන්තර තත්ත්වය, රටට පාලනය කළ නොහැකි බාහිර තත්ත්වයන් සම්බන්ධයෙන් පුරෝකථනය කරලා, ඒ පුරෝකථන ඔස්සේ ගමන් කිරීමෙන් ඉලක්ක ළඟා කර ගැනීම තමයි ඕනෑම රටක ආර්ථික සැලසුම් සකස් කිරීමේ ක්‍රියාදාමය වෙන්නේ. මේ ආර්ථික විද්‍යාවේ සරල මූලධර්මයක් තිබෙනවා. කිසියම් ආයෝජනයක අවදානම අඩුයි නම් එම ආයෝජනයේ ප්‍රතිලාභත් අඩුයි. කිසියම් ආයෝජනයක අවදානම වැඩියි නම් එම ආයෝජනයේ ප්‍රතිලාභත් වැඩියි. ඒ නිසා මේ ආණ්ඩුකරණයේදී ජාතික ජන බලවේගය ආණ්ඩුවටත් ඔය මාර්ග දෙකෙන් තීන්දු තීරණ ගන්න වෙච්ච අවස්ථා තිබුණා. රටේ පොදු ජනයා ගැන හිතන, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහජන ආණ්ඩුවක් බවට ජනතා විශ්වාසය තහවුරු කරන ආණ්ඩුවක් විධියට අපි හැම වෙලාවේම කටයුතු කර තිබෙනවා. ඉතා සරල මාර්ග ඔස්සේ ගිහිල්ලා, අනාගතයේ ජනතාවට ප්‍රතිලාභ අඩුවෙන් බුක්ති විඳින්නට ලැබෙන ආර්ථික ක්‍රියාකාරකම්, තීන්දු තීරණ ගන්නවා වෙනුවට, ඉතා අසීරු මාර්ග ඔස්සේ ගොස් අනාගත සුබසාධනය, සුබසිද්ධිය මහ ජනතාවට මහ පොළොවේ උද්දීපනය කරන්න අවශ්‍ය තීන්දු තීරණ වසර එකහමාරක් පුරාවටම අපි අරගෙන තිබෙනවා.

2026 වර්ෂයට අදාළ අය වැය සම්පාදනය කරමින් තිබෙන අවස්ථාවක, අය වැය විවාදය පවත්වමින් තිබෙන අවස්ථාවක, අය වැය විවාදයේදී යම් යම් අමාත්‍යාංශ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ විවාද පවත්වන අවස්ථාවක නොසිතූ ලෙසට ඉතිහාසයේ දරුණුම ස්වභාවික ව්‍යසනයක්, ඛේදවාචකයක් වූ "දිට්වා" ආපදාවට මුහුණ දෙන්න ශ්‍රී ලංකාවට සිද්ධ වුණා. ඒ වෙලාවේදී විපක්ෂයේ බහුතර මන්ත්‍රී ප්‍රමාණයකගේ - සමස්ත විපක්ෂය කිව්වත් මා නිවැරදියි - ඉල්ලීම වුණේ 2026 වර්ෂය සඳහා සකස් කර තිබෙන අය වැය යළි සංශෝධනය කරලා, එහෙම නැත්නම් වෙනස් කරලා "දිට්වා" ආපදාවට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් වෙනම සහන පැකේජයක් ගේන්න, අය වැයෙන් යම් යම් අමාත්‍යාංශවලට, නැත්නම් දෙපාර්තමේන්තුවලට වෙන් කර තිබුණු ප්‍රතිපාදන කප්පාදු කරලා ජනතාවට සහන සලසන්න අවශ්‍ය කරන පැකේජයක් නිර්මාණය කරන්න කියන එකයි. ඒ වෙලාවේ අපටත් තිබුණා, පාරවල් දෙකක්. එකක් තමයි සරල මාර්ගය, ලෙහෙසි පාර. ඒ මොකක්ද?

අය වැයෙන් වෙන් කර තිබෙන ප්‍රතිපාදන කප්පාදු කරලා 2026 වර්ෂයට අදාළ සංවර්ධන ක්‍රියාවලිය පොඩ්ඩක් පස්සට අරගෙන ජනතාවට අවශ්‍ය සහන සලසන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තමයි පළමුවැනි මාර්ගය. සංවර්ධන ක්‍රියාදාමය දශමයකින්වත් අඩු නොකොට සංවර්ධනය සඳහා ගත්ත ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති වෙනස් නොකොට 2026 වර්ෂයේ සංවර්ධනය එලෙසම පවත්වාගෙන යමින් ජනතාවට සහන සැලසීමට වෙනම වැඩ පිළිවෙළක් සකස් කිරීම දෙවැනි මාර්ගයයි. ඒ දෙවැනි මාර්ගය අසීරුයි. ආණ්ඩුවක් විධියට ගත්තොත්, දෙවැනි මාර්ගය භාරදූරයි. දෙවැනි මාර්ගය තෝරා ගැනීම අභියෝගාත්මකයි. නමුත්, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මහජනතාවට තමන් ජනතා ආණ්ඩුවක් පත් කරගෙන ඇති බව සනාථ කරන්න, ඒ විශ්වාසය තවදුරටත් තහවුරු කරන්න අපි තෝරා ගත්තා, දෙවැනි මාර්ගය. ඒ, මොකක්ද? 2026 වර්ෂයට වූ අය වැයේ කිසිදු වෙනසක් නොකොට ආපදාවට පත් වෙච්ච ජනතාවට අවශ්‍ය කරන, ඉතිහාසයේ නොවූ විරූ සහන පැකේජයක් ක්‍රියාත්මක කරන්න අපි තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව මේ බිමේ අපි ක්‍රියාත්මක කළා. ඒ වෙලාවේ විපක්ෂය කිව්වේ, මේ ආපදාව වෙලාවේ ඔබතුමන්ලා ගන්න ඕනෑම තීන්දුවකට - තීරණයකට - අපි එකඟයි, ඒ නිසා මේ අය වැය වෙනස් කරලා ගන්න තීන්දුවකට උදව් කරන්න ඉදිරිපත් වෙනවා කියලායි. නමුත්, අපි මේ භාරදූර තීන්දුව අරගෙන පළමුවැනි මාසය යනකොට විපක්ෂයෙන් ගෝරනාඩුවක්, එහෙම නැත්නම් කෙඳිරිල්ලක්, එහෙම නැත්නම් මැසිවිල්ලක් නිතර ආවා, "කෝ, දැන් මාසයක් යන්න ළඟයි, ගෙවල් සුද්ද කරගන්න රුපියල් 25,000 ගෙව්වාද? බඩු මුට්ටු ගන්න රුපියල් 50,000 ගෙව්වාද? දරුවන්ට පෙළ පොත් ගන්න රුපියල් 15,000 ගෙව්වාද?" කියලා. ඒ මැසිවිල්ල මාසයක් තිබුණා. හැබැයි, අද වනකොට ඒ මැසිවිල්ල නැහැ. ඇයි, ඒ? අද වනකොට ඒ කිව්ව කාරණා සියල්ල අපි සම්පූර්ණ කරලා ඉවරයි, "දිට්වා" ආපදා සහන පැකේජය ඇතුළේ.

මාස එකහමාර පනින්න හම්බ වුණේ නැහැ, මාස දෙක පනින්න හම්බ වුණේ නැහැ, ඊට පස්සේ ආපු චෝදනාව තමයි, "ගෙවල් කුලිය ගෙව්වාද? ගෙවල් කුලිය ගෙවන්න පටන් ගත්තාද? ගෙවල් කුලිය දුන් ගෙවල් ගණන කියන්න, මේ වනකොට කිසිම ගෙදරකට ගෙවල් කුලියක් ගෙවලා නැහැ" කියන එක. ඒක තමයි මාස එකහමාරක්, දෙකක් යනකොට විපක්ෂයෙන් ආපු ගෝරනාඩුව, මැසිවිල්ල. හැබැයි, අද වනකොට ඒ මැසිවිල්ල.

එහෙම නැත්නම් ඒ චෝදනාව අපි ව්‍යර්ථ කරලා තිබෙනවා. ගෙවල් කුලිය ලැබීමට සුදුසු සියලු ජනතාවට ආපදා සහන පැකේජය යටතේ අපි ගෙවල් කුලිය ගෙවලා තිබෙනවා. ඊට පස්සේ මාස තුනක් පනිනකොට ආපු ප්‍රධාන මැසිවිල්ල, එහෙම නැත්නම් චෝදනාව තමයි, "ගෙවල් හදනවා කිව්වා, ගෙවල් හදන්න පටන් ගත්තාද? කෝ, හදපු ගෙයක් පෙන්වන්න" කියන එක. "දිට්වා" ආපදාවෙන් හානියට පත් වෙච්ච සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සිටි අදාළ නිවාසලාභීන්ට, නැත්නම් ගෙවල් ලැබීමට සුදුසුකම් තිබෙන ජනතාවට ගෙවල් ඉදිකිරීමේ වැඩ පිළිවෙළ අද වනකොට ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. දැන් අලුත්ම චෝදනාව තමයි, අලුත්ම මැසිවිල්ල තමයි, "ගෙවල් හදලා ඉවරද? කෝ, ගෙවල් හදලා බාර දුන්නාද?" කියන එක. අපි අභියෝගාත්මකව, එහෙම නැත්නම් ඉතාම අභිමානයෙන් කියනවා, අපි ක්‍රමක්‍රමයෙන් ආපු ආර්ථික ගමන තුළ පසුගිය මාස කිහිපයේදී ඔබතුමන්ලාගෙන් ආපු සෑම චෝදනාවකටම නිවැරදි ආකාරයට පිළිතුරු ලබා දෙන්න අපට හැකියාව ලැබුණා නම්, අපි මේ ගෙවල් ටික ඉතා ඉක්මනින් හදලා අදාළ ජනතාව පදිංචි කරවනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගෙවල් හදලා අදාළ ජනතාව පදිංචි කරවනවා කියන එක අස්සේ බොහොම දුක්ඛිත කථාවක් තිබෙනවා. අපි මේ ගෙවල් හදන්නේ 2026 "දිට්වා" සුළි කුණාටුව නිසා ආපදාවට පත් වෙච්ච ජනතාවට විතරක් නොවෙයි. 2012, 2016 වාගේ වර්ෂවල ආපු ස්වාභාවික ව්‍යසනයන්ට ගොදුරු වෙච්ච මේ ලංකාවේ බහුතරයක් ජනතාවට එදා ඉඩම් කෑල්ලක් දෙන්න, ගෙයක් හදලා දෙන්න බැරි වෙච්ච ඒ ආණ්ඩු නඟන මැසිවිලිවලටත් දැන් අපි පිළිතුරු දෙනවා. ඔබතුමන්ලාට කරගන්න බැරි වෙච්ච ඒ වැඩ ටිකත් අපේ ගොඩට දමා තිබෙනවා. අපි වර්ග භේදයකින්, ආගම් භේදයකින්, කාල පරිච්ඡේද භේදයකින් තොරව විපතට පත් වෙච්ච ජනතාවට 2026 වර්ෂයේදී ඒ සහනය ලබා දීලා, අපේ බලාපොරොත්තුව ඉෂ්ට කරනවා, අපේ ඉලක්කය සපුරනවා.

මම අවසාන විනාඩි දෙක ගන්නම්, "දිට්වා" ආපදා තත්ත්වය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයට වුණු හානිය පිළිබඳව පැහැදිලි කරන්න. මොකද, මේක මාතලේ දිස්ත්‍රික්කයටත් වැදගත් වන නිසා. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ටම අදාළව "දිට්වා" ආපදාවෙන් හානියට පත් වෙච්ච යම් නිවාස ප්‍රමාණයක් තිබෙනවා නම් ඒ නිවාස ප්‍රමාණය හදන්න ඕනෑ කරන ඉඩම් ප්‍රමාණය වෙන් කර ගැනීමේ වැඩ පිළිවෙළ අපි මේ වනකොටත් ක්‍රියාත්මක කරලා ඉවරයි. ඇතැම් ඉඩම් ගන්න තිබෙන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. පෙර තිබුණු අනීතික ආණ්ඩු කළා වාගේ ඉඩම බලලා කැලෑ එළිපෙහෙළි කරලා තමන්ගේ හිතවතුන්ට, තමන්ගේ ගජ මිතුරන්ට දවසෙන්, දෙකෙන් ගෙවල් හැදුවා වාගේ අපට හැසිරෙන්න බැහැ. ඒ නිසා අපි කරන හැම වැඩක්ම නීත්‍යානුකූල ක්‍රමවේදයක් ඔස්සේ කරන්න ඕනෑ. අපි ගෙවල් හදනවා කියලා කොතැන හරි ඉඩමකට ගෙනිහිල්ලා මේ ජනතාව යළි පදිංචි කරවන්න බැහැ. එම නිසා ඉතිහාසයේදී මුහුණ දුන් ඛේදවාචකයට මේ ජනතාව අනාගතයේ යළිත් දවසක මුහුණ නොදෙන විධියට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය සමඟ ඒකාබද්ධ වෙලා සුදුසු ඉඩම් තෝරාගෙන මේ ජනතාව පදිංචි කරවන්න අපට සිද්ධ වනවා.

මාතලේ දිස්ත්‍රික්කය ගැන කියනවා නම්, ගෙවල් හදන්න ඕනෑ කරන ඉඩම් සියල්ල මේ වනකොට අපි හඳුනාගෙන ඉවරයි. ඒවා පවරා ගැනීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වනවා. තමන්ටම අයිති ඉඩමක් තිබෙනවා නම් අපි ඒවායේ ගෙවල් හදන්න පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන් ලග්ගල ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ටම අදාළව ජනතාව පදිංචි කරන්න අවශ්‍ය ඉඩම් අපි මේ වනකොට වෙන් කරගෙන තිබෙනවා. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ මේ ආණ්ඩුව කරගෙන යෑමේදී, මේ රාජ්‍යකරණ ක්‍රියාවලියේදී යම් අවස්ථාවක අභියෝගාත්මක තීන්දුවක් ගන්න වෙනවා නම් ඒ අභියෝගාත්මක තීන්දුවේදී පොදු මහජනතාව වෙනුවෙන් දශමයක හරි ප්‍රතිලාභයක් වැඩිපුර ලැබෙනවා නම් අපි නොබියව ඒ තීන්දුව ගන්න බවත්, අදත්, හෙටත්, මතු පරම්පරාවේ අනාගතය වෙනුවෙනුත් මේ ආණ්ඩුව පවතින තාක්කල් ජන ජීවිත සුඛිත මුදිත කරන්න අවශ්‍ය තීන්දු තීරණ දෙපාරක් නොහිතා ගන්නා බවත් තමයි. එසේ තීරණ ගන්න හැකියාව සහිත ජාතික ජන බලවේගයේ සැබෑ ආණ්ඩුවක් අපි බිහි කර තිබෙනවා කියලා ප්‍රකාශ කරමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. S.M. Marikkar. You have four minutes.

[අ.භා. 1.18]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණය කියනවා. ඊයේ ඩොලරයේ අගය රුපියල් 344යි. අද වන විට රුපියල් 354යි. රුපියල් 10කින් වැඩි වෙලා. එතකොට දවසක් ඇතුළත අපේ ණය බර රුපියල් බිලියන 400කින් වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියාවි, ණය ගෙවන්නේ ඩොලර්වලින් කියලා. හැබැයි, අපි කියන්නේ අද තිබෙන යථාර්ථය. ඒකේ ප්‍රතිඵල අපි ඊයේ දැක්කා. කිරිපිටි පැකට් එකක් රුපියල් 50කින් වැඩි වෙලා වෙළෙඳ පොළට ආවා. මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්නේ නැහැ. ඒවායේ ප්‍රතිඵල තැපෑලෙන් එයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපි ප්‍රමිතියෙන් බාල ගල් අඟුරු ගැන කථා කරනකොට ආණ්ඩු පක්ෂයේ අය විවිධ කථා කිව්වා. මෙතෙක් ආපු ගල් අඟුරු නැව්වලින් 9වැනි ගල් අඟුරු නැව වෙනකම් තමයි මේ රටේ ජනතාව දන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි 10වැනි නැවේ ගල් අඟුරුවල දළ කැලරි අගය කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5,220යි. ඒ කියන්නේ, 5,900ට අඩුයි. 11වැනි නැවේ එම අගය 5,110යි; 12වැනි නැවේ 5,105යි; 13වැනි නැවේ 4,985යි; 14වැනි නැවේ 5,049යි; 15වැනි නැවේ 5,857යි; 16වැනි නැවේ 4,565යි; 17වැනි නැවේ 5,665යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරු නැව් 17යි ආවේ. ඒ නැව් 17ම ෆේල්. තව මොනවාද කියන්නේ? මොන කයිය ගැහුවත්, මොන සුන්දර කථා කියන්න ගියත් රුපියල අවප්‍රමාණය වෙලා නූල කැඩිච්ච සරුංගලය වාගේ යනවා. දවසින් දවස පැයෙන් පැයට අපේ ණයබරතාව වැඩි වනවා. අනෙක් පැත්තෙන් ගල් අඟුරු නැව් එනවා, ඒ ආපු ගල් අඟුරු නැව් 17ම ෆේල් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගල් අඟුරු නැව් ෆේල් වෙච්ච බව සඳහන් වන reports කිහිපයක් මා සතුව තිබෙනවා. මේ අවස්ථාවේදී මා එම reports **සභාගත*** කරනවා.

මේවා මරික්කාර් කියන ඒවා නොවෙයි. ලක්විජය විදුලි බලාගාරයේ reports. ඒ වාගේම මහජන උපයෝගිතා කොමිසමේ වාර්තා අනුව පසුගිය ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳලා මැයි

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මාසයේ 13වැනි දා දක්වා ලක්විජය විදුලි බලාගාරයෙන් ජනනය කළ යුතු විදුලිය මෙගාවොට් පැය ප්‍රමාණය 155,961ක්. නමුත් එම විදුලිය මෙගාවොට් පැය 155,961ක ප්‍රමාණය ජනනය වෙලා නැහැ. එතකොට මේ අවශ්‍ය විදුලිය ප්‍රමාණය නිෂ්පාදනය කරන්නේ කොහොමද? Furnace oilවලිනුයි, ඩීසල්වලිනුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේකේ පාඩුව කොච්චරද කියලා. තෙල් මිල වැඩි වෙන්න කලින් පළමුවැනි නැව් 9 පාඩුව රුපියල් මිලියන 8,497යි. මේ සියල්ලේම පාඩුව ගණනය කළාම අනිවාර්යයෙන්ම රුපියල් බිලියන 30කට වැඩිය පාඩු කරලා තිබෙනවා, හිටපු බලශක්ති ඇමති. හොරකම් කළේ නැහැ කියලා කියයි. හැබැයි, අර්ජුන රණතුංගටයි, ධම්මික රණතුංගටයි නඩු දමා තිබෙන්නේ රජයට පාඩු කළා කියලා. ඒ නිසා මේ පාඩුවට රජය වග කියන්න ඕනෑ; තනිවම හෝ සාමූහිකව වග කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ සමහර කට්ටිය කියනවා, IMF එකේ ඩොලර් මිලියන 700 ආවාම, ඒ වාරික දෙක ආවාම ඔක්කෝම හරි යයි කියලා. මාස එකහමාරකට තෙල් ගන්න ඒ මුදල ඇති. මාස එකහමාරකට තෙල් ගන්න පුළුවන් මුදලක් තමයි ඩොලර් මිලියන 700ක් කියන්නේ. මේ ආණ්ඩුව කයිය ගහමින් ඉන්නවා. අපේ රටට සෘජු විදේශ ආයෝජන නොපැමිණීමේ ප්‍රතිවිපාක දැන් ඇති වී තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවේ නොහැකියාව නිසා සහ කාර්යක්ෂමතාවක් නොමැති නිසා ඩොලර්වලින් වියදම් කරලා බාල ගල් අඟුරු ලංකාවට ගෙන්වීම හේතුවෙන් අවශ්‍ය විදුලිය ජනනය නොවුණා කියන කාරණයත් මම සඳහන් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have one more minute.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නැව් 17ක් ආවා. නැව් 17ම ෆේල්. ඒ හේතුවෙන් අවශ්‍ය විදුලිය නිපදවෙන්නේ නැති නිසා spot tenders අධික මිලකට දැම්මා. ඒකෙනුත් රජයට පාඩුයි. ඒ වාගේම මෙගාවොට් 155,961ක් නිෂ්පාදනය නොවීමේ ගැටලුව ඉදිරි සැප්තැම්බර් මාසය වෙනකම් තිබෙනවා. එසේ ගණනය කළ නොහැකි මට්ටමේ අතිවිශාල පාඩුවක් සිදු වුණේ මේ කයිය ගහන කට්ටියගේ අකාර්යක්ෂමතාව නිසා තමයි. අද ජාත්‍යන්තර ආයෝජකයන්ට අපේ රටේ ආර්ථිකය පිළිබඳව ශත පහක විශ්වාසයක් නැති මට්ටමට පත් වෙලා තිබෙන්නේ. මේ අය තවම නිකම් දොඩව දොඩවා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 අවුරුද්දේ ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව ගිය පාරේම තමයි මේ යන්නේ. ඒ ආණ්ඩුව ගිය විධියම තමයි මේ පෙනෙන්නේ. ජනතාවට උදේ හවා දැනෙන්නේ ඒකම තමයි. කිරි පිටි මිල වැඩි වෙනවා. හෙට අනිද්දා වෙනකොට ඩොලර් වියදම් කර ආනයනය කරන තව තවත් දේවල් අඩු වෙනවා. ඒ නිසා අපි ජනතාවට කියන්න කැමැතියි, දැන්වත් ඇත්ත තේරුම් ගන්න කියලා. මේ අයගේ වැඩ නිසා තමයි ජනතාව ඔහොම දුක් විඳින්නේ.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. D.V. Chanaka. You have six minutes.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දිනයේ මම විශේෂ හෙළිදරව්වක් කරන්න බලාපොරොත්තු වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Deputy Minister?

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ ගල් අඟුරු සම්බන්ධ කාරණය පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order, Hon. Deputy Minister. I will give you 30 seconds, anyway. Hon. S.M. Marikkar, do you want to take that on?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Yes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. But, do not make it a debate please.

Hon. Deputy Minister, I will give you 30 seconds.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු නැව් 17ක් දැනට ඇවිල්ලා තිබෙනවා. නැව් 16ක results ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ඩොලර් මිලියන 27ක දඩ මුදලක් දැනටත් අය කරගෙන තිබෙනවා. ඒක කිසිසේත්ම විදුලි බිලට හෝ කිසිම දෙයකට එකතු කරලා නැහැ. ඒක PUCSL වාර්තාවේත් තිබෙනවා. ඒ පාඩුව නිසා එහෙම ප්‍රශ්නයක් ඇති වුණා කියන එක සම්පූර්ණයෙන්ම වැරදි කථාවක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. S.M. Marikkar. Make it very brief. I will give you also just 15 seconds.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දේවල් මම කියපු ඒවා නොවෙයි. මේ නැව් 17ම ෆේල්. මෙගාවොට් 155,000 ගණනක් ජනනය වෙලා නැහැ කියලායි PUCSL වාර්තාවේ තිබෙන්නේ. ඒ ප්‍රමාණය furnace, නැප්තා සහ ඩීසල්වලින් මිලදී ගත්තා කියන කාරණය කියනවා. එසේ පාඩු වුණු හරි ගණන කියන්නකෝ. තවම ඒක ගණනය කර ගන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

Hon. D.V. Chanaka, I am sorry about the interruption.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලබා දුන් විනාඩි 6ක කාලයම ලැබෙයි කියලා මම හිතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 1.23]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජ්‍ය ඇමතිතුමාට උත්තරයක් දීගෙනම මගේ කථාව පටන් ගන්නම්. ඩොලර් මිලියන 27ක් කියන්නේ, රුපියල් බිලියන 10යි. වර්තමාන ඩීසල් මිලට අනුව ගණනය කළාම පළමු නැව් 8න් විතරක් රුපියල් බිලියන 30ක් පාඩුයි. එතකොට ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔය නැව් 17ටම ගෙව්වා කියන්නේ ඩොලර් මිලියන 27යි. ඒ කියන්නේ එතැනම රුපියල් බිලියන 20ක් පමණ පාඩුයි. ඒ නිසා මම ඒ ගැන මින් එහාට කථා කරන්නේ නැහැ.

අද මම ඊටත් වඩා භයානක හෙළිදරව්වක් කරන්නයි යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ටී.බී. සරත් මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න එක ගැන මා සතුටු වෙනවා. මොකද, එතුමා කෘෂිකාර්මික ප්‍රදේශයක් නියෝජනය කරන්නේ. ඒ වාගේ ප්‍රදේශවලට බලපාන කාරණයක් මම මේ කියන්නේ. ලංකාවේ කෘෂි කර්මාන්තයට - වගාවන්ට - බලපෑම් කරන, හානි කරන සත්වයෙක් තමයි, සුදුමැස්සා - whitefly - කියන්නේ. සුදුමැස්සා අපේ රටේ වගාවට බරපතළ ලෙස බලපානවා. අපි අපනයනය කරන අඹ සහ කරවිල වාගේ එළවලු විශේෂයෙන්ම යුරෝපයෙන් ගන්නේ නැහැ. මොකද, ලංකාවේ whitefliesලා ඉන්නවා කියන නිසා. ඒ වාගේම සමහර fungus නිසාත් ලංකාවේ භෝග වර්ග ගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ flies, fungus වාගේ rusts අපේ රටට එන්නේ සාමාන්‍යයෙන් යම් යම් දේවල් ආනයනය කිරීමේදීයි.

2026 ජනවාරි මාසයේ 12වැනි දා සිදු වුණු ලොකුම අක්‍රමිකතාවක්, දූෂණයක් පිළිබඳව තමයි අද මම හෙළි කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්තරා සමාගමක් විසින් ලංකාවට chrysanthemum කියන මල් වර්ගය සහිත කන්ටේනර් 18ක් අරගෙන ආවා. සාමාන්‍යයෙන් National Plant Quarantine Service එකෙන් ගිහිල්ලා ඇස්වලින් බලලා මේවා check කරනවා. ඒක check කරපු නිලධාරියා minute එකක් ගහලා තිබෙනවා, මේවායේ ඇස්වලට පෙනෙන කෘමීන් ඉන්නවා, ඒ වාගේම මල්වල සහ පත්‍රවල rust තිබෙනවා, පුස් වාගේ බැඳිලා තිබෙනවා කියලා. හැබැයි, එහෙම තිබියදී කෘෂිකර්ම අධ්‍යක්ෂතුමිය විසින් වාචිකව - verbally - උපදෙස් දෙනවා, කමක් නැහැ, කන්ටේනර් 6ක් - කන්ටේනර් 2, 3, 4, 5, 7, 9 - තියා ගෙන ඉතුරු කන්ටේනර් 12ම යවන්න කියලා. ඊට පස්සේ අර තියා ගත්ත කන්ටේනර් 6හි සාම්පල් ටික යවනවා, National Plant Quarantine Service එකට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒගොල්ලන් samples check කළාම result එක එනවා, "The tested sample was contaminated with live whitefly...." කියලා. මේවායේ සුදු මැස්සන් - whiteflies - ඉන්නවා කියලා මේ සාම්පල lab එකට ගෙන ගියාම කියා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "The submitted samples of chrysanthemum spp. were contaminated with Rust disease" කියාත් එහි සඳහන්ව තිබෙනවා.

ඊළඟට, Recommendation එකේ කියනවා, "As it is a highly destructive pathogen and can be easily transmitted, it is advised to destroy affected parts under strict sanitary conditions" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කියන්නේ මොකක්ද? මේ නිර්දේශයේ කියනවා, මේ මල්වල තිබෙන pathogen එක කඩිනමින් වගාවන් විනාශ කරන්න පුළුවන් පුස් වර්ගයක් බවත්, whiteflies කියලා මැස්සන් වර්ගයක් ඉන්න බවත්. මේ රෝගය වගාවන්ට ඉක්මනට පැතිරෙන්න පුළුවන්, ඒ නිසා ඉක්මනට මේවා විනාශ කරන්න කියලා උපදෙස් එනකොට කන්ටේනර් 18න්, 12ක් එළියට යවලාත් ඉවරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. උපදෙස් දෙනකොට ලංකාව ඇතුළේ තිබුණේ කන්ටේනර් 6යි.

1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ - Regulation under the Plant Protection Act, No. 35 of 1999 - 96වන වගන්තිය යටතේ උපදෙස් දීලා තිබෙනවා, ලංකාවට ගෙනෙන කන්ටේනර්වල මොනවා හෝ කෘමියෙක් - an insect - live හිටියොත් අනිවාර්යයෙන්ම ඒවා සම්පූර්ණයෙන් විනාශ - destroy - කරන්න ඕනෑ කියලා. හැබැයි, එහෙම තිබියදීත්, ඇස්වලින් ඒක දැකලා නිලධාරීන් කියද්දීත් කන්ටේනර් 18න්, 12ක් යවලාත් ඉවරයි. මෙහෙම වුණේ එක වතාවක් විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් ඉන්න නිලධාරීන් 36දෙනෙක් අත්සන් කරලා අමාත්‍යවරයා වාගේම අමාත්‍යාංශය දැනුවත් කර තිබෙනවා. හැබැයි, එහෙම තිබියදී මේ වාගේ කන්ටේනර් 100කට වැඩිය එකම සමාගමෙන් 8 වතාවක් ලංකාවෙන් එළියට ගිහිල්ලා තිබෙනවා. මෙහෙම තමයි ලංකාවේ වගාවන්වලට ලෙඩ එන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා විනාශ කරන්න කියලා National Plant Quarantine Service එකෙන් කියද්දී, labsවලින් කියද්දී ආණ්ඩුවේ හයිය අරගෙන, ඇමතිවරුන්ගේ හයිය අරගෙන තමයි මේ කටයුතු කරන්නේ. මම ඊට අදාළ lab reports සියල්ල මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩී.වී. චානක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ Minutes තිබුණාට අපේ වගාවන්වලට හානි වන whiteflies එන්නේ කන්ටේනර්වලින්. Rust තිබෙන ඒවා ලංකාවට ගෙනැල්ලා විශාල විනාශයක් කරන්න කටයුතු කරගෙන යනවා. අද වනතුරු දන්නේ නැහැ, මේ කන්ටේනර් නිසා වගාවන්ට කොච්චර හානි වුණාද කියලා. විශේෂයෙන්ම රටේ ජනතාවට මම කියන්න කැමතියි, ඔබතුමන්ලාගේ වගාවන්වල යම්කිසි පුස් වර්ගයක් හැදිලා තිබෙනවා නම්, සුදු මැස්සා - whiteflies - කියන සතෙක් ඉන්නවා නම් එහෙම ඇවිල්ලා තිබෙන්නේ මේ ආණ්ඩුවෙන් ජනවාරි මාසයේ ගෙනාපු කන්ටේනර්වලින් කියන එක. එහෙම දෙයක් සිදු වෙලා තිබෙනවා නම් කරුණාකරලා ඒ ගැන පැමිණිලි කරන්න; අපිට තොරතුරු දෙන්න. අපි බලාපොරොත්තු වෙනවා, මේ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවදුරටත් ඒ ගැන කථා කරන්න වෙලාව නැහැ. අදත් රුපියල් 12කින්, ඩොලරයට සාපේක්ෂව රුපියල කඩාගෙන වැටුණා. ඊයේ 6යි; පෙරේදා 3යි; අද 12යි. හෙට කීයද කියලා අපි කවුරුවත් දන්නේ නැහැ. බලාගෙන සිටියදී රටේ ආර්ථිකය විනාශ කරනවා. දූෂණය, හොරකම, අනෙක් පැත්තෙන් වගාවන් විනාශ කරනවා. මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග නිසා ඩොලරයට සාපේක්ෂව රුපියල වැඩියෙන්ම කඩා ගෙන වැටෙන ආසියාවේ රට බවට මේ වනකොට මේ ආණ්ඩුව විසින් අපේ රට පත් කරලා තිබෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have two minutes.

[අ.භා. 1.31]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මට කථා කරන්න මිනිත්තු දෙකයි දීලා තිබෙන්නේ. නමුත් මෙවැනි අවස්ථාවක මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන් ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ද සම්මත කරන අද දවසේ මම නුවරඑළියේ ගොවියෝ ගැන කථා කරන්න ඕනෑ. මම කියන්නේ මේ කාරණයයි. දැන් නුවරඑළිය ගොවියෝ harvest කරන කාලය. ඒ නිසා ආනයනික අලවලට tax එකක් දාන්න. ගරු ඇමතිතුමාට මම ඊයේ පෙරේදා දවසකත් කිව්වා. දැන් ඒ tax එක රුපියල් 80ක් කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒක රුපියල් 100ක් කරන්න. වාහනවලට සියයට 50කට වැඩිය tax දානවා නම් ඇයි ගොවියෝ වෙනුවෙන් රුපියල් 20කින් tax එක වැඩි කරන්න බැරි? Tax එක රුපියල් 20ක් වැඩි කළොත්, අල කිලෝ එකක මිල රුපියල් 250ට යන්න පුළුවන්. අද අල කිලෝ එකක් හදන්න රුපියල් 200ක් වැය වනවා. ඉතින්, කිලෝ එකක් රුපියල් 250ටවත් විකුණුවේ නැත්නම් අල වවන එක පාඩුයි. එතකොට ගොවියා ආපහු අල වවන්නේ නැහැ. ගොවියෝ අල වවන්නේ නැත්නම් ඒගොල්ලන් ඔක්කෝම එළවලු වවනවා. එතකොට එළවලු මිල බහිනවා. එළවලු විකුණා ගන්න බැහැ. එතකොට මොනවාද වෙන්නේ? නැවත ගොවියෝ අමාරුවේ වැටෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. ඊයේත් මම මෙතැන කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ. මට අවස්ථාවක් ලැබුණේ නැහැ. කරුණාකරලා මේ tax එක රුපියල් 100ට වැඩි කරන්න.

අපි පුළුවන් තරම් අපනයනය වැඩි කරන්න ඕනෑ. අපි නිතරම කරන්නේ, ආනයනය වැඩි කරන එකයි. ඒක තමයි කරන්නේ. ඒක තමයි හාල්වලටත් වෙන්නේ. හාල් import කරන නිසා හාල් මිල වැඩි වෙනවා. මේ අවස්ථාව වනකොට ඩොලරයේ මිල රුපියල් 354කට ගිහිල්ලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Import කරන කොට පාඩුයි. ඇයි, ඒවා import කරන්න ඕනෑ? ගොවියාට තව සහන දෙන්න පුළුවන් නේ. පොහොර මිල අඩු කරලා දෙන්න පුළුවන්. තෙල් මිල අඩු කරලා දෙන්න පුළුවන්. කිසිම සහනයක් නැහැ, නුවරඑළියේ ගොවියාට. ඒ නිසා කරුණාකරලා මේ ආණ්ඩුව කියපු විධියට tax එක වැඩි කරන්න එහෙම නැත්නම් අලවල මිල වැඩි කරන්න යම්කිසි දෙයක් කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Major General (Rtd.) G.D. Sooriyabandara. You have 10 minutes.

[අ.භා. 1.33]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද විවාදයට ගන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතට අදාළ රෙගුලාසි සහ විසර්ජන පනත යටතේ යෝජනා සම්මතයන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ විවාදය සඳහා සහභාගි වෙලා ඉන්න කොට, ඇහුම්කන් දීගෙන ඉන්න කොට මට අපැහැදිලිතාවක් ඇති වුණා, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු මේ විවාදයට සම්බන්ධ වෙලා කථා කළේ, යටි ගිරියෙන් කෑ ගැහුවේ මොනවාද කියලා. එක් අවස්ථාවකදී ගල් අඟුරු ගැන කථා කළා. තවත් අවස්ථාවකදී 2022දි රට පත් වෙලා තිබුණු තත්ත්වයට දැන් තත්ත්වය සම කරන්න උත්සාහ කරමින් කථා කළා. ගල් අඟුරු වංචාව සම්බන්ධයෙන් විමර්ශනය කරන්න කොමිසමක් පත් කරලා තිබෙනවා. කාට හරි සැකයක්, සංකාවක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ඒ කොමිසමට ගිහිල්ලා කරුණු වාර්තා කරන්න පුළුවන්. කරුණු වාර්තා කරලා ඒ තොරතුරු නිවැරැදි බව ඔප්පු වුණොත් අදාළ වැරැදිකරුවන්ට එරෙහිව දඬුවම්

කිරීමේ අවස්ථාව උදා කරලා තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුව තුළ කෑ ගහලා හරියන්නේ නැහැ. එතැනට ගිහිල්ලා පැමිණිලි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට, 2022 වර්ෂය තුළ ඇති වෙච්ච ආර්ථික අර්බුදය සහ වර්තමානයේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය ගැන කථා කළොත්, 2022දී වුණේ අපේ රටට ඩොලර් සංචිත අහිමි වීම තුළින් ආනයන සීමා වෙලා මේ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවල හිඟතාවක් ඇතිවීම. ඒ ගැටලුව නිසා තමයි ආර්ථිකය දරුණු ලෙස කඩා වැටීමකට ලක් වුණේ. නමුත් වර්තමානයේ ඇති වෙලා තිබෙන අර්බුදය ඇත්තටම අපේ රටේ ප්‍රශ්නයක් නොවෙයි. මේක ගෝලීය අර්බුදයක්. මැද පෙරදිග කලාපයේ ඇති වී තිබෙන යුද්ධමය තත්ත්වය මත අපේ රටට පමණක් නොවෙයි, ලෝකයේ සියලු රටවල ආර්ථිකයන්ට බලපාලා තිබෙන අර්බුදයක් නිසා තමයි මේ ආකාරයේ ගැටලු ඇති වෙලා තිබෙන්නේ. ඒක නිසා තමයි සමහර අය මේක දඩමීමා කරගෙන 2022 වර්ෂයේ තත්ත්වයට සමාන කරන්න උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථා කරපු ආකාරයට අද දවසේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතට අනුකූලව 2026 මාර්තු මස 23 දින ප්‍රකාශයට පත් කර තිබෙන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 2026 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිත්, 2026 මාර්තු මස 31 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2482/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුකූලව 2026 අංක 2 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ 2482/12 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 2026 අංක 3 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි විවාදයට ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පිළිබඳව කථා කළොත්, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මඟින් අපේ රටට ගුවන් යානා සඳහා භාවිත කරන ටයර් ඇතුළුව නැවත අඩිය පුරවන ලද ටයර් ආනයනය තහනම් කර තිබුණා. නමුත්, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරලා තිබුණා, ශ්‍රීලන්කන් ගුවන් සේවය සඳහා HS code 4012.13 යටතේ වර්ගීකරණය කරන ලද නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් ආනයනය කරන්න අවසර දෙන්න කියලා. ඉතිහාසයේදීත් මේ විධියට නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් ආනයනය කර තිබෙන බව සඳහන් වෙනවා. ඒ වාගේම ඒ එක් එක් නැව්ගත කිරීමකට වෙන් වෙන්ව අවසර ලබා ගැනීමේ ක්‍රමවේදය මත කියලා තමයි මෙම ආනයන කටයුතු සිදු කරලා තිබෙන්නේ. ඉතින් අද අනුමත කරන රෙගුලාසි තුළින් බලාපොරොත්තු වෙන්නේ, 2028 මාර්තු මස 31 දින දක්වා බලාත්මක වන ආකාරයට නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් ආනයනයට අවසර ලබා දීමයි. මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, මෙම රෙගුලාසි යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මෙහෙයුම් සීමාවන් ඇතුළත පමණක් භාවිත කරන්න සිදු වෙනවා සේම, මෙරට තුළ අපහරණය කිරීමට කිසිදු අවසරයක් නැහැ කියන කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අංක 2 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පිළිබඳව කථා කළොත්, ජාතික උප බෙදුම්වලට අයත් සහ ආනයන බලපත්‍ර පාලනයට යටත් තිප්පිලි, ලුණු සහ බහුවර්ණ මුද්‍රණ යන්ත්‍රවලට අයත් HS codesවල සිදු කරන වෙනස්කම් කිහිපයක් එහි තිබෙන්නේ. මීට පෙර ගම්මිරිස් සහ තිප්පිලි සඳහාත්, පාවිච්චි කළ සහ නොකළ බහුවර්ණ පිටපත් මුද්‍රණ යන්ත්‍ර සඳහාත්, සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු, පාෂාණ ලුණු සඳහාත් එක HS code එකක් යටතට ඇතුළත් වීමෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වෙලා තිබුණා. ඒ ගැටලුකාරී තත්ත්වය මඟහැරීම සඳහා වෙන් වෙන්ව HS codes ලබා දීම තමයි මෙම රෙගුලාසි පැනවීම තුළින් සිද්ධ වෙන්නේ. ඒ වාගේම, මෙම රෙගුලාසි පැනවීමෙන් පසු ගම්මිරිස් ගෙන්වීම සඳහා ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වුවත්, තිප්පිලි ආනයනයේදී එවැනි බලපත්‍රයක් අවශ්‍ය නොවන බව පෙන්වා දීමට කැමැතියි.

ඒ වාගේම, පාවිච්චි කළ බහුවර්ණ පිටපත් මුද්‍රණ යන්ත්‍ර ආනයනය පාරිසරික හේතූන් මත දැනටමත් තහනම් කර තිබෙනවා. ඒ වාගේම, අලුත් බහුවර්ණ පිටපත් මුද්‍රණ යන්ත්‍ර ආනයනයේදී ඒ තොග සමඟ පැරණි මුද්‍රණ යන්ත්‍ර ගෙන්වීමේ අක්‍රමිකතාව වැළැක්වීමද මෙහි ප්‍රධාන අරමුණක් වෙනවා. ඒත් එක්කම, අලුත් බහුවර්ණ පිටපත් මුද්‍රණ යන්ත්‍ර ගෙන්වීමේදී ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වෙනවාය කියන කාරණයත් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අංක 3 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පිළිබඳව කථා කළොත්, ඇත්තටම 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි අනුව HS codes 10063019 සහ 10063029 යටතේ වර්ගීකරණය කර තිබූ සහල් ආනයනය අත්හිටුවා තිබුණා. නමුත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා විසින් 2026 මාර්තු මස 26වන දින "දේශීය වෙළෙඳ පොළේ සම්බා සහ කීරි සම්බා සහල් සඳහා ආදේශිත සහල් වර්ග ආනයනය කිරීම සඳහා අනුමැතිය" මැයෙන් ඉදිරිපත් කරපු ඒකාබද්ධ සංදේශය ප්‍රකාරව සම්බා සහ කීරි සම්බා සඳහා ආදේශක වශයෙන් HS code 10063029 යටතේ වර්ගීකරණය කළ පොන්නි සම්බා සහ කීරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 හාල් වර්ග ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාසනය කිරීමටත්, ආනයනකරුවන් පාලන බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීමටත් මින් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී අවධාරණය කළ යුතු කාරණය තමයි, අදාළ ආදේශක සහල් නැව්ගත කළ දිනය 2026 අප්‍රේල් මස 02 දින සිට 2026 අප්‍රේල් මස 30 දින දක්වා වන කාලය තුළ බවට නෞභාර පත්‍රයේ සඳහන් විය යුතු වීම. ඒ වාගේම එක් එක් ආනයනකරුවෙකුට මෙට්‍රික් ටොන් 1,040ක් යනුවෙන්ද නෞභාර පත්‍රයේ සඳහන් විය යුතු වෙනවා. මේ රෙගුලාසි පැනෙව්වත් සහල් තොග 2026 මැයි මස 30 දින හෝ ඊට පෙර අනිවාර්යයෙන් රේගුවෙන් නිදහස් කරගත යුතු වෙනවා. ඒ වාගේම HS code 10063029 යටතේ වර්ගීකරණයට අදාළ සම්බා සහ කීරි සම්බා සඳහා ආදේශක වන පොන්නි සම්බා සහ කීරි/ පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 ලෙස හඳුන්වන සහල් වර්ගයන් විය යුතු වීම අනිවාර්යයයි කියන එක මෙම රෙගුලාසිය තුළින් සහතික කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා, අපට මේ රෙගුලාසි පැනවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා. අවසාන වශයෙන්, මේ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) M.L.A.M. Hizbullah. You have three minutes.

[பி.ப. 1.43]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மிகவும் சந்தோஷமடைகின்றேன். பொருளாதார வளர்ச்சியை நோக்கிச் செல்லவேண்டிய நாம், நாளுக்கு நாள் பொருளாதார வீழ்ச்சியை நோக்கியே கடந்த சில மாதங்களாகச் சென்றுகொண்டு இருக்கின்றோம். "இந்த நாட்டின் பொருளாதாரம் வலுவாக இருக்கின்றது; நாங்கள் பொருளாதாரத்தை இறுக்கமாக வைத்திருக்கிறோம்" என்று சொல்கின்ற அதேவேளை, நாளுக்கு நாள் அமெரிக்க டொலருக்கு நிகரான இலங்கை ரூபாயின் பெறுமதி வீழ்ச்சியடைந்து கொண்டு செல்கின்றது. மார்ச் மாதம் 23ஆம் திகதிக்குப் பின்னர் ஏற்பட்ட மிக மோசமான நிலைமையால் இன்று ஒரு டொலரின் பெறுமதி 354 ரூபாயாக அதிகரித்து இருக்கின்றது. ஒவ்வொரு நாளும் 4 ரூபாய், 5 ரூபாய் என்று டொலரின் பெறுமதி அதிகரித்துக்கொண்டு செல்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷவின் ஆட்சியில் டொலரின் பெறுமதி 400 ரூபாயை எட்டியதால் நாடு மிக மோசமான நிலைக்குத் தள்ளப்பட்டது. எனவே, பொருளாதார வீழ்ச்சியைக் கட்டுப்படுத்தி, இலங்கை ரூபாயின் பெறுமதியை நிலையாக வைத்திருக்கவேண்டிய பொறுப்பும் கடமைப்பாடும் அரசாங்கத்துக்கு இருக்கிறது. அரசாங்கம் அந்தப் பணியைச் செய்ய வேண்டுமெனவும், அதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனவும் நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have one more minute.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Sir.

இன்று எனக்கு முன்னர் உரையாற்றிய உறுப்பினர்கள் கூறியதுபோல, எமது நாட்டுக்கு அரிசி, உருளைக்கிழங்கு போன்றவற்றை இறக்குமதி செய்வதால், உள்நாட்டில் அவற்றை உற்பத்தி செய்கின்ற விவசாயிகள் மிக மோசமாகப் பாதிக்கப்படுகின்றார்கள். எங்களுடைய விவசாயிகள் நெல்லை அறுவடை செய்வதற்கு ஆயத்தமாகிக் கொண்டு இருக்கும் போது, நீங்கள் பாரியளவில் அரிசியை இறக்குமதி செய்கிறீர்கள். இதனால் நாட்டில் அரசியின் விலை குறைவடைந்து, விவசாயிகள் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள்.

நேற்று மாண்புமிகு சனாதிபதி அவர்கள் மட்டக்களப்புக்கு வந்தபோது, நாங்கள் ஒரு விடயத்தைச் சொன்னோம். அதாவது, 10,000 ரூபாயென விலை நிர்ணயம் செய்யப்பட்ட உர மூடையை விவசாயிகள் 18,000 - 19,000 ரூபாய் கொடுத்து வாங்கவேண்டி இருக்கின்றது. நேற்று முந்தினம் நான் பொத்தானை, காரமுனை போன்ற பிரதேசங்களுக்குச் சென்றபோது, அங்குள்ள மக்கள் சொன்னார்கள், "18,000 - 19,000 ரூபாயைக் கொடுத்துத்தான் நாங்கள் உர மூடையை வாங்க வேண்டும்" என்று. அரசாங்கத்திடம் குறிப்பாக கமநல சேவைகள் திணைக்களத்திடம் யூரியா உரத்தை வாங்குவதற்கான வசதிகள் இல்லை. அங்கு stock இல்லாத காரணத்தால் மக்கள் தனியாரிடமிருந்து உரத்தை வாங்குகிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது குறித்து உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும்; விவசாயிகளைப் பாதுகாக்க வேண்டும். ஏனெனில், அவர்களுடைய பொருளாதார நிலைமை மிக மோசமாகிக் கொண்டு செல்கின்றது. எனவே, அவர்களுக்குத் தேவையான உரம் அரசாங்கத்தால் கொடுக்கப்பட வேண்டும். அரசாங்கத்தால் உரம் வழங்கப்படுவதாகச் சொல்கிறீர்கள். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்கு விவசாயம் செய்து முடித்த பின்னர்தான் உரம் கிடைக்கிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Sir.

18,000 ரூபாய்க்கு உரத்தை வாங்கி, ஒரு நாளும் நெல்லை நியாய விலைக்கு விற்க முடியாது. விவசாயிகள் மிக மோசமான பொருளாதார நிலைமையில் இருந்துகொண்டு இருக்கிறார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Upul Kithsiri. You have 10 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.48]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පනවන රෙගුලාසි කිහිපයක් අනුමත කර ගැනීම සඳහා අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව, 2023 ජනවාරි

මස 01වන දින ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සීමා වූ ගුවන්යානා සඳහා භාවිත කරනු ලබන ටයර් ඇතුළුව නැවත අඩිය පුරවන ලද ටයර් ආනයනය කිරීමටත්, සම්බා සහ කීරි සම්බාවලට ආදේශක ලෙස පොන්නි සම්බා සහ කිරි පොන්නි සහල් ආනයනය කිරීමටත් අදාළ රෙගුලාසි අනුමත කර ගැනීමට ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන්ම මේ දිනවල පාර්ලිමේන්තුවේදී අපි දැකපු දේ තමයි උදෑසන සිට විපක්ෂය ඇවිල්ලා මොනවා හෝ ටිකක් කියලා, කෑගහලා යනවා. හවස් වෙනකොට මේ සභා ගර්භයේ කවුරුවත් නැහැ. බොහෝ වේලාවට අපි දකින්නේ ඒක තමයි. එතුමන්ලා උදේට පාර්ලිමේන්තුවට එනවා. ඇවිල්ලා බොරුවක්, මොනවා හෝ දෙයක් මේ පාර්ලිමේන්තුවට කියලා, ඒක මාධ්‍යවලට ඉදිරිපත් කරලා යන එක තමයි ඒ අයගේ ප්‍රධාන කාර්යභාරය වෙලා තිබෙන්නේ.

මේ දිනවල ලෝකයේ පවතින තත්ත්වයත්, ආර්ථිකමය ගැටලු පිළිබඳවත් අපි බොහෝදෙනෙක් දන්නවා. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගොඩක් වෙලාවට බලාපොරොත්තු වෙන්නේ මේ අර්බුදය මේ ආණ්ඩුව විසින් ගෙන එන ලද අර්බුදයක් විධියට හුවා දක්වන්නයි. හැබැයි, ඒ අයට අමතක වෙලා තිබෙනවා 2022 අවුරුද්දේ මේ රට බංකොලොත් වුණේ කොහොමද, බංකොලොත් කළේ කොහොමද කියලා. ඒක මේ සභාවට කියන්න ඒ අය මැළි වෙනවා. ඒක රහසක් හැටියට තබාගෙන ඉන්නවා. අපි දන්නවා, එදා ඒ අර්බුදය එන වෙලාවේ අපේ ඩොලර් සංචිත ඇමෙරිකානු ඩොලර් මිලියන 600ට වඩා අඩු වුණු බව. ඒ වාගේම, අපේ රටේ තෙල් පෝලිම් ඇතිවෙලා තිබුණා. මේ රටට ඇතුළු වෙන්න බලාගෙන රට වටේ තෙල් නැව් නවත්වාගෙන හිටියාට, ගෙවන්න ඩොලර් නැති වුණු නිසා ඒ නැව්වලට මේ රටට එන්න බැරිව හිටියේ. සලාක ක්‍රමයට නැව්වලින් තෙල් බාන තත්ත්වයක් තමයි එදා අපි දැක්කේ. ඒ වාගේම, රට පුරා ගෑස් පෝලිම්වල ජනතාව ඉන්නවා, ඒ ජනතාව මැරෙනවා අපි දැක්කා. ඒ වාගේම, දවසට පැය 13ක්, 16ක් විතර විදුලිය කප්පාදු කළා. ඒකෙන් කොළඹ හා තදාසන්න නගරවල ජනතාව දැඩි පීඩාවට පත් වුණා. එදා අපි ප්‍රධාන වශයෙන්ම දැක්කා, රටේ ගොවීන්ට අවශ්‍ය පොහොර ටික තිබුණේ නැහැ. අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟයක් තිබුණා. ඒ කොයි තරම් ද කියනවා නම්, ඒ ප්‍රශ්න මහජන අර්බුදයක් බවට පත් වෙද්දී අපේ රටේ පාලකයෝ හැංගිලා හිටියේ. සමහර අය මේ රට දාලා ගියා. ඒ ඉතිහාසය අමතක වෙලා වාගේ තමයි මේ අය දැන් කථා කරන්නේ. ඒ තමයි එදා මේ රට තිබුණු තැන. ඒ අර්බුදයට ප්‍රධානම හේතුව තමයි එදා පැවැති අකාර්යක්ෂම පාලනය. මේ රටේ නාස්තිය, හොරකම, දූෂණය නිසා තමයි එදා එවැනි තත්ත්වයක් මේ රටට අත් වුණේ කියලා අපි කවුරුත් දන්නවා. ඒක ඇතුළේ කොයි තරම් පවුල් පාලනය තිබුණාද කියලා කියනවා නම් එදා පාර්ලිමේන්තුවේ එකම පවුලේ, - විශේෂයෙන්ම ගත්තොත් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පවුලේ - හත්දෙනෙක් පමණ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන තැනට පත් වෙලා තිබුණා.

මෙන්න මේ කියන තත්ත්වය ඇතුළේ, අපි ආණ්ඩුව භාර ගන්නකොටත් ඒ දේවල්වල අඩුපාඩුකම් තිබුණා. 2019 ඉඳලා රාජ්‍ය සේවයට බඳවා ගැනීම් නතර කරලා තිබුණේ. ඒ නිසා තමයි මේ වෙනකොට පොලිසියේ නිලධාරින් 31,000ක පමණ හිඟයක් මතුවෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි 23,000ක පමණ ගුරු හිඟයක් තිබෙන්නේ. රාජ්‍ය සේවයේ තනතුරුවල පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙන්නේ 2019 ඉඳලා රාජ්‍ය සේවයට බඳවා ගත්තේ නැති නිසා. ඒ වාගේම රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කළේ නැහැ. විශ්‍රාමිකයන්ට අවශ්‍ය ඒ දීමනා, ඒ පහසුකම් සලසා දෙන්න එදා ආණ්ඩු කටයුතු කළේ නැහැ. එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. වර්තමාන ආණ්ඩුව 2024දී බලය ගත්තාට පස්සේ අපි සෑහෙන දුරට මේ රට වෙනස් කළා. ඒක අපි කවුරුත් දන්නවා. රටේ ජනතාවත් දන්නවා. ඉතිහාසයේ 2022දී රට තිබුණු තැනත්, අපි රට භාරගෙන පරිවර්තනය කරපු විධියත් දන්නවා. ඒ නිසා මේ ලෝක ආර්ථික අර්බුදය පිළිබඳ අපි හොඳ විග්‍රහයක් කරගන්න ඕනෑ. අපි කැමති වුණත්, අකමැති වුණත් මේ තත්ත්වයට අපට මුහුණ දෙන්න වෙලා තිබෙනවා.

මේ අර්බුදය කොයි තරම්ද කියනවා නම්, ඒක අපට සාමාන්‍ය විධියට කළමනාකරණය කරගන්න අමාරුයි. අපි මේ ලෝකය ඇතුළේ තවමත් නැඟී සිටින රාජ්‍යයක් නිසාම, අපි 2022 අර්බුදයේ කොටස්කරුවන් වෙච්ච නිසාම, මේ තත්ත්වය අපට ප්‍රධාන වශයෙන්ම දැනිලා තිබෙනවා. ඒක අපට දැනෙමින් තිබෙනවා. අපි මේ තත්ත්වය කළමනාකරණය කරගනිමින් ඉන්නවා. මේ අර්බුදය ගොඩනැඟුණු වෙලාවේ තෙල් පෝලිම් නිර්මාණය වෙන්න නොදී අපි ඒක කළමනාකරණය කරගත්තේ කොහොමද කියලා අපි දන්නවා. අද වෙනකොට ඒ ලෝක තත්ත්වය නිසා තෙල් මිල යම් ලෙසකින් වැඩි වුණත්, හිඟයකින් තොරව තෙල් ටික, අවශ්‍ය පොහොර ටික ලබා දෙන්න අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ කටයුතුවල යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒවායේ මිල ගණන්වල වැඩි වීමක් තිබෙන්න පුළුවන්. නමුත් අපි ඒක මනාව කළමනාකරණය කරමින් මේ රටේ ජනතාවට අවශ්‍ය විධියට කටයුතු කරමින් ඉන්නවා. අපි තවදුරටත් කළමනාකරණය කර ගනිමින් ඉන්නවා. ඒක තමයි ආණ්ඩුවක වගකීම. ඒක තමයි අපේ හැකියාව. එදා පැවති ආණ්ඩුවට කරන්න බැරි වෙච්ච, නොහැකි වෙච්ච දේ අද අපි කළමනාකරණය කරමින් ඉන්නවා. අභියෝගවලට මුහුණ දෙමින්, කොහොමද ආණ්ඩුවක් ගෙනියන්න ඕනෑ කියන එක අද මේ ආණ්ඩුව මනාව පෙන්නුම් කරමින් ඉන්නවා. ඒ නිසා තමයි ලෝකයේ ඇතිවන අර්බුද හමුවේත් අපි මනා ලෙස බලශක්තිය කළමනාකරණය කරමින් ලෝක තත්ත්වයන්ට මුහුණ දෙමින් කටයුතු කරමින් ඉන්නේ. මේ තත්ත්වය තුළ ලෝකයේ පවතින අර්බුද පහව ගිය මොහොතේ සිට මේ රට නැවත තිබුණු තැනට වඩා ඉහළට ගෙන එන්න අපට හැකියාව, ශක්තිය තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. ජනාධිපතිතුමාගේ ඉඳලා ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි කාගේත් එකම ප්‍රාර්ථනාව තිබෙන්නේ මේ රටේ ජනතාව හිටපු තැනට වඩා ඉහළ තැනකට ගෙන ඒමයි. ඒ නිසා කොයි තරම් හොරා කනවා ද, කොයි තරම් මේ රටේ මුදල් නාස්ති කරනවා ද කියන පෞද්ගලික බලාපොරොත්තු කිසිවක් අපට කිසිසේත්ම නැහැ. අපේ එකම බලාපොරොත්තුව තමයි, අපේ රටේ අනාගත දරුවන් වෙනුවෙන් හොඳ රටක් නිර්මාණය කරන එක. ඒ වෙනුවෙන් තමයි අපි මේ ලෝක අර්බුදය පවා මනා ලෙස කළමනාකරණය කරමින් ඉදිරියට යමින් තිබෙන්නේ. අද දවසේත් විපක්ෂය මොන තරම් කතන්දර කිව්වත්, අපි පවතින තත්ත්වය මනාව කළමනාකරණය කරමින් ඉන්නේ. මීට ටිකකට කලින් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉතා ආවේගශීලිව කථා කරමින් හිටියා. අපි නිතරම කියනවා කිව්වා, "භාණ්ඩාගාරය පිරී ඉතිරිලා යනවා" කියලා. එතුමාට මෙන්න මේක අමතක වෙලා ඇති. එතුමාගේ ඉස්සරහින් අසුන්ගෙන ඉන්න හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා තමයි පසුගිය අය වැය අවස්ථාවේදී මුලින්ම කිව්වේ, "භාණ්ඩාගාරය පිරී ඉතිරිලා යනවා" කියලා. එතුමාට ඒක අමතක වෙලා, දැන් හුවා දක්වන්න යනවා ඒක අපිම කියපු කථාවක් කියලා. නැහැ, ඒ වැඩේ ආරම්භ කළේත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මීට ටික වෙලාවකට කලින් අදහස් දක්වපු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, අපි නින්දෙන් ඇහැරිලා වාගෙයි කථා කරන්නේ කියලා. එතුමා තමයි මැරිලා ඉපදිලා වාගේ කථා කළේ. මොකද, එතුමා අපේ රටේ ආර්ථිකය ගැන කිව්වා. රුපියල පා වෙන හැටි, රුපියල මස්තබාල්දු වෙන හැටි තමයි එතුමා කථා කළේ. එතුමා දන්නේ නැහැ, එතුමාත් හිටපු

[ගරු උපුල් කිත්සිරි මහතා]

ආණ්ඩුවේ එතුමාගේ පාලකයෝ මේ රටේ රුපියල මස්තබාල්දු කළේ කොහොමද, මේ රටේ රුපියල කඩා වැට්ටුවේ කොහොමද කියලා. මේ රට ආර්ථික වශයෙන් බිඳ වැට්ටුවේ කොහොමද කියන එක එතුමාටත් අමතක වෙලා, අද නින්දෙන් නැඟිටලා වාගේ තමයි එතුමා කථා කරන්නේ. ඒ ගැන අපි කනගාටු වෙනවා. මේ රට බිඳ වට්ටලා, අර කියපු විධියට රුපියල මස්තබාල්දු කළේ එතුමන්ලා කියන එක අපි ඉතා නිවැරදිව, පැහැදිලිව කියන්න ඕනෑ.

අපට දැන් වගකීමක් තිබෙනවා. දැන් මේ රට ගොඩ නැඟීමේ වගකීම අපේ උර මත තිබෙනවා. අපි සහතික කර කියනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ රට හදනවා, මේ රට නිවැරදි තැනට ගේනවා කියලා. ඒ අදහස සපථ කරමින් මේ රට නිවැරදි රටක් බවට පත් කරලා ලෝකයේ තිබෙන ප්‍රධානම රටක් බවටත්, ප්‍රධාන ජාතියක් බවටත් පත් කරනවා කියලා පොරොන්දු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විනාඩි 6ක් නොවෙයි, මට විනාඩි 7ක් තිබුණා. ඇත්තටම විනාඩි 8ක් වත් දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට විනාඩි 6ක කාලයක් තමයි තිබෙන්නේ.

[1.59 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Deputy Chairperson of Committees, we are debating three Regulations under the Imports and Exports (Control) Act and nine Resolutions under the Appropriation Act. Those are being passed primarily to stem the downsliding of the economy, to stabilize it and to some extent, bring about growth.

But, the people in the Northern Province, which I represent, Madam, have long-term problems. The Regulations and Resolutions under the Acts we are discussing today are for short-term concerns. If you look at the GDP contribution of the Northern Province, it is at the last place. So, we need fairly serious policies brought into effect, if the Northern Province is to move forward.

The matter that I wish to raise, Madam, is with regard to education because, at the end of the day, education has to be the foundation on which any country could expect development to take place. And, in the Northern Province, the complete opposite is being done. The education in the Northern Province handled by the provincial administration, which is controlled by this Government through the Governor, is deliberately being destroyed. In the Northern Province, actions carried out under the name of "transfers based on 'exigencies of service' " have seriously affected education. Transfers can only be carried out under annual transfers, transfers based on exigencies of service and on disciplinary action. Then, transfers on the basis of exigencies of service can only be carried out under three circumstances: one, when there is an urgent and immediate need for a teacher in a particular school; two, when the service of a specific teacher is specifically required for a particular school and three, when retaining a teacher in a particular station or school leads to problems or disturbances. Only under those three circumstances can a transfer be made on the grounds of exigencies of service. But, without any consultation with teachers' trade unions or their participation, educational authorities of the Northern Province arbitrarily transferred 193 teachers under the pretext of exigencies of service.

Section 3.3 under Chapter III of the Establishments Code clearly states, I quote:

> "One or more Transfer Boards should be set up in every Department which has twenty five or more transferable officers."

And, this matter is also referred to in Section 188 of the Northern Provincial Public Service Procedural Regulations Code published in Gazette Extraordinary No. 1817/30 dated 03.07.2013.

Further, Section 259 of the Gazette Extraordinary No. 2310/29 dated 14.12.2022 states, I quote:

> "Before a public officer is transferred on exigencies of service, the Appointing Authority or the authority with delegated power shall satisfy himself that a need has actually arisen as set out in Section 258 above and that the transfer concerned cannot be deferred till the next annual transfers."

This matter is also referred to in Section 208 of the Northern Provincial Public Service Procedural Regulations Code published under Gazette Extraordinary No. 1817/30 dated 03.07.2013. Furthermore, as specified under the category of "transfers" classified under Section 185, these transfers should have been carried out only under the category of "annual transfers."

Madam, in view of those irregularities in the Northern Province or the way in which they have handled those transfers, many teachers who have already received annual transfers have still not been released from their respective schools by the Northern Provincial education authorities.

The appeals submitted by teachers affected by those transfers based on exigencies of service have also been handled by the Northern Provincial Public Service Commission in a politically-influenced, discriminatory and vindictive manner. As a result, the fundamental rights

of many affected teachers have been severely violated including the right to livelihood of both the teachers and their dependent members.

The irregularities committed by the Northern Provincial Public Service Commission in handling these appeals include, victimizing teachers in violation of Section 4.4 of the Northern Provincial Transfer Policy, although the service in the islands, Vadamarachchi East and other similar areas had been consistently treated as equivalent to outstation services up to 2025 by Transfer Board decisions, only certain teachers who served in such areas were selectively victimized and many affected teachers have completed more than six years of service in areas considered equivalent to outstation service and several had submitted medical documents. Despite that, they have been victimized for speaking on media against the injustices committed against them.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි,

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Madam.

Also, the teachers currently teaching English-medium subjects were victimized under the guise of "service requirement transfers" despite there being no actual requirement for such transfers in the recipient district schools. This has also adversely affected the rights of the students studying under those teachers. Then, whilst teachers who had served for more than six years in the Island Zone, previously considered equivalent to outstation service, were transferred to other districts, individuals who had never served in outstations or equivalent service areas were transferred into the Island Zone. That is discriminatory, Madam.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I hope, if the Government is true to its word that they are genuinely not discriminating against the people of the North and the East and that they truly want the Northern Province, which is, today, in the last place with regard to the GDP contribution in this country, to be developed, the last thing they would do is to act in this arbitrary and discriminatory way with regard to education in the Northern Province, which directly comes under the President because the Governor and the Northern Province directly come under the control of the Government today.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.05]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1990ஆம் ஆண்டு இந்த நாட்டில் ஏற்பட்ட பயங்கரவாத நடவடிக்கைகள் காரணமாக, எமது பிரதேச செயலாளர் பிரிவுகளில் குறிப்பாக, பொத்துவில், லகுகலை போன்ற பிரிவுகளிலுள்ள காணிகளில் செய்கை பண்ணப்படவில்லை. 2006.07.20ஆம் திகதிய வர்த்தமானிமூலம் பூங்காக்களுக்கும் வன இலாகா, வனசீவராசிகள் திணைக்களத்துக்கும் அவை கையகப்படுத்தப்பட்டன. இவற்றில், விவசாயத்துக்குப் பொருத்தமான காணிகளை விடுவிப்பது தொடர்பாக, அரசாங்கத்தால் மாவட்ட மட்டத்தில் குழுக்கள் நியமிக்கப்பட்டு, கலந்துரையாடல்கள் இடம்பெற்று வருகின்றன. அதன்படி, அம்பாறை மாவட்டக் குழு 2026.02.22ஆம் திகதி முதற்கட்டமாக கூடியபோது, மாவட்ட மட்டத்தில் அடையாளம் காணப்பட்ட சில காணிகளை விடுவிப்பதற்கு சிபாரிசு செய்தது.

மேலும், இரண்டாம் கட்டமாக மாவட்டக் குழு 2026.04.24ஆம் திகதி கூடியபோது, எமது பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பொத்துவில் 26 துக்கொள்ளவில் 32 ஹெக்டெயார், பொத்துவில் 10 கும்மாவெளியில் 23.36 ஹெக்டெயார், Pottuvil 17 பிரிவில் 3.26 ஹெக்டெயார், Pottuvil 24 பிரிவில் 0.52 ஹெக்டெயார், கிரான்கோவையில் 600 ஏக்கர், Udakovaiஇல் 125 ஏக்கர், Madeena Nagarஇல் 75 ஏக்கர், Hijrath Nagarஇல் 30 ஏக்கர், Miyanthawalaஇல் 77 ஏக்கர், Puthuvelyஇல் 52 ஏக்கர், Pulipudichchenaiஇல் 50 ஏக்கர், Sengamam, Tsunami Roadஇல் 200 ஏக்கர், Ullaikudaஇல் 40 ஏக்கர், Thuruthirachenaiஇல் 25 ஏக்கர், Paankathamvellyஇல் 25 ஏக்கர், Muthirathitheevuஇல் 45 ஏக்கர், Ooththumaduஇல் 70 ஏக்கர், Periyamurunganthanaiஇல் 60 ஏக்கர், கனகர் கிராமத்தில் 90 ஏக்கர், அறுபதாம் கட்டையில் 50 ஏக்கர், Hijra Nagarஇல் 41 ஏக்கர் ஆகிய காணிகளை விடுவிக்க இயலாதென மாவட்ட வன இலாகா அதிகாரிகள் கூறினார்கள். அப்படியானால், 2023.01.23, 2023.06.26, 2023.12.18 மற்றும் 2024.06.03ஆம் திகதிகளிலும் இறுதியாக, 25/1560/826/020ஆம் இலக்க, அமைச்சரவைத் தீர்மானம் ஏன் எடுக்கப்பட்டது எனக் கேட்க விரும்புகிறேன்.

யுத்தம் காரணமாக சுமார் 40 ஆண்டுகள் செய்கை செய்யப்படாது, களவாக மேற்கொள்ளப்பட்டு அரசாங்கம் கையகப்படுத்திய எமது விவசாயிகளின் விவசாயக் காணிகளை விடுவிக்க அரசானது நடவடிக்கை எடுக்க வேண்டும். மேலும், எமது பகுதி மக்களது வேகாமம் விவசாயக் காணிகள் - சுமார் 1,900 ஏக்கர் - லகுகலை பிரதேச செயலாளர் பிரிவினுள் உள்ளது. 1956ஆம் ஆண்டு மட்டக்களப்பு கச்சேரிமூலம் 136 மத்தியதர வகுப்பினருக்காக வழங்கப்பட்ட இந்தக் காணிகள் சம்பந்தமாக, பொத்துவில், லகுகலை பிரதேச செயலாளர்கள் அறிக்கையிடாமல் இருந்தமை மிகவும் வேதனையளிக்கின்றது.

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

கடந்த அரசாங்கம் இந்த 1,990 ஏக்கர் காணியில் சுமார் 449.35 ஏக்கர் காணியை வனசீவராசிகள் திணைக்களத்தில் இருந்து விடுவிக்க முடியுமென சிபாரிசு செய்தது. அரசாங்க அதிபர், வனசீவராசிகள் திணைக்கள அதிகாரிகள் உள்ளிட்ட குழுவினர் 2015.10.22ஆம் திகதிய கடிதம்மூலம் இதற்கு இணக்கம் தெரிவிப்பதாக அறிவித்தனர். பின்னர், 2021.11.12, 2021.11.18ஆம் திகதிகளில் கிழக்கு மாகாண ஆளுநரால் நியமிக்கப்பட்ட குழுவினது அறிக்கையின் பிரகாரம், சுமார் 350 ஏக்கர் நிலங்களை விடுவித்து, அதில் நெற்செய்கை பண்ண முடியுமெனத் தெரிவிக்கப்பட்டுள்ளது. எனவே, இந்தப் புதிய அரசானது எமது பிரதேச செயலக மக்களது நலனைக் கவனத்திற்கொண்டு, எம்மால் யுத்தம் காரணமாகச் செய்கை பண்ணப்படாமல் விடப்பட்ட விவசாயக் காணிகளை நேரில் சென்று பார்வையிட்டு விடுவிப்பதன்மூலம், எமது பகுதி விவசாயிகள் விவசாயம் செய்து வருமானம் ஈட்டி, நாட்டுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கிழக்கு மாகாண சபையில் தற்போது 2013 ஆளணியின் பிரகாரம், 374 Management Service Officersக்கான வெற்றிடங்கள் காணப்படுகின்றன. கிழக்கு மாகாண சபையால் இறுதியாக 2018ஆம் ஆண்டுதான் முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களுக்கான மட்டுப்படுத்தப்பட்ட திறந்த போட்டிப் பரீட்சை நடத்தப்பட்டது. 2019ஆம் ஆண்டே நியமனங்கள் வழங்கப்பட்டன.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි. .

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තත්පර 30ක් දෙන්න.

எனவே, விரைவாக இந்த வெற்றிடங்களை நிரப்புவதற்கு அரசும் மாகாண அரசும் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதன்மூலம் கிழக்கு மாகாண அரச அலுவலகங்களது சேவைகளைப் பூரணமாக மக்கள் பெற முடியும். பிரதேச சபைகளில் காணப்படும் செயலாளர் வெற்றிடங்களை நிரப்புவதற்கு எமது மாகாண சபை நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இறக்காமம் பிரதேச செயலாளர் பிரிவில் ஆற்று மண் ஏற்றும் வியாபாரத்தை மேற்கொண்டு வந்த 9 பேரினது அனுமதிப்பத்திரங்கள் சில வருட காலமாகப் புதுப்பிக்காமை காரணமாக இரத்துச் செய்யப்பட்டு, தற்போது புதிய நபர்களுக்கு உத்தரவுப் பத்திரங்கள் வழங்கப்பட்டுள்ளதாக அறிய முடிகின்றது. அதாவது, அப்பகுதி மக்கள் அன்றி வேறு பல பிரதேச மக்களுக்கு இவ்வனுமதி வழங்கப்பட்டு இருக்கின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இது விடயமாக அரசாங்க அதிபர், பிரதேச செயலாளர் மூலமாகப் பாதிக்கப்பட்டவர்களின் கோரிக்கையை மீள்பதிவு செய்ய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද ලලිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි සම්බන්ධවත් සාකච්ඡා කරන අද දවසේදී, මේ රටේ ආර්ථික තත්ත්වය මොකක්ද, මේ රටේ ජන ජීවිත ඉස්සරහට ගෙන යන්නේ කොහොමද, අනෙක් පැත්තෙන්, මේ ලෝක තත්ත්වය යටතේ මේ රටේ ආර්ථිකය රැකගෙන, එම තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙන් අවශ්‍ය ප්‍රමාණයටත් වඩා කරුණු දැක්වූවා කියා මා හිතනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පැය ගණන් කොච්චර කිව්වත්, දවස් ගණන් තිස්සේ කොච්චර කිව්වත්, විපක්ෂයට මේක තේරෙන්නේ නැති එක තමයි කනගාටුවට කරුණ. ආණ්ඩුවට ආණ්ඩුවක වගකීම තිබෙනවා වාගේම විපක්ෂයටත් ජනතාව කොහොම හරි ඡන්දය දීලා එවලා තිබෙන්නේ, තමන්ගේ වගකීම ඉෂ්ට කරන්න. පාසල් විවාදවලදී වාගේ, දහම් පාසල් විවාදවලදී වාගේ මෙතැන ලකුණු දෙන්න කවුරුවත් නැහැ, විවාදය විනිශ්චය කරන්න කණ්ඩායම් නැහැ. හැබැයි රටේ ජනතාව මේවා බලනවා; දකිනවා. ඒ අනුව ලකුණු දෙනවා, ගණන් හදනවා, මේ අය තමන් දරන වගකීම් කොටස කොහොමද ඉෂ්ට කරන්නේ කියලා. හැබැයි, මේ විපක්ෂය ලෝකයේ තිබෙන විවිධ න්‍යායන්, විවිධ මතවාද අතර තිබෙන ගොබෙල්ස් න්‍යාය අද තමන්ගේ එකම ගමන් මඟ බවට පත් කරගෙන තිබෙනවා. රජය පැත්තෙන් මෙච්චර කරුණු හෙළිදරව් කරද්දී, කරුණු දක්වද්දී, පිළිතුරු බඳිද්දී තමන්ගේ එකම න්‍යාය ගොබෙල්ස් න්‍යාය බවට පත් කරගෙන, එකම බොරුව සිය සැරයක් කියනකොට ඒක ඇත්ත වනවා, ඇත්ත බවට පත් වනවා කියලා හැදිච්ච මතයට එහා ගිය තැනකට මේ විපක්ෂය අද පල්ලම් බැහැලා තිබෙනවා. නැඟලා නොවෙයි, පල්ලම් බැහැලා තිබෙනවා. ඒ මොකද? ඔවුන් බොරු සියයක් විතර සතියකට කියනවා. ඉතින් බොරුවම ජීවිතය බවට පත් කර ගත්තාට පස්සේ, විපක්ෂයේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා රටට හෙළි වුණාට පස්සේ අනේ මන්දා, ඒ අඩුවත් පුරවන්න වෙන්නේ කවදා හරි මේ ආණ්ඩුව හොබවන අපටම තමයි කියලා මට හිතෙනවා. ඒ නිසා මීට වඩා වගකීමෙන් යුතුව වැඩ කරන්න කියලා අපි ජනතාව වෙනුවෙන් අනුකම්පාවෙන් යුතුව විපක්ෂයෙන් අප ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම ගත්තොත්, අපේ රටේ ජනතාව අවුරුදු 450ක් තිස්සේ පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් යටතේ විවිධාකාර පාලනයන්ට යට වෙච්ච, සැකයට, බියට ලක් වෙච්ච ජනතාවක්. ඒ විතරක් නොවෙයි. අවුරුදු 76ක පාලනයක් යටතේ දේවාලවලට වාගේ ගෞරවයෙන් වැඳ පුදාගෙන හිටපු නායකයෝ තමන්ගේම ඔළුවට අත හෝදපු හැටි දැකලා සැකයට, බියට පත් වෙච්ච ජනතාවක් ඉන්නේ. සම්පූර්ණයෙන් ගත්තාම අවුරුදු පන්සිය ගණනක් තිස්සේ සැකයට, බියට පත් වෙච්ච ජනතාවක් තමයි අපේ රටේ ජනතාව. අවසානයේ එහෙම ජනතාව එකතු වෙලා, රැවටීමට ලක් වෙන්නේ නැතුව අලුත් තත්ත්වයකට මේ රට පත් කර ගත්තා.

ඒ කථාව එහෙම තිබියදී බිය, සැකය වාගේ දේවල් තමන්ගේ ඇඟට උරා ගත්, පීඩාවට පත් වෙච්ච ජනතාවගේ ජාතිවාදී, ආගම්වාදී වශයෙන් තිබෙන හැඟීම්, එහෙම නැත්නම් ඒ බිය, සැක

අවුස්සලා, මේ ආණ්ඩුව කරන කැප කිරීම් සියල්ල විකෘති කරලා පෙන්වන්න තමයි මේ විපක්ෂය කටයුතු කරන්නේ. ඉතින් ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලනවා, මේ බොරුවලට තවත් රැවටෙන්න එපා කියලා. අපේ ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා සිව් දිගින් මේ රටේ ජනතාව සමඟ ආදරය බෙදා ගනිමින්, ජනතාවට ශක්තිය එකතු කරමින් කටයුතු කරන මේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් විතරක් නොවෙයි, ඒ වටා හිඳින නම් නොදත් පිරිසක් ස්වේච්ඡාවෙන් විශාල කැපවීමකින් කටයුතු කරන බලවේගයක් මේක. ඉතින් එවැනි බලවේගයක් හැල්ලු කරන්න තවත් කාටවත් අපි ඉඩ තියන්නේ නැහැ වාගේම අපි භාර ගත් මේ රටේ අනාගතය, ජනතාවගේ අනාගතය අපි අත්හරින්නේත් නැහැ.

ලෝකය කුමන තත්ත්වයකට පත් වුණත්, තවත් ශක්තිමත්ව අපි මේ රට ඉදිරියට ගෙන යනවා. මේ, බංකොලොත් කරලා, වට්ටලා තිබ්ච්ච රටක්. හැබැයි විපක්ෂය දැන් කයිවාරු ගහනවා, මේ ලෝක තත්ත්වය අමතක කරලා. මේ රටේ මුදලේ සිදු වන වෙනස්කම්, අවප්‍රමාණය වීම්, කිරිපිටි මිල ඉහළ යෑම් ආදියට විතරක් ගොනු වෙලා ඔවුන් අද කථා කරනවා, ලෝකයේ තත්ත්වය අමතක කරලා. හැබැයි, අවුරුදු ගණනාවක් තිස්සේ වට්ටපු රටේ නිෂ්පාදනය ඔවුන් දියුණු කළාද? දේශීය නිෂ්පාදනය වැඩි කළාද? රටේ ජනතාවට එවැනි තත්ත්වයක් දුන්නාද? තිබුණු ඒවාත් බංකොලොත් කරලා දැම්මා; වට්ටලා දැම්මා; නැති කරලා දැම්මා. මේ, ඔවුන් හොඳට හදපු රට නේ! සුඛිත මුදිත වෙලා තිබුණු රටක් අපට භාර දුන්නා වාගේ තමයි මේ අය දැන් මේ මුසා බස් දොඩවන්නේ. ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලනවා, ඇත්ත තේරුම් ගන්න කියලා. අපි මේ රට හදනවා.

අපේ ඇමතිවරුන්ගේ අඩුපාඩු ගැන කියවනවා, ඔවුන්ට අත්දැකීම් මදි කියනවා. මොනවාද, මදි? අපේ ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් වැඩ කරමින් තමන්ගේ වගකීම ඉෂ්ට කරනවා. ඒ වාගේම කම්කරු ඇමතිතුමා, මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ධුරයත් දරමින් තමන්ගේ අත්දැකීම් එකතු කරලා වැඩකටයුතු කරනවා. එකම දිස්ත්‍රික්කයෙන් ආපු විජිත හේරත් ඇමතිතුමා ලෝකය පුරා ශ්‍රේෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයෙකුගේ වගකීම ඉෂ්ට කරමින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කටයුතු ඉටු කරනවා. අද කී දෙනෙක් ඒ විධියට සාර්ථකව වැඩ කරනවාද? ඒ නිසා සෙල්ලම් කරන්න හදන්න එපා. මේ වගකීම් සියල්ල අතට අරගෙන තනතුරුවලින් බැබළෙන්නේ නැතිව තමන්ගේ වගකීම ඉෂ්ට කරන්න තමයි, රටේ ජනතාව භාර දීපු වගකීම එතුමන්ලා භාරගෙන තිබෙන්නේ. ඒ නිසා අත්දැකීම් තිබෙනවා කිව්ව, එහෙම නැත්නම් අපි තමයි මේකේ චණ්ඩි කිව්ව අය රටට කරලා තිබෙන්නේ මොනවාද කියන එක ජනතාව දන්නා නිසා අපි ඕවාට සැලෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ පැත්තෙන් නාස්තිය දූෂණය අඩු කරලා, රටේ ආදායම් තත්ත්වය ඉහළ දමා, විදේශීය ආදායම් උපයන ගමන් ඒවාට අදාළ සැලසුම් ගණනාවක් පෙන්වමින් තමයි අපි මේ ගමන යන්නේ. මුදල් අමාත්‍යාංශය දිනාගෙන තිබෙන ආර්ථික දත්තවලින් කිහිපයක් මේ වෙලාවේ මම පෙන්වන්න ඕනෑ, නැහැ, බැහැ කියලා කෑ ගහන විපක්ෂයට. මේ රට විවිධාකාරයෙන් ඉතිහාසයට එකතු වුණා. පසුගිය කාලයේ බංකොලොත්භාවයෙන් එකතු වුණා. හැබැයි, රට නඟාසිටුවීමේදී, වේගයෙන් සංවර්ධනය වෙමින් යන රටක් හැටියට, ණය බරින් මිදෙමින් ඉස්සරහට යන රටක් හැටියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් පවා එම සහතික අපේ රටට ලැබුණා. ඒක රටේ ජනතාවත් දන්නවා, ලෝකයත් දන්නවා. එහෙම තිබියදී තමයි මේ අය මේ විධියට බොරු ගොතන්නේ.

වසර 19කට පස්සේ ඉහළම රාජ්‍ය ආදායම ලබා තිබෙන්නේ මේ ආණ්ඩුව. එය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 16.7ක්. ඒක, ලොකු ජයග්‍රහණයක්. ප්‍රාථමික අය වැය අතිරික්තය සියයට 5.4යි. එය, ඉතිහාසය තුළ වාර්තා වුණු ඉහළම අගය. රජයේ ඉලක්කය වුණු සියයට 2.3 ඉක්මවා යෑමක් එහිදී වෙලා තිබෙනවා. මේවා බොරුවට හදපු ගණන් නොවෙයි. ජංගම ගිණුමේ අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 0.7යි. වසර 38කට පස්සේ තමයි එහි අතිරික්තයක් පෙන්වන්නේ. පසුගිය වසර 76 අතර තමයි ඔය 38ත් තිබුණේ. ඔය ඔක්කෝම හිටියේ ඒ වසර 76 ඇතුළේ තමයි. ණය තත්ත්වය සහ මූල්‍ය කළමනාකරණය ගත්තාම මධ්‍යම රජයේ ණය බර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 95යි. පෙර වසරේ 95.5ක් වෙච්ච එක මේ වසරේ අපි 95ට අඩු කරලා තිබෙනවා. ඒ විධියට තව ඕනෑ තරම් කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ සියලු දේවල් එක්ක, මේ නාටක අස්සේ මේ සංවාදය මෙහෙම යද්දී මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මැයි මාසය ගත්තොත්, සැමරුම් ගොඩක් එක්ක යන මාසයක්. එක පැත්තකින් රණවිරු සැමරුම තිබුණා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ජාතික ජන බලවේගයේ අපටත් සැමරුමක් තිබුණා. අපේ පක්ෂය නිර්මාණය කරලා අවුරුදු 61ක් වෙනවා. "අපේ බුදුන් අපි වැන්දා, එරන් පතුල අපි වැන්දා..." කියලා කොල්ලෝ බඩ ගා ගෙන සිරිපාදෙ යනකොට කියනවා වාගේ රණවිරු සැමරුම බඩ ගාගෙන වඳින්න ගිහිල්ලා, මල් කලඹ තියන්න ගිහිල්ලා රටට ලජ්ජා කරපු, තමන්ගේ කැත පෙන්වපු අයත් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මෙච්චර ලස්සනට පාර්ලිමේන්තුව පවත්වාගෙන යද්දී මොකද වුණේ? ගරු කථානායකතුමාට, වේත්‍රධාරිතුමාගේ පිහිට තිබුණේ නැත්නම් මෙතැනට වනජීවී එකේ නිලධාරින්ව කැඳවන්න වෙනවා. මොකද, මෙතැන අලි අල්ලනවා වාගේ වැඩක් වෙනවා නේ. එවැනි තත්ත්වයකට මේ පාර්ලිමේන්තුව පත් කරමින් මේ රට අවලස්සන කරන්න හදන විපක්ෂයට අපි කියන්න කැමැතියි, ජනතාව ඉස්සරහ, ලෝකය ඉස්සරහ මේ රටට ලජ්ජා කරන්නේ නැතිව, මේ ආර්ථික දත්ත ඉහළ නංවමින් මේ රට ඉස්සරහට ගෙන යන්න සම්බන්ධ වෙන්න කියලා.

ඒ විතරක් නොවෙයි. තරුණයින් දිරිගන්වමින් සමාජවාදී තරුණ සංගමය විසින් තරුණ සමුළුව මීරිගමින් ආරම්භ කරලා මේ රටේ තරුණයින්ට වගකීම් පවරන්න පෙළ ගැසුණු හැටි පසුගිය දිනක අපි දැක්කා. එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා එහිදී හොඳ දේශනයකුත් පැවැත්වූවා. ඒ වාගේම සංචාරක කර්මාන්තය වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ නව පියවරක් තබන්නත් අපි කටයුතු කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ සභාපති ආචාර්ය මහේෂ් ප්‍රියදර්ශන මැතිතුමා, සංචාරක අමාත්‍යාංශයේ උපදේශක ආචාර්ය සමන්ත පතිරණ මැතිතුමා ඇතුළු නිලධාරින් එකතු වෙලා අඹේපුස්ස ගොවිපොළේ පැවැත්වූ හමුවේදී සංචාරක කර්මාන්තය පැත්තෙන් ආදායම් රැසක් ගෙනෙන රටාවකට මේ රට පෙළගස්වන්න අවශ්‍ය කටයුතු කළා. අපි දිස්ත්‍රික්ක මට්ටමින්, ජාතික මට්ටමින් කරන වැඩසටහන් සියල්ල අවුල් කරලා, රටට වැරැද්දක් පෙන්වලා ආණ්ඩුවේ යහපත් ගමන අවලස්සන කරලා ඉතිහාසයේ කුණු බක්කියටම තවත් වැටෙන්න එපා කියලා

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

විපක්ෂයෙන් ඉල්ලන ගමන්, මේ ජයග්‍රහණය සඳහා අත්වැල් බැඳ ගන්න කියලා හැමදෙනාටම ආරාධනා කරමින්, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.20]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාලය පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට වර්තමානයේ මුහුණ පෑමට සිදු වී ඇති ඉරණම පිළිබඳව කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, පසුගිය වර්ෂයේ ඇති වුණු "දිට්වා" සුළි කුණාටුවෙන් වැඩිම ව්‍යසනයකට පත් වුණේ අපේ මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව බව. අද වෙනකොට "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා මාස 6ක් ගත වුණත්, හිටපු තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක නොවෙයි මහනුවර ජනතාව නම් ඉන්නේ. මොකද, මම මේ කථා කරන මොහොතේදීත් මහනුවර දිස්ත්‍රික්කයේ අර්ධ හානි සිදු වුණු ගෙවල් 11,352ක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මීට දින කිහිපයකට පෙර ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා සභාගත කරපු වාර්තාවකට අනුව තමයි මම මේ දත්ත ඉදිරිපත් කරන්නේ. අර්ධ හානි සිදු වුණු ඒ ගෙවල් 11,352න් අද වෙනකොට ගෙවල් 3,192කට තමයි ප්‍රතිලාභ ලැබී තිබෙන්නේ. ඒ කියන්නේ, මාස හයකින් සියයට 21කට - හතරෙන් එකක් වැනි කොටසකට - තමයි අද වෙනකොට යම්කිසි මුදලක් මේ රජය විසින් ලබා දී තිබෙන්නේ.

විශේෂයෙන්ම මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙවල් 1,973කට අර්ධ හානි සිදු වුණත් අද වෙනකොට ගෙවල් 49කට - සියයට 2.4කට - විතරයි යම්කිසි වන්දි මුදලක් ලැබී තිබෙන්නේ. උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත්, අර්ධ හානි සිදු වුණු ගෙවල් 1,286න්, ගෙවල් 1,175කට විතරයි අද වෙනකොට වන්දි මුදල් ලැබී තිබෙන්නේ; ඒ කියන්නේ, සියයට 13ක ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට. දොලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙවල් 1,834කට අර්ධ හානි සිදු වුණත් ගෙවල් 312කට විතරයි අද වෙනකොට වන්දි ලැබී තිබෙන්නේ. එය, සියයට 17ක් වැනි අඩු අගයක්. ඒ වාගේම දෙල්තොට ප්‍රදේශයේ අර්ධ හානි සිදු වුණු ගෙවල් 514න්, ගෙවල් 95කට - සියයට 18ක ප්‍රමාණයකට - තමයි ප්‍රතිලාභ ලබා දී තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් අහිමි වුණු පුද්ගලයන් 6,119ක් හිටියත් අද වෙනකොට විකල්ප ඉඩම් ලැබී තිබෙන්නේ 302කට විතරයි. එය සියයට 5ක් වැනි අඩු අගයක්.

ඒ වාගේම වන්දි ලබා දීම සම්බන්ධයෙන් කථා කළොත්, දෙල්තොට, මයිලපිටිය ප්‍රදේශයේ කාන්තාවක් අද මට දුරකථනයෙන් අමතා කිව්වා, එතුමියගේ වර්ග අඩි 1,120ක ගෙදරට ලැබී තිබෙන්නේ රුපියල් 64,000 කියලා. එතුමිය කියන ආකාරයට ග්‍රාම නිලධාරි විතරයි එතුමියගේ නිවස බැලීමට අද වෙනකොට ඇවිල්ලා තිබෙන්නේ. අඩුම තරමින් TO කෙනෙක්වත් ඒ නිවස තක්සේරු කරන්න ඇවිල්ලා නැහැ. මම අහන්න කැමතියි, මේවා තක්සේරු කරන්නේ කෙසේද කියලා. හිතුණු හිතුණු ගණන් දමලා අපේ අහිංසක ජනතාවට මේ වාගේ සලකන එක ගැන ඇත්තටම අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ආර්ථික අර්බුදයක් පෙනෙන තෙක් මානයට රට ගමන් කරමින් පවතින බව දකින මොහොතක තමයි අද අපි මේ අදහස් දැක්වීම සිදු කරන්නේ. ආර්ථිකය හැසිරවීම පිළිබඳව මේ සතිය පුරාවටම විවිධ අදහස් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම බදු එකතු කිරීම පිළිබඳව ආණ්ඩුව දිගින් දිගටම කථා කළා. නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ සභාවේදී කිව්වා, කවදාවත් බදු එකතු කරන වැඩ පිළිවෙළක් හදලා තිබුණේ නැහැ කියලා. ඇත්තටම, එතුමාට කියලා දෙන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බොහොම අමාරුවෙන් තමයි මේ ව්‍යාපාර පවත්වා ගෙන යන්නේ. ඇත්ත, ඒගොල්ලන් බදු දැලට අසු වෙලා නොතිබුණත්, වක්‍රාකාරයෙන් ඒ හැමෝම බදුවලට අහු වෙලා තමයි තිබෙන්නේ. ඒ, කොහොමද? කඩයක් කරන කෙනෙක්, වෙළෙඳාමක් කරන කෙනෙක්, එහෙම නැත්නම් ගොවිතැන් කරන කෙනෙක් නියමිත පරිදි බදු නොගෙව්වත් අවසානයේදී ඒ ලැබෙන මුදල් ටික නැවත නැවතත් ව්‍යාපාරයට යොදවලා ව්‍යාපාරය දියුණු කළාට පස්සේ ඊළඟට කරන්නේ තමන්ගේ සාර්ථකත්වය මනින මිනුම් දණ්ඩක් විදියට වාහනයක් ගන්න උත්සාහ කරන එකයි. ලංකාව, ලෝකයේ කිසිම රටක නැති විශාල බදු ප්‍රමාණයක් වාහනවලට ගහලා තිබෙන්නේ ඔන්න ඔය ටික අර ගන්නයි. ඒ කියන්නේ, නියමිත ආකාරයට බදු නොගෙවන මිනිස්සු සල්ලි ටික එකතු කර ගත්තාට පස්සේ වාහනය ගන්න යද්දී අර අවුරුදු ගණනටම හරියන්න බදු ටික ගන්නවා, වාහනය හරහා.

Leasing company එකක් දැම්මාට පස්සේ ඒ leasing හරහා ආණ්ඩුව බදු ගන්නවා. අදාළ වාහනය ගත්ත කෙනා ඒ වෙනුවෙන් බදු ගෙවනවා. ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් දිගින් දිගටම බදු ගෙවමින් සිටින අතරතුර, තව තවත් තමන්ගේ capital එක එකතු කර ගන්න විවිධ ආකාරයට බදු ගනිමින් ඒක සාධාරණීයකරණය කරන ආණ්ඩුවක් නියෝජනය කරන අය තමයි මේ මොහොතේදී මා ඉදිරියේ ඉඳන් මේ කථා කරමින් ඉන්නේ. එහෙම බදු එකතු කර ගත්තත් ඉන්ධන මිල දවසින් දවස ඉහළ යනවා. ජල බිල දවසින් දවස ඉහළ යනවා. විදුලි බිල දවසින් දවස ඉහළ යනවා. ඊට අමතරව, විවිධ වූ වියදම් සහ තමන්ගේ නොසැලකිල්ල නිසා විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති කර ගන්නා අතරතුර, රට ආර්ථික වශයෙන් ක්‍රමානුකූලව පල්ලමක ගමන් කරන බවක් පෙනෙන්න තිබෙනවා. ඒ අතරතුර ඩොලරයේ මිල අනපේක්ෂිත ලෙස විශාල වශයෙන් ඉහළ යනවා.

පසුගිය ඉරිදා මම එක්තරා රැස්වීමකදී ජනාධිපතිවරයාට කිව්වා, ඩොලරයේ අගය 292ට නැවත වතාවක් ගෙනියන විධිය කියන්න කියලා. තවම ආණ්ඩුවේ කවුරුවත් ඒකට උත්තරයක් දුන්නේ නැහැ. අද මම ජනාධිපතිවරයාට; මුදල් ඇමතිවරයාට කියනවා, දවස් 10ක් වාගේ ඇතුළත ඩොලරයක මිල රුපියල් 20කින් වැඩි කරන විධිය ලෝකයට කියලා දෙන්න කියලා. මොකද, එච්චර වේගයෙන් ඩොලරයක මිල ඉහළ යනවා. මේ පවතින තත්ත්වය දිහා බලනකොට පෙනෙනවා, අපේ රට ගමන් කරන්නේ නරක අතටයි කියන එක. හැබැයි, ආණ්ඩුව කියනවා, එහෙම අර්බුදයක් නැහැ කියලා. අර්බුදයක් නැහැ කියලා අපේ රටේ ආණ්ඩුවයි, ඇමතිවරුයි, ජනාධිපතියි කියන අතරතුර, ඉන්දියාවේ අගමැතිවරයා පිළිබඳව මේ මෙතැන පිටුපස ඉන්න මන්ත්‍රී කෙනෙක් වර්ණනා කරනවා ඊයේ මම අහගෙන හිටියා, ශ්‍රේෂ්ඨ නායකයෙක්, ඉදිරි වසරක කාල සීමාව තුළ කරන්න ඕනෑ සැලසුම් ටික කිව්වා, ඒ සැලසුම් හරහා ක්‍රියාත්මක වුණොත් තමයි ගොඩ යන්න පුළුවන්, විපක්ෂ නායකතුමාත් ඒ වාගේ හැසිරෙන්න ඕනෑය කියලා. මම හිතන විධියට, එතුමා හිටපු විදුහල්පතිතුමෙක්. හැබැයි, එතුමාට අමතක වෙච්ච දේ මේකයි. "අපට නැතත්" කියාත් එතුමා කියනවා මම අහගෙන හිටියා. ඔව්, ලංකාවේ ජනතාව කුඹුරුවල කුරුල්ලෝ එළවන්න පුළුවන් මිනිස්සු නායකයෝ බවට පත් කරගෙන ශ්‍රේෂ්ඨ නායකයන් දිහා බල බලා කිඹුල් කඳුළු හෙළනවා. රටේ මැතිවරණයක් තිබෙන වේලාවක දැන ගන්න ඕනෑ, රටට ගැළපෙන නායකයෙක් පත් කර ගන්න. එහෙම නැතුව කුරුල්ලෝ එළවන්න පුළුවන් මිනිස්සු නායකයෝ බවට පත් කරගෙන ඉන්දියාවේ නායකයා දිහා බල බලා හුල්ලන්න දෙයක් නැහැ.

ඊළඟ කාරණාව මේකයි. ඉන්ධන මිල ක්‍රමානුකූලව වැඩි වන අතරතුර, මේ සතියේ යළිත් වතාවක් ඉන්ධන මිල වැඩි කරන්න උත්සාහ කරන බවක් පෙනෙන්න තිබෙනවා. එලෙස ඉන්ධන මිල වැඩි කරන්න උත්සාහ කරන අතරතුර සමස්ත ජන ජීවිතයම ක්‍රමිකව කඩාගෙන වැටෙමින් පවතිනවා. එලෙස ජන ජීවිතය ක්‍රමිකව කඩාගෙන වැටෙන අතරතුර ජනාධිපතිවරයා රටේ නායකයා විධියට තමන්ගේ වගකීම භාර අරගෙන ආණ්ඩුවේ වගකීම, ඉදිරි අවුරුද්දේ වැඩ පිළිවෙළ පිළිබඳව කියයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඉන්දියාවේ අගමැතිවරයා කියනවා, ජනතාවට මෙන්න මෙහෙම කරන්න කියලා. නමුත්, අපේ රටේ නායකයා කොහේද ඉන්නේ කියලා බලනකොට එතුමා පුස්තකාලයක් විවෘත කරන්න ගිහිල්ලා ඉන්නවා මම දැක්කා. මේ රට ඇතුළේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ආර්ථික වශයෙන් රට වේගයෙන් කඩාගෙන වැටෙමින් යනවා. බලාගෙන ඉන්නවා, IMF ණය වාරිකය එනකම්. ඒ අතරතුර අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යනවා. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යන අතරතුර මම දැක්කා, ජනාධිපතිවරයා පුස්තකාලයක් විවෘත කරන තැනක මොනවා දෝ කථා කර කර ඉන්නවා. ඒක තමයි අපේ රටේ වගකීම පිළිබඳව මුදල් ඇමතිවරයා විධියට කටයුතු කරන එතුමා හැසිරෙන ආකාරය.

දැන් මේ තත්ත්වය යටතේ 2022 අවුරුද්දේ වාගේ මේ රට අර්බුදයකට යන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ආණ්ඩුවේ වගකීම තමයි එහෙම තත්ත්වයකට මේ රට නොයවා ඉන්න එක. එහෙම වුණොත් රටේ පුරවැසියන් විධියට අපි සියලු දෙනා ඒකෙන් අපහසුතාවට පත් වෙනවා. මෙහෙම ගියොත්, ගෝඨාභය හිටපු ජනාධිපතිවරයාට වාගේ පිටිපස්සෙන් රටින් පැනලා යන්න හැකියාවක් නැහැ. මොකද, ගෝඨාභය හිටපු ජනාධිපතිවරයා යුද්ධයත් එක්ක කටයුතු කරලා ලබා තිබුණු ඒ හැකියාව නිසා යම්කිසි ගැටලුවකදී එහෙම යන විධිය දන්නවා. ඊට පස්සේ ආපු රනිල් වික්‍රමසිංහ මේ සියලු අර්බුද ටික කළමනාකරණය කර ගන්න සෑහෙන මහන්සියක් ගත්තා. වයස, අත්දැකීම්, ඊට අමතරව බුද්ධාගමෙන් ලැබුණු පෝෂණය කියන ඒ සියලු දේවල් එක්ක කොහොම හරි එතුමා ඒ අභිමිවීම් එක්ක කටයුතු කරගෙන ගියා. හැබැයි, වර්තමාන ජනාධිපතිවරයා මුහුණ දෙන අභියෝගය තමයි, ළඟදීම තමන්ගේ ජනාධිපති ධුරය ඉවර වෙන්න නියමිතයි කියන එක. තව අවුරුදු තුනක් යද්දී කොහොමත් ජනාධිපති ධුරය ඉවරයි. ඊට කලින් ඒ ධුරය ඉවර නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. ගොබෙල්ස් න්‍යාය ගැන මගේ මිත්‍රයා වන මීරිගම මන්ත්‍රීතුමා කිව්වා. ලංකාවේ original ගොබෙල්ස් තමයි, අනුර කුමාර. එකම බොරුව දිගටම කියලා බලයට පත් වුණා. ඊට පස්සේ මොකද වෙන්නේ? සත්‍යයට මුහුණ දෙන්න බැරිව දඟලනවා. එහෙම සත්‍යයට මුහුණ දෙන්න බැරිව එතුමා දඟලන අතරතුර, ආණ්ඩුවේ මන්ත්‍රී කෙනෙක් අපට ගොබෙල්ස් න්‍යාය පිළිබඳව කියනවා. ඇත්තටම ගොබෙල්ස් න්‍යාය නොවෙයි, අනුර න්‍යාය පාවිච්චි කරන්නේ නැති එක තමයි අපි මේ වෙලාවේදී කරන වැදගත්ම දේ. කොහොම හරි කමක් නැහැ, අවසානයේදී රනිල් වික්‍රමසිංහගෙනුත් නොවෙයි, ගෝඨාභය රාජපක්ෂගෙනුත් නොවෙයි, මේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගෙන් මම කාරුණිකව ඉල්ලීමක් කරනවා, මොන ප්‍රශ්නය ආවත්, බල නහරය කපා ගෙන සියදිවි නසා ගන්නවා වාගේ වැඩ කරන්න එපා, ආර්ථිකය යන්නේ නරක අතට, ඒ නිසා පුළුවන් නම් ක්‍රමිකව උත්සාහ කරලා මේ රට ගොඩනහා ගන්න කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට තව විනාඩියක් දෙන්න පුළුවන් නම් හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ සතිය, අපේ රටට ඓතිහාසික සතියක්. ඒ තමයි, රණවිරුවන් විසින් මේ රට බේරා ගැනීම සිහි කරන සතිය. මේ රට යුද්ධයෙන් බේරා ගත්ත ඒ රණ විරුවන් සිහි කිරීම අවුරුදු 17කට පස්සේ සමරන මොහොතේදී විශේෂයෙන්ම හමුදාව, නවීන හමුදාවක් බවට අපේ රට පත් කරනවාද, හමුදාවෙන් විශ්‍රාම යන නිලධාරින්ට ඒ නිසි ගෞරවය සහ ලැබිය යුතු වරප්‍රසාද ටික හිමි වෙනවාද කියන එක පිළිබඳවත් ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.29]

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන රෙගුලාසි සහ තවත් යෝජනා සම්මත කිහිපයක් පාර්ලිමේන්තුවේ

[ගරු රත්න ගමගේ මහතා]

අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් පදනම් කරගෙන තමයි අපට ඒ ගැන කථා බහ කරන්න තිබෙන්නේ.

එකක් තමයි, ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ඉදිරිපත් කරන්නේ ඇයි කියන එක. මේ රජය බලයට පත් වුණාට පස්සේ අපි අවස්ථා කිහිපයක් විවිධාකාරයේ ආනයන හා අපනයන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළා. අපි පිළිගන්නවා, මීට වසර 2කට කලින් සහල් ගැන කථා කළා, ඒ වාගේම ලුණු ගැන කථා කළා. රටේ ආහාර තත්ත්වය, ආහාර සුරක්ෂිතතාව පිළිබඳව රජය කිසිම අධ්‍යයනයක් කරලා නැද්ද, ඒ සම්බන්ධව සොයා බැලීමක් කරලා නැද්ද කියලා ඇහුවා. සොයා බැලීමක් කරලා තිබෙනවා. ඒ අනුව තමයි ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව මඟින් ඉදිරිපත් කරලා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ යටතේ අද ආනයන හා අපනයන (පාලන) පනතට මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

මේක දැක්මක් තිබෙන රජයක්, වැඩ පිළිවෙළක් සහිත රජයක්. අපේ රජය බලයට පත් වෙන වෙලාවේ අපි ඉදිරිපත් කළ එක කාරණයක් තමයි අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් හදනවා, ඒ නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණව ජනතාවට බෙදී යාමට සලස්වනවා සහ ඒ නිෂ්පාදන ආර්ථිකයට මහජන සහභාගීත්වය ලබා ගන්නවා කියන එක. නිෂ්පාදන ආර්ථිකයක්, ඒ සඳහා මහ ජනතාවගේ සහභාගිත්වයක් සහ එහි ප්‍රතිලාභ සාධාරණව ජනතාවට බෙදී යාමක්. එයට අදාළව මේ කටයුත්ත අපි සාර්ථකව ඉෂ්ට සිද්ධ කරගෙන ගියා. මේ රටේ ජනතාව දන්නවා ඒ කටයුත්ත අපේ රජය අවංකව කළා කියන එක.

මේ කාලය තුළ කෘෂි කාර්මික ක්ෂේත්‍රය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය සහ මේ රටේ නිෂ්පාදන ආර්ථිකය කිසියම් ඉහළ තැනකට ඔසවා ගැනීමට අපේ රජය යටතේ හැකියාවක් ලැබුණා. ඒ වාගේම තමයි පසුගිය අවුරුදු කිහිපය තුළ විදේශ ප්‍රේෂණ සහ සංචාරකයින්ගේ පැමිණීම තුළින් අපට ඩොලර් ආදායම වැඩි කර ගැනීමට හැකියාවක් ලැබුණා. 2023 අවුරුද්දේ සංචාරක කර්මාන්තයෙන් ඩොලර් මිලියන 2,070ක්, 2024දී ඩොලර් මිලියන 3,170ක් සහ 2025දී ඩොලර් මිලියන 3,220ක් අපි උපයාගෙන තිබෙනවා. එය කිසියම් ප්‍රමාණයකින් ප්‍රතිශතාත්මකව අඩු වුණා "දිට්වා" සුළි කුණාටුවත් සමඟ. නමුත්, සාධනීය වර්ධනයක් කර ගැනීමට හැකියාවක් ලැබුණා. විදේශීය ප්‍රේෂණ 2022දී ඩොලර් මිලියන 3,789යි, 2023දී ඩොලර් මිලියන 5,970යි, 2024දී ඩොලර් මිලියන 6,570යි සහ 2025දී ඩොලර් මිලියන 8,070යි. ඒ විධියට ක්‍රමික වර්ධනයකට ගෙනාවා.

2026 වර්ෂය ආරම්භයත් සමඟ, -"දිට්වා" සුළි කුණාටුවෙන් අනතුරුව - මැද පෙරදිග යුද්ධමය තත්ත්වය වර්ධනය වීමත් සමඟ අපේ ආර්ථිකයට බලපෑමක් ආවා. අපි එය නිහතමානීව පිළිගන්නවා. අපට විතරක් නොවෙයි ලෝකයේ අනෙක් රටවලටත් මේ ප්‍රශ්නය ඇති වුණා. දැන් මේ සභාවේ කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් - tuition master කෙනෙක් - කිව්වා ජනාධිපතිතුමා කිව්වාය කියලා "එහෙම දෙයක් නැහැ, අපට මුහුණ දෙන්න පුළුවන්" යනුවෙන්. කරුණාකරලා අද පත්තර ටික බලන්න, ජනාධිපතිතුමා කළ ප්‍රකාශය තිබෙනවා. ඒ වෙනුවට කිසියම් ප්‍රකාශයක් කළා නේ. ඔබත්, මමත් භෞතික විද්‍යාව උගන්වපු ගුරුවරු. ඔබතුමා යාන්ත්‍ර විද්‍යාව පාඩමේ නිව්ටන්ගේ තුන්වන නියමය බලන්න, ඒ උදාහරණය ඔබේ නායකයාට යොදා ගන්න. "සෑම ක්‍රියාවකටම සමාන හා ප්‍රතිවිරුද්ධ වූ ක්‍රියාවක් ඇත." යාන්ත්‍ර විද්‍යාවේ නිව්ටන්ගේ තුන්වෙනි නියමය තමයි ඒ කියන්නේ.

රටේ ජනාධිපතිතුමා කිව්වේ ඒ හේතුන් නිසා රුපියලට පීඩනයක්, දැඩි තෙරපුමක් ඇති වෙලා කියලා. අද පුවත් පත් ටික බලන්න. පාර්ලිමේන්තුවේ කථාවක් කරනකොට පත්තර ටික හරි බලන්න එපායැ. අඩු ගාණේ TV එකේ වැඩසටහන් ටික හරි බලලා එන්න එපායැ. අද දවසේ පුවත් පත්වල තිබෙන දේවල් නොකියවපු විපක්ෂයක් මේ ඉන්නේ. විශේෂයෙන් මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රකාශය අනුව ඉන්දියානු රුපියල සියයට 6.4කින්, නේපාල රුපියල සියයට 6.2කින්, ඉන්දුනීසියානු රුපියල සියයට 5.2කින්, ශ්‍රී ලංකා රුපියල සියයට 4.8කින්, පිලිපීන පේසෝ එක සියයට 4.7කින්, තායිලන්ත බාත් මුදල් ඒකකය සියයට 4කින් තෙරපුමකට ලක් වෙලා තිබෙනවා, පීඩනයකට පත් වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. ඒක මැද පෙරදිග අර්බුදයත් එක්ක ආව ප්‍රශ්නයක්.

අපි රජයක් වශයෙන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කොහොමද? එකක් තමයි, පළමුවෙනි මොහොතේම රජයක් වශයෙන් ඒ පාඩුව අපි විඳ දරා ගන්නවා. තමුන්නාන්සේලා දන්නවාද, විපක්ෂයේ ඔබතුමන්ලා දන්නවාද, මැද පෙරදිග අර්බුදයත් සමඟ තෙල් මිළ ඉහළ ගිය පළමුවෙනි මොහොතේම ඒකට මුහුණ දුන්නේ කවුද කියලා? අපි. ජනාධිපතිතුමායි, අග්‍රාමාත්‍යතුමිය ඇතුළු ඇමති මණ්ඩලයයි, නියෝජ්‍ය ඇමතිවරුයි අපේ තෙල් කෝටා එක අඩු කර ගත්තා.

තමුන්නාන්සේලා දන්නවා, අපේ රජය බලයට පත් වුණාට පසුව හිටපු ජනාධිපතිවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කළ බව. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කළා. හිතාගෙන හිටියා නේද, මේගොල්ලෝත් බලයට ආවාට පසුව ඒක කරන එකක් නැහැයි කියලා? මොකද, ඒගොල්ලෝ කළේ එහෙම නේ. හිතන්න ඇති, අපිත් එහෙමයි කියලා. නැහැ, අපි වෙනස්. අපි අලුත් දේශපාලන සංස්කෘතියක් හැදුවේ. ඒ නිසා තමයි අපි මේ කටයුත්ත කරන්නේ. මැද පෙරදිග අර්බුදය එනකොට බලයේ හිටියේ තමුන්නාන්සේලා නම් ජනතාවට කියයි, පටි තද කර ගන්න කියලා. නමුත්, බලයේ හිටියේ ජාතික ජන බලවේගය. මතක තබා ගන්න, අනුර දිසානායක ජනාධිපතිතුමාගේ රජය නිසා පටි තද කර ගත්තේ අපි. තමුන්නාන්සේලා බලයේ හිටියා නම් ජනතාවට පටි තද කර ගන්නය කියයි බොටුව මිරිකෙන කල්. අපි අද මොකද කළේ? ජනතාව නොවෙයි, මේ රටේ පාලනය කරන අපි තමයි ඒ කටයුත්ත කළේ. ඒ නිසා මේ තිබෙන්නේ ආදර්ශවත් පාලනයක්. අපි රට ගෙන යන්නේ නිවැරදි තැනකට.

අපි දීර්ඝ කාලයක් දේශපාලනය කළා. ඔව්. දේශපාලනයේදී අපට උගන්වා තිබෙන්නේ, මට, මා, එහෙම නැත්නම් මගේය කියලා හිතන්න නොවෙයි; අපි, අප, අපට කියලා පරාර්ථකාමීව හිතන්නයි. ඕනෑ දෙයක් පරිත්‍යාග කරලා වැඩ කරන්න තමයි අපට මේ දේශපාලනය ඉගැන්වූයේ. ඒ නිසා තමයි මේ විධියේ crisis එකක් වෙලාවේ තත්ත්වය අවම කර ගන්න හැකියාව තිබෙන්නේ. ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන් ඒ කැපවීම කළා. ඒ කැප කිරීම අපට උගන්වලා තිබුණා. අපට එය උගන්වන්න සූදානම් වෙන්න එපා. අපි එය ඉගෙන ගත්ත දේශපාලන ව්‍යාපාරයක් විධියට තමයි මේ පාලන බලය ගත්තේ. ඒ නිසා තමයි, රිදිලා තිබෙන්නේ; වැදිලා තිබෙන්නේ. රිදිච්ච සහ වැදිච්ච හැටි මට තේරුණා.

ජනාධිපතිතුමා ඊයේ මඩකලපුවට ගියා. ඔව්. එතුමා මේ රටේ සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව ආදරය කරන නායකයෙක්. මේ, සියලු ජනතාව ආදරය කරන ආණ්ඩුවක්. කෝ, දැන් මෙතැන ගජේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා නැහැ නේද? හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා හා රාසමාණික්කම් මන්ත්‍රීතුමාත් හිටියා නම් වැදගත්. ඊයේ මඩකලපුවට ගිහිල්ලා ඒ පුස්තකාලය විවෘත කළාට රිදිලා තිබෙනවා. අන්න, සමගි ජන බලවේගයට රිදිලා. ඇත්ත, රිදෙන්න

ඕනෑ. ජාතිවාදී දේශපාලන පක්ෂවලට ඒකෙදි රිදෙන්න ඕනෑ. දේශපාලනයේදී අපට උගන්වලා තිබෙන්නේ කුමක්ද? අපට උගන්වලා තිබෙන්නේ, ජාතික සමගිය ගැන. බෞද්ධ, හින්දු, කතෝලික හා ඉස්ලාම් කියන ආගම් අදහන ජනතාව, සිංහල, දෙමළ හා මුස්ලිම් කියන සියලු ජාතීන් අතර ජාතික සමගිය, ආගමික සහයෝගිතාව වර්ධනය කරන්නයි අපට උගන්වලා තිබෙන්නේ. එදා බෙදුම්වාදී යුදමය තත්ත්වයක් ඇති වුණු අවස්ථාවේදීත් මේ දේශපාලනය අපි රැක්කා. පාස්කු ප්‍රහාරය වෙලාවේදීත් අපි මේ දේශපාලනය රැක්කා. ඊයේ කථා වුණා නේ, හතර දෙනෙක් ගැන. බාප්පොච්චිලා, අප්පොච්චිලා, පුතාලා ගැන. දැන් පාර්ලිමේන්තුවට එන්නෙත් නැහැ. දැන් මොකද වෙලා තිබෙන්නේ? මෙන්න බඩු අතට අහු වුණා. මෙන්න, ජාතිවාදය උලුප්පපු අය. මෙන්න, ආගම්වාදය පතුරපු අය. අද ඒ අය මෙතැන නැහැ. මඩකලපුව පුස්තකාලය හදපු එකට රිදුණු විපක්ෂයක්, කැත විපක්ෂයක් ඉන්නේ.

ගරු ගජේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා, මේ රටේ ජාතික සමගිය ඇති වනවාට විරුද්ධයි ඔය පිටුපස ඉන්න කට්ටිය. මතක තබා ගන්න. ආගමික සහයෝගීතාව ඇති වනවාට විරුද්ධයි. උතුරට, නැඟෙනහිරට වැඩ කරනවාට විරුද්ධයි. මතක තබා ගන්න, මේ රජය බලයට පත් වුණු දවසේ ඉඳලා ලංකාවේ දකුණ, නැඟෙනහිර, බටහිර හා උතුරට සාධාරණව සලකපු බව. "දිට්වා" සුළි කුණාටුව ඇති වූවාට පසුව අපි කොහොමද කටයුතු කළේ? මධ්‍ය කඳුකරයට සැලකුවා. මතක තබා ගන්න, ගෙයක් හදා ගන්න රුපියල් ලක්ෂ 50යි. ඉඩම් නැත්නම් කෝටියයි. තමුන්නාන්සේලා අර කියපු එක, නිව්ටන්ගේ තුන්වන නියමය අනුව ගැළපෙන නායකයා ඒ ආපදා අවස්ථාවේ හිටියා නම් මොකද වෙන්නේ? රුපියල් ලක්ෂ 2යි දෙන්නේ. ඒ කියන්නේ, පෙරේත පාදෙන් ගොඩ එන්න දෙන්නේ, ඒ කාලයේ. ගිනි පෙට්ටි හදන්න. නමුත්, අපි කුමක්ද කළේ? අපි සාධාරණව කටයුතු කළා. ජනතාවට සහන දුන්නා. ඒවාට රිදෙනවා.

තෙල් මිල වැඩි වනකොට මොකද වුණේ? තෙල් මිල වැඩි වනකොට, ජනතාවට අර්බුදය එනකොට සහ සිංහල හින්දු අලුත් අවුරුද්ද සමරන්න මේ රටේ දිළිඳු ජනතාවට සහන දෙනකොට රිදුණා. රිදෙන්නේ මොකෝ? ආණ්ඩු කරන්න ඒගොල්ලන්ට බලයක් ලැබෙන බවත් පෙනෙන තෙක් මානයකවත් නැහැ. රිදෙනවා තමයි; වේදනාවයි. ඔබේ හදවතේ ගැඹුරුම තැනට දැනෙන වේදනාව, කම්පනය අපට දැනෙනවා. මොනවා කරන්නද ඉතින්? ඔය වේදනාවට, කම්පනයට, අපට කරන්න දෙයක් නැහැ. ඔය විධියට අඬා වැළපෙයි, හොටු හූරමින්. කළු ගලේ ඔළුව ගහ ගත්තා වාගේ ඉන්න වනවා හැම දාම.

අපට තිබෙන්නේ මේ රට නිවැරදි තැනකට ගෙන යන මාර්ගයක්. ඒ නිසා ඔබ ගැන මට දුකයි. කරන්න දෙයක් නැහැ. වේදනාවට කියන දේවල් අපි පිළිගන්නෙත් නැහැ. අපි රට නිවැරදි තැනකට ගෙන යනවා. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මේ රෙගුලාසි ගෙන එන්නේ මේ රටේ අනාගතය ගැන හිතලා, ආහාර සුරක්ෂිතතාව ගැන හිතලා. ඒ වෙනුවෙන් ඔබේ සහයෝගය පළ කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 2.40]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! திருகோணமலை மாவட்டத்தில் இப்பொழுது ஏற்பட்டிருக்கின்ற ஒரு பிரச்சினை சம்பந்தமாக இந்த இடத்தில் பேசலாமென நினைக்கின்றேன். அங்குள்ள கருமலையூற்று கடற்கரைப் பகுதியில் கடந்த சில தினங்களாக நிலவிவருகின்ற பாரதூரமான நிலைமை குறித்து இந்தச் சபையினதும் அரசாங்கத்தினதும் கவனத்துக்குக் கொண்டுவரலாமென நினைக்கின்றேன். கடந்த மே மாதம் 05ஆம் திகதி காலை எவ்வித முன்னறிவிப்பும் இன்றி பாதுகாப்புத் தரப்பினரால், குறிப்பாக விமானப் படையினரால் கருமலையூற்று கடற்கரைப் பகுதியில் திடீர் வீதித் தடையொன்று ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. அந்தப் பாதையானது பல தசாப்தங்களாக அப்பகுதியிலுள்ள மீனவர்கள், பொதுமக்கள் மற்றும் சுற்றுலாப் பயணிகள் பயன்படுத்துகின்ற ஒரு வீதியாகக் காணப்படுகின்றது. அவ்வாறு வீதித் தடை ஏற்படுத்தப்பட்ட அன்று, இந்த விடயம் என்னுடைய கவனத்துக்குக் கொண்டுவரப்பட்டதை அடுத்து, நான் உரிய தரப்பினரோடு தொடர்புகொண்டு இந்த விடயத்தைத் தெளிவுபடுத்தி இருந்தேன்.

நான் இது சம்பந்தமாக சனாதிபதியின் பாராளுமன்ற அலுவல்களுக்கான இணைப்புச் செயலாளர் அவர்களுக்கும் எழுத்துமூலம் கடிதமொன்றை வழங்கியிருந்தேன். அன்றைய தினமே கௌரவ பிரதி அமைச்சர் அவர்கள் என்னிடம் இந்த வீதித் தடை அகற்றப்பட்டு இந்தப் பிரச்சினை தீர்க்கப்படுமெனக் கூறியிருந்தார். என்னுடைய முகப்புத்தகத்தில்கூட - FBஇல்கூட - அவர் இது சம்பந்தமான பதிவை இட்டிருக்கிறார். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடந்த 14ஆம் திகதி அந்த இடத்துக்கு நான் நேரடியாகச் சென்று பார்வையிட்டிருந்தேன். அங்கு மிகவும் மோசமான, கவலைக்குரிய ஒரு நிலைமை காணப்படுகின்றது. அகற்றப்பட்டதாகக் கூறப்பட்டாலும், அங்கு அந்த வீதித் தடை இன்னும் அகற்றப்படாமலே இருக்கின்ற அதேவேளை, அதிகளவான பாதுகாப்புத் தரப்பினர் அந்த இடத்தில் நிறுத்தப்பட்டு இருக்கிறார்கள். இது அந்தப் பிரதேசத்திலுள்ள மக்களுக்குப் பெரும் அச்சத்தையும் சந்தேகத்தையும் ஏற்படுத்தி இருக்கின்றது.

ஏனென்றால், முத்துநகர் பிரதேசத்திலும் இவ்வாறான நடவடிக்கைகளால் மக்களின் காணிகள் சுவீகரிக்கப்பட்டு, அந்த மக்கள் இன்னும் கஷ்டத்தில் இருக்கின்றனர். அவ்வாறானதொரு நிலை எங்களது பிரதேசத்திலும் ஏற்பட்டுவிடுமோ என்ற அச்சத்துடன் அங்குள்ள மக்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, அரசாங்கமானது இந்த வீதித் தடையை அகற்றி, அங்கிருக்கின்ற மீனவர்களும் பொது மக்களும், அங்கு வருகை தருகின்ற உல்லாசப் பயணிகளும் அந்த வீதியைப் பயன்படுத்த அனுமதி வழங்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். குறித்த இடத்தில் வீதித் தடை காணப்படுகின்றது என்பதை எனது கையிலிருக்கும் இந்தப் புகைப்படம் உறுதிப்படுத்துகின்றது. இது இன்றைய தினம் எடுக்கப்பட்டதாகும். அதை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முத்துநகர் பிரதேசத்திலும் இது போன்றதொரு நிலைதான் காணப்படுகின்றது. இந்தச் சபையில் அது தொடர்பாகப் பல தடவை பேசப்பட்டாலும், இன்னும் அதற்கான தீர்வு வரவில்லை. நான் கடந்த 17ஆம் திகதி மீண்டும் அந்த இடத்துக்கு நேரடியாகச் சென்று பார்வையிட்டபொழுது, குளங்கள் உட்பட 400 ஏக்கர் காணிகள் துறைமுக அதிகாரசபையால் அடையாளப்படுத்தப்பட்டு, வேலியிட்டு அடைக்கப்பட்டுள்ளன.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

இவ்வாறு அடைக்கப்பட்டிருப்பதன் காரணமாகவும், அந்த வீதித் தடை காரணமாகவும் அங்குள்ள மீனவர்கள் கடலுக்குச் செல்ல முடியாத நிலையை எதிர்நோக்கியுள்ளனர். விவசாயம், மீன்பிடி போன்ற தொழில்களை மேற்கொள்ள முடியாதிருப்பதனால் அவர்கள் வாழ்வாதாரத்தை இழந்தவர்களாகக் காணப்படுகின்றார்கள். ஆகையால், தயவுசெய்து முத்துநகர் பிரதேச மக்களுக்கான நிவாரணத்தை வழங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டும். அதேபோன்று, அந்த வீதித் தடையை அகற்றி அங்குள்ள மீனவர்கள் கடலுக்குச் செல்வதற்கான ஏற்பாடுகளையும் செய்ய வேண்டுமென இந்த இடத்தில் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෙෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.44]

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பில் கருத்துத் தெரிவிக்க முன்னர், முக்கியமானதொரு விடயத்தைக் கூற விரும்புகின்றேன்.

எமது ஈழ விடுதலைப் போராட்டத்தின் சமர்க்கள நாயகன் பிரிகேடியர் பால்ராஜ் அவர்கள் எம்மை விட்டுப் பிரிந்து 18 ஆண்டுகள் கடந்திருக்கின்றன. கந்தையா பாலசேகரம் என்ற இயற்பெயரையுடைய சமர்க்கள நாயகன் பிரிகேடியர் பால்ராஜ் அவர்கள், முல்லைத்தீவு மாவட்டத்தின் கொக்குத்தொடுவாய் பகுதியைச் சேர்ந்தவர். உலகப் போரியல் வல்லுநர்களே கண்டு வியந்த சமர்க்கள நாயகன் பிரிகேடியர் பால்ராஜ் அவர்களுக்கு இந்த உயரிய சபையில் சிரம் தாழ்த்தி எனது அஞ்சலிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, காடழிப்பு விடயம் பற்றி சொல்ல விரும்புகிறேன். வவுனியா பல்கலைக்கழகம் முன்பாக பாரிய காடழிப்பு நடைபெறுகின்றது. அங்கு வெட்டப்படும் மரங்கள் உடனேயே அப்புறப்படுத்தப்படுவதாக மக்கள் தெரிவிக்கின்றார்கள். காடழிப்புச் செய்யப்படுகின்ற இடத்திலிருந்து சுமார் 2 கிலோ மீற்றருக்குள்தான் வன இலாகாவின் அலுவலகம் இருப்பதாகவும் சொல்லப்படுகின்றது. வனவளத் திணைக்களத்தின் உதவியுடன் இது நடைபெறுகின்றதோ என அங்குள்ள மக்கள் அனைவரும் சந்தேகிக்கின்றார்கள். தற்போது 40 ஏக்கருக்கும் மேல் காடு அழிக்கப்பட்டு, அந்த இடத்தில் வேலி அமைப்பதற்கு 'கொங்ரீட்' தூண்களும் போடுவதற்கு ஆயத்தமாக இருப்பதாகச் சொல்லப்படுகின்றது. இப்படி அழிக்கப்பட்டதற்கான ஆதாரம் எங்களிடம் உள்ளது. இது கடவுளுக்குத்தான் வெளிச்சம்! எனவே, அரசாங்கம் இது சம்பந்தமாக உடனடியாக நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்த உயரிய சபையில் தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சருமானவரால் சமர்ப்பிக்கப்பட்ட இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின்கீழ் கொண்டுவரப்பட்டுள்ள மூன்று முக்கிய ஒழுங்குவிதிகள் மற்றும் ஒதுக்கீட்டுச் சட்டத்தின்கீழ் முன்வைக்கப்பட்டுள்ள ஒன்பது தீர்மானங்கள் மீதான விவாதத்தில் வன்னி மண்ணைச் சேர்ந்த மக்களின் சார்பாளனாக நின்று சில முக்கிய யதார்த்தங்களை அரசின் மேலான கவனத்துக்குக் கொண்டுவரக் கடமைப்பட்டு இருக்கின்றேன்.

2026 ஏப்பிரல் 02ஆம் திகதியிட்ட 2482/12ஆம் இலக்க அதிவிசேட வர்த்தமானிமூலம் உள்நாட்டுச் சந்தையில் ஏற்பட்டுள்ள சம்பா மற்றும் கீரி சம்பா அரிசி தட்டுப்பாட்டை நிவர்த்தி செய்வதற்காக பொன்னி சம்பா, பால்பொன்னி உள்ளிட்ட GR11 அரிசி வகைகளை இறக்குமதி செய்வதற்கான கட்டுப்பாட்டு உரிமத் தேவை நீக்கப்பட்டுள்ளதாகக் கூறப்படுள்ளது. ஓர் இறக்குமதியாளர் அதிகபட்சமாக 1,040 மெற்றிக்தொன் அரிசியை மே 31ஆம் திகதிக்குள் சுங்கத்திலிருந்து விடுவிக்க வேண்டுமென்ற நிபந்தனையோடு இந்த தற்காலிக அனுமதி வழங்கப்பட்டுள்ளது.

அரச தரப்பு தகவல்களின்படி, நெல் களஞ்சியப்படுத்தல் சபையின் களஞ்சியசாலைகளில் 185,000 மெற்றிக்தொன் நெல் தேங்கிக்கிடப்பதாகக் கூறப்படுகின்றது. கடந்த மூன்று பருவகாலங்களாகத் தொடர்ச்சியாக கொள்வனவு செய்யப்பட்ட நெல் இன்னும் முறையாகச் சந்தைப்படுத்தப்படாமல் முடங்கிக் கிடக்கிறது. இவற்றுள் எத்தனை மெற்றிக்தொன் சம்பா, கீரி சம்பா நெல் தேங்கிக் கிடக்கிறது என்பதை கௌரவ அமைச்சர் அவர்கள் இச்சபைக்கு வெளிப்படுத்த வேண்டும்.

ஒரு புறம், ஓர் இலட்சத்துக்கும் அதிகமான மெற்றிக்தொன் நெல் அரச களஞ்சியங்களில் வீணாகிக்கொண்டு இருக்கின்றது. மறுபுறம், நுகர்வோருக்கு சம்பா அரிசி இல்லை என்ற காரணத்தைக் காட்டி வெளிநாட்டிலிருந்து பொன்னி சம்பா, பால்பொன்னி சம்பா அரசியை இறக்குமதி செய்ய அவசர தளர்வுகளை இந்த அரசு ஏற்படுத்துகின்றது. இது என்ன வகையான பொருளாதாரக் கொள்கை என்று எமக்குப் புரியவில்லை.

தொடர்ந்து மூன்று பருவகால நெல் கையிருப்பில் உள்ளபோது, அவற்றை ஏன் இன்னும் காத்திரமான முறையில் அரிசியாக மாற்றி சந்தைக்கு விநியோகிக்க முடியவில்லை?

அரசாங்கத்தின் இந்த மந்தகதி, நிருவாகத் திறன் வீழ்ச்சியால் எமது உள்ளூர் நெல் உற்பத்தியின் தரம் குறைவடைந்து வீணாகிப்போகும் நிலை ஏற்பட்டுள்ளது. இந்த வினைத்திறனற்ற சந்தைப்படுத்தல் மற்றும் கொள்வனவுத் தாமதங்களால் ஏற்படும் கோடிக்கணக்கான நட்டத்துக்குப் பொறுப்பேற்கப் போவது யார்? இது இந்த நாட்டு மக்களின் வரிப் பணம்தானே!

இப்போது நடைபெற்றுக்கொண்டு இருக்கும் சிறுபோகத்தின் அறுவடைக்கு குறிப்பாக, முல்லைத்தீவின் குமுழமுனை கமநல சேவை நிலையத்துக்கு உட்பட்ட பிரிவில் 3,492.9 ஏக்கரில் மேற்கொள்ளப்பட்ட நெற்செய்கையின் அறுவடைக்கு - முல்லைத்தீவு மாவட்டத்தின் கிட்டத்தட்ட 13 சதவீதமான நெற்செய்கையின் அறுவடைக்கு - இன்னும் ஒரு மாதம்கூட இல்லை. குமுழமுனை கமநல சேவை நிலையத்துக்கு உட்பட்ட வயல்களில் 1,325.625 ஏக்கர் அளவில் கீரி சம்பா நெல் உற்பத்தியே மேற்கொள்ளப்படுகின்றது.

இவ்வாறு நாடு தழுவிய வகையில் குளத் திருத்த வேலைகள் உள்ளிட்ட பல்வேறு காரணங்களாலும் சிறுபோக வேளாண்மையை அடுத்தடுத்த மாதங்களில் அறுவடை செய்யவுள்ளோரின் நெல் உற்பத்தியைக் காலந்தாழ்த்தாது நியாய விலையில் நெல் சந்தைப்படுத்தல் சபை பெற்றுக்கொள்ளுமா? இவ்வாறு பெறப்படுகின்ற நெல் கொள்வனவுக்கு இறக்குமதிச் சலுகைக்கு அளிக்கும் முன்னுரிமைக்கு மேலான முன்னுரிமையை விவசாய அமைச்சு அளிக்குமா? இவ்வாறான உள்ளூர் நெல் உற்பத்தியை நெல் சந்தைப்படுத்தல் சபை நியாய விலையில் பெற்று, அவ்விவசாயிகளின் விளைச்சலை உடன் சந்தைப்படுத்த இந்த அரசு தயாராக உள்ளதா? என இந்தச் சபையில் கௌரவ விவசாய அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த போகத்தில் முல்லைத்தீவிலிருந்து 2,500 மெற்றிக்தொன் நெல்லைக் கொள்வனவு செய்ய உத்தேசித்து இருந்தபோதும், ஏற்கனவே நெல் நிரம்பிய களஞ்சியசாலைகள் வெறுமையாக்கப்படாததால் நெற்களஞ்சியசாலைகளுக்குத் தட்டுப்பாடு ஏற்பட்டு, கடைசியில் 2,195.82 மெற்றிக்தொன் நெல்லே முல்லைத்தீவு மாவட்டத்தில் கொள்வனவு செய்யப்பட்டது. அதுபோல, வவுனியாவில் 1,444.76 மெற்றிக்தொன் நெல்லே கொள்வனவு செய்யப்பட்டதாக நெல் சந்தைப்படுத்தல் சபையால் 2026.03.12ஆம் திகதியன்று வவுனியா மாவட்டச் செயலகத்தில் தெரிவிக்கப்பட்டது. கொள்வனவு செய்யப்பட்ட நெல்லைத் தேக்கிவைக்கும்போதும், தேக்கி வைக்கப்பட்ட நெல்லைச் சந்தைப்படுத்தும்போதும் காட்டாத அக்கறையையும் அவசர நிலையையும் தற்போது இந்த அரிசி இறக்குமதியில் அரசு காட்டுகிறதோ? என்று எண்ணத் தோன்றுகின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Madam.

சம்பா, கீரி சம்பா உள்ளிட்ட அரிசி வகைகளுக்குத் தட்டுப்பாடு நிலவக்கூடும் என்ற வகையில், தட்டுப்பாட்டை இழிவளவாக்கவும், சந்தையில் அரிசியின் விலை பாரியளவில் உயர்வதைத் தடுக்கவும், நுகர்வோருக்கு நியாய விலையில் அரிசி கிடைப்பதை உறுதி செய்யவும்தான் இந்த அவசர நடவடிக்கையை நீங்கள் மேற்கொள்வீர்கள் என்றால், சமநேரத்தில் நெல் சந்தைப்படுத்தல் சபை ஊடாகவும் தற்போது இருந்தான நெல் கொள்வனவையும் உறுதிப்படுத்தி, உள்ளூர் நெல் உற்பத்தியை உச்ச அளவில் சந்தைப்படுத்தலில் பயன்படுத்துமாறு இச்சபை ஊடாக கௌரவ விவசாய அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවත් සාකච්ඡා කරන මේ වෙලාවේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

මීට පෙර මන්ත්‍රීවරයෙක් කරපු කථාව මම අහගෙන හිටියා. අපේ රටේ වර්තමාන අර්බුදය ජනාධිපතිතුමා ඇතුළු අපි ආණ්ඩුවක් ලෙස දක්ෂ ලෙස කළමනාකරණය කරනකොට, ජනාධිපතිතුමා ඊයේ මඩකලපුවට ගිහිල්ලා සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවගේ හදවත් දිනාගෙන රටපුරා විසිරී සිටින සියලු ජනතාවගේ හදවත් ස්පර්ශ කරනකොට, ඉතිහාසයේ පුස්තකාල ගිනි තියපු පක්ෂවලට ඥාතිත්වයක් තිබෙන සමහරුන්ට, ඒ අවසන් පුරුක්වලට රිදිලා තිබෙනවා. පුස්තකාල විවෘත කරනකොට රිදෙනවා. අපි සතුටුයි එහෙම රිදෙන එක ගැන. ඒ වේදනාව කොච්චරක්ද, කොහොමද කියන එක අපට තේරෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අතරේ මම මේ සාකච්ඡාව තවත් පැත්තකට යොමු කරන්න කැමැතියි. මේ අදබාල විපක්ෂය දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් වාගේම, රට පුරා තැන් තැන්වලත් විවිධ බොරු, මඩ අවලාද හදන්න උත්සාහ කරමින් ඉන්නවා. නැති අර්බුදයක් රටේ ගොවි ජනතාවට මවා පෙන්වන්න හදනවා. අපි ආණ්ඩුවක් විධියට විශේෂයෙන්ම කියන්න කැමැතියි, මැද පෙරදිග ඇති වෙච්ච මේ යුදමය තත්ත්වය මූලික කරගෙන, කෘෂිකර්ම අමාත්‍යාංශයට, රටේ අනාගතයට වෙන්න යන දේ අපේ ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව දැක්ක බව. ඒ නිසා අපේ රටේ කෘෂි කර්මාන්තයත් එක්ක පොර බදන, ඔට්ටු වෙන ජනතාවගේ පොහොර ප්‍රශ්නය විසඳන්නේ කොහොමද කියලා වේලාසනින් කල්පනා කරලා, අපි ඒ කටයුත්ත ඉතා දක්ෂ ලෙස කළමනාකරණය කළා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. කෘෂිකර්ම ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්, නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්, අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ නිලධාරීන් කැඳවලා, පොහොර සමාගම් ටික කැඳවලා, ඉතිහාසයේ පළමුවැනි වතාවට මෙතෙක් නොකරපු දෙයක් කරන්න අපි තීරණයක් ගත්තා. මොකක්ද ඒ? මේ අර්බුදය කළමනාකරණය කරන්න අපේ රටේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා රුපියල් 10,200ට යූරියා මිටියක් සියයට 65ක් වූ ගොවි ජනතාවට ලබා දෙන්න අපි තීරණයක් ගත්තා, ප්‍රවාහන වියදමත් එක්ක. අපි ඒ තීරණය ගත්තා. අපි ඉතා දක්ෂ ලෙස රට පුරා දිස්ත්‍රික්ක විසිපහේම අවශ්‍යතා මේ වෙනකොට එකතු කරගෙන තිබෙනවා. ඒ එකතු කළ ප්‍රමාණය

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

බෙදා හරිමින් තිබෙනවා. මම ඒක ඉලක්කම් ලෙස කියන්නම්. මේ වෙනකොට මෙට්‍රික් ටොන් 48,299ක අවශ්‍යතාවක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට වාර්තා වෙලා තිබෙනවා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඒ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන්, රාජ්‍ය පොහොර සමාගම මෙට්‍රික් ටොන් 12,930ක් මේ වෙනකොට නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම, මේ වෙනකොට පෞද්ගලික පොහොර සමාගම් මෙට්‍රික් ටොන් 33,124ක් අපි ඉල්ලපු ප්‍රමාණයට අනුව ලබා දීලා තිබෙනවා. නමුත් මේ විපක්ෂය උත්සාහ කරනවා, "පොහොර, පොහොර" කියලා අපේ රටේ ජනතාව පාරට ගෙනැල්ලා, විවිධ මත, බොරු මඩ අවලාද හදන්න. අපි කියන්නේ නැහැ, ප්‍රශ්න නැහැ කියලා. ප්‍රශ්න ඇති. ඒ ප්‍රශ්න අපි කළමනාකරණය කරමින් තිබෙනවා.

ඒ වාගේම තමයි, යූරියා පොහොර අවශ්‍යතාවත් වගා කරන ප්‍රමාණයට අනුව සපයනවා. පසුගිය කාලයේ කාලගුණයේ තිබුණු වෙනස්වීම නිසා, අතහැර තිබුණු සමහර වැව් යටතේ තිබෙන කුඹුරු වගා කරන්න ගොවි ජනතාව පටන් ගත්තා. ඒ වගා කිරීමේ ප්‍රමුඛතාව අනුව කන්න රැස්වීම් තියලා, ගොවි ජනතාව ඉල්ලපු පොහොර ටික ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ලබා දෙන්න සමත් වෙලා තිබෙනවා. අනුරාධපුරය වෙන්න පුළුවන්, පොළොන්නරුව වෙන්න පුළුවන්, අම්පාර වෙන්න පුළුවන්, හම්බන්තොට වෙන්න පුළුවන්, පුත්තලම වෙන්න පුළුවන්, ඒ දිස්ත්‍රික්කවලට ගොවි ජන සේවා මධ්‍යස්ථාන හරහා ඉල්ලපු ප්‍රමාණය කොච්චරද, ලබා දුන්නු ප්‍රමාණය කොච්චරද කියලා මගේ අතේ තිබෙන මේ වාර්තාවේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ විතරක් නොවෙයි. මේ යල කන්නය වෙනුවෙන් මෙට්‍රික් ටොන් 48,000ක් මදි නිසා, තව මෙට්‍රික් ටොන් 15,000ක් පෞද්ගලික සමාගම් හරහා රජයට මිලදීගෙන, රුපියල් 10,200ටම ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි ජනතාවට ලබා දෙන්න, ගිය 18වැනි දා කැබිනට් මණ්ඩලයෙන් විශේෂ අනුමැතියක් ගත්තා. එහෙම කරද්දීත් මේ අඳබාල විපක්ෂය තැන් තැන්වල රටේ ගොවි ජනතාවට බොරු, මඩ, අවලාද පතුරවමින් ඉන්නවා. ඒ නිසා අපි විපක්ෂයේ අයගෙන් ඉල්ලනවා, ඒ බොරු, මඩ අවලාද පතුරවන්න එපා කියලා. අපි සියයට 65ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහාත්, සියයට 35ක් පෞද්ගලික සමාගම් හරහාත් ඒ අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා දීමට අදාළ මැදිහත්වීම කරමින් ඉන්නවා.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා වී සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. අපේ රටට පොන්නි සම්බා සහ කීරි සම්බා ආනයනය කරන්න අදාළ අනුමැතිය දීලා තිබුණා. නමුත්, දැන් ඒක නවත්වලා තිබෙනවා. හැබැයි, අපි එක සහතිකයක් ලබා දෙනවා. මෙට්‍රික් ටොන් 150,000කට වඩා ප්‍රමාණයක් අපේ රටේ වී අලෙවි මණ්ඩල ගබඩා සතුව තිබෙනවා. හැබැයි, කීරි සම්බා නැහැ ඒ ගබඩාවල. ඒ නිසා මේ මොහොත වනකොට අපේ රටට කීරි සම්බා ආනයනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ගොවි ජනතාවට කීරි සම්බා වගා කිරීම වෙනුවෙන් වැඩි මිලක් ලබා දෙන්න කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි සැලසුම් හදලා තිබෙනවා. අපේ රටේ අවශ්‍යතාව අනුව කීරි සම්බා ගෙන්වීම වෙනුවෙන් අවස්ථාවක් හදලා දුන්නා. නමුත් දැන් අපි ඒ ගෙන්වන ප්‍රමාණය නවත්වලා තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය, වී අලෙවි මණ්ඩලය යන මේ ආයතන කිහිපයම එක්කහු වෙලා, වී අලෙවි මණ්ඩලය සතුව තිබෙන ඒ වී ටික සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හරහා, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන හරහා කොටලා, මේ රටේ ජනතාවට සහන මිලට ලබා දෙන්න අවශ්‍ය මැදිහත්වීම කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ මේ තිබෙන තත්ත්වය - මැදපෙරදිග අර්බුදය - ඇතුළේ පොහොර ප්‍රශ්නය විතරක් නොවෙයි, සෑම ප්‍රශ්නයක්ම ඉතා දක්ෂ ලෙස කළමනාකරණය කරමින් තිබෙනවා. ඒ නිසාම තමයි මේ විශේෂ තත්ත්වය සලකා වැඩි වන ඉන්ධන මිලට සාපේක්ෂව යල කන්නය වගා කිරීම වෙනුවෙන් රුපියල් 25,000ට තිබුණු පොහොර සහනධාරය තව රුපියල් 5,000කින් වැඩි කළේ. 2024දී අපි ජයග්‍රහණය කරනකොට හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි පොහොර සහනාධාරය දුන්නේ. දැන් 30,000ක් දෙනවා. දැන මේ කැ මොර දෙන විපක්ෂයෙන් අපි අහනවා, ඒවා මතක් වෙන්නේ නැද්ද කියලා. අපි සියයට සියයක් පොහොර සහනාධාරය වැඩි කර තිබෙනවා. මේ වනකොට හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක පොහොර සහනාධාරයක් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ගොවි ජනතාවට හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් පොහොර සහනාධාරය හැටියට දෙනකොට ඒක ගොවි ජනතාවට හෙක්ටෙයාරයකට යන වියදම එක්ක ගළපනකොට පොහොර මිටියකට රුපියල් 9,000ක වාගේ මුදලක් තමයි ගොවියාට වැය වෙන්නේ.

ඊළඟට සමහරු කෑ ගහනවා, වීවලට මිලක් නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ජාතික ජන බලවේගය මේ ආණ්ඩුව ගන්නකොට - ජයග්‍රහණය කරනකොට - වී කිලෝවක සහතික මිල රුපියල් 105යි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ. අපි ඒක රුපියල් 120 කළා. රුපියල් 120 කළාට පස්සේ රුපියල් 85ට, 90ට, 80ට වී දුන්න ගොවියාගේ වී කිලෝව ස්ථාවර මිලකට ඇවිල්ලා තිබෙනවා, රුපියල් 104න්, රුපියල් 105න් උඩට. රුපියල් 20කින් වාගේ වැඩිවෙලා වී මිල යම් ස්ථාවර මිලකට ගෙනැල්ලා තිබෙනවා. ගොවියා වී ටික විකුණාගන්න බැරුව හිටියා. ඔව්, දැන් ඒ වී ටික සාධාරණ මිලකට විකුණා ගන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා. අලුතින් නිර්මාණය වන තත්ත්වය ඇතුළේ සමහර විට ඒකත් ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. ඒක අපි පිළිගන්නවා. ඔව්, ඒක ඇත්ත. හැබැයි, ලෝකය මේ තත්ත්වය කළමනාකරණය කරනකොට අපේ රට ඇතුළේ තත්ත්වය ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ඉතා දක්ෂ ලෙස කළමනාකරණය කරමින් ඉන්නවා.

ගොවි ජනතාවටත්, මේ රටේ ජීවත් වන සමස්ත ජනතාවටත් අවශ්‍ය පහසුකම් ටික ලබා දීම වෙනුවෙන් අපි ආණ්ඩුවක් විධියට උපරිම ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා කියන එක මේ මොහොතේදී මා කියන්න කැමැතියි.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අයියෝ විනාඩි 3ද! මට තව විනාඩියක්වත් දෙන්නකෝ. හොඳයි, විනාඩි 3න් කියන්න පුළුවන් දේ කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විෂම චක්‍රයකට අහු වෙලා තිබෙන්නේ අපේ foreign exchange market එක. අපට ගොඩක් දේවල් කථා කරන්න පුළුවන් ඉරාන යුද්ධය, හෝමූස් සමුද්‍ර සන්ධිය ගැන. ඒ ඔක්කොම හරි. අනෙක් රටවලටත් ඒවා බලපානවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, ඊයේ පෙරේදා වනකොට අපේ රටේ රුපියල ඉතා වේගයෙන් කඩාගෙන වැටුණා.

වෙළෙඳ පොළ කියන්නේ විශ්වාසය මත වැඩ කරන තැනක්. විශ්වාසය කඩාගෙන වැටුණොත්, වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා. මේක තමයි ඇත්ත කථාව. Forex market එකත් එහෙමයි; rupee market එකත් එහෙමයි. දැන් මම Bank of Ceylon එකේ බැලුවා, ඩොලරයේ විකුණුම් මිල රුපියල් 354යි. මෙහෙම ගියොත් කොතැනින්ද මේක නවතින්නේ? අපට තර්ක කරන්න පුළුවන්, විශ්වවිද්‍යාලයේ කරන තර්ක. හැබැයි, ඒ තර්කයි, වෙළෙඳ පොළේ තර්කයි අතර පොඩි වෙනසක් තිබෙනවා.

ඇත්ත වශයෙන්ම කාලයක් තිස්සේ වෙළෙඳ පොළේ වැඩ කරපු පුද්ගලයකු හැටියට මම මේකේ අනෙක් පැත්ත දකිනවා. අනෙක් පැත්ත තමයි, විශ්වාසය ගොඩනඟන්න. මොකද, ඩොලරය රුපියල් 340ට, රුපියල් 350ට, රුපියල් 360ට ගියොත්, ඒක රටටම බලපානවා. ඔයගොල්ලන්ගේ management එක ගැන ඔයගොල්ලන් හිතන්න. ඔයගොල්ලන් හිතන්න, වෙළෙඳ පොළට විශ්වාසය ලබා දෙන්නේ කොහොමද කියලා. ජනාධිපතිතුමා කියනවා මම අහගෙන සිටියා, "ඔව්, මම මේ රට වැටෙන්න දෙන්නේ නැහැ" කියලා. හැබැයි, ඒක වෙළෙඳ පොළට මදි. වෙළෙඳ පොළට ඕනෑ, වෙළෙඳ පොළ විශ්වාස කරන දෙයක්. The markets are different. They are not political. They need to see what exactly is going on in the marketplace.

දැන් බලන්න, විෂම චක්‍රය කියන්නේ මොකක්ද? Exportersලා ඒගොල්ලන්ගේ ඩොලර් ටික රුපියල්වලට convert කරන්නේ නැහැ. ඇයි? ඒගොල්ලෝ හිතනවා, හෙට තව රුපියල් දෙකකින්, තුනකින් මේක වැටෙයි, එතකොට අපට හොඳයි කියලා. Importersලා වහාම ඩොලර් ටික ගන්න හදනවා. මොකද, ඒගොල්ලෝ LCs open කරලා තිබෙනවා, ඒගොල්ලන්ගේ shipment එක එන සතියේ, එහෙමත් නැත්නම් ඊළඟ සතියේ තිබෙනවා. ඊළඟ සතිය වෙනකොට ඩොලරයේ අගය රුපියල් 375ක් වුණොත්, ඒ නිසා අද රුපියල් 355ට ගන්න පුළුවන් නම් හොඳයි කියලා ඒ අය හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද market එකේ එක rate එකක්වත් නැහැ, එක bid එකක්, එක offer එකක් නැහැ කියලා ඔබතුමිය දන්නවාද? Market එකක එහෙම වෙන්නේ කොහොමද? එක bid එකක්වත්, offer එකක්වත් market එකේ නැහැ. Market එකේ තිබෙන්නේ Central Bank එකෙන් දෙන trade එක විතරයි. එහෙම බිස්නස් කරන්න බැහැ; එහෙම market එකක් ගෙන යන්න බැහැ. අපේ රටට ඇවිල්ලා, Port City එකට ඇවිල්ලා, එහෙට ඇවිල්ලා, මෙහෙට ඇවිල්ලා එක bid එකක් හරි, එක offer එකක් හරි නැති market එකකට invest කරන්න කියලා අපි ලෝකයට අප ගැන විශ්වාසයක් ගොඩනඟන්නේ කොහොමද?

ඒ නිසා කරුණාකරලා තේරුම් ගන්න, market එකේ විශ්වාසය ගොඩනඟන්න කරන්න පුළුවන් දෙයක් තිබෙන බව. ඒවා කරන්න. අවාසනාවන්ත විධියට හරි වෙන්න තිබෙන දේ මම කියන්නම්. මම හිතන විධියට, එන සතිය වෙනකොට පොලී අනුපාතය අවම වශයෙන් basis points 50කින් හෝ basis points 100කින්, ඒ කියන්නේ සියයට 0.5කින් හෝ සියයට 1කින් වැඩි වෙන්න ඉඩ තිබෙනවා. මොකද, market එක විශ්වාස කරන්නේ නැහැ, ඔය ආණ්ඩුව. දේශපාලන වේදිකාවේ කොච්චර **දේවල්** කිව්වත් වැඩක් නැහැ. අවාසනාවට, මොකක්ද වෙන්නේ? මෙහෙම ගිහිල්ලා වෙළෙඳ පොළේ පොලී අනුපාතය අවම වශයෙන් basis points 100කින්, එහෙමත් නැත්නම් percentage එකකින් වැඩි කළොත්, ආණ්ඩුවටත් ගෙවන්න තිබෙන පොලිය වැඩි වෙනවා, ජනතාවගෙන් අය කරන බදු ප්‍රමාණයත් වැඩි වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඉක්මනින් අවසන් කරනවා. කාලයකින් නේ කථා කළේ.

එම නිසා කරුණාකරලා මේක තවත් slide වෙන්න දෙන්න එපා. තමන්ගේ market intelligence පාවිච්චි කරන්න. ජනාධිපතිතුමා දේශපාලනය කරාවි. ඔයගොල්ලන්ට කරන්න වැදගත් වැඩක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශය, භාණ්ඩාගාරය, මහ බැංකුව වෙළෙඳ පොළේ විශ්වාසය ගොඩනඟන්න කරන්නේ මොකක්ද කියලා කියන්න. එහෙම නැත්නම් මේ විෂම චක්‍රය තවදුරටත් පැටලෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.04]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் நிதி அமைச்சுடன் தொடர்புடைய விவாதம் நடைபெறுகின்றது. இங்கு எதிர்க்கட்சியினர் எமது அரசாங்கத்தைப் பார்த்து பரிகசிப்பதோடு, பரிதாபப் படுவது போலவும் நடந்து கொள்கின்றார்கள். இவர்களது இந்தச் செயற்பாடு மிகவும் வேடிக்கையாக இருக்கின்றது. தற்பொழுது ஏற்பட்டிருக்கின்ற தற்காலிக பொருளாதார நெருக்கடியானது, எமது அரசாங்கத்தால் ஏற்படுத்தப்பட்டது போன்ற தோரணையில் இவர்கள் கருத்துகளைத் தெரிவித்துக் கொண்டு இருக்கின்றார்கள். இவர்கள் தங்களுடைய கடந்த காலச் செயற்பாடுகளை மறந்தே இவ்வாறான கருத்துகளைத் தெரிவித்துக்கொண்டு இருக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உண்மையிலேயே இந்த நெருக்கடியானது எமது அரசாங் கத்தால் ஏற்படுத்தப்பட்டதல்ல. 2022-2023 காலப்பகுதியில் ஏற்பட்ட பொருளாதார நெருக்கடியானது, இந்த நாட்டை

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

ஆட்சி செய்த ஆட்சியாளர்களால் ஏற்படுத்தப்பட்டது. எமது நாட்டின் வருமானத்தைச் சுரண்டி, அதைத் தங்களுடைய சொத்துக்களாக மாற்றி ஏப்பம் விட்டதனாலேயே அந்தப் பொருளாதார நெருக்கடி ஏற்பட்டது. ஆனால், தற்பொழுது ஏற்பட்டிருக்கின்ற பொருளாதார நெருக்கடியானது, முழு உலகுக்கும் பொதுவானது. மத்திய கிழக்கில் ஏற்பட்டிருக்கின்ற அசாதாரண சூழ்நிலை காரணமாக அனைத்து உலக நாடுகளிலும் இந்தப் பொருளாதார நெருக்கடி ஏற்பட்டிருக்கிறது. அதற்கு எங்களுடைய நாடு விதிவிலக்கல்ல. ஏனெனில், எங்களுடைய நாடும் இந்த உலகத்திலுள்ள ஒரு நாடுதான். நீலிக்கண்ணீர் வடிக்கும் இவர்களது இந்தச் செயற்பாடு வேடிக்கையாக இருப்பதோடு, உக்கி அறுந்த கயிற்றைப் பிடித்துக்கொண்டு தொங்குபவர்கள் போலவே இவர்கள் இருக்கிறார்கள்.

பொருளாதார நெருக்கடியான சூழ்நிலையிலும், எங்களுடைய நாட்டைவிட பொருளாதார ரீதியில் பலமாக இருக்கின்ற நாடுகளோடு ஒப்பிடுகையில், நாம் எரிபொருளின் விலையை ஸ்திரமாகப் பேணி வருகின்றோம். உதாரணத்துக்கு, தற்போது இலங்கையில் ஒரு லீற்றர் ஒக்டேன் 92 பெற்றோலின் விலை 410 ரூபாய். அதேநேரம், நேபாளத்தில் அதன்விலை இலங்கையின் நாணயப் பெறுமதியில் கிட்டத்தட்ட 461 ரூபாயாகவும், பாகிஸ்தானில் 537 ரூபாயாகவும் இருக்கின்றது. இலங்கையில் ஒரு லீற்றர் டீசலின் விலை 392 ரூபாயாக இருக்கையில், நேபாளத்தில் அதன் விலை இலங்கையின் நாணயப் பெறுமதியில் 478 ரூபாயாகவும் பாகிஸ்தானில் 609 ரூபாயாகவும் இருக்கின்றது. மக்களுக்குச் சுமையை ஏற்படுத்தாத வகையில், நாங்கள் பொருளாதார ஸ்திரத்தன்மையைப் பேணி வருகின்றோம். டொலரின் பெறுமதி தொடர்பாகவும் இங்கு பல்வேறு குற்றச்சாட்டுகளை முன்வைக்கின்றார்கள். உலக நிலைமை நிச்சயமாக மாறும் என்பது எங்களுக்குத் தெரியும். அவ்வாறு மாறும்போது இலங்கை ரூபாய்க்கு நிகரான டொலரின் பெறுமதி நிச்சயமாகக் குறைவடையும். பொருளாதார ரீதியாக இதைவிட மோசமான நிலையில் இருந்த நாட்டை மீட்டெடுத்த எங்களுக்கு, இது பெரியதொரு காரியமல்ல. இது உலகளாவிய ரீதியில் ஏற்பட்டிருக்கின்ற பொதுவான நெருக்கடி என்பதால் நிச்சயமாக நாங்கள் இதிலிருந்து மீண்டெழுவோம் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எமது தேசிய இறையாண்மை மற்றும் பொருளாதார பாதுகாப்பின் மையமாக விளங்கும் முக்கியமானதொரு விடயமான நமது அந்நியச் செலாவணி வீதக் கட்டமைப்பு குறித்து உரையாற்றுவதற்கு விழைகின்றேன். நாம் அந்நியச் செலாவணி பற்றி பேசும்பொழுது, மத்திய வங்கியின் கணக்குப் புத்தகங்களிலுள்ள வெறும் எண்களைப் பற்றி மட்டும் பேசவில்லை. நமது நாட்டின் தாய்மார் மற்றும் தந்தைமாரின் வாங்கும்திறன், நமது தொழில் அதிபர்களுக்குத் தேவைப்படும் முன்கூட்டியே கணிக்கக்கூடிய தன்மை மற்றும் இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின்மீது உலகளாவிய சந்தை வைத்துள்ள நம்பிக்கை ஆகியவற்றைப் பற்றியே நாம் இங்கு பேசிக்கொண்டு இருக்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எதிர்க்கட்சி ஆசனங்களில் அமர்ந்துகொண்டு, நாணய மதிப்பின் ஏற்ற இறக்கங்களை விமர்சிப்பது எளிதானது. அதேபோல், உலகளாவிய ரீதியில் சூழல் மாறும்போது விரல்நீட்டுவதும் எளிது. இன்று நான் உண்மைகளைச் சமர்ப்பிக்க விரும்புகிறேன். இந்த அரசாங்கத்தின் இலக்கு நிர்ணயிக்கப்பட்ட, ஒழுக்கமான நிதி மற்றும் நாணயக் கொள்கைகள், நம்மை வரலாற்றுச் சிறப்புமிக்க பொருளாதார ஸ்திரமற்ற தன்மையின் விளிம்பிலிருந்து மீட்டு, மறுக்க முடியாத, ஆவணப்படுத்தப்பட்ட ஸ்திரத்தன்மையின் புதிய அத்தியாயத்துக்கு எவ்வாறு கொண்டுவந்துள்ளன என்பதை இந்தச் சபை அறியும். நாங்கள் இங்கு இலகுவாக விரலைநீட்டி குற்றம் சுமத்தி விடலாம். பொறுப்புள்ள அரசாங்கம் என்ற வகையில், இவ்வகையான நெருக்கடியான சூழ்நிலையிலும் நாங்கள் மக்களுக்குச் சிறந்த சேவைகளை வழங்கி வருகின்றோம்.

எங்களுடைய வருமானத்தைக் கடந்த காலத்தோடு ஒப்பிட்டுப் பார்ப்போம். இறைவரிமூலம் 2023ஆம் ஆண்டு 2.72 ரில்லியன் ரூபாய் வருமானம் பெறப்பட்டு இருக்கின்றது. அதேபோல், 2024ஆம் ஆண்டு 3.7 ரில்லியன் ரூபாய் வருமானமாகப் பெறப்பட்டு இருக்கின்றது. 2025ஆம் ஆண்டு அது 5.04 ரில்லியன் ரூபாயாக அதிகரித்திருக்கிறது. அதை நாங்கள் எங்களுடைய இறைவரிக் கொள்கையின் ஊடாகவே பெற்றுக்கொள்ளக் கூடியதாக இருந்தது. எனவே, எங்களுடைய நாட்டின் அபிவிருத்தியை நோக்காகக்கொண்டு இறைவரிக் கொள்கையில் அவ்வப்போது சில மாற்றங்களை ஏற்படுத்த வேண்டியது அத்தியாவசியமானது.

அடுத்து, கடந்த மூன்று ஆண்டுகளில் எங்களுடைய ஏற்றுமதி வருமானத்தைப் பார்ப்போம். 2023ஆம் ஆண்டு 11,919 மில்லியன் டொலர்களையும், 2024ஆம் ஆண்டு 12,772 மில்லியன் டொலர்களையும், 2025ஆம் ஆண்டு 13,581.4 மில்லியன் டொலர்களையும் நாங்கள் ஏற்றுமதி வருமானமாக ஈட்டியிருக்கிறோம். இவ்வாறு நாங்கள் கடந்த ஆட்சியாளர்களைவிட ஏற்றுமதி வருமானத்தை அதிகரித்து இருக்கின்றோம். தற்போது ஏற்பட்டுள்ள நெருக்கடியானது தற்காலிகமானது.

இதிலிருந்து நிச்சயமாக எமது அரசாங்கம் மீளும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. எங்களுடைய சனாதிபதி உட்பட அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் அனைவரும் இது தொடர்பில் தொடர்ந்து அவதானத்தைச் செலுத்தி வருகின்றார்கள். பொருளாதார நெருக்கடி இருந்த போதிலும், எங்களுடைய அரசாங்கம் எந்தவோர் அபிவிருத்தித் திட்டத்தையும் நிறுத்தவில்லை. அவை வழமைபோன்றே இடம்பெற்று வருகின்றன. மக்களுடைய அரசாங்கம், மக்களுக்கான அரசாங்கம் என்ற வகையில், அபிவிருத்தித் திட்டங்களை நிறுத்தாமல், அனைத்தையும் சரியான முறையில் முகாமைத்துவம் செய்து, தொடர்ந்து மேற்கொண்டு வருகின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

முல்லைத்தீவு மாவட்டத்தில் 'தித்வா' புயலால் அழிவடைந்த வீடுகளை முழுமையாக அமைப்பதற்கு ஒரு குடும்பத்துக்கு 50 இலட்சம் ரூபாய் வீதம் வழங்கி, 1,000 வீடுகளை இந்த வருடத்துக்குள் அமைக்க இருக்கின்றோம்.

அதற்கான அனுமதியும் கிடைத்திருக்கின்றது. வடக்கு மாகாணத்தில் குடிநீர் வழங்கலை முகாமைத்துவம் செய்வதற்கு நாங்கள் பல்வேறு செயற்றிட்டங்களை மேற்கொள்ள இருக்கின்றோம். சுமார் 60 வருடங்கள் பழமைவாய்ந்த வவுனியா மாவட்ட செயலக கட்டிடத்தை முழுமையாகப் புனரமைப்பதற்கு எதிர்வரும் 2027ஆம் ஆண்டில் 1,750 மில்லியன் ரூபாயை ஒதுக்குவதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் எங்களுக்கு வாக்குறுதி அளித்திருக்கிறார். மக்களுடைய அரசாங்கம் என்ற ரீதியில், நாங்கள் மக்களுக்கான சேவைகளை ஒருபோதும் நிறுத்தப்போவதில்லை. எனவே, நான் இந்தச் சபையிலுள்ள எதிர்க்கட்சியினருக்குக் கூறிக்கொள்ள விரும்புவது என்ன வெனில், வெறுமனே எதிர்க்கட்சியில் இருந்துகொண்டு அரசாங்கத்தை விரல்நீட்டி குற்றம் சுமத்துவதை விடுத்து, பொறுப்புள்ள எதிர்க்கட்சி என்ற வகையில், வீழ்ச்சியிலிருந்தும் பொருளாதாரப் பாதிப்பிலிருந்தும் இந்நாட்டை மீட்டெடுப் பதற்கான உத்திகளை முன்வையுங்கள் என்றுதான். தயவுசெய்து, குறைகூறுவதை மட்டும் செயலாகக்கொள்ள வேண்டாமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.14]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම සතිය වසර 30ක යුද්ධය අවසන් කරන්න දිවි පරිත්‍යාග කොට කටයුතු කරපු විරෝදාර රණවිරුවන් සිහිපත් කරන සතිය නිසා මම මුලින්ම ඒ අයට අපගේ උත්තමාචාරය පුද කරනවා. ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් යුද පෙරමුණේ වසර ගණනාවක් සේවය කරලා විශ්‍රාම ගිය පසු සේවා අවශ්‍යතා මත නැවත සේවයට කැඳවා, අනතුරුව වසර ගණනාවක් සේවය කළ පසු එම රණවිරුවන්ට ඒ කාලයට අදාළ වැටුප විතරයි මේ වනකොට දීලා තිබෙන්නේ. මේ වනකොට ඒ කාලයට අදාළව විශ්‍රාම වැටුප් ගණනය කිරීමක් සිද්ධ කරලා නැහැ කියලා චෝදනාවක් තිබෙනවා වාගේම ඒ සම්බන්ධව ඔවුන්ගේ ඉල්ලීමකුත් තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරලා මේ වීරෝදාර රණවිරුවන් සිහිපත් කරන වකවානුවේ ඒ අයට ඒ සාධාරණත්වය ඉෂ්ට කර දෙන්න කියන කාරණයත් මේ වෙලාවේ මම කියනවා.

Bloomberg සඳහන් කර තිබෙනවා මම දැක්කා, ආසියාවේ වේගයෙන්ම පිරිහෙන මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල කියලා. ඒ ඇහෙන කොට එක්ක ගත්තාම මේ මාලිමාවාසීන් කියන පිරිස මේ කාල සීමාවේ ඉන්නේ ලංකාවේ නොවෙයිද කියලා අපට සැකයක් ඇති වෙනවා. මේගොල්ලන් මේ මහ පොළොවේ ඉන්නවා නම්, ශ්‍රී ලංකාවේ ඉන්නවා නම් මේගොල්ලන්ට මේ දේවල් කථා කරන්න පුළුවන්ද? එම නිසා මේගොල්ලන් කවින් කථා කරනවාද, වෙන කොහෙන් හරි කථා කරනවාද කියන සැකයත් මේ වෙලාවේ අපට ඇති වනවා. 2020 වසරේ සිට රට මේ විධියට බංකොලොත්භාවයට ගමන් කරනකොට ඔය විධියට එහා පැත්තේ ඉඳගෙන ඔය හා සමානම වූ පිරිසක් - තුනෙන් දෙකකට ආසන්න වූ පිරිසක් - පාර්ලිමේන්තුවේදී ඔය විධියටම කථා කළා අපි දැක්කා. අවසානයේ ඒ අයට සිද්ධ වුණේ මොකක්ද කියන එක මම කියන්න යන්නේ නැහැ. ඒවා ඉතිහාසය තුළ මකා දැමිය යුතු කාල වකවානු. වාසනාවකට පාර්ලිමේන්තුවට ආපු කණ්ඩායම් මේ විධියට අසාර්ථකත්වය වහගන්න කවින් විතරක් බතල හිටවන්න ගිහිල්ලා අවසානයේ තමන්ගේ දරු පවුල්වලට ජීවත් වෙන්න තිබෙන නිවස අහිමි කරගන්න එපා කියලා අපි කියනවා. ඒ නිසා මේ කාල වකවානුව තුළ බොහොම කල්පනාවෙන්, තමන්ට ලැබිච්ච ජන වරම අනුව ජනතාව වෙනුවෙන් පෙනී සිටින්න. මේ රට කාලකණ්ණි කරන, මේ රට හරියට පරිපාලනය කරගන්න බැරි කණ්ඩායම්වලට ආවඩන්න ඒ අය පිටුපස ගිහිල්ලා තමන්ගේ දරු පවුල් අනාථ කරන්න එපා කියන එක තමයි අද කථා කරන මාලිමාවේ මන්ත්‍රීවරුන්ට අපි කියන්නේ.

මා නියෝජනය කරන දිස්ත්‍රික්කයම නියෝජනය කරන මගේ මිත්‍රයා මේ සභාවේ කථා කළා. එතුමාගේ කථාව ඇහුවාම නම් පෙනෙන්නේ, අද ගොවි ජනතාවට ගැටලු මොකුත් නැහැයි කියලායි. ඒක තමයි අපේත් ප්‍රාර්ථනය. මේ රටේ ගොවි ජනතාවට දෙපයින් නැඟිටින්න, තමන්ගේ වෘත්තිය කරලා තමන්ගේ දරු පවුල ජීවත් කරවන්න පුළුවන් ආර්ථිකයක් ගොඩනැඟීම තමයි අපේත් අවශ්‍යතාව. එතුමා කියනවා, පොහොර සහනාධාරය රුපියල් 25,000ක් කළේ එතුමන්ලාලු. හැබැයි එතුමන්ලා 2025 සැප්තැම්බර් මාසයේ 21වැනි දා බලයට එනකොට රනිල් වික්‍රමසිංහ රජයෙන් ඒ රුපියල් 25,000 දෙන්න යෝජනා කරලා තිබුණේ. එතුමන්ලා මේ සැරේ පොහොර සහනාධාරය රුපියල් 5,000කින් වැඩි කරපු එක අපි පිළිගන්නවා. එතුමන්ලා බලයට එනකොට මහ කන්නය ක්‍රියාත්මකයි. ඒ වාගේම ඒ මහ කන්නයේ රුපියල් 25,000ක පොහොර සහනාධාරය දෙමිනුයි තිබුණේ. මේවා අමතක කරන්න එපා. රුපියල් 25,000 පොහොර සහනාධාරය රුපියල් 5,000කින් වැඩි කරනකොට එදා රුපියල් 7,500ට තිබිච්ච පොහොර මිටිය අද ගොවියාට රුපියල් 17,500කට මිලදී ගන්න වෙලා තිබෙනවා. ගොවියාට සහනාධාර දෙනවා කියලා කිව්වාට අද වනකොට සහනාධාර ලැබිච්ච ගොවියෝ සියයට 5ක්වත් හොයාගන්න නැහැ. ගොවියෝ විසින්ම කොහෙන් හරි සල්ලි ටික උපයාගෙන පොහොර ටික ගන්න බලනවා. ගොවි සංවිධාන සල්ලි ටික එකතු කරගෙන බලාගෙන ඉන්නවා. සල්ලි එකතු කරගෙන හිටියාට අවසානයේ පොහොර ටික නැහැ. දැන් ගොවි සංවිධානවල නිලධාරින් බලන් ඉන්නේ ඒ සල්ලි ආපහු ගොවීන්ට දෙන්න. ඒ කියන්නේ, ගොවීන්ගෙන් එකතු වෙලා තිබෙන විශාල සල්ලි ප්‍රමාණය ආපහු ගොවීන්ට ලබා දෙන තැනට අද පත් වෙලා. පොහොර හිඟයක් නැහැ කියලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ කිව්වාට ඔබතුමන්ලා සැබැවින්ම මේ මහ පොළොවේ ජීවත් වෙන ගොවියෝ නම්, ගොවි පුතුන් නම් අපි කියන්නේ අනිවාර්යයෙන්ම මහ පොළොවේ ජීවත් වෙන ජනතාවට මේ සහනය ලබා දෙන්න කටයුතු කරන්න කියලායි. පාර්ලිමේන්තුව තුළ කියන ආකාරයට නම් පොහොර ඕනෑ තරම් තිබෙනවා. හැබැයි ගොවීන්ට සහන මිලකට ගන්න පොහොර නැහැ. අද අපේ දිස්ත්‍රික්කයේ ඉන්න ගොවීන්ට පොහොර මිලදී ගන්න වෙලා තිබෙන්නේ රුපියල් 17,500ට.

ඒ වාගේම වී මිල ගැනත් මෙතැනදී කථා කළා. නාඩු වී කිලෝවක් සඳහා රුපියල් 120ක මිලක් දුන්නා කිව්වා. අද රුපියල් 120ට නාඩු වී කිලෝවක් විකුණපු ගොවියෙක් ඉන්නවාද? දැන් පොහොර මිලදී ගන්න ගොවීන්ට වී ටික විකුණන්න සිද්ධ වන කාලය ඇවිල්ලා තිබෙන්නේ. අද රුපියල් 95 ඉඳලා තමයි වී කිලෝවක විකුණුම් මිල නියම වෙන්නේ. මාස ගණනක් තිස්සේ වෙළා ගේ ඇතුළේ තියාගෙන ඉන්න වී ටික කිලෝවක් රුපියල් 120ට ගන්නවා කියලා මෙතුමන්ලා කියනවා. වී කිලෝවක් රුපියල් 120ට දෙන්න නම් මාලිමාවේ පැලවත්ත කාර්යාලයට වී ගේන්න වෙනවා. අපි මේ වී ටික ඒ මිලට විකුණන්නේ පැලවත්තටද? හැබැයි මහ පොළොවේ ඉන්න වී මෝල්හිමියෝ කවුරුවත් වී කිලෝවක් රුපියල් 120ට මිලදී ගැනීමක් සිද්ධ

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

කරන්නේ නැහැ, කිලෝවක් රුපියල් 95 ඉඳලා වී මිල නියම වෙලා තිබිච්ච නිසා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ කාලය කා දමලා, බොරු කියලා මේ රටේ ගොවි ජනතාව අමාරුවේ දාන්නේ නැතුව කටයුතු කරන්න කියලා අපි කියනවා.

සමාජය තුළ තව කථාවක් යනවා මම දැක්කා, "ඩොලරය රුපියල් 370 පැන්නාම අනුර කුමාර දිසානායක මැතිතුමාට ගෝඨාභය මුණ ගැහෙයි" කියලා. එතුමාත් ගෝඨාභයගේ ගමන් මාර්ගයේ යන බව අපට පෙනෙනවා. ඒ නිසා අපි කියනවා, පරිස්සම් වෙන්න කියලා. තමන්ගේ දරු පවුල් ද ආරක්ෂා කරගෙන රට වෙනුවෙන් තමන් වෙත පැවරුණු වගකීම, යුතුකම ඉෂ්ට කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.19]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි කිහිපයක් අද දින පාර්ලිමේන්තුවේ සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපේ රට තුළ කිරි සම්බා හිඟයක් පැවතුණා. ඒ නිසා කිරි සම්බා ආනයනය කර ගැනීමටත්, SriLankan Airlines එකේ භාවිතයට අවශ්‍ය ටයර් ගෙන්වීමට සහ තවත් HS codes කිහිපයක් වෙනස් කර ගැනීමටත් අදාළව තමයි එම රෙගුලාසි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සම්බන්ධව පවත්වන මෙම විවාදයේදී විශේෂයෙන්ම විපක්ෂය පැත්තෙන් නිතරම මතු කළ කාරණය තමයි, මහා ආර්ථික අර්බුදයක් ඇති වෙලා අපේ රට අගාධයට යනවා කියන කාරණය. ඒගොල්ලන් හැම තිස්සේම ඒ කාරණය තමයි හුවා දක්වන්න උත්සාහ කළේ. නමුත් අද විපක්ෂයේ සිටින ඔබ කාටවත් ඒ කාලයේ කරන්න බැරි වුණු ආකාරයට අපි 2025 අවුරුද්දේදී ඉතිහාසයේ පළමුවැනි වතාවට සියලුම ආර්ථික දර්ශක ඉතාම ඉහළ මට්ටමින් සපුරා ගනිමින් ඒවා සංඛ්‍යාත්මකව ඔප්පු කර පෙන්වන්න සමත් වුණා. ඒ වාගේම ඉතිහාසයේ පැවැති අවම අය වැය හිඟයක් සහිතව, වැඩිම ආදායමක් උපයා ගන්න අපි සමත් වුණා. විශේෂයෙන්ම ප්‍රාථමික ශේෂය ධන අගයක් ගනිමින් එය සියයට 5.3ක් දක්වා ඉහළට ගෙනියන්න සමත් වුණා. ඒත් එක්කම මා සඳහන් කරන්න ඕනෑ, අපේ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 109කට ආසන්න අගයක් බව; ඒ කියන්නේ, රුපියල් ට්‍රිලියන 32ක් බව. ඒ අනුව ඒකපුද්ගල දළ ජාතික ආදායම ඇමෙරිකානු ඩොලර් 5,003 මට්ටමට ගෙනියන්න අප සමත් වුණා. මේ ආකාරයට අපි රටේ ආර්ථිකය වඩාත් හොඳින් ස්ථාවර කරන්න සමත් වුණා.

මේ තත්ත්වය ඉලක්කම්වලින්ම පෙන්වා සනාථ කර තිබෙන වෙලාවක, රට තුළ ආර්ථික අර්බුදයක් තිබෙනවා කියන මතය තවදුරටත් තහවුරු කරන්න විපක්ෂය විසින් උත්සාහ කිරීම ඉතාම කනගාටුදායකයි. මොකද, අපි 2025 වසරේදී ඉතාම පැහැදිලිව ආර්ථිකය වඩාත් හොඳින් ස්ථාවර කළා. ඊට පසුව අපි බලාපොරොත්තු වුණේ මේ ස්ථාවර කරපු ආර්ථිකය 2026 වසරේදී වඩාත් පුළුල් මට්ටමකට ගෙනියන්නයි. අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය අනුව 2025 වසරේදී අපි සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගත්තා. අපි මේ ආර්ථික වර්ධන වේගය සියයට 7ක මට්ටමට ගෙනියන්න තමයි සැලසුම් හදා තිබුණේ. 2026 අවුරුද්දේ පළමුවැනි මාස තුන තුළ ඒ සියලුම දර්ශකවලින් ඉතාම හොඳ ප්‍රතිඵල අපට ලැබෙමින් පවතින අවස්ථාවක තමයි අපි කවුරුත් නොහිතපු අවස්ථාවක මැද පෙරදිග යුද්ධය ඇති වුණේ. ඒක අපේ පාලනයෙන් තොර කාරණයක්. මැද පෙරදිග යුද්ධයත් එක්ක අපේ ආනයන වියදම වැඩි වුණා. විශේෂයෙන්ම ඉන්ධන සහ අනෙකුත් බලශක්ති වෙනුවෙන් අපිට විශාල පිරිවැයක් දරන්න වුණා. ඉන්ධන සහ බලශක්තිය වෙනුවෙන් විශාල පිරිවැයක් දරනකොට, නැව් ගාස්තු වැඩි වුණා. ඒ වාගේම අපි ආනයන මත තමයි රඳා පවතින්නේ. සියලු ආනයනවල පිරිවැය වැඩි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවුරුදු පහක් තිස්සේ මේ රට තුළ රථ වාහන ආනයනය නැවතිලා තිබුණේ. අපි ඒ අවස්ථාව 2025දී සම්පූර්ණයෙන්ම විවෘත කළා. එසේ විවෘත කළ අවස්ථාවේදී අපි මුලිකවම බලාපොරොත්තු වුණේ අපේ රටට වාහන ආනයනය කිරීම ඩොලර් බිලියන 1.2ක වාගේ ප්‍රමාණයකට සීමා වෙයි කියලා. නමුත් ඒ සඳහා විශාල ඉල්ලුමක් පැවතුණා. ඒ විශාල ඉල්ලුම අනුව වාහන ආනයනය වෙනුවෙන් 2025 වසර අවසන් වෙනකොට ඩොලර් බිලියන 2.2කට ආසන්න ප්‍රමාණයකට ණයවර ලිපි විවෘත වෙලා තිබුණා. එහෙම ණයවර ලිපි විවෘත වෙලා තිබුණා වුණත්, 2026 වසරේදී අපි වාහන ආනයනය සීමා කළේ නැහැ. මොකද, වාහන ආනයනය තුළින් ආර්ථිකයට වන දායකත්වය නිසා; ආර්ථික වර්ධනයක් ලබා ගන්න ඒ කටයුතු යම් ආකාරයකින් ඉවහල් වන නිසා. 2025 වසරේ මුල් මාස පහ තුළ ආනයනය කළ වාහනවලට වඩා විශාල ප්‍රමාණයකට ණයවර ලිපි -LCs- 2026 වසරේදී විවෘත වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වෙනවා.

මේ අවස්ථාව වනවිට රුපියල තාවකාලිකව යම් ප්‍රමාණයකින් අවප්‍රමාණය වීමට ලක් වෙලා තිබෙනවා. රුපියල අවප්‍රමාණය වීම ගැන කථා කරනකොට, මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ අපි විතරක් නොවෙයි කියන කාරණයත් සඳහන් කළ යුතුයි. මේ කලාපයේ අනෙක් රටවල් වන ඉන්දියාව, පිලිපීනය, තායිලන්තය, ඉන්දුනීසියාව වැනි රටවලත් මුදල් ඒකක අවප්‍රමාණයට ලක් වෙමින් පවතිනවා.

ආසියාවේ වැඩියෙන්ම පිරිහෙන මුදල් ඒකකය රුපියල කියලා Bloombergහි තිබුණු බව මේ සභාවේදී ප්‍රකාශයට පත් වුණා. ඒක වැරදි ප්‍රකාශයක්. මම ඒ මන්ත්‍රීතුමාට කියනවා, ඒ කාරණය පෙන්වන්නය කියලා. මොකද, එතැන සඳහන් කර තිබෙනවා, ඉන්දියාව තමයි වැඩියෙන්ම මේ අර්බුදයට මුහුණ පාන්නේ කියලා. එම නිසා ඒ වාගේ වැරදි කරුණු ප්‍රකාශ කරන්න එපා.

මේ සභාවේදී හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇත්තටම සාධනීය කරුණු ඉදිරිපත් කළා. එතුමා කිව්ව කරුණු හරි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි රටක් විධියට, රජයක් විධියට මේ තත්ත්වය පාලනය කර ගන්න ඕනෑ. අපි ඒ සාධනීය කරුණු ඉතාම සාදරයෙන් පිළිගන්නවා. ඒක හරි. වෙළෙඳ පොළ ස්ථාවරත්වය ඇති කිරීම තමයි මේකේ ප්‍රධානම කාරණයක් වෙන්නේ.

මේ බාහිර සාධක මත මේ අවස්ථාවේදී volatility එක වැඩි වෙන්න හේතුව වෙන්නේ මෙන්න මේ කාරණයයි. ක්ෂණිකව

ආනයන වැඩි වුණා. ඒ සඳහා යන වියදම් වැඩි වුණා. එතකොට සමාජයේ මතයක් හැදුණා, ඉදිරියේදී මෙන්න මේ ආනයන තහනම් වෙන්න පුළුවන් කියලා. එම නිසා සමාජයේ විශාල අනියත බියක් ඇති වුණා. අන්න ඒ අනියත බිය නිසා විශාල පිරිසක් තමන්ගේ භාණ්ඩ වැඩියෙන් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරන්න පටන් ගත්තා. ඊටත් අමතරව ඉන්ධන සඳහා වන පිරිවැයට විශාල මුදලක් වැය වෙන්න පටන් ගත්තා. ඉතින්, මේ තත්ත්වය තුළ අපේ රටේ තිබෙන ඩොලර් සැපයුමට සාපේක්ෂව ඉල්ලුම වේගයෙන් වැඩි වෙන්න ගත්තා. මෙන්න මේ කාරණය තුළ තාවකාලිකව රුපියල යම් අවප්‍රමාණයක් වීමකට ලක් වෙලා තිබෙනවා.

මේ තත්ත්වය පාලනය වීම සම්බන්ධයෙන් ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග 5ක් අපි දකිනවා. ඒ අනුව සාමාන්‍යයෙන් මේ වාගේ සිද්ධි කොච්චර සිදු වුණා වුණත්, ජනතාවගේ ක්‍රය ශක්තියේ සීමාවක් තිබෙනවා. එම නිසා ඒ ක්‍රය ශක්තියේ සීමාව ඉක්මවා ඔවුන්ට වියදම් කිරීමේ හැකියාවක් නැහැ. එම නිසා ඉදිරියේදී මේක යම් ප්‍රමාණයකට auto පාලනය වීමක් වෙන්න පුළුවන්. නමුත්, ඒක සාර්ථක දෙයක් නොවෙයි.

මීට අමතරව අපි ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට මේ සඳහා විශේෂ ක්‍රියාමාර්ග රාශියක් ගන්න පුළුවන්. ශ්‍රී ලංකා මහ බැංකුව මේ වෙනකොට ඒකට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා. ඊට පස්සේ රජයක් විධියට අපි මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් වන ප්‍රතිපත්තිමය තීරණ මේ වෙනකොට ගනිමින් සිටිනවා. ඊට අමතරව ජනතාවට මේ කෙරෙහි ස්වයං පාලනයක් ඇති කර ගන්න පුළුවන්. මොකද, ජනතාවට රට ගැන හිතලා, රටේ ඉදිරි අනාගතය ගැන හිතලා තාවකාලිකව මේ අවස්ථාවේදී තමන්ගේ ආනයන ප්‍රමාණයන් සීමා කිරීමේ හැකියාවක් තිබෙනවා. අපි ජනතාවගෙනුත් ඉල්ලා සිටිනවා, මේ අවස්ථාවේදී තමන්ගේ ආනයන වෙනුවෙන් කරන වියදම කෙටි කාලීනව පොඩ්ඩක් අඩු කරලා මේකට අදාළ සහයෝගය ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවුරුද්දේ ජූනි මාසයේ මුල් සතිය වාගේ වෙද්දි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක වාගේ මුදලක් අපිට ලැබෙන්න තිබෙනවා. ඊට අමතරව ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව වාගේ ආයතනවලින් ඩොලර් බිලියනයක වාගේ මුදලක් මේ වසර තුළදී අපේ රටට ලැබෙන්න තිබෙනවා. එතකොට මේ වසර තුළදී අපේ ඩොලර් සැපයුම යම් ප්‍රමාණයකින් වැඩි වෙනවා. ඒවායේ බලපෑමත් එක්ක ඉදිරියේදී මේක යම් පාලනයකට එනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
රජය විසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ, මහ බැංකුවෙන් ගනු ලබන තීන්දු තීරණ සහ ගරු හර්ෂ මන්ත්‍රීතුමා අදහස් දැක්වූවා වාගේ අපි වෙළෙඳ පොළ විශ්වාසය තහවුරු කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය තුළින් ඉදිරියේදී විශේෂයෙන්ම මෙය පාලනය කරන්න අපට හැකියාව තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි එය පාලනය කිරීමේ කටයුත්ත වෙනුවෙන් මැදිහත් වෙනවා කියන කාරණය විශේෂයෙන් මම ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට අමතරව මට විශේෂ ප්‍රකාශයක් කරන්න තිබෙනවා. මේ වෙලාවේදී ආනයනකරුවන් කලබල වෙලා තිබෙනවා. භාණ්ඩ වෙනුවෙන් විශාල පිරිවැයක් දරලා තමයි ඒවා ආනයනය කරන්න වෙන්නේ. රුපියල්වලින් විශාල පිරිවැයක් දරමින් භාණ්ඩ ආනයනය කරලා විශාල තොග මෙහේ රැස් කර ගත්තාට ඉදිරියේදී ගන්නා තීන්දු තීරණත් එක්ක ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම අඩු වෙලා පෙර අගයට රුපියල කෙටි කාලයක් ඇතුළත පත් වෙනවා. කලබල වෙලා, අනියත බියක් ඇති කරගෙන විශාල ලෙස ආනයන ප්‍රමාණයක් කරලා, තොග රැස් කරගෙන, විශාල පිරිවැයක් දැරුවොත් ඒ තොග වෙනුවෙන් විශාල අලාභයක් දරන්න වෙනවා, ඉදිරියේදී රුපියල ශක්තිමත් වීම තුළ. ඒ නිසා මම විශේෂයෙන්ම ආනයනකරුවන්ට කියනවා, අනවශ්‍ය විධියට ආනයනයන් කරන්න පෙලඹෙන්නේ නැතිව මේකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

ඊට අමතරව මේ රජය ඉතාම ශක්තිමත්ව ආර්ථිකය මෙහෙයවන්න මේ වෙනකොට කටයුතු කරලා තිබෙනවා. විපක්ෂය "ආර්ථික අර්බුදයක්" කියලා කොච්චර කිව්වත් ආර්ථික අර්බුදයක් විධියට මෙය පැවතියා නම් ආර්ථිකය කඩා වැටෙන්න ඕනෑ. 2022දී මොකද වුණේ? 2022දී අපේ ආර්ථිකය හැකිළිලා ඩොලර් නැති වුණාට පස්සේ තමයි ආර්ථික අර්බුදයක් ඇති වුණේ. ඒ නිසා අපිට අවශ්‍ය තෙල් ටික ගෙන්වා ගන්න, ණය ගෙවා ගන්න, අපේ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ඩොලර් නැතිව ගියා. නමුත්, මේ අවස්ථාවේදී අපට එහෙම කිසිම බියක් සැකයක් නැහැ. අපිට අවශ්‍ය මුදල් තිබෙනවා. අපේ ණය වාරික ගෙවා ගෙන යනවා. රජයට ඒ හැකියාව තිබෙනවා. නමුත්, මේ අවස්ථාවේදී ඩොලරයට ඇති වුණු ඉල්ලුම හා සැපයුම අතර වෙනස නිසා, ඒ කියන්නේ ඩොලර් ඉල්ලුමට අදාළව සැපයුම අඩු වීම හේතුවෙන් තමයි රුපියල අවප්‍රමාණය වෙන්න ලක් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපි ගන්නා ඉදිරි ක්‍රියාමාර්ගය තුළ ඒක ඉතාම පැහැදිලිව පාලනය වෙනවා. ඒකට අවශ්‍ය උපාය මාර්ග රජය සහ මුදල් අමාත්‍යාංශය විසින් මේ වෙනකොට ගනිමින් පවතිනවා. මම ඉතාම පැහැදිලිව කියනවා, කෙටි කාලයක් තුළ අපිට මේ තත්ත්වය පාලනය කරන්න හැකියාවක් ලැබෙන බව. ඒක නිසා ජනතාවට විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ අනවශ්‍ය විධියට කලබල වෙන්නේ නැතිව තමන්ගේ ආනයන සීමාසහිතව, අනවශ්‍ය ආනයන කරන්නේ නැතිව කටයුතු කරන්න කියලායි.

අපි වාහන ආනයනයට වුණත් අධිභාරයක් පනවන්න හේතුව වුණේ සුඛෝපභෝගී වාහන ගෙන්වන එක කෙටි කාලයකට පොඩ්ඩක් නවත්වා ගන්නයි. ඒ අවස්ථාවේදී රටේ සංවර්ධනයට, ආර්ථික ප්‍රසාරණයට අදාළ වන කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වාහන, පොදු ප්‍රවාහනයට අදාළ ලොරි රථ, ට්‍රක් රථ සහ බස් රථ යනාදී වාහන ගෙන්වන්න අධිභාරයක් පැනෙව්වේ නැහැ. අපේ ආර්ථිකය ප්‍රසාරණය කර ගන්න අදාළ කරුණු ඉටු වන විධියට තමයි මේ අධිභාරය පනවා තිබෙන්නේ. ඒ අනුව තමයි කටයුතු කරන්න වෙන්නේ කියන එක අපි ජනතාවටත් විශේෂයෙන්ම මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා,

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 31 දිනැති අංක 2482/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.05 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 අප්‍රේල් 02 දිනැති අංක 2482/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.05 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# විසර්ජන පනත: යෝජනා සම්මතය
## ஒதுக்கீட்டுச் சட்டம்: தீர்மானம்
## APPROPRIATION ACT: RESOLUTION

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| අයිතමය | සංශෝධනය |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 14,500,000,000 සිට<br>රු. 9,000,000,000 දක්වා |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 14,500,000,000 සිට<br>රු. 5,000,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 10,000,000,000 සිට<br>රු. 3,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 38 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 38 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| <u>**අයිතමය**</u> | <u>**සංශෝධනය**</u> |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 2,500,000,000 සිට<br>රු. 800,000,000 දක්වා |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,000,000,000 සිට<br>රු. 1,175,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 700,000,000 සිට<br>රු. 375,000,000 දක්වා |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 39 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 39 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| <u>**අයිතමය**</u> | <u>**සංශෝධනය**</u> |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 8,000,000 සිට<br>රු. 1,500,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 40 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 40 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

| අයිතමය | සංශෝධනය |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 800,000 සිට රු. 570,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## V

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 41 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 41 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | සංශෝධනය |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,250,000,000 සිට රු. 1,150,000,000 දක්වා |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,250,000,000 සිට රු. 1,150,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VI

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 42 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 42 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | සංශෝධනය |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,000,000,000 සිට රු. 2,000,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VII

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 43 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 43 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | සංශෝධනය |
|---|---|
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000 සිට රු. 60,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VIII

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 44 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 44 දරන නියමය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

| **අයිතමය** | **සංශෝධනය** |
| --- | --- |
| (i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 450,000,000 සිට රු. 325,000,000 දක්වා |
| (iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026.04.06 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IX

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියම අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

(මෙම නියමයන් වලංගු වන්නේ 2025.12.31 වැනි දින දක්වා පමණි.)

### උපලේඛනය
### 2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධාන

2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2025 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

**කණ්ඩායම් විධාන අංක 01**

2025 අංක 3 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතලවලට අනුව අනුර කුමාර දිසානායක වන මම, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය යටතේ මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00801, 01101, 02101, 10201, 11201, 11601, 13501, 14901, 15101, 17101, 18601, 21901, 22801, 23801, 24301, 24401, 24801, 24901, 25601, 25701, 26201, 26301, 26501, 28001, 28101, 28901, 29001, 29201, 29701, 29901, 30001, 30301, 30701, 31101, 33201 සහ 33801 ට අදාළ වන්නාවූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | ශ්‍රේණි අංකය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 00801 | - | - | 4,500,000 | 3,900,000 | - | - | 1 |
| 2 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 01101 | - | - | 3,200,000 | 2,800,000 | - | - | 2 |
| 3 | ජාතික විගණන කාර්යාලය | 02101 | - | - | - | - | 200,000,000 | 245,000,000 | 3 |
| 4 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා | 10201 | 20,000,000 | 20,353,000 | - | - | - | - | 4 |
| 5 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා | 11201 | - | - | - | - | 130,000,000 | 170,000,000 | 5 |
| 6 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා | 11601 | - | - | 9,000,000 | 5,000,000 | - | - | 6 |
| 7 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා | 13501 | - | - | - | - | 100,000,000 | 120,000,000 | 7 |
| 8 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා | 14901 | 200,000,000 | 200,600,000 | - | - | - | - | 8 |
| 9 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යවරයා | 15101 | - | - | 8,000,000 | 7,760,000 | - | - | 9 |
| 10 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරයා | 17101 | - | - | 47,000,000 | 40,000,000 | - | - | 10 |
| 11 | ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා | 18601 | - | - | - | - | 3,500,000 | 9,000,000 | 11 |
| 12 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | - | - | 11,000,000 | 10,711,700 | - | - | 12 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | අධිකරණ පරිපාලනය | 22801 | 550,000,000 | 550,737,401 | - | - | - | - | 13 |
| 14 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 23801 | - | - | 3,000,000 | 2,500,000 | - | - | 14 |
| 15 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 24301 | - | - | 4,000,000 | 3,750,000 | - | - | 15 |
| 16 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 16 |
| 17 | සුරාබදු දෙපාර්තමේන්තුව | 24801 | - | - | 45,000,000 | 41,000,000 | - | - | 17 |
| 18 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 24901 | - | - | 6,000,000 | 5,000,000 | - | - | 18 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | 150,000,000 | 135,000,000 | - | - | 19 |
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 25701 | - | - | - | - | 350,000,000 | 372,000,000 | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | - | - | 260,000,000 | 360,000,000 | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 26301 | - | - | - | - | 250,000,000 | 275,000,000 | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මන්නාරම | 26501 | - | - | 20,000,000 | 17,500,000 | 80,000,000 | 83,000,000 | 23 |
| 24 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 28001 | - | - | 5,000,000 | 3,700,000 | - | - | 24 |
| 25 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 28101 | 350,000,000 | 351,682,850.41 | - | - | - | - | 25 |
| 26 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28901 | - | - | 45,000,000 | 40,000,000 | - | - | 26 |
| 27 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 29001 | - | - | 25,000,000 | 24,400,000 | - | - | 27 |
| 28 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 29201 | - | - | 25,000,000 | 23,000,000 | - | - | 28 |
| 29 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 29701 | - | - | 6,000,000 | 5,900,000 | - | - | 29 |
| 30 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 29901 | - | - | 4,000,000 | 3,000,000 | - | - | 30 |
| 31 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 30001 | - | - | 4,000,000 | 3,100,000 | - | - | 31 |
| 32 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 5,000,000 | 4,800,000 | - | - | 32 |
| 33 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 30701 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 33 |
| 34 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 31101 | - | - | 9,200,000 | 6,700,000 | - | - | 34 |
| 35 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 33201 | - | - | 12,000,000 | 11,321,006 | - | - | 35 |
| 36 | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | 33801 | - | - | - | - | 4,500,000 | 9,500,000 | 36 |

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9,10,11 සහ 12 දරන යෝජනා යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ස්ථාවර නියෝග 19 (අ) හා (ආ) අනුව සභාව කල් තැබීමේ යෝජනාව, ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා.

ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## මලෙයහම් ජනතාව ජාතික ප්‍රවාහයට ඒකාබද්ධ කිරීම
## மலையக மக்களை தேசிய நீரோட்டத்துக்குள் உள்வாங்குதல்
## INTEGRATION OF MALAIYAGAM PEOPLE INTO THE NATIONAL MAINSTREAM

[பி.ப. 3.33]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நாங்கள் இந்தச் சபையில் நிலையியற் கட்டளை 19இன்கீழ் அவசர விவாதமொன்றுக்கு அனுமதி தர வேண்டுமெனக் கோரினோம். அதற்கு ஒத்துழைப்பு வழங்கிய கௌரவ பிமல் ரத்நாயக்க அவர்களுக்கும் கௌரவ கயந்த கருணாதிலக்க

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

அவர்களுக்கும் இந்தச் சபைக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொண்டு, பின்வரும் பிரேரணையை முன்மொழிகின்றேன்:

"உலக வங்கி, ஐ.நா., மத்திய வங்கி ஆய்வு அறிக்கைகளின்படி, வறுமை, கல்வி, சுகாதாரம், போஷாக்கு, சிசுமரணம், காணி - வீட்டுரிமை ஆகிய புள்ளிவிபரங்களில் பெருந்தோட்டப் பிரதேசங்கள்தான் நாட்டில் மிகவும் பின்தங்கிய நிலையில் உள்ளன. தற்போதைய மண்ணெண்ணெய், அரிசி, மா என்பவற்றின் விலை உயர்வாலும் மின் கட்டண உயர்வாலும், ஏற்கெனவே துன்பத்தில் உழன்ற பெருந்தோட்ட மக்கள் இன்று அதலபாதாளத்தில் விழுந்து விட்டார்கள்; இலங்கையின் தேசிய நீரோட்டத்திலிருந்து மிகவும் ஒதுக்கப்பட்டு விட்டார்கள். சமூக - ஜனநாயக அரசியல் முகாம் என்ற வகையில், எமது ஆட்சிக் காலத்தில் மலையகப் பெருந்தோட்ட மக்களை இலங்கையின் தேசிய நீரோட்டத்தில் உள்வாங்கும் பல அம்ச முற்போக்குப் பயணத்தை நாங்கள் ஆரம்பித்தோம்.

நாம் முன்னெடுத்த காத்திரமான சில பணிகள் பின்வருமாறு:

1. காணி மற்றும் வீட்டுரிமை: வரலாற்றில் முதன்முறையாக அமைச்சரவைத் தீர்மானம், நாடாளுமன்ற சட்டம்மூலம் மலையக மக்களுக்கு 'ஏழு பேர்ச்சஸ்' காணி உரிமையுடன்கூடிய தனி வீட்டுத்திட்டம்.

2. பாரத நிதி உதவி: இந்திய அரசுடன் பேச்சுவார்த்தை நடத்தி, சுமார் 14,000 வீடுகளுக்கான உத்தரவாதத்தைப் பெற்றோம். இன்று ஒரு வீட்டின் பெறுமதி 22 இலட்சம் ரூபாயாகக் கணிக்கப்படுகின்றது.

3. உள்ளூராட்சிச் சபை அதிகாரப் பரவலாக்கம்: மலையக மக்களுக்கு 30 வருடங்களுக்கும் மேல் மறுக்கப்பட்டிருந்த நியாயத்தைப் பெற்றுக்கொடுக்கும் முகமாக நுவரெலியா மாவட்ட பிரதேச சபைகளின் எண்ணிக்கையைப் பத்தாக உயர்த்தினோம். இவற்றை அரசாங்கத்தின் அனுசரணையோடு விரிவுபடுத்த வேண்டுமென நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

4. அரச நிருவாக பரவலாக்கம்: ஏனைய பிரஜைகளுக்குக் கிடைக்கும் அரச நிருவாக சேவைகள் மலையக மக்களுக்கும் கிடைப்பதை உறுதிசெய்ய வர்த்தமானி பிரகடனம்மூலம் பெருந்தோட்டப் பிரதேசங்களில் மாவட்ட செயலகம், பிரதேச செயலகம் மற்றும் கிராம சேவகர் வலயம் ஆகியவற்றின் எண்ணிக்கையைக் கூட்டினோம்.

5. பிரதேச சபை சட்டத் திருத்தம்: வாக்களிக்கும் பெருந்தோட்ட மக்கள் வாழும் பிரதேசங்களின் அபிவிருத்திக்கு பிரதேச சபைகள் நிதியொதுக்கீடு செய்ய முடியாது என்ற பிற்போக்கு பிரதேச சபை சட்டத்தின் 33ஆவது விதியைத் திருத்தினோம்.

6. கல்வி அபிவிருத்தி: பெருந்தோட்டப் பாடசாலைகளின் அபிவிருத்திக்காக, அண்மித்த இரண்டு ஏக்கர் காணியைச் சுவீகரிக்கும் உரிமையைப் பாடசாலைகளுக்குப் பெற்றுக் கொடுத்தோம். விசேட ஆசிரியர் நியமனங்களைப் பெற்றுக் கொடுத்தோம்.

7. சுகாதாரம்: தோட்ட நிருவாகத்தின் கீழிருந்த வைத்திய சாலைகளை தேசிய சுகாதாரக் கட்டமைப்புக்குள் உள்வாங்கினோம்.

8. பெருந்தோட்ட அதிகாரசபை: மலையகப் பெருந்தோட்ட மக்களின் குறை வளர்ச்சியைக் கவனத்திற்கொண்டு, அம்மக்களின் விசேட பிரச்சினைகளைக் கையாண்டு, அவர்களை ஏனைய சமூகங்களுக்கு நிகராக உயர்த்துவதற்காக "மலையக அதிகாரசபை" எனும் சட்டக் கட்டமைப்பை உருவாக்கினோம்.

9. வருமானம்: எமது கொள்கையின்படி, 'நாட்சம்பளம்' என்பது ஒருபோதும் நிரந்தரத் தீர்வாக அமையாது. மாறாக, பெருந்தோட்டத்துறையைக் கூட்டுறவுத்துறையாக அடிப்படை மாற்றம் செய்து, தொழிலாளர்களைப் பங்காளர்களாக மாற்றுவதே நிரந்தரத் தீர்வென அறிவித்து நாம் பணியாற்றினோம்.

நாங்கள் ஆரம்பித்த இந்த "மலையக மறுமலர்ச்சி" மாற்ற பயணத்தை தேசிய மக்கள் சக்தி - NPP - அரசாங்கம் கடந்த ஒன்றரை வருடங்களாக கணக்கில் எடுத்ததாகத் தெரியவில்லை. தோட்ட நிருவாகத்தின் பிடியிலிருந்து மலையக மக்களை வெளியில் கொண்டுவருவதை நிறுத்திவிட்டு, அங்கே பணிசெய்யும் சுமார் 75,000 தொழிலாளர்களை மென்மேலும் நவீன கொத்தடிமைகளாக கம்பனிகளின் அதிகாரப்பிடிக்குள் சிக்கி வாழும் நிலைமையை இந்த அரசு ஏற்படுத்தி விட்டது. இதனால் இன்று இம்மக்களின் உயிர் வாழும் உரிமைக்குப் பாரிய அச்சுறுத்தல் ஏற்பட்டுள்ளது. தொழிலாளர்கள் மீதான தோட்ட நிருவாகத்தின் கடுமையான அடக்குமுறை முன்பைவிட இன்று பலமடங்கு அதிகரித்து விட்டது. அவர்களின் குடியிருப்புகள் தகர்க்கப்பட்டு, அவர்கள்மீது வன்முறைகள் கட்டவிழ்த்து விடப்பட்டுள்ளன. 'தித்வா' புயலால் வீடிழந்த கண்டி, நுவரெலியா, பதுளை மாவட்ட மலையகக் குடும்பங்கள் இன்றளவும் கூடாரங்களிலே வாழ்கின்றன.

எனவே, பொறுப்புள்ள ஓர் அரசாங்கம் என்ற வகையில், இவ்விடயத்தில் உடன் தலையிட்டு, மலையக மக்கள் மீதான வன்முறைகளைத் தடுத்து நிறுத்துமாறும், நாம் ஆரம்பித்த மலையக மக்களை இலங்கையராக தேசிய நீரோட்டத்துக்குள் உள்வாங்கும் பயணத்தை முன்னெடுக்குமாறும் இச்சபை ஊடாக அரசாங்கத்தைக் கோருகின்றேன்."

பொது மக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்களின் தலைமையில் நடந்த கூட்டத்தில் நாங்கள் சில விஷயங்களைத் தெளிவுபடுத்தினோம். அவரும் சில விஷயங்களை ஒத்துக் கொண்டு இருக்கின்றார். விசேடமாக, மலையகப் பகுதியில் நடைபெறுகின்ற அடாவடித்தனங்களைத் தடுப்பதற்கான நடவடிக்கைகளை எதிர்காலத்தில் எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

பெருந்தோட்ட மக்களுடைய முக்கியமான பிரச்சினை, காணிப் பிரச்சினை என்பது உங்களுக்கு நன்றாகத் தெரியும். சிட்டுக் குருவிக்குக்கூட ஒரு கூடு இருக்கின்றது. ஆனால், மலையக மக்களுக்கு ஒரு தனி வீடு கிடையாது. எனவே, மலையக மக்கள் வீடுகளை அமைப்பதற்கு ஏற்ற வகையில், முதலில் நீங்கள் அவர்களுக்குக் காணியைக் கொடுங்கள்! வீடு கட்டுவது என்பது இரண்டாவது பிரச்சினை! அதை எப்படியாவது அவர்கள் கட்டிக்கொள்வார்கள் அல்லது வேறு அரசாங்கங்களுடைய அனுசரணையைப் பெற்றுக்கூட அதைச் செய்துகொள்ளலாம். ஆனால், காணி உரிமை என்பது மிக முக்கியமான ஒரு பிரச்சினையாக இருக்கின்றது. நேற்று ஏழு வயதுச் சிறுவன் ஒருவன் காணிக்காக நடைப்பயணம் செய்ததை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது. அதை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. ஏழு வயதுச் சிறுவன் அதைச் செய்திருக்கக் கூடாது. ஆனாலும், அவன் ஓர் ஆர்வக் கோளாறு காரணமாக அப்படிச் செய்ததை அவதானிக்க முடிந்தது. அந்த வகையில், மலையக மக்களுடைய பிரதான பிரச்சினையாக காணிப் பிரச்சினை இருக்கின்றது.

இன்று அரசாங்கம் டிஜிட்டல் முறைமையை ஆரம்பித்திருக்கின்றது. இன்று நாடு முழுவதும் டிஜிட்டல் முறையில் பரிமாற்றங்களைச் செய்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டு இருக்கின்றது. அது வரவேற்கக்கூடிய ஒரு விஷயமாகும். ஆனால், இந்த டிஜிட்டல் உலகத்தில் நவீன கொத்தடிமைகளாக மலையக மக்கள் இருப்பதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. Specially, இது வரைக்கும் ஒரு முகவரி அவர்களுக்குக் கிடையாது. 6ஆம் number லயன், 3ஆம் number லயன் என்று வீரைய்யா அல்லது காமாட்சி என்ற பெயருடன்தான் அந்த வீடுகளுக்கு address இடப்படுகின்றது. அதுவும் officeஇல் கொண்டுபோய்த்தான் கடிதங்களைக் கொடுக்க வேண்டும். அவர்கள் நினைத்தால் அவற்றை உரியவர்களிடம் கொண்டுபோய்க் கொடுக்கலாம்; கொடுக்காமலும் விடலாம். உலகத்திலுள்ள எந்தச் சமூகத்துக்கும் இல்லாத ஒரு நிலைமை மலையக மக்களுக்கு இருக்கின்றது என்பதை இந்த அரசாங்கம் தெரிந்துகொள்ள வேண்டும் என்பதை நான் மிகவும் கரிசனையுடன் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று அரசாங்கம் மலையக மக்களைப் பற்றி அதிகமாகப் பேசுகின்றது. 'மலையகம்' என்ற வார்த்தையை உருவாக்கியது NPP. சந்தோசம்! முதலில் "பெருந்தோட்டம்" என்றுதான் நாங்கள் சொன்னோம். மலையக மக்களுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இன்னும் எத்தனை காலம்தான் அவர்கள் இந்த நாட்டில் 'லயன்' காமராக்களில் இருப்பது? 'லயன்' காமராக்களை அகற்ற வேண்டுமானால், அதற்கு ஒரு தீர்வுத் திட்டம் இருக்க வேண்டும். அந்தத் தீர்வுத் திட்டத்துக்கு நீங்கள் எங்களுக்கு உதவி செய்யுமாறு கேட்டுக்கொள்கின்றேன்.

தோட்ட முகாமைத்துவத்தின் குத்தகை முடிவதற்கு இன்னும் 15 வருடங்கள் இருக்கின்றன. குத்தகை முடிகின்ற கையோடு தோட்டத்துறையை இல்லாமல் செய்து விடுவார்கள் என்ற நம்பிக்கைதான் எங்களுக்கு இருக்கின்றது. அதை இல்லாமல் செய்யாமல் பாதுகாக்க வேண்டிய பொறுப்பு இன்றைய அரசாங்கத்துக்கு இருக்கின்றது என்பதை நான் தெட்டத்தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். உங்களுடைய ஹட்டன் பிரகடனத்தை - Hatton Declaration - நடைமுறைப்படுத்தினாலே போதும்! வேறு ஒன்றுமே தேவை இல்லை என்பதை நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු ජනාධිපතිතුමා හැටන් ප්‍රදේශයට ඇවිල්ලා කාරණා කීපයක් ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශ කළ දේවල් ඉෂ්ට කළා නම් ඇති. වෙන මොකුත් ඕනෑ නැහැ. ඒ ප්‍රකාශ කරපු එක ඇතුළේ ඔක්කෝම දේවල් තිබෙනවා. වෙනත් විශේෂ දෙයක් නැහැ. හැටන්වලට ඇවිල්ලා කථා කරපු කරුණු ටික implement කළා නම් ඇති. ඒ වාගේම තලවකැලේ තියපු අන්තිම රැස්වීමටත් ඇවිල්ලා එතුමා කථා කළා. තලවකැලේදීත් ඒ පොරොන්දුවම දුන්නා. එතුමා කිව්වා, කොත්තු රොටි ගහන්න කෙනෙක් ඕනෑ නම් තලවකැලෙන් සොයා ගන්න පුළුවන් කියන තත්ත්වයක් තිබුණේ කියලා; ගෙදරක වැඩ කරන්න ගැහැනු කෙනෙක් ඕනෑ නම් හැටන්වලින් සොයා ගන්න පුළුවන් කියන තත්ත්වයක් තිබුණේ කියලා. ඒ තත්ත්වය නැති වන විධියට, ඒ කියන්නේ අපිත් මේ සමාජයත් එක්ක එකතු වෙන්න ඕනෑ. And, there should be equality. We cannot be second-class citizens in this country; we should be equal to you.

ඔබතුමන්ලා ඒක කරන්න කියා ඉල්ලා සිටීමට මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නා බව කියමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන මම ඉතාම සතුටු වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කිරීම, ගරු පලනි දිගම්බරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

[பி.ப. 3.43]

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ இராதாகிருஷ்ணன் அவர்களால் முன்மொழியப்பட்ட ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். மலையக மக்களின் காணிப் பிரச்சினை என்பது நீண்டகாலப் பிரச்சினையாகும். அந்தப் பிரச்சினைக்கு மாறி மாறி வந்த அரசாங்கங்கள் இதுவரை தீர்வைக் கொடுக்கவில்லை. 2015ஆம் ஆண்டு காலப்பகுதியில் நான் அமைச்சராக இருந்தபோது, அந்த மக்களுக்கு கிட்டத்தட்ட 8,000 வீடுகளை கட்டிக்கொடுத்தோம்; இந்திய அரசாங்கத்தின் உதவியுடன் 4,000 வீடுகளை நிர்மாணித்தோம். மேலும், கிட்டத்தட்ட 8,000 குடும்பங்களுக்கு காணி உரிமையைக் கொடுத்தோம். மலையக மக்களுக்கு காணி உறுதிப்பத்திரம் முதன்முதலாக 'நல்லாட்சி' அரசாங்கத்தால்தான் கொடுக்கப்பட்டது. அக்காலப்பகுதியில் கௌரவ கயந்த கருணாதிலக்க அவர்கள்தான் காணிக்குப் பொறுப்பான அமைச்சராக இருந்தார். அவர் மூலமாகத்தான் நாம் அவற்றை வழங்கியிருந்தோம்.

இந்த நாட்டுக்கு அதிகளவான அந்நியச் செலாவணியை ஈட்டிக்கொடுப்பவர்கள் மலையக மக்கள்தாம். ஆனால், அந்த மக்கள் இதுவரை லயத்து வாழ்க்கையையே வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். இந்த அரசாங்கம் ஆட்சிக்கு வரும்பொழுது, அம்மக்களுக்குக் காணி உரிமை கொடுப்பதாகவும் வீட்டுரிமை கொடுப்பதாகவும் ஹட்டன் பிரகடனத்தில் குறிப்பிட்டு இருந்தது. ஆனால், அரசாங்கம் ஆட்சிக்கு வந்து 2 வருஷமாகின்றது. அதுபற்றி பெரிதாக ஒன்றும் பேசவில்லை. சம்பளத்தைக் கூட்டிக் கொடுத்தார்கள். நாங்கள் அதற்கு

[ගරු පලනි දිගම්බරම් මහතා]

ஆதரவு கொடுத்தோம். எவ்வாறாயினும், அந்த மக்கள் வீதிக்கு இறங்கிப் போராடுவதற்கு முன்னர் அந்த மக்களுக்கான காணி உரிமையைக் கொடுங்கள்! 200 வருடங்களுக்கும் மேலாக வாழுகின்ற அந்த மக்களுக்கு 10 பேர்ச் காணியைக் கொடுப்பதில் எந்தவிதமான பிரச்சினையும் கிடையாது. தோட்டங்களில் நிறையக் காணிகள் உள்ளன. ஆனால், அவற்றைக் கொடுப்பதற்கு எவருக்கும் மனசு வரவில்லை. தற்போதைய சனாதிபதி அவர்கள் எதிர்க்கட்சியில் இருக்கும்போது, அந்த மக்களைப் பற்றி அதிகமாகப் பேசியுள்ளார். அப்போது அவருக்கு அதிகாரம் இருக்கவில்லை. ஆனால், இப்போது முழு அதிகாரமும் அவருக்கு இருக்கிறது. இந்தப் பாராளுமன்றத்தில் அந்த sideஇல் 159 பேர் இருக்கிறார்கள். எதிர்க்கட்சிக்காரரும் support பண்ணுவார்கள். அவர் நினைத்தால் நாளைக்குக்கூட அது சம்பந்தமான நடவடிக்கையை எடுத்து, அந்த மக்களுக்கான காணி உரிமையைக் கொடுக்க முடியும். ஆனால், இன்னும் இந்த அரசாங்கத்துக்கு மனசு வரவில்லை. அரசாங்கம் செய்யும் நல்ல நடவடிக்கைகளுக்கு எங்களுடைய ஆதரவை வழங்குவோம். அதேநேரம், மக்களுக்குத் துரோகம் செய்தால் நாங்கள் எதிர்ப்போம். இந்த அரசாங்கத்தின் ஆட்சிக் காலம் முடிவதற்கு இன்னும் 3 வருடங்கள்தான் இருக்கிறது. அதற்கு முன்னர் இந்த மக்களுக்கான காணி உறுதியைக் கொடுங்கள்! நாங்கள் இரண்டு கைகளையும் உயர்த்தி இந்த அரசாங்கத்துக்கு support பண்ணுவோம்.

'நல்லாட்சி' அரசாங்கத்தில் இந்த மக்களுக்கு காணி உரிமை கொடுக்கப்பட்டது உங்களுக்குத் தெரியும். அதேபோல, வீடுகளை கட்டிக் கொடுத்தோம்; மலையக அபிவிருத்தி அதிகாரசபையைக் கொண்டுவந்தோம்; பிரதேச செயலகங்களை அதிகரித்தோம்; பிரதேச சபைகளை அதிகரித்தோம். இவ்வாறான நல்ல வேலைத்திட்டங்களை நாங்கள் செய்தோம். ஆனால், ஆளுங்கட்சியிலுள்ள மலையக தமிழ்ப் பிரதிநிதிகள் நாங்கள் ஒன்றுமே செய்யவில்லை என்று சொல்கிறார்கள். ஆளுங்கட்சியிலுள்ள மலையக தமிழ்ப் பிரதிநிதிகள் சனாதிபதியுடன் கதைத்து, எப்படியாவது இந்தக் காணி உரிமையைப் பெற்றுக் கொடுங்கள்! கட்டாயம் நாங்கள் உங்களுக்கு support பண்ணுவோம் என்று கூறி, இந்தச் சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මලෙයහම් ජනතාව සම්බන්ධයෙන් පැන නැඟී තිබෙන ගැටලු සහ ඔවුන් වෙනුවෙන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ඉස්සෙල්ලාම මලෙයහම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රී කණ්ඩායමට අපේ ස්තුතිය පුද කර සිටිනවා.

ජාතික ජන බලවේගය ආණ්ඩුව පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උදා කිරීම වෙනුවෙන් අදාළ දේශපාලන ගමන තමයි ආරම්භ කරලා තිබෙන්නේ. විශේෂයෙන් මලෙයහම් ජනතාවට වැදගත් පෞරුෂයක් සහිත, හොඳ ආර්ථිකයක් සහිත සම බිමක ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීමට තමයි අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව "හැටන් ප්‍රකාශනය" කියලා ප්‍රකාශනයක් ඉදිරිපත් කරලා මේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය වෙනස් කරමින් ගෞරවනීයව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් ඇති කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නේ.

අවුරුදු 76කට වැඩි කාලයක් පැවැති පාලන ක්‍රමය තුළ, අවුරුදු 200ක් පමණ කාලයක් වතුවල වැඩ කරන අපේ මලෙයහම් ජනතාවගේ අයිතීන් දිනා දීම සම්බන්ධයෙන් ගත්තොත්, ඉතාම ඛේදජනක තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි ඒක පිළිගෙනයි තිබෙන්නේ. එය පිළිගෙන ඒ තත්ත්වය වෙනස් කරන්න තමයි අපි දේශපාලනය කරමින් ඉන්නේ. අපි ආණ්ඩුව විධියට මේ වනකොට අවුරුද්දයි මාස හයක් ඇතුළත අපේ ආදරණීය මලෙයහම් අම්මා තාත්තාගේ, සහෝදර සහෝදරයන්ගේ ජීවිත වෙනස් කරන්න අදාළ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මලෙයහම් ජනතාවට අප ඒ ඓතිහාසික ජයග්‍රහණ අරගෙන දෙන වෙලාවක, ඒ ජනතාව පාවිච්චි කරමින් හුදු, පටු බලලෝභී දේශපාලනයකුත් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. විශේෂයෙන් මම කියන්න ඕනෑ, මෙතැන මා ඉදිරිපිට ඉන්න අපේ ගරු මන්ත්‍රීවරුන් ජාතික සමගිය පැත්තට කථා කරද්දී, ඒ පක්ෂවල බිම් මට්ටමේ ඉන්න සමහර අය - ප්‍රාදේශීය සභා මන්ත්‍රී මට්ටමේ ඉන්න සමහර අය - මේ වෙලාවේ ජාතිවාදී ස්වරූපයකින් ජාතිවාදී ගිනි දැල් ඇවිළීම වෙනුවෙන් කටයුතු කරමින් ඉන්න තත්ත්වයක් තිබෙන බව. ඒ නිසා අපි පළමුවෙන්ම අපේ මන්ත්‍රීවරුන්ගෙන්, විශේෂයෙන් මලෙයහම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, අපි සමඟි සම්පන්න රටක් හදමු; ශ්‍රී ලාංකීය පුරවැසියන්ට අදාළ රටක් හදමු කියලා.

එක් එක් සිදුවීම් පදනම් කරගෙන ඇති වන ව්‍යාකූල තත්ත්වයන් දේශපාලන කරලියට ගෙන එන්න ප්‍රාදේශීය දේශපාලනය කටයුතු කරමින් ඉන්නවා. මා මෙය කියන්නේ ඉතාම වගකීමෙන්. අවුරුදු හතක පොඩි දරුවෙකු ඉඩම් අයිතිය ඉල්ලා තලවකැලේ ඉඳන් කොළඹට ගේන්න සැලසුම් කරලා තිබෙනවා. එහි ඡායාරූප ටික අරගෙන හොඳට, පිළිවෙළට බැලුවාට පස්සේ පෙනෙනවා, ඒවායේ ප්‍රාදේශීය දේශපාලනඥයින් ඉන්න බව; ප්‍රධාන පක්ෂවල දේශපාලනඥයන් ඉන්න බව. අන්න ඒකට ඉඩ නොතබා ජාතික සමඟිය වෙනුවෙන් වැඩ කරන්න එන්න කියලා මම ඉස්සෙල්ලාම ආරාධනා කරනවා.

අපි දන්නවා, ඔබ විසින් ඉතිහාසය පුරා වැදගත් තීන්දු තීරණ ගෙන තිබෙන බව. අපි ඒවා සියයට සියයක් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඔබ රජුන් තනන්නන් විධියට කටයුතු කරලා තිබෙනවා; ඒ හරහා මලෙයහම් ජනතාවට අයිතිවාසිකම් දෙන්නත් කටයුතු කරලා තිබෙනවා; යම් ජයග්‍රහණත් අරගෙන දීලා තිබෙනවා. නමුත් ඔබ නතර කරපු තැන ඉඳලා අපට තව බොහෝ දුර ගමනක් යන්න තිබෙනවා. මම කියන්නම්, උදාහරණ කිහිපයක්. නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත්, ගැසට් නොකරපු, කාටවත් අයිති නැති පාරවල් අටසිය අසූ ගණනක් තිබෙනවා. ඒ පාරවල් තිබෙන්නේ වතු ඇතුළට යන්න තමයි. ඔබ ආණ්ඩුවල හිටපු කාල පරිච්ඡේදය ඇතුළත ඒවා ගැසට් කරලා ජනතාවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ටික දී ගන්න බැරි වෙලා තිබුණා. ඒවා පිළිගන්න ඕනෑ. අපි දැන් අලුත් ආණ්ඩුව විධියට ගරු ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා ඒ පාරවල් අටසිය ගණන ගැසට් කරලා RDA එකට පවරන්න පුළුවන් ඒවා RDA එකට, PRDA එකට පවරන්න පුළුවන් ඒවා PRDA එකට, පළාත් පාලන ආයතනවලට පවරන්න පුළුවන් ඒවා පළාත් පාලන ආයතනවලට පවරමින් ඉන්නවා.

අපේ ආදරණීය මලෙයහම් ජනතාවට ජීවිතය තමයි ඒ දෙන්න හදන්නේ. ඔබ දන්නවා, ලිඳුල ඉඳලා ඩයගම දක්වා

තිබෙන්නේ විශාල ආර්ථිකයක් තිබෙන පාරක් බව. එළවලු ටික මේ ප්‍රදේශයට ගෙනෙන්නේ ඒ පාරෙන්. ඔබ හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරලා බලන්න, ඒ පාර හදන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ ජනතාවට ජීවිතය දෙන්න පුළුවන් වුණාද? අන්න, දැන් රුපියල් මිලියන 3,250ක් වියදම් කරලා කිලෝමීටර 22ක පාර හදන්න මේ අවුරුද්දේ - 2026දී - වැඩ පටන් ගන්න සූදානම් වෙලා තිබෙනවා. "දිට්වා"වලට විනාශ වෙච්ච ප්‍රධාන පාරවල් 23ක් - RDA එක සතුව තිබෙන පාරවල් විතරක් - සංවර්ධනය කරන්න විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි වතුකරයේ ජනතාවට ජීවිතය දෙමින් ඉන්නවා. අපි දන්නවා, ඒක ප්‍රමාණවත් මදි කියලා. අවුරුද්දකුත්, මාස එකහමාරක් ඇතුළත සුරංගනා ලෝකයක් හදනවා වාගේ නොවෙයි, වැඩ කරලා තමයි මේ ප්‍රශ්න බේරන්න තිබෙන්නේ. අපි ඒකට වැඩ කරමින් ඉන්නවා. ඒකට ඔබ ඇගයීමක් දිය යුතුයි.

මධ්‍යම පළාතේ පාසල් 1,510ක් තිබෙනවා. ඔබ හිතට එකඟව කල්පනා කර බලන්න. ඒ පාසල් ඇතුළේ ඉඩම් ආරාවුල් බේරා ගන්න තිබෙනවා. කොච්චර ඇති කියලා හිතනවාද? LRC ඉඩම්, වතු සමාගම් සතු ඉඩම් සහ රජයේ ඉඩම් ඇතුළේ තිබෙන පාසල් 968ක ඉඩම් ආරවුල් ටික බේරලා දෙන්න තිබෙනවා. අපි ඒවාට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. සහතික වශයෙන් අපි කියනවා, මධ්‍යම කඳුකරයේ ඉන්න අපේ ආදරණීය පාසල් දරුවන්ට සුරක්ෂිත පාසලක් අරගෙන දෙන්න අදාළ වැඩ පිළිවෙළ අපි කරමින් ඉන්නවා. ඒකට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. ඒ කෙසේ වෙතත්, ඔබ කියන කථාවේ ඇත්තක් තිබෙනවා. ඒ නිවාස ප්‍රශ්න තවම සම්පූර්ණයෙන් විසඳලා නැහැ, පාරවල් ප්‍රශ්න සම්පූර්ණ විසඳලා නැහැ, රෝහල්වල ප්‍රශ්න සියයට 100ක් විසඳලා නැහැ. ඒ සඳහා තමයි අපි වැඩ පටන් අරගෙන තිබෙන්නේ. අපට බාධා ආවා. "දිට්වා" ඇවිල්ලා යම් මට්ටමක පසුබෑමකට ලක් වෙන්න සිද්ධ වුවත්, අපි නැවතත් නැඟිටලා නිවැරදි දිශානතිය වෙත ගමන් කරමින් ඉන්නවා. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උදා කරන්න පුළුවන් ගමන අපි යමින් තිබෙනවා. හැටන් ප්‍රකාශනයේ එකින් එක, එකින් එක පිටුවලට අදාළ දේවල් ක්‍රියාත්මක කරන්න පටන් අරන් තිබෙනවා. ඔබ ඉදිරිපත් කරන තර්ක අපි ඉතාම ගෞරවයෙන් භාර ගන්නවා වාගේම, එහි අවසාන අකුර දක්වාම වග කියන්න බැඳිලා ඉන්නවා. ඒ වෙනුවෙන් අපි කටයුතු කරනවා. එම නිසා සැකයක් තියාගන්න එපා, මලෙයහම් ජනතාවගේ ජීවිත ගොඩනැඟීමට අදාළව ලබා දුන් පොරොන්දු ඉටු කර දෙන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

අපි "ප්‍රජා ශක්ති" කියලා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ආරම්භ කළේ සිංහල, දෙමළ, මුස්ලිම් භේදයක් ඇති කරන්න නොවෙයි. සෑම ග්‍රාම නිලධාරි වසමකම ජීවත් වන මිනිසුන්ට ජීවිතයක් ලබා දෙන්න අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. රජයේ සංවර්ධන ව්‍යාපෘති එකින් එක දිගහැරෙන අතරේ, "ප්‍රජා ශක්ති" වෙනුවෙන් විතරක් නුවරඑළියේ දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 998ක් වෙන් කර තිබෙනවා. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව ජීවත් වන මලෙයහම් ජනතාවගේ ජීවිතය උසස් කරන්න, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න, ඔවුන් ව්‍යවසායකයන් බවට පත් කරන්න, ඔවුන්ගේ ආර්ථිකය උඩට ගේන්න අදාළ වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. ඒවාට අදාළ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඉවරයි. මේ වෙනකොට නුවරඑළිය දිස්ත්‍රික්කය තුළින් "ප්‍රජා ශක්ති" කමිටුවට යෝජනා ඇවිල්ලා තිබෙනවා. ඊට අදාළ සංවර්ධන කටයුතු ආරම්භ කරන්න තමයි දැන් අපට තිබෙන්නේ. අපි ඒ වැඩ කටයුතු ආරම්භ කරමින් තිබෙනවා.

ඒ වාගේම මම මෙතැනදී තවත් කාරණයක් කියන්න කැමැතියි. අපට දිස්ත්‍රික්කය ඇතුළේ සමඟියෙන් වැඩ කරන්න පුළුවන් වටපිටාවක් තිබෙනවා. දැන් ප්‍රභූ දේශපාලනයක් නැහැ. ඉන්දියාවේ, තමිල්නාඩුවේ තිබෙන චිත්‍රපට රඟපාන්න අවශ්‍යතාවක් නැහැ, දැන්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තිබෙනවා. අන්න ඒකට එන්න යෝජනා අරගෙන. අපට ඉතාම ප්‍රගතිශීලීව, ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා කරලා මධ්‍යම කඳුකරයේ මලෙයහම් ජනතාවට අවශ්‍ය ජීවිතය ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්. හැබැයි මම අහනවා, මේ කාරණයත්. මේ සමහර මන්ත්‍රීවරු හෘදය සාක්ෂියට එකඟව එනවාද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට? නැහැ සම්බන්ධ වෙන්නේ නැහැ. ඒ අය මාධ්‍යවලට එකක් කියනවා, පාර්ලිමේන්තුවේ එකක් කියනවා. නමුත්, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන්න සූදානම් නැහැ. ඒ නිසා වැඩ කරන්න එන්න. අපි ප්‍රභූ දේශපාලනය පරද්දලා මේ රට නිවැරදි මාවතකට ගන්න කටයුතු කරද්දී, හොඳ වැඩ කරන්න පක්ෂ, විපක්ෂ භේදයක් නැහැ. අපි හොඳ වැඩ කරන්න ආරම්භ කරලා තිබෙනවා; කැපකිරීම් කරමින් ඉන්නවා; පරිත්‍යාග කරමින් ඉන්නවා; ආදර්ශ දෙමින් තිබෙනවා. අපි පරිස්සමින්, සමඟිය තහවුරු කරමින් වැඩ කරමින් ඉන්නවා; නීතිය අකුරට ක්‍රියාත්මක කරමින් ඉන්නවා. වෙන දා වතුකරයේ මලෙයහම් ජනතාවට තිබුණු දේශපාලනය මොකක්ද? ඒ රාජකාරිවලට තිබුණු බාධා මොනවාද? මීට ඉස්සර වෙලාත් අපි මේවා කථා කළා. දැන් නීතිය අකුරට ක්‍රියාත්මක වෙනවා. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව ජනතාවට නීතිය තහවුරු කරන්න වැඩකටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා මම මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඔබ විසින් නවතපු තැන ඉඳලා අපට මහා පිම්මක් පනින්න තිබෙනවා, ඒ පිම්ම පනින්න සියලුදෙනාම එකතු වෙලා වැඩ කරමු කියන ඉල්ලීම කරමින්, මෙම අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවින්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් මාතෘකාවක් යටතේ අපි සාකච්ඡා කරනවා. අපේ මලෙයහම් ජනතාව මුහුණ දෙන ගැටලු පිළිබඳවයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මලෙයහම් ජනතාව නියෝජනය කරන ප්‍රදේශයක මන්ත්‍රීවරයකු වන මට කථා කරන්න මේ වේලාව වෙන් කිරීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි ආණ්ඩුව ලබාගෙන මේ වන විට අවුරුද්දයි මාස 6ක් වාගේ කාලයක් ගතවෙලා තිබෙනවා. මේ කාල සීමාව තුළ අපි විශේෂයෙන්ම මේ මලෙයහම් ජනතාවගේ නොවිසඳුණු ප්‍රශ්න විසඳීම සඳහා මැදිහත් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නවලට හේතු භූත වුණු කරුණු රාශියක් තිබෙනවා. මලෙයහම් ජනතාවගේ අනුහසින් නියෝජිතයන් බවට පත් වෙලා, ඒ ජනතාව පාවා දීලා ඒ විවිධ රජයන් යටතේ බලයේ ඉඳලා, වතු බංගලා බලෙන් අයිති කරගෙන ඉඳලා, අවුරුදු 203ක් තිස්සේ ඒ මලෙයහම් ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳන්නේ නැතිව ඒ ජනතාව ලැයිම් කාමරවල කොටු කර තැබුවා. දැන් ඒ ජනතාවට ලිපිනයක් නැහැ කියනකොට, ඉඩමක් නැහැ කියනකොට, ඔවුන්ගේ පාර හැදිලා නැහැ කියනකොට අපට ගැටලුවක් මතු වෙනවා, ඇත්තටම මේවාට වග කියන්න ඕනෑ අපිද කියලා. හැබැයි, මේ යෝජනාවේ තිබෙන සාධනීය දේවල් අපි පිළිගන්නවා. ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය විසඳෙන්න ඕනෑ, ඔවුන්ට ඉඩමක් තිබෙන්න ඕනෑ,

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ඔවුන්ගේ පාර හැදෙන්න ඕනෑ කියන කාරණා අපි පිළිගන්නවා. අපි දන්නවා, ඉතිහාසය පුරා තිබුණු ඔවුන්ගේ වැටුප් ප්‍රශ්නය. ඒ වැටුප් ප්‍රශ්නය අපි විසඳුවා. පුළුවන් නම් රුපියල් 10ක් වැඩි කරලා දෙන්න කියලා අපට අභියෝග කළා. අපි රුපියල් 400ක් වැඩි කර ඒ වැටුප් ප්‍රශ්නය විසඳුවා. ඒ වාගේම දැන් ඒ අය වෙනුවෙන් මුදල් වෙන් කිරීම්, ඒවා මේවා ගැනත් කියනවා නේ. මම නිකම් එක උදාහරණයක් කියන්නම්.

මම අද ගෙන්වා ගත්තා ඌව පළාත් සභාවෙන් මේ ජනතාව වෙනුවෙන් වෙන් වෙච්ච ප්‍රතිපාදන පිළිබඳ විස්තර. 2024 අවුරුද්දේ වතු යටිතල පහසුකම්වලට වෙන් වෙලා තිබෙනවා, රුපියල් මිලියන 60ක්. නිවාස හදන්න, ජල සම්පාදනය කරන්න, රැකියා පුහුණු ලබා දෙන්න වාගේ දේවල් සඳහා තමයි ඒ මුදල වෙන් කර තිබෙන්නේ. අපි බලයට එන්න පෙර ඔවුන් වෙනුවෙන් අවුරුද්දකට වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 60ක්. 2025 අවුරුද්දේ ඒ වැඩකටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 151ක් අපි වෙන් කර තිබෙනවා. ඒ, එදාට වඩා තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයක්. 2026 අවුරුද්දේ රුපියල් මිලියන 196ක් වෙන් කර තිබෙනවා. ඔවුන්ගේ කාලයේ වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 60ක් වෙනකොට, දැන් රුපියල් මිලියන 196ක් වෙන් කර තිබෙනවා. 2027 අය වැය යෝජනා සඳහා අපි ඇස්තමේන්තු දීලා තිබෙනවා, රුපියල් මිලියන 300ක්. ඒ කියන්නේ, පස් ගුණයක්. රුපියල් මිලියන 60ක මුදල රුපියල් මිලියන 300 දක්වා වැඩි කර තිබෙනවා. අන්න ඒ විධියට තමයි අපි වැඩකටයුතු කරගෙන යන්නේ. ඒ මම කිව්වේ, පඩිපෙළක් හදන්න, පාරක් හදන්න, පොදු පහසුකම් සංවර්ධනය කරන්න පළාත් සභා හරහා වෙන් කළ මුදල් ප්‍රමාණය. මධ්‍යම ආණ්ඩුව හරහා ගත්තාම, 2024 වර්ෂයේ වතුවල infrastructure developmentවලට රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. 2025දී රුපියල් මිලියන 1,813ක් වෙන් කර තිබෙනවා. 2026දීත් එවැනි මුදලක් වෙන් කර තිබෙනවා. මම හිතන විධියට, ඒ කාරණා සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම දැන් ඔය "දිට්වා" සුළි කුණාටුව නිසා විපතට පත් වූ අය තවම කඳවුරුවල ඉන්නවා කියා ඒ ගැනත් කථා කළා. ඒ සියලුදෙනා සඳහා සංක්‍රාන්ති නිවාස හදන වැඩේ, තාවකාලික නිවාස හදන වැඩේ පටන් අරගෙන තිබෙනවා. ඒ අයට ස්ථිර නිවාස ලබා දෙනවා. ඉඩම් අයිතිය නොමැති වීම නිසා ඒ අයට අර රුපියල් ලක්ෂ 50ක මුදල ලැබුණේ නැහැ නේ. නමුත්, ගරු ජනාධිපතිතුමා විශේෂයෙන් තීරණය කර තිබෙනවා, ඒ අයටත් ඒ මුදල ලබා දෙන්න. ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ රුපියල් ලක්ෂ 50ක මුදල ඒ අයටත් ලැබෙනවා.

නිවසක් පූර්ණ හානියට පත් වුණා නම්, එහෙම නැත්නම් අධි අවදානම් තත්ත්වයේ ඉන්නවා නම් ඒ වන්දි මුදල ලබා දෙනවා. ඒ වාගේම තමයි, ඒවාට ඉඩම් සොයා ගැනීමත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද විස්තර ගෙන්වා ගත්තා, කොච්චර ප්‍රමාණයක් ඉඩම් හොයලා තිබෙනවා ද කියලා. හෙක්ටෙයාර 83ක් මේ වෙනකොට සොයාගෙන තිබෙනවා. ඒවා වතු වශයෙන් තිබෙනවා; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තිබෙනවා. ඒ නිසා දැන් මම කිව්වේ ඒකයි, අර වෙනස තමයි දැන් සිද්ධ වෙන්නේ කියලා. මම හිතන විධියට ඒ වෙනස මේ සැරේ මැයි දිනයේදීත් දැක්කා. මැයි දිනයේ දී ඒ වෙනස අපි දැක්කා.

ඊළඟට, හෙට අනිද්දාට තව දෙයක් බලා ගන්න පුළුවන්. ලබන මාසයේ විතර unions form වෙනවා නේ. ඔය ගොඩක් unions ගත්තාම, විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කය ගත්තාම සාම්ප්‍රදායික දමිළ දේශපාලන පක්ෂවල එකම එක නියෝජනයක්වත් නැහැ. එහෙම නියෝජනයක් නැති වුණේ ඇයි? මැයි දිනයේදී එහෙම දෙයක් වුණේ ඇයි? හොඳට මතක තියා ගන්න, ලියලා තියාගන්න ලබන මාසයේදී - ජූනි මාසයේදී - unionsවල අය එන්නේත් එහෙම තමයි. ඒ අය අපට කථා කරනවා. අපට කථා කරලා අහනවා, මේකට බැදෙන්නේ කොහොමද කියලා. "මේකට බැදෙන්න ඕනෑ, මේකට බැඳිලා අපට හැදෙන්න ඕනෑ" කියනවා. මම තව උදාහරණ කියන්නම්. 2024දී PRDA මාර්ග සඳහා අපේ දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන් කර තිබුණේ රුපියල් මිලියන 750යි. 2025දී ඒක රුපියල් මිලියන 2,750ක් වුණා. මේ සැරේ රුපියල් මිලියන 7,000ක් වෙලා තිබෙනවා. ඒ සංවර්ධනය සිදු වෙමින් යනවා. අපි වෙන්කොට සලකන්නේ නැහැ නේ. අපේ රටේ කිසිම ජන කොටසකට අපි වෙන්කොට සලකන්නේ නැහැ. අපේ ළඟ ජාතිවාදය නැහැ. අපි ඒවා තුරන් කරලා තිබෙන්නේ. වෙන්කොට සලකපු අතීතය තුළ තමයි එවැනි දේවල් වුණේ. ඒ කාලයේ දේශපාලනඥයෙක් වත්තට ගිය විධියයි, දැන් දේශපාලනඥයෙක් වත්තට යන විධියයි ගොඩක් වෙනස්. ඒ මිනිස්සුම; මලෙයහම් ජනතාවම අපට ඒක කියනවා. කලින් හිටපු දේශපාලනඥයන් වත්තට එන්න ඉස්සෙල්ලා රතිඤ්ඤා පෙට්ටි ටිකක් එවනවා. ඒ අයම මල් මාලා එවනවා. ඊට පස්සේ තමයි ඒ අය එන්නේ. පොලිස් නිලධාරින් පිරිවරාගෙන ඒ අය එනවා. නමුත්, අපි වත්තට යන්නේ සාමාන්‍ය විධියට. අන්න ඒ වෙනස තමයි තිබෙන්නේ. අපේ සෙල්වරාජ් සහෝදරයා ගත්තත්, අම්බිකා සහෝදරිය ගත්තත්, අපේ කලෙයිවෙල්වි සහෝදරිය ගත්තත්, ඒ අය පරණ විධියට වත්තේ ලැයිම් කාමරවල ජීවත් වෙනවා. අපි පොදු ජනතාවත් එක්ක එකතු වෙලා වත්ත සංවර්ධනය කරමින්, රටේ ජන කොටස්වලට වෙන්කොට සලකනවා කියන මතය ඉවත් කරලා තිබෙනවා. ඉන්දියාවෙන් අපේ රටට ආවා වාගේම වෙනත් රටවලටත් ඒ කාලයේ දමිළ ජනතාව ගියා. නමුත්, ඒ රටවල මේ ජනතාව වෙන්කොට සලකන්නේ නැහැ. ඒ අය තවම ලැයිමේ ජීවත් වෙන්නේ නැහැ. නමුත් අපේ රටේ ඒ තත්ත්වය අද දක්වා ආවේ කවුරුන් නිසා ද කියන එක අංක එකට හිතන්න. තමන්ගේ පපුවට තට්ටු කරලා ගොඩක් අයට ඒක හිතන්න වෙනවා. මේ ඉන්න ගොඩක් අයට ඒක හිතන්න වෙනවා. ඒ ප්‍රශ්න ටික ලස්සනට, පිළිවෙළට විසඳාගෙන යනකොට දැන් ඒකට සහයෝගය දෙන්නේ නැහැ.

ආපදාවට ලක් වෙච්ච නිවාස ගැන කියනකොට මම තව දෙයක් කියන්නම්. මම නියෝජනය කරන හපුතලේ ප්‍රදේශයේ කබරගල නාය ගිය නිසා ඒ ජනතාව අතහැර දාපු tea factory එකක තමයි හිටියේ. ඔවුන් තවමත් එතැන ඉන්නේ. දැන් තමයි අපේ රජය ඇවිල්ලා ඉඩම් හොයලා නිවාස 50ක් හදලා, කලින් හදපු නිවාසවලටත් වඩා ඉතාම උසස් ප්‍රමිතියේ නිවාස හදලා තිබෙන්නේ. දැන් ඒ කටයුතු අවසාන අදියරේ තිබෙන්නේ. ඒ වාගේම, ඒ ආසන්න ප්‍රදේශවල නාය යෑම් දිහා බැලුවාම, අධි අවදානම් සහිත මල්වත්තවත්ත කියන ප්‍රදේශයෙන් ජනතාව ඉවත් කරන්න කියලා 2012දී දැනුම් දීලා තිබෙනවා කියලා අපි දැක්කා. නායබැද්ද හිටපු ජනතාවටත් 2012දී ඉවත් වෙන්න කියලා දැනුම් දී තිබුණා. ඒ වාගේම, පසුගිය දවස්වල ජීවිත හානි සිද්ධ වෙච්ච කහගලවත්තත් එහෙමයි. 2012දී තමයි කිව්වේ, ඒ ජනතාවත් ඉවත් කරන්න කියලා. ඔබතුමන්ලාගේ කාලසීමාවේදී ඒක කරන්න බැරි වුණා. 2012දී ඉවත් කරන්න කියලා දැනුම් දී තිබුණත්, ඔබතුමන්ලාට එම ජනතාව ඒ තැන්වලින් ඉවත් කරන්න බැරි වුණා. දැන් තමයි අපි ඒ අය වෙනුවෙන් නිවාස ව්‍යාපෘති පටන් ගන්නේ. ගිය සතියට කලින් සතියේ අපි නිවාස 35කට මුල්ගල් තිබ්බා. ලංකාවේ ආණ්ඩුවෙන් වියදම් කරලා තමයි ඒ කටයුතු කළේ. ඉන්දියානු නිවාස ව්‍යාපෘති වෙනම යනවා. අන්න ඒක තමයි අලුත් දේශපාලන සංස්කෘතිය. වතු ජනතාවට ඒ වත්තෙන් පර්චස් 7ක් දෙනවා කියලා ඒ කාලයේ කිව්වා. අපි ඒකට සතුටු වෙනවා. අපි ඒක පර්චස් 10 දක්වා වැඩි කළා.

ඊළඟට, මේ අයට නිවසක ලිපිනය ලබා දීම ගැන කථා කළා. ජනාධිපතිතුමාත්, අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් ඉතා පැහැදිලිව කිව්වා, ඒ සියලු දෙනාටම තමන්ගේ කියා ලිපිනයක් ලබා දෙන්න කටයුතු කරනවා කියලා. ඒක මේච්චර කාලයක් නොවෙච්ච එක ගැන අපි කනගාටු වෙනවා. අපි ඒකට වග කිවයුත්තන් නොවුණත්, අපි ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා. එම නිසා අපි අන්න ඒකටත් අත තබලා තිබෙනවා. දැන් මෙතැන හදිසියේම මේ කලබලය ඇති වෙන්නේ වෙන මුකුත් නිසා නොවෙයි. මැයි දිනයෙන් දැක්ක දේ සහ ඉදිරියේ එන තත්ත්වයත් එක්ක මේ අයගේ දේශපාලනය අතුගෑවිලා ගිහිල්ලා අවසන් වෙනවා. හැබැයි, අපි සාධනීයව දකින දෙයක් තිබෙනවා. ඒ තමයි මේ කියන යෝජනා. "අපි මේක පටන් ගත්තා, අපේ ක්‍රමයටයි යන්නේ" කියලා මේ අය කියනවා නේ. අපි කියන්නේ මේකයි. ඒ පටන් ගත්ත දේ යනවා. හැබැයි, ඒ ක්‍රමයට නොවෙයි අපි යන්නේ. රතිඤ්ඤා ටික කලින් යවන, මල් මාලා ටික කලින් යවන ක්‍රමයට නොවෙයි අපි යන්නේ. මෙන්න මේ system එකට තමයි අපි යන්නේ.

දැන් මේ අයට අවතැන් කඳවුරුවල ඉන්න ජනතාව ගැනත් ලොකු ආදරයක් ඇති වෙලා තිබෙනවා නේ. ඇත්තටම ඔවුන් ගැන ඒ ආදරය අපටත් තිබෙනවා. හැබැයි, අපි මේකත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ කාලයේ සිට තවමත් අවතැන් කඳවුරුවල ඉන්න අයටත් අපි නිවාස ව්‍යාපෘති හදන ගමන් ඉතාම ඉක්මනින් සංක්‍රාන්ති නිවාසත් - තාවකාලික නිවාසත් - ඉදිවෙනවා. ඒවාට දැනටමත් ඉඩම් සොයාගෙන තිබෙන්නේ. ඒ ඉඩම් ටික හොයාගෙන ඒ ව්‍යාපෘති පටන් අරන් ඉවරයි. ඒ වාගේම, විශේෂයෙන්ම ඒ අය කඳවුරුවල ඉන්නකොට සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක වුණා. ඒ අයව නොයෙකුත් විධියට දැනුවත් කිරීම් සිදු කරමින් සංස්කෘතික වැඩසටහන් වාගේ දේවල් කෙරුණා. ඒ හැමදෙයක්ම ඔක්සේ තමයි අපි මේවා කියන්නේ. මේ ජනතාවට අපි වෙන්කොට සලකනවා කියලා දැන් ඔබතුමන්ලා කියනවා නේ. අපි එහෙම වෙන් කොට සලකන්නේ නැහැ. එහෙම වෙන් කොට සලකන්නේ නැතිව පොදු විධියට හිතන, පොදු විධියට දකින ජනතාවක් තමයි අපට ඕනෑ.

මෙතැනදී අපි දකින තව දේවල් තිබෙනවා. ඔබතුමන්ලාට කරන්න බැරි වෙච්ච තව දේවල් තිබෙනවා. මේ දමිළ ජනතාව, අපේ මලෙයහම් ජනතාව අධ්‍යාපනයෙන් ඉහළට එන්න ගත්තා. අපේ දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වන දමිළ දූ දරුවන්ගේ ප්‍රමාණය බොහොම අඩුයි. ඒකට එක හේතුවක් තමයි අධ්‍යාපනය නිසි පරිදි ලැබෙන්නේ නැති එක. ඒ සඳහා නිසි පහසුකම් ඒ දරුවන්ට නැහැ. එම නිසා තමයි දැන් ඒ දරුවන් වෙනුවෙන් smart classrooms වාගේ දේවල් අපි වෙන් කර තිබෙන්නේ. දැන් ඒ පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අපි කඩිනම් කර තිබෙනවා.

අනෙක් ප්‍රධාන කාරණය තමයි, මේ ප්‍රදේශවල ව්‍යාප්ත වන කසිප්පු භාවිතය. දැන් විෂ මත්ද්‍රව්‍ය නැති කරනවා වාගේම නැති කරන්න ඕනෑ අනෙක් දේ තමයි කසිප්පු. ඒ වෙනුවෙන් මහජන ආරක්ෂක කමිටු හරහා ජනතාවගේ සහභාගිත්වයෙන්, පොලීසියේ සහයෝගයත් අරන් කසිප්පු භාවිතය තුරන් කරන්න අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතිනවා. අපි දැන් කසිප්පු පාවිච්චිය ගොඩක් දුරට වතුවලින් ඈත් කර තිබෙනවා. අතීතයේ සිද්ධ වුණේ මොකක්ද? ඒ හැමදේටම දේශපාලන අනුග්‍රහය තිබුණා. ඒ කාලයේ මේකට දේශපාලන අනුග්‍රහය තිබුණා. කොහෙන් හරි අල්ලාගෙන ගියත් ඒ අල්ලාගෙන යන්නේ ඒවා නිෂ්පාදනය කරන අය නොවෙයි, ඒවා පාවිච්චි කරන අය. අන්න එවැනි තත්ත්වයක් තමයි අතීතයේ රටේ තිබුණේ. එම නිසා දැන් අපි වතුවලට ගියාම, මලෙයහම් ජනතාව හම්බ වෙන්න ගියාම, විශේෂයෙන්ම කසිප්පු ප්‍රශ්නය විසඳීම සම්බන්ධව කාන්තා පාර්ශ්වය අපට ස්තුතිවන්ත වෙනවා. මම කියන්නේ නැහැ, හැම වත්තකම සියයට 100ක්ම කසිප්පු පාවිච්චිය නැති කළා කියලා. හැබැයි, සැලකිය යුතු මට්ටමකින් ඒ දේ කරලා තිබෙනවා. ඒ නිසා ඔය කියන ඒවායේ සාධනීය පැත්ත අරගෙන, ඔබතුමන්ලාට කරන්න බැරි වෙච්ච දේ අපි කරනවා. අන්න ඒකට සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.07]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனக்கு முன்னர் பேசிய ஆளும் கட்சி MP அவர்களும் அதற்கு முன்னர் பேசிய நுவரெலியா மாவட்ட MP கௌரவ மஞ்ஜுள சுரவீர ஆரச்சி அவர்களும் சிறப்பாக உரையாற்றினார்கள். பிரச்சினையில்லை! நாங்கள் செய்வது என்னவென்றால், ஆளுகின்ற அரசாங்கத்தின் அவதானத்துக்கு, நாங்கள் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய மக்களின் பிரச்சினைகளைக் கொண்டுவருவதுதான். அவ்வளவுதான்!

அன்று JVPஇனர் எதிர்க்கட்சியில் இருந்தபொழுது, நாடு முழுவதும் சென்று ஆர்ப்பாட்டங்களையும் ஊர்வலங்களையும் கடையடைப்புகளையும் செய்து, பல சந்தர்ப்பங்களில் அப்போதிருந்த அரசாங்கங்களின் அவதானத்துக்கு மக்கள் சார்ந்த விஷயங்களைக் கொண்டுவந்தார்கள். அதேபோல் நாங்களும் இப்பொழுது எதிர்க்கட்சியில் இருந்துகொண்டு, மலையகத் தமிழ் மக்களின் - இந்திய வம்சாவளி தமிழ் மக்களின் - பிரச்சினைகளை ஆளும் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டு வருகிறோம். இந்தப் பாராளுமன்றம்தான் உயரிய சபை! நாங்கள் இங்கிருந்து இதைச் செய்யாவிட்டால், எங்கு செய்வது? இதைப் புரிந்துகொள்ள வேண்டும்.

தமிழ் முற்போக்குக் கூட்டணியினராகிய நாங்கள், எமது கட்சி ஆரம்பிக்கப்பட்ட காலத்திலிருந்து மலையகத்தில் தேங்காய் துருவவில்லை. பல வேலைகளைச் செய்திருக்கின்றோம். கௌரவ மஞ்ஜுள சுரவீர ஆரச்சி அவர்கள் பேசும்போது சொன்னார், "நீங்கள் விட்ட இடத்திலிருந்து ஆரம்பிப்போம்" என்று. அது நல்ல விஷயம்! அதைச் செய்ய வேண்டும். நாங்கள் முதன்முதலாக அமைச்சரவைத் தீர்மானத்தைக் கொண்டுவந்து, மலையக மக்களுக்கு ஏழு பேர்ச்சஸ் காணியில் தனி வீட்டுத் திட்டத்தை அறிமுகப்படுத்தி, பாராளுமன்றத்தில் சட்டத்தை நிறைவேற்றி, அரச கொள்கைப்படி அதை ஆரம்பித்தோம். ஏழு பேர்ச்சஸானது பத்து பேர்ச்சஸ் ஆகலாம்! கடந்த ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய ஆட்சிக் காலத்தில், கௌரவ ஜீவன் தொண்டமான் அவர்கள் அமைச்சராக இருந்தபோது, 7 பேர்ச்சஸ் என்பது 10 பேர்ச்சஸாக அதிகரிக்கப்பட்டது. நீங்கள் அதை 20 பேர்ச்சஸாக அதிகரியுங்கள்! அது நல்லதுதானே! வளர்ச்சியை ஆரம்பிக்க வேண்டுமல்லவா? நாங்கள் ஆரம்பித்த

[ගරු මනෝ ගනේසන් මහතා]

பயணத்தை முன்னோக்கிக் கொண்டு செல்லுமாறுதான் சொல்கின்றோம். அவ்வளவுதான்! அதில் நாங்கள் முரண்படத் தேவையில்லை.

அதுமட்டுமல்ல, நாங்கள் இந்திய அரசாங்கத்துடன் பேச்சுவார்த்தை நடத்தி, முதலில் 4,000 வீடுகளையும் பின்னர் 10,000 வீடுகளையும் கொண்டுவந்தோம். இப்பொழுது இந்த அரசாங்கத்தின் கையில் அவற்றை ஒப்படைத்து இருக்கின்றோம். அதில் 4,000 வீடுகளை நாங்கள் கட்டிமுடித்து விட்டோம். இன்னும் 10,000 வீடுகள் இருக்கின்றன. அவற்றை நீங்கள் கட்டுங்கள்! இன்று அந்த ஒவ்வொரு வீட்டினதும் பெறுமதி 28 இலட்சம் ரூபாய் - Rs. 28 lakhs, රුපියල් ලක්ෂ 28ක්. அதற்கான நிதி உதவியை நாங்கள் இந்தியாவிடமிருந்து பெற்றுக்கொடுத்து இருக்கிறோம்.

இங்கு பேசிய நுவரெலியா மாவட்ட MP ஒன்றைத் தெரிந்துகொள்ள வேண்டும். முன்னர் நுவரெலியா மாவட்டத்தில் பிரதேச சபைகள் ஒழுங்காக இருக்கவில்லை. அம்பகமுவ பிரதேச சபையின் சனத்தொகை 2 1/2 இலட்சமாக இருந்தது. அதேபோல், நுவரெலியா பிரதேச சபையின் சனத்தொகையும் 2 1/2 இலட்சமாக இருந்தது. அதை யாரும் கவனத்தில் எடுக்கவில்லை. நாங்கள் அந்த நிலைமையை மாற்றி, நுவரெலியா மாவட்டத்தில் ஒட்டுமொத்தமாக 10 பிரதேச சபைகளைக் கொண்டுவந்தோம். அந்தப் பிரதே சபைகள் மூலமான சேவை அதாவது, அடிப்படை அரசியல் அதிகார அலகு மூலமான சேவை மக்களைச் சென்றடைந்தது. அன்றைய பிரதேச சபைச் சட்டத்தின்படி, பிரதேச சபைகளுக்கு மக்கள் பிரதிநிதிகளைத் தெரிவுசெய்யலாம். ஆனால், அந்தப் பிரதிநிதிகள், வாக்களித்து தங்களைத் தெரிவுசெய்த மக்களுக்கு நிதி ஒதுக்க முடியாது. அந்தச் சட்ட ஏற்பாட்டை - பிரதேச சபைகள் சட்டத்தின் 33ஆம் பிரிவை - நாங்கள் மாற்றியமைத்தோம்.

மேலும், பிரதேச சபைகளுக்குச் சமமாக புதிய பிரதேச செயலகங்களையும் உருவாக்கி இருக்கிறோம். வர்த்தமானிப் பிரகடனம் செய்து, நுவரெலியா மாவட்டத்தில் புதிய பிரதேச செயலகங்களை உருவாக்குவதற்கான அடிப்படைகளைச் செய்திருக்கிறோம். அதேபோல, புதிய கிராம சேவகர் வலயங்களை உருவாக்குவதற்கும் வர்த்தமானிப் பிரகடனம் செய்திருக்கிறோம். அதை நாங்கள் ஆரம்பித்தோம். இவை உருவாக்கப்பட வேண்டும். அரசாங்கத்தின் சேவைகள் கீழ்மட்டத்திலுள்ள மக்களைச் சென்றடைவது, மாவட்ட செயலகம், பிரதேச செயலகம், கிராம சேவகர் வலயம் மூலமாகத்தான். இன்றும் நுவரெலியா மாவட்டத்தில், இலங்கையில் மிகவும் அதிகமான சனத்தொகையைக் கொண்ட கிராம சேவகர் வலயங்கள் இருக்கின்றன. அவற்றைப் பல பிரிவுகளாகப் பிரித்து, சிறிதாக்குங்கள்! நாட்டின் ஏனைய பகுதிகளில் இருப்பதுபோல, 500 குடும்பங்களுக்கு ஒரு கிராம சேவகர் வலயம் வீதம் நுவரெலியா மாவட்டத்திலும் உருவாக்குங்கள்! அவ்வாறு செய்தால்தான் அரசாங்கத்தின் சேவைகள் அந்த மக்களைச் சென்றடையும். அதேபோல், பிரதேச செயலகங்களும் உருவாக்கப்பட வேண்டும். ஏற்கனவே நாங்கள் முன்னெடுத்த பயணத்தின்மூலம் நுவரெலியா மாவட்டத்தில் அதிகமான பிரதேச சபைகளை உருவாக்கி இருக்கிறோம். பத்தாக இருக்கும் பிரதேச சபைகள் இருபதாக வேண்டும். அதேபோல், ஐந்தாக இருக்கும் பிரதேச செயலகங்களும் இருபதாக வேண்டும். அப்படிச் செய்தால்தான் அரசாங்கத்தின் சேவைகள் அப்பிரதேச மக்களைச் சென்றடையும். எனவே, அதனைச் செய்ய வேண்டும். அது நாங்கள் ஆரம்பித்த பயணம்!

மலையக மக்களைப் பொறுத்தவரையில், அவர்கள் மிகவும் பின்தங்கிய மக்கள்! உலக வங்கியின் அறிக்கையாக இருக்கலாம் அல்லது இலங்கை மத்திய வங்கியின் அறிக்கையாக இருக்கலாம். அவற்றை எடுத்துப் பார்த்தால் தெரியும், அந்த மக்கள் பின்தங்கிய மக்களாக இருக்கிறார்கள் என்பது. அதற்குக் காரணம், நாங்கள் அல்லர். கறுப்பு வரலாறு!

எல்லாப் பிரச்சினைகளையும் எங்களது தலையில் போடாதீர்கள்! நீங்கள் போட்டால், நாங்களும் போடலாம்! கடந்த காலத்தில் JVP ஐந்து வகுப்புகளை நடத்தியது. ஐந்தாவது வகுப்பு, 'இந்திய ஏகாதிபத்தியம்' பற்றியது. இந்திய ஏகாதிபத்தியத்தின் அடையாளமாக இலங்கையின் மலையக மக்களைச் சுட்டிக் காட்டியவர்கள் நீங்கள்! அந்தக் காரணத்தால்தான், அப்பாவிச் சிங்கள மக்களின் மனங்களில் மலையக மக்கள் தொடர்பில் தவறானதோர் அபிப்பிராயம் உருவாகியது. அதுதான் இன்று அந்த மக்களுக்கு காணி உரிமை கிடைப்பதற்குத் தடையாக இருக்கின்றது. அது பழைய வரலாறு! அதனை நான் கிளற விரும்பவில்லை. நீங்கள் சொன்னால், நாங்களும் சொல்லலாம். எனினும், சொல்ல விரும்பவில்லை. இதுதான் உண்மை; புரிந்து கொள்ளுங்கள்!

மலையக மக்கள் அரசியல், சமூக, பொருளாதார, கலாசார அடிப்படையில் பின்தங்கிய மக்கள் என்ற காரணத்தால்தான், அவர்களுக்கென விசேடமாக 'மலையக அதிகாரசபை' என்ற ஓர் அதிகாரசபையைக் கொண்டுவந்தோம். அது தொடர்பில் சட்டம் இருக்கிறது. அந்த அதிகாரசபைக்கு அதிகாரம் இருக்கின்றது. அதனை இன்னும் உங்களுக்குப் பயன்படுத்தத் தெரியவில்லை. அதற்கான நிதி ஒதுக்கீட்டில் ஓரவஞ்சனை காட்டுகின்றீர்கள். விசேடமாக மலையக மக்கள்மீது அக்கறைகாட்டி, அந்த அதிகாரசபையைப் பயன்படுத்தி, அம்மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துங்கள்! அதற்கான பொறிமுறை அதில் இருக்கின்றது என்பதை கௌரவ அமைச்சர் அவர்களுக்குக் கூறிவைக்க விரும்புகின்றேன். தயவுசெய்து, அதனைப் பயன்படுத்துங்கள்!

மேலும், தோட்ட நிருவாகத்தின் ஆளுகையின்கீழ் இருந்த மருத்துவமனைகளை தேசிய சுகாதார கட்டமைப்புக்குள் கொண்டுவந்து இருக்கின்றோம். அதுமட்டுமல்ல, பெருந்தோட்டப் பாடசாலைகளுக்கு அவசியமென்றால், அவற்றுக்கு அண்மித்து இருக்கின்ற இரண்டு ஏக்கர் நிலத்தைச் சுவீகரிக்க முடியுமென்ற அதிகாரத்தை நாங்கள் பெற்றுக்கொடுத்து இருக்கின்றோம். இவை எல்லாவற்றையும் நாங்கள் அமைச்சரவைத் தீர்மானம் மூலமாகவும், சட்டம் மூலமாகவும்தான் செய்திருக்கிறோம். வெறும் வாய்ப்பேச்சு அல்ல. எனவே, நாங்கள் 'சும்மா' இருக்கவில்லை; தேங்காய் துருவவில்லை; காரியங்களை ஆற்றி இருக்கின்றோம். எனினும், நாங்கள் ஆற்றிய காரியங்கள் போதாது. 200 வருட கால கொத்தடிமை முறைமையை 5 வருடத்துக்குள் முடிவுக்குக் கொண்டுவர முடியாது. ஆனாலும், நாங்கள் பயணத்தை ஆரம்பித்தோம். மலையக மறுமலர்ச்சிப் பயணத்தை ஆரம்பித்தது நாங்கள்தான். ஆகவே, தயவுசெய்து நாங்கள் ஒன்றுமே செய்யவில்லை என்று சமூகமயப்படுத்த முயற்சிக்காதீர்கள்.

වතුකරයේ, එහෙම නැත්නම් කඳුකරයේ ඉන්න පිරිස් හෝ පක්ෂ මොනවත් කළේ නැහැ කියන බොරුව සමාජගත කරන්න උත්සාහ කරන්න එපා. අපි වැඩ කරලා තිබෙනවා. අපි ආරම්භ කරපු වැඩ ඉස්සරහට කරගෙන යන්න. එච්චරයි අපි කියන්නේ. වෙන මොනවත් නැහැ. අපි රණ්ඩු කරගන්න ඕනෑ නැහැ, ගහගන්න ඕනෑ නැහැ, මරාගන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා

ආණ්ඩුවේ, අපි විපක්ෂයේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානයට කියන්නේ, ජනාධිපතිතුමා එක්ක මම සාකච්ඡා කරනවා. මීට ස්වල්ප වේලාවකට පෙර මහජන ආරක්ෂක අමාත්‍ය ආනන්ද විජේපාල මැතිතුමාගෙන් අපි ඉල්ලීම් කළා, වතුකරයේ ඇති වෙච්ච ප්‍රශ්න සම්බන්ධයෙන්. අපි ඒ ගැන සාකච්ඡා කළා.

கடந்த பாராளுமன்ற அமர்வு வாரத்தில் நானும், தம்பி ஜீவன் தொண்டமானும் இந்தப் பாராளுமன்றத்தில் கோரிக்கை ஒன்றை விடுத்தோம். மலையகப் பகுதியில் அதிகமாக வன்முறை நடப்பதாகச் சொல்லியிருந்தோம். எங்களுடைய கோரிக்கையை ஏற்றுக்கொண்டு, மாநாடு ஒன்றைக் கூட்டுவதாக அமைச்சர் அவர்கள் சொன்னார். இன்று அந்த மாநாடு கூட்டப்பட்டது. அங்கிருந்துதான் நான் இங்கே வந்தேன். அதில் நாங்கள் பேசியிருக்கிறோம். அந்த மாநாட்டில் எடுக்கப்பட்ட முடிவு சிறப்பாக இருக்கிறது; நன்றாக இருக்கிறது. பரவாயில்லை! பெருந்தோட்டத் தொழிலாளர் களாக இருக்கலாம் அல்லது அங்கு வாழும் எவராகவும் இருக்கலாம், எந்தப் பெருந்தோட்ட நிறுவனமும் மலையக மக்கள்மீது கைவைக்க முடியாது என்ற தீர்மானத்துக்கு நாங்கள் வந்திருக்கிறோம். எதுவாக இருந்தாலும், பொலிஸில் புகாரிட வேண்டும். பொலிஸாரே சட்டத்தை நிலைநாட்ட வேண்டுமே தவிர, எவரும் சட்டத்தைக் கையில் எடுத்துக்கொண்டு செயற்பட முடியாதென்ற தீர்மானத்துக்கு நாங்கள் வந்திருக்கிறோம். அது நல்ல விஷயம்! நாங்கள்தான் அதனை அரசாங்கத்தின் அவதானத்துக்குக் கொண்டுவந்தோம். அரசாங்கத்தின் அவதானத்துக்குக் கொண்டுவருவது என்பது, அரசாங்கத்தைக் குறைசொல்வதோ, விமர்சிப்பதோ அல்ல. குறைசொல்வதையும் விமர்சிப்பதையும் வேறோர் இடத்தில் வைத்துக் கொள்வோம். பிரச்சினையில்லை! ஆனால், நாங்கள் இங்கு அரசாங்கத்திடம் சொல்ல வேண்டும். நாங்கள் எங்களது கடமையைச் செய்கின்றோம்.

பெருந்தோட்டத்துறைப் பிரதி அமைச்சர் தம்பி சுந்தரலிங்கம் பிரதீப் அவர்கள் இங்கு இருக்கிறார். சற்றுமுன்னர் நடந்த அந்த மாநாட்டுக்கு அவரும் வந்திருந்தார். அதேபோல, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் கௌரவ ஆனந்த விஜேபால அவர்களும் வந்திருந்தார். நான் சொல்லும்பொழுதே, அவர் சபைக்குள் வருகிறார். நல்ல விஷயம்! அம்மாநாட்டில் நானும் இருந்தேன்; பழனி திகாம்பரமும் இருந்தார்; இராதாகிருஷ்ணனும் இருந்தார்; தம்பி ஜீவன் தொண்டமானும் இருந்தார்; ஆளும் கட்சி MPsஉம் இருந்தார்கள். அம்மாநாட்டுக்கு பெருந்தோட்ட நிறுவனத்தினரும் வந்திருந்தார்கள். மேலும், பொலிஸ்மா அதிபர் உட்பட சப்ரகமுவ, ஊவா, மேல், மத்திய, தென் மாகாணங்களைச் சேர்ந்த DIGsஉம் வந்திருந்தார்கள். எல்லோரும் பேசி, ஒரு முடிவுக்கு வந்திருக்கிறோம். "எந்தக் காரணம் கொண்டும் யாரும் சட்டத்தைக் கையிலெடுக்க முடியாது. சட்டத்தை அமுல்படுத்த வேண்டிய பொறுப்பும் கடப்பாடும் பொலிஸாருக்கு இருக்கின்றது. அவர்கள் அதனைச் செய்வார்கள். யாரும் எவர்மீதும் கைவைக்க முடியாது" என்று கௌரவ அமைச்சர் அவர்கள் தெளிவாகச் சொன்னார். இனிமேல் மலையகத்தில் குறிப்பாக பெருந்தோட்டப் பகுதியில் வன்முறை நிகழாதென்ற நம்பிக்கை ஏற்பட்டு இருக்கின்றது. நல்ல விஷயம்! அது எப்படி வந்தது? நாங்கள் இதனை அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவந்ததனால்தான்.

இது அரசாங்கமும் எதிர்க்கட்சியும் சேர்ந்து செயற்பட வேண்டிய காலகட்டம். நாங்கள் சேர்ந்து செயற்படுவோம். ஏனென்றால், எமது மக்கள் மிகவும் பின்தங்கிய மக்கள்; துன்புறும் மக்கள்; வளர்ச்சி குன்றிய மக்கள்! அவர்கள் வளர்ச்சிய குன்றிய மக்களாக இருப்பதற்குக் காரணம் வேறொன்றுமல்ல, கறுப்பு வரலாறுதான். 200 வருடங்களில், முதல் 125 வருடங்கள் வெள்ளையார்கள் ஆண்டார்கள். அடுத்த 75 வருடங்கள் கறுப்பர்கள் ஆண்டார்கள். அவ்வளவுதான். எங்களுடைய மக்கள் பின்தங்கிய மக்கள்தான். நாங்கள் அரசாங்கத்தில் இருந்தாலும், எதிர்க்கட்சியில் இருந்தாலும் சிறுபான்மை மக்கள்தான். அதனை அடிப்படையாகக் கொண்டுதான் இன்று தமிழர் முற்போக்குக் கூட்டணியினரால் இந்த ஒத்திவைப்புப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கின்றது. இதனை அரசாங்கம் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ பிரதி அமைச்சர் சுந்தரலிங்கம் பிரதீப் அவர்கள்! உங்களுக்கு ஒன்பது நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.17]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்கள் விடுதலை முன்னணி நடத்திய வகுப்புகளில், தோட்டத் தொழிலாளர்களுக்கு எதிரான ஒரு வகுப்பும் இருந்ததாக கௌரவ மனோ கணேசன் அவர்கள் கூறினார். அவ்வாறெனில், இந்தப் பாராளுமன்றத்தில் நான் இருக்க முடியாது. அன்று மலையகத்தில் படித்த இளைஞர்கள் அதிகமானோர் மக்கள் விடுதலை முன்னணி முன்னெடுத்த சமூகப் புரட்சியில் இணைந்து கொண்டார்கள்; அந்தச் சமூக மாற்றத்துக்காக உயிர்த் தியாகம் செய்தார்கள். அவ்வாறு உயிர்த் தியாகம் செய்தவர்களில் எனது தந்தையும் ஒருவர் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். எனவே, முழுப் பூசணிக்காயை சோற்றுக்குள் மறைக்கும் செயற்பாட்டை நாங்கள் கண்டிக்கின்றோம்.

கடந்த காலங்களில் இவர்கள் மலையகத்தில் அபிவிருத்திப் பணிகளை மேற்கொண்டு இருந்தாலும், இன்று அந்தப் பணிகளைத் தொடர வேண்டிய கடமையும் பொறுப்பும் எங்களுக்கு இருக்கின்றது. இந்திய அரசாங்கம் எமது மலையக மக்களுக்காகக் கொடுத்த வீட்டுத்திட்டத்தை இவர்கள் முன்னெடுத்தாலும்கூட, அதில் பாரிய குறைபாடுகள் இருக்கின்றன. இவர்களின் காலத்தில் 1,300 வீடுகள் கட்டுவதற்கு நடவடிக்கை எடுத்திருந்தும்கூட, வெறுமனே 25 வீடுகள் மாத்திரம்தான் பயனாளிகளுக்குக் கொடுக்கப்பட்டன. மிகுதி வீடுகள் எல்லாம் கட்டப்பட்டு, பாதியில் கைவிடப்பட்ட நிலையிலே இருந்தன. எமது அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்றவுடன், கிட்டத்தட்ட 600 கோடி ரூபாயை ஒதுக்கி, அந்த வீடுகளைக் கட்டி, அந்த மக்களிடம் கையளிப்பதற்கு நடவடிக்கை எடுத்து வருகின்றது. அது மட்டுமல்ல, இன்று பெருந்தோட்டப் பகுதிகளிலுள்ள பாடசாலைகளுக்கு இரண்டு ஏக்கர் வீதம் காணியை வழங்குவதற்கான நடவடிக்கையை நாங்கள் எடுத்து வருகிறோம். அதேபோல, தற்போது ஆலயங்கள் இருக்கின்ற நிலங்களை அந்த ஆலயங்களுக்கே வழங்குவதற்கான ஆரம்பக்கட்ட நடவடிக்கையையும் நாங்கள் எடுத்து வருகின்றோம். சுமார் 76 வருடங்களாக மலையக மக்களுக்கு

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

இழைக்கப்பட்ட அநீதிகளை வெறுமனே ஒன்றரை வருடத்தில் நிவர்த்தி செய்ய வேண்டுமென எதிர்பார்ப்பது வேடிக்கை யானது.

மலையக மக்கள் இன்று அரசியல் ரீதியாகப் புதிய கலாசார மாற்றத்தைக் கொண்டுவந்து இருக்கிறார்கள். ஆரம்பத்திலே மலையக மக்கள் மலையகத் தலைவர்களாலும் மலையக அரசியல்வாதிகளாலும் துன்பத்துக்கு உட்படுத்தப்பட்ட பல்வேறுபட்ட சந்தர்ப்பங்கள் காணப்படுகின்றன. இன்று படித்த இளைஞர், யுவதிகள், புத்திஜீவிகள் தமக்கென்று புதியதோர் அரசியல் கலாசாரத்தை உருவாக்கி இருக்கிறார்கள். அவ்வாறு ஏற்பட்ட மாற்றத்தை மீண்டும் மலையக மக்கள் விட்டுக் கொடுப்பார்கள் என்று ஒருபோதும் நான் நம்பவில்லை. மலையக மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்குக் காத்திரமானதொரு முன்னெடுப்பை எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. அண்மைக் காலமாக மலையகப் பகுதிகளிலே பெருந்தோட்டக் கம்பனிகளுடைய அராஜகம் காரணமாகத் தோட்டத் தொழிலாளர்கள் தாக்கப்பட்டு வருகிறார்கள் என்பது உங்களுக்குத் தெரியும். இன்றைய தினம் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் தலைமையில் விசேட கூட்டமொன்று நடைபெற்றது. அந்தக் கூட்டத்தில் பெருந்தோட்டக் கம்பனிகளின் அராஜகத்தை ஒழிப்பதற்குப் பல்வேறுபட்ட தீர்மானங்களை நாங்கள் எடுத்தோம்.

மலையக மக்கள் இந்த நாட்டில் ஏனைய இனங்களுக்குச் சமமாக வாழக்கூடிய மக்கள்! ஆரம்பக் காலகட்டத்தில் அவர்கள் "වතු දෙමළ" – "தோட்ட மக்கள்" - என்றுதான் அழைக்கப்பட்டார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிக்கு வந்தவுடன்தான், "මලෛයහම් ජනතාව" - "மலையகத் தமிழ் மக்கள்" என்ற பதத்தைப் பிரயோகித்து அந்த மக்களுக்கு ஒரு கௌரவத்தை வழங்கியிருக்கிறோம். தேசிய மக்கள் சக்தி அரசாங்கம் மலையக மக்களுக்கு வழங்கிய மிகப்பெரிய ஒரு கௌரவமாக அதனை நாங்கள் எண்ணுகின்றோம். அது மாத்திரமல்ல, மலையக மக்களுடைய கல்வியாக இருக்கலாம், சுகாதாரமாக இருக்கலாம், பொருளாதாரமாக இருக்கலாம்! எல்லாத் துறைகளிலும் அந்த மக்களை வளர்ச்சிப் பாதையிலே கொண்டுசெல்வதற்கான தார்மீகப் பொறுப்பும் கடமையும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது.

மலையக மக்கள் இந்த அரசாங்கத்தின்மீது ஆணித்தரமான நம்பிக்கையை வைத்திருக்கிறார்கள். அதன் ஒரு பிரதிபலிப்புத்தான் இம்முறை நுவரெலியா மாவட்டத்தில் நடைபெற்ற மே தினக் கூட்டத்தில் வரலாறு காணாத அளவிலான மலையக மக்கள் கலந்துகொண்டமை. மலையக மக்கள் தேசிய மக்கள் சக்தியுடன் இணைந்துகொண்டிருப்பது இன்று நாட்டு மக்கள் எல்லோருக்கும் வெளிச்சமாகத் தெரிகிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஏனைய பிரதேசங்களில் முன்னெடுக்கின்ற அபிவிருத்திப் பணிகளைப் போன்று குறையின்றி மலையகப் பகுதிகளுக்கும் நாங்கள் முன்னெடுத்துச் செல்கின்றோம்.

விசேடமாக, மலையக மக்களுடைய காணிப் பிரச்சினைக்கு நாங்கள் தீர்வை மேற்கொள்ள இருக்கின்றோம். தற்பொழுது அது தொடர்பாக ஆரம்பக்கட்டப் பேச்சுவார்த்தைகளை நாங்கள் முன்னெடுத்திருக்கிறோம். மலையகத்தில் காணப் படுகின்ற பல்வேறுபட்ட பிரச்சினைகளுக்கு ஆரம்பப் புள்ளியாக இருப்பது காணி உரிமைப் பிரச்சினையாகும். மலையக மக்கள் நிம்மதியான ஒரு வாழ்க்கையை வாழ்வதற்கு, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் அவர்களுக்குக் காணி உரிமை நிச்சயமாக வழங்கப்படும் என்பதைக் கூறிக் கொள்கின்றேன். எமது அரசாங்கத்தால் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வை வழங்க முடியாதென்று அன்று கூறினார்கள். ஆனால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வை வழங்கி அம்மக்களுடைய பொருளாதாரத்தை முன்னேற்றி இருக்கின்றது.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

"මලෛයහම් ජනතාව" කියන එක ගැන පොදු එකඟතාවක් තිබෙන නිසා දැන් ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ තිබෙන අච්චු පොත්වලට, විශ්වවිද්‍යාල coursesවලට ඒ නම ඇතුළු වෙලා තිබෙනවාද, නැත්නම් ඔබතුමන්ලා ඒක ඇතුළු කරන්න යෝජනා කරනවාද?

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

ඒ සම්බන්ධයෙන් අදත් අපි සාකච්ඡා කළා. අපි නීත්‍යානුකූලව ඒ නම ඇතුළු කරන්න ඉදිරියට ක්‍රියාමාර්ග ගන්නවා.

மலையக மக்களுடைய சம்பள உயர்வு தொடர்பாக எங்களுடைய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் முன்மொழிவைச் செய்தபோது, ஐக்கிய மக்கள் சக்தியைச் சேர்ந்த பெண் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் அன்று அதற்கு எதிராக முறைப்பாடு செய்திருந்தார். அன்று அந்தக் கட்சிக்கு எதிராக கூட்டணிக் கட்சியினர் ஏன் குரல் எழுப்பவில்லை? அன்று அந்தக் கட்சி செய்தது துரோகம்! எனவே, எதிர்க்கட்சி, ஆளும்கட்சி என்று எமக்குள்ள முரண்பாடுகளை விடுத்து, தூய இதயத்தோடு ஒன்றிணைந்து, ஒரு குரலோடு நாங்கள் பயணிக்கும் பட்சத்தில் மலையக மக்களுக்கான நிலையான அபிவிருத்தியைப் பெற்றுக்கொடுக்கலாம்.

எதிர்க்கட்சியினர் என்ற அடிப்படையில் எங்களுக்கு நீங்கள் ஆலோசனை வழங்கலாம். நாங்கள் தவறு செய்யும் பட்சத்தில், நீங்கள் சரியான முறையில் அதனைச் சுட்டிக் காட்டலாம். நாங்கள் தவறு செய்திருந்தால் அதனை ஏற்றுக்கொள்வதற்கு என்றும் பின்நிற்கப் போவதில்லை என்பதை நாங்கள் கூறிக்கொள்ள விரும்புகின்றோம். போலியான செய்திகளைப் பரப்பி, மக்கள் விடுதலை முன்னணிக்கும் தேசிய மக்கள் சக்திக்கும் இடையில் பிளவு ஏற்பட்டுள்ளதாகவும், இன்று எமது அரசாங்கத்தில் பல்வேறு

பிழைகள் நடைபெறுவதாகவும் சமூகமயப்படுத்தப் பார்க்கின்றார்கள். இந்த நாட்டிலுள்ள மக்கள் உண்மையை உணர்ந்தவர்கள். அதனால்தான், 76 வருட சாபக்கேட்டை அவர்கள் முடிவுக்குக் கொண்டுவந்து இருக்கின்றார்கள். எனவே, மீண்டும் பொய்களைக் கூறிக்கொண்டு, இனவாதத்தைப் பேசிக்கொண்டு இந்த ஆட்சியைக் கவிழ்க்க முடியுமென்றால், அது பகல் கனவாகத்தான் இருக்குமென நான் நினைக்கின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கம் நிச்சயமாக மலையக மக்களின் காணியுரிமை, கல்வி, சுகாதாரம் போன்ற பல்வேறு பிரச்சினைகளுக்குத் தீர்வைப் பெற்றுக் கொடுக்கும் என்பதைக் கூறிக் கொள்கின்றேன்.

இந்த நாட்டில் குறிப்பாக, மலையகப் பகுதிகளில் தமிழ் மொழிமூலமாக நிருவாகத்தை மேற்கொள்வதில் சில குறைபாடுகள் இருக்கின்றன. எதிர்வரும் காலங்களில் பொலிஸ் நிலையங்களுக்கு தமிழ் மொழி பேசும் பொலிஸ் உத்தியோகத்தர்களை நியமனம் செய்து, அங்குள்ள மக்கள் தமிழ் மொழி மூலமாக தமது முறைப்பாட்டைச் செய்வதற்கும் நாங்கள் நடவடிக்கைகளை எடுத்து வருகின்றோம் என்பதைக் கூறிக்கொண்டு, இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்காக நன்றிகூறி விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.27]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)

(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையக மக்கள் தொடர்பான இந்த ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மலையகத்தில் வாழும் மக்களுக்கு எங்களுடைய நன்றிகளை நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம். ஏனென்றால், அவர்கள் இந்த நாட்டுக்காக உழைத்தவர்கள். விசேடமாக, நான் இந்த இடத்தில் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். வரலாற்று ரீதியாகப் பார்க்கின்றபோது, மலையக மக்கள் பல்வேறு இன்னல்களையும் நெருக்கடிகளையும் சந்தித்தவர்கள். ஒருநாள், இரண்டு நாளல்ல, 200 வருடங்கள்! ஒரு தலைமுறை, இரண்டு தலைமுறை அல்ல, ஏழு தலைமுறைகளாக இந்த மண்ணுக்காகத் தங்களுடைய இரத்தத்தையும் வியர்வையையும் சிந்தியவர்கள்; தங்களுடைய உயிரைப் பணயமாக வைத்து உழைத்தவர்கள்.

மலையக மக்கள் இந்தியாவிலிருந்து படகுகள்மூலம் அழைத்து வரப்பட்டபோது, தலைமன்னாரில் இறக்கி விடப்பட்டதாகவும், அவர்கள் நடைபயணமாகவே மத்திய மலைநாட்டுக்கு அழைத்து வரப்பட்டதாகவும், அவ்வாறு மலைமுகட்டை நோக்கி வந்த அவர்களில் பல நூற்றுக் கணக்கானவர்கள் வழியிலே செத்து மடிந்ததாகவும் வரலாறு கூறுகின்றது. அப்படியானால், உழைப்பின் மூலமாக மாத்திரமல்ல, இந்த நாட்டில் காலடி வைத்தபோதே எல்லா இடங்களிலும் அவர்களது உடல்கள் உரமாக்கப்பட்டு இருக்கிறன. அதுமாத்திரமல்ல, அன்றைய காலகட்டத்தில் இந்தியாவிலிருந்து வருகின்றபோது, ‘ பாக்கியலட்சுமி’ என்ற கப்பல் கவிழ்ந்து, நூற்றுக் கணக்கானவர்கள் இறந்து போனதை கடலுக்கு - சமுத்திரத்துக்கு - வாய் இருந்தால் அதுவும் சொல்லும். அவ்வாறான ஒரு வரலாற்றைப் பின்னணியாகக் கொண்டவர்கள்தான் நாங்கள்.

எங்களுக்குச் சுதந்திரம் கிடைத்ததாகக் கூறப்பட்டாலும், அந்த சுதந்திரத்தைக்கூட பூரணமாக அனுபவிக்க முடியாத மக்களாக அவர்கள் ஆக்கப்பட்டார்கள். அந்த வரலாற்றை மாற்றியமைப்பதாகக் கூறிக்கொண்டு அன்றைய காலகட்டங்களில் ஆட்சிபீடம் ஏறியவர்களால், அந்த நிலைமையை மாற்ற முடியவில்லை. எங்களுடைய உறவுகள் இந்தியாவில் இருந்தார்கள். 1948இல் எங்களுடைய பிரஜாவுரிமை பறிக்கப்பட்டது. அதன் காரணமாக அவர்களுடைய பிள்ளைகள் இலங்கையில் நாடற்றவர்களாக்கப்பட்டு, அந்தரமான நிலைக்குத் தள்ளப்பட்டார்கள் என்பது எல்லோருக்குமே நன்றாகத் தெரியும். எங்களுடைய பெற்றோருடைய, பாட்டிமாருடைய கதறல்கள், அழுகைகள், முனகல்களை Nanuoya Railway Station கேட்டிருக்கும்! அந்த அளவுக்கு வேதனைகள், வடுக்கள் நிறைந்ததுதான் எங்களுடைய மலையக மக்களின் வரலாறு! அத்தகைய வரலாற்று ரீதியான வடுக்களைச் சுமந்தவர்கள் நாங்கள்.

இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் சிறிமா - சாஸ்திரி உடன்படிக்கை செய்து கொள்ளப்பட்டபொழுது, நாடற்றவர்கள் என ஒருசிலர் ஒதுக்கப்பட்டார்கள். அந்த நாடற்றவர் பரம்பரையில் நானும் ஒருவன். அதில் எங்களது பெற்றோரும் அடங்குவர். எங்களுக்கு இந்தியாவும் கிடையாது; இலங்கையும் கிடையாது. நாங்கள் நாடற்றவர்களாக ஆக்கப்பட்டிருந்தோம். அந்த வேதனை எங்களுக்கு இருந்தது. 2007-2009ஆம் ஆண்டு காலப்பகுதியில் நானும் தற்போது சபை முதல்வராக இருக்கின்ற எங்களுடைய கௌரவ பிமல் ரத்நாயக்க அவர்களும் இந்தியாவுக்குச் சென்று, அங்குள்ள அகதி முகாம்களிலுள்ள மக்களைச் சந்தித்திருந்தோம். அங்கு அகதி முகாம்களில் வாழ்ந்த மக்கள் எங்களிடம், “ஐயா! நாங்கள் இந்திய பிரஜைகளும் அல்லர், இலங்கை பிரஜைகளும் அல்லர். எங்களுக்கு வேறெதுவும் வேண்டியதில்லை; எங்களுக்கு இலங்கையில் வாழ்வதற்கான பிரஜாவுரிமையைப் பெற்றுத் தாருங்கள்!” என்று வேண்டிக் கொண்டார்கள். அதற்கேற்ப நாங்கள் இலங்கைக்கு வந்ததன் பிறகு இந்தப் பாராளுமன்றத்தில் அதற்கான ஒரு தெரிகுழுவை அமைத்தோம். அந்தத் தெரிகுழுவுக்கு அப்போது நான்தான் தவிசாளராக இருந்தேன். அந்தத் தெரிகுழுவின் மூலமாக இந்த நாட்டில் நாடற்றவர்கள் அல்லது பிரஜாவுரிமை அற்றவர்கள் அல்லது குடியுரிமை இல்லாதவர்கள் என்ற சொல்லுக்கே முற்றுப்புள்ளி வைத்தவர்கள் வேறு யாரும் அல்லர், அன்றைய காலகட்டத்தில் மக்கள் விடுதலை முன்னணியினராகிய நாங்களேயாவோம்.

அன்றைய காலகட்டங்களில் எங்கள்மீது அபாண்டமான குற்றச்சாட்டுகளைச் சுமத்தினார்கள். இந்திய வம்சாவளி மக்கள் இலங்கையில் தங்கியிருப்பதும் இந்தியாவுக்குத் திரும்புவதும் அவரவர் விருப்பத்துக்கு ஏற்ப அமைய வேண்டும் என்று எங்களுடைய கொள்கைப் பிரகடனம் மிகத் தெளிவாகச் சொல்கின்றது. அவ்வாறு அவர்கள் இந்தியாவுக்குச் செல்ல விரும்பினால், அவர்களுக்குக் கிடைக்க வேண்டிய அனைத்து உரிமைகளையும் பெற்றுக்கொடுத்து, அவர்களைக் கௌரவமான பிரஜைகளாக அனுப்பி வைப்பதே எங்களுடைய நோக்கமாகும். 1989ஆம் ஆண்டை எடுத்துக்கொண்டாலும் சரி, 1971ஆம் ஆண்டை எடுத்துக் கொண்டாலும் சரி, எந்தவொரு மலையகக் குடிமகனாவது, மலையகத்தவன்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

அல்லது தமிழன் என்ற காரணத்தால் இனவாத அடிப்படையில் அவனுடைய நிழலுக்குக்கூட தீங்கு விளைவிக்காத கட்சிதான் எங்களுடைய கட்சி என்பது கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கு நன்றாகத் தெரியும்.

கௌரவ தொண்டமான் அவர்களே, இன்றைக்கு இந்தப் பிரேரணையைக் கொண்டுவந்ததன் பின்னர் நான் சிறிது யோசித்துப் பார்த்தேன். நீங்கள் எதைச் சொன்னாலும்கூட, எதை முன்வைத்தாலும்கூட, பதுளை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ கிட்ணன் செல்வராஜ் அவர்கள் இன்றைக்கும் மலையகத்தில் 'லயன்' அறையில்தான் வாழ்ந்துகொண்டு இருக்கின்றார். எங்களுடைய கௌரவ உறுப்பினர் கலைச்செல்வி அவர்கள் இன்றைக்கும் லயத்தில்தான் வாழ்கின்றார். இன்னுமொரு பாராளுமன்ற உறுப்பினர் இருக்கின்றார். அவரும் ஹப்புத்தளையில் 'லயன்' அறையில்தான் வாழ்கின்றார். எனது பெற்றோர் இப்போது உயிருடன் இல்லை. இருந்தபோதும், எனது பிரதான வீடு மலையக லயத்தில்தான் உள்ளது.

லயன்களில் வாழுகின்ற மக்களுக்கு குளிர் என்றால் என்ன? வேதனை என்றால் என்ன? துன்பம் என்றால் என்ன? பசி என்றால் என்ன? அனைத்தும் நன்றாகத் தெரியும். அமைச்சர்களாக, பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கின்ற எங்களுக்கு நிச்சயமாக ஒரு கடப்பாடு இருக்கின்றது. 200 வருட சாபக்கேடாக, மாடாய் உழைத்து ஓடாய்த் தேய்ந்து, கடைசியில் மாங்கொட்டைகளைப் போல சூப்பி எறியப்பட்ட எங்களது மக்களுடைய வாழ்க்கையில் மறுமலர்ச்சியை ஏற்படுத்த வேண்டும். அவர்களைப் புதிய சகாப்தத்துக்கு அழைத்துச் செல்ல வேண்டும். நவீன தொழில்மயத்தை மலையகத்துக்குக் கொண்டுவர வேண்டும் என்பதில் மாற்றுக் கருத்துக் கிடையாது. எங்களுடைய மலையக மக்களுடைய வாழ்க்கையை மேம்படுத்துவதற்குத் தேவையான சகலவிதமான செயற்பாடுகளையும் முன்னெடுத்து அவர்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவோம். கல்விப் பிரச்சினையாக இருக்கலாம், சுகாதாரப் பிரச்சினையாக இருக்கலாம், வீட்டுப் பிரச்சினையாக இருக்கலாம், குடிநீர்ப் பிரச்சினையாக இருக்கலாம், வீதிப் பிரச்சினையாக இருக்கலாம், அனைத்துப் பிரச்சினைகள் தொடர்பாகவும் கூடுதலான கரிசனை காட்டுகின்ற அரசாங்கமாக எங்களுடைய அரசாங்கம் செயற்படும் என்பதைக் கூறிக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள்! உங்களுக்கு 4 நிமிடங்கள் உண்டு.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[பி.ப. 4.36]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் கொண்டுவந்த ஒத்திவைப்பு வேளைப் பிரேரணையில் பேசுவதற்கு வாய்ப்பு அளித்தமைக்கு நன்றி கூறுகின்றேன். மலையகத் தமிழ் மக்கள் என்ற சொற்பதங்கள் எனக்குப் பிடித்திருக்கிறது. அந்த மக்கள் மலை சார்ந்த இடங்களில் வாழ்கின்றபடியால் 'மலையக மக்கள்' என்று அழைக்கப்படுகிறார்கள். அவர்களைத் தேசிய இனமாக நாங்கள் அங்கீகரித்து இருக்கின்றோம். எங்களுடைய தலைவர் சிறீ சபாரத்தினம் அவர்கள் மலையக மக்களுடைய உரிமை சம்பந்தமாகப் பேசி இருக்கிறார். மலையக மக்களுடைய சகல பிரச்சினைகளுக்கும் எல்லா விதத்திலும் குரல்கொடுக்க வேண்டும் என்ற நிலைப்பாட்டில் நாங்கள் இருக்கிறோம். மலையக மக்களுக்காக எங்களுடைய ஆளுமையைச் செலுத்துவோம்; குரலை உயர்த்துவோம். அவர்களுடைய போராட்டங்களை ஆதரிக்கும் செயற்பாட்டில் நாங்கள் இருக்கிறோம்.

நான் பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற காலத்திலிருந்து மலையக மக்களுடைய காணிப் பிரச்சினை, பொதுப் பிரச்சினை மற்றும் 'லயன்' வாழ்க்கை முறை பற்றி பேசி வருகின்றேன். அங்கு நான் சென்று பார்க்கின்ற சந்தர்ப்பங்களில், ஒரு சமூகம் இப்படியான சூழ்நிலையில் வாழுகிறது என்று எண்ணி மிகவும் வேதனைப்படுவதுண்டு. என்னைப் பொறுத்தமட்டிலே, இன்றைக்கும் மலையக மக்களுடைய செயற்பாடுகள், நடவடிக்கைகள் ஆளுமை மிக்கவை என்றே சொல்ல முடியும். மலையகத்தில் இருந்து எங்களுடைய வடக்கு, கிழக்கின் எல்லைக் கிராமங்களிலே வந்து குடியேறி, இன்றைக்கு அந்தப் பிரதேசங்களைக் காக்கின்ற காவல் வீரர்களாக அவர்கள் இருந்துகொண்டு இருக்கிறார்கள். அங்கேயும் காணிப் பிரச்சினை அவர்களுக்கு இருக்கின்றது. வவுனியா, கிளிநொச்சி போன்ற இடங்களில் காவல் அரண்களை அமைத்துக் காவலர்களாக இன்றைக்கும் அந்த மக்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அப்படி அங்கே அவர்கள் வரவில்லை என்றால், எங்களுடைய பிரதேசம் இன்றைக்கு சிங்களப் பெரும்பான்மை இனத்தினுடைய ஆட்சிக்கு உட்படுத்தப்பட்டிருக்கும். எனக்கு முன்னர் பேசிய கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள், மலையக மக்கள் எப்படி தங்களுடைய வாழ்வியல் செயற்பாடுகளைச் செய்கிறார்கள் என்பதை அனுபவ ரீதியாகச் சொன்னார். இந்த நிலையிலே, ஏனைய பிரதேசங்களிலுள்ள மக்களைக் கவனிப்பதைவிட கூடுதலாக மலையக மக்கள் விடயத்தில் உங்களுடைய செயற்பாடுகளைக் காட்ட வேண்டுமென நான் இந்த அரசாங்கத்திடம் விநயமாகக் கேட்கின்றேன்.

கடந்த காலங்களில் மலையக அரசியல் கட்சிகள், அரசாங்கத்தோடு இணைந்து செயற்பட்டால்தான் அந்த மக்களை மேம்படுத்த முடியுமென எண்ணிச் செயற்பட்டன.

அவர்களில் பலர் அமைச்சர்களாகவும் இருந்திருக்கின்றார்கள். இந்தப் புதிய அரசாங்கம் சாமானிய மக்களோடு பழகுகின்ற ஓர் அரசாங்கமாக இருக்கின்றது. அந்த வகையில், மலையக மக்களுடைய அனைத்து விடயங்களிலும் கவனம் செலுத்த வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலேயே அவர்களுடைய 'லயன்' வாழ்க்கை முறையை ஏற்றுக்கொள்ள முடியாது. ஒரு வீட்டுக்குள் 4 குடும்பங்கள் வாழ்ந்தால் அவர்கள் எப்படிக் குடும்பம் நடத்த முடியும்? இளம் வயதினர் கலியாணம் கட்டினால் எப்படிக் குடும்பம் நடத்த முடியும்? அப்படியான நிலைமையில் மாற்றம் ஏற்பட வேண்டும் என்பதற்காக எல்லோரும் உழைத்திருக்கிறார்கள். எனவே, இந்த அரசாங்கமும் அந்த விடயத்தில் கவனம் எடுக்க வேண்டும். அந்த விடயத்திலே நாங்களும் உங்களுக்கு ஆதரவு தரத் தயாராக இருக்கின்றோம். என்ன விடயம் என்றாலும் மலையக மக்களுக்கான விடயங்களிலே எங்களுடைய கரங்கள் உங்களோடு சேர்ந்திருக்கும். அவர்களுக்குக் காணி கொடுப்பது, அவர்களுடைய 'லயன்' வாழ்க்கை முறையை ஒழிப்பது, வறுமையில் இருந்து அவர்களை மீட்டெடுப்பது போன்ற நல்ல விடயங்களுக்கு நாங்கள் ஆதரவு வழங்குவோம்.

என்னைப் பொறுத்தமட்டில், இன்றைக்கு அந்தத் தேயிலைத் தோட்டங்களுக்கு இடப்படுகின்ற உரம் எதுவென்று பார்க்கின்றபோது, அது அந்த மக்களுடைய உடல்களாகத்தான் இருக்குமே ஒழிய, உரம் போட்டு அவை வளர்ந்ததான வரலாற்றைச் சொல்ல முடியாது. மிகவும் கஷ்டத்துக்கு மத்தியில் அவர்கள் வேலையாட்களாக எமது நாட்டுக்கு அழைத்து வரப்பட்டார்கள். இந்த நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்துகின்ற ஒரு சக்தியாக இப்போது அவர்கள் மாற்றப்பட்டிருக்கிறார்கள். இந்த நாட்டைத் தூக்கி நிறுத்துகின்ற பொறுப்பைக் கொண்டிருக்கின்ற அவர்களுடைய அடிப்படைத் தேவைகள் மற்றும் அவர்களுடைய அடிப்படை உரிமைகள் மறுக்கப்படுகின்ற அவல நிலையை ஒருபோதும் பார்த்துக்கொண்டு இருக்க முடியாது; அதை ஏற்றுக்கொள்ளவும் முடியாது. அந்த வகையிலே, எங்களுடைய மலையக சமூகத்தினுடைய, அந்தத் தேசிய இனத்தினுடைய வாழ்க்கையை மேம்படுத்துவதற்கு நாங்கள் எல்லோரும் கைகோர்த்துச் செயற்பட வேண்டும்.

இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்காகத் தங்களுடைய உடலை உரமாக்கி, அட்டைக் கடியிலே வாழ்ந்துகொண்டிருக்கின்ற அந்த உறவுகளுக்கு நன்மை செய்ய வேண்டுமாக இருந்தால், நாங்கள் எல்லோரும் ஒன்றிணைய வேண்டும் என்பதே என்னுடைய கருத்தாக இருக்கின்றது.

ஆகவே, இந்த அரசாங்கம் மலையக மக்கள் தொடர்பில் மிகுந்த கரிசனைகொண்டு, அவர்கள் தொடர்பாக மிகுந்த நல்ல விடயங்களை உங்களுடைய காலத்திலேயே செய்து, அவர்களுடைய வாழ்க்கை முறையை மாற்றியமைக்க வேண்டும். அவர்கள் சுதந்திர புருஷர்களாக வாழ்வதற் கேற்றவாறு நீங்கள் செயற்பட வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.42]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எதிர்க்கட்சி உறுப்பினர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள், பாராளுமன்ற நிலையியற் கட்டளை 19இன்கீழ் கொண்டுவந்துள்ள ஒத்திவைப்புப் பிரேரணைக்காக உண்மையில் அவருக்கு நன்றி தெரிவிக்க விரும்புகின்றேன். என்றாலும், என் மனதில் சிறியதொரு வருத்தமும் இருக்கின்றது. இன்று எதிர்க்கட்சி உறுப்பினர்களாக இருந்து மலையகத்தைப் பிரதிநிதித்துவம் செய்யும் இவர்கள் சென்ற 76 வருட பாராளுமன்ற வரலாற்றில் அமைச்சர்களாகப் பதவி வகித்தவர்கள்தான். மலையக மக்களின் 200 வருடகால வரலாற்றை ஆராய்ந்து பார்க்கும்போது உண்மையில் மலையகத்தில் வாழும் எமது உறவுகள் மிகவும் கஷ்டமான நிலையில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள் என்பது புரியும்.

கௌரவ உறுப்பினர் அவர்கள் மலையகத்தில் உள்ள வீடு, காணி தொடர்பாக, அங்குள்ள கல்வி, சுகாதாரம் மற்றும் நிருவாக முறைமை தொடர்பாக அனைத்து விடயங்களையும் தெரிவித்து, அவை கடந்த காலங்களில் தங்களால் பூரணப்படுத்தப்பட்டவை எனக் குறிப்பிட்டிருந்தார். தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் இந்த நாட்டின் ஆட்சியைக் கைப்பற்றியது, இந்த நாட்டில் உள்ள ஒவ்வொரு தரப்பினருக்கும் தனித்தனியான வாழ்க்கையைப் பெற்றுக்கொடுப்பதற்கு அல்ல. இந்த நாட்டில் உள்ள அனைத்து மக்களுக்கும் உண்மையான ஒரு வாழ்க்கையை, சுதந்திரமான ஒரு வாழ்க்கையை, வளமான ஒரு வாழ்க்கையை, அழகான ஒரு வாழ்க்கையைப் பெற்றுக் கொடுப்பதே தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் முக்கிய நோக்கமாகும். மலையக வாழ் மக்கள் இன்னமும் பல பிரச்சினைகளுக்கு முகம் கொடுக்க வேண்டிய சூழ்நிலைக்குத் தள்ளப்பட்டுள்ளார்கள். அவற்றில் வீடு, காணி, வீதிப் பிரச்சினைகள் பிரதானமானவை. இவை தொடர்பாக நாம் தொடர்ச்சியாகக் கலந்துரையாடி, அதற்கான சில செயற்றிட்டங்களையும் முன்னெடுத்து வருகின்றோம். கிட்டத்தட்ட 200 ஆண்டுகளாக நாட்டின் தேசிய வருமானத்துக்குப் பெரும் பங்களிப்புச் செய்து வரும் மலையக மக்களின் கல்வி நிலை பற்றி கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிடும்போது, அவர்களது கல்விப் பிரச்சினை தீர்க்கப்பட்டுவிட்டதென்று சொன்னார்.

விசேடமாக, நுவரெலியா மாவட்டம் உட்பட மலையகத்தில் 500க்கும் அதிகமான பாடசாலைகளுக்கு முறையான காணி உறுதிப்பத்திரங்கள் இல்லை. இது தொடர்பாக மாவட்ட அபிவிருத்திக்குழுக் கூட்டத்தில் கலந்துரையாடப்பட்டு, அவற்றுக்கான உறுதிப் பத்திரங்களைப் பெற்றுக்கொடுக்கும் செயற்றிட்டம் முன்னெடுக்கப்பட்டுள்ளது. பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர் கௌரவ சுந்தரலிங்கம் பிரதீப் அவர்களின் தலைமையில் Committee ஒன்று உருவாக்கப்பட்டு, அதன்மூலமாக மலையகத்தில் முறையான காணி உறுதிப்பத்திரங்கள் இல்லாத அனைத்துப் பாடசாலைகளுக்கும் அவற்றைப் பெற்றுக் கொடுப்பதற்கான செயற்றிட்டம் முன்னெடுக்கப்பட்டுள்ளது. மலையத்தில் உள்ள வைத்தியசாலைகளின் நிலையும் அவ்வாறே உள்ளது. அவை தொடர்பாகவும் கலந்துரையாடப்பட்டுள்ளது. மலையகத் தோட்டப்புறங்களில் உள்ள வைத்தியசாலைகளை மத்திய அரசாங்கத்தின்கீழ் கொண்டுவந்து, அவற்றுக்குரிய அனைத்து அந்தஸ்துகளையும் வளங்களையும் வழங்கிச் சீர்திருத்தங்களை மேற்கொள்ளத் தீர்மானங்கள் எடுக்கப்பட்டுள்ளன. இவர்கள்

[ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය]

குறிப்பிட்டபடி, சென்ற காலங்களில் மலையக மக்களுக்குப் பெற்றுக்கொடுத்திருக்கும் உரிமைகள் உண்மையிலேயே வரவேற்கத்தக்கவை. இவர்கள் சில உரிமைகளைப் பெற்றுக் கொடுத்துள்ளார்கள்தாம். ஆனாலும், அவர்களது வாழ்க்கையுடன் தொடர்பான முக்கியமான பிரச்சினைகள் தீர்க்கப்படவில்லையென்பதுதான் உண்மை.

விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள இந்தப் பிரேரணையில் முக்கியமான ஒரு விடயம் குறிப்பிடப்பட்டுள்ளது. அது என்னவென்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிக்கு வந்து 1½ வருடங்களாக தோட்ட மக்களைக் கணக்கில் எடுத்ததாகத் தெரியவில்லை என்பதுதான். அதாவது, அவர்கள் சகலதும் செய்துள்ளார்கள்; ஆனால், நாம் ஒன்றும் செய்யவில்லை என்பதுதான். இதுதானா எங்களுக்குள்ள பிரச்சினை? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையக மக்களின் எதிர்கால வாழ்க்கை எப்படி அமையப் போகின்றது என்பது தொடர்பான 'ஹட்டன் பிரகடனத்தை' தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர், 2023ஆம் ஆண்டு ஒக்டோபர் 13ஆம் திகதி ஹட்டனில் வைத்து நாங்கள் வெளியிட்டோம்.

மலையக மக்கள் புறக்கணிக்கப்பட்ட மக்கள் அல்லர் என்றும் 'தோட்டப்புற மக்கள்', 'தோட்டத்தில் வாழ்பவர்கள்', 'இந்திய வம்சாவளி மக்கள்' என்று அவர்களைத் தனியாகக் குறிப்பிடுவதில்லை என்றும் அவர்களையும் இந்த நாட்டின் தேசியத்தோடு இணைக்க வேண்டும் என்றும் அதில் முதலாவதாகக் குறிப்பிடப்பட்டுள்ளது. அந்த வகையில், அவர்களின் உரிமையான 'மலையகம்' என்ற உரிமையைப் பெற்றுக்கொடுத்த கௌரவம் வேறு யாருக்குமல்ல; அது தேசிய மக்கள் சக்தி அரசாங்கத்திற்கே உண்டு.

அது மாத்திரமல்ல, அந்த 'ஹட்டன் பிரகடனத்தின்' மூலம் மலையகத்தில் வாழும் மக்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்காக அவர்களின் தேவைகளை ஒவ்வொன்றாகப் பூர்த்தி செய்வோம் என்ற ஒரு தீர்மானத்துடன், எமது அரசாங்கம் அவர்களின் இரண்டாவது முக்கிய தேவையாக இருக்கின்ற சம்பள அதிகரிப்பை சென்ற வரவு செலவுத்திட்டத்தினூடாகப் பெற்றுக் கொடுத்துள்ளோம். வீடு, காணி என்று கூறும்போது, உண்மையிலேயே இந்திய வீட்டுத்திட்டம் அல்லாது எமது அரசாங்கத்தினால் கிட்டத்தட்ட 10,000 வீடுகளை நிர்மாணிப்பதற்கான தீர்மானம் எடுக்கப்பட்டுள்ளது என்பதை பெருந்தோட்டத்துறைக்குப் பொறுப்பான அமைச்சினால் தற்பொழுது 396 வீடுகள் கட்டப்பட்டுக் கொண்டிருக்கின்றன என்பதையும் குறிப்பிட வேண்டும். .

சென்ற காலத்தில் பாரிய இயற்கை அனர்த்தங்களால் பாதிக்கப்பட்ட இரண்டு தோட்டங்கள் இருந்தன. ஒன்று, பூனாகலை, கபரகல தோட்டம்; மற்றையது, தலவாக்கலை, வோல்ட்ரீம் தோட்டம். இங்கு வாழ்ந்தவர்கள் பல வருட காலமாக முகாம்களிலும் உறவினர்களின் வீடுகளிலும் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். கபரகலை தோட்டத்து மக்களை எடுத்துக்கொண்டால், ஒரு தேயிலைத் தொழிற்சாலையில் கிட்டத்தட்ட 54 குடும்பங்களைச் சேர்ந்தவர்கள் தொடர்ச்சியாக வாழ்ந்து வருகிறார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிக்கு வந்த பிறகுதான் அவர்களுக்கான காணியைத் தீர்மானித்து, அந்த 54 குடும்பங்களுக்கும் சகல வசதிகளுடனான வீடுகள் கட்டி முடிவுறும் நிலையில் இருக்கின்றன. வோல்ட்ரீம் தோட்டத்திலிருந்த மக்கள் - கிட்டத்தட்ட 24 குடும்பங்கள் - 4 வருட காலமாக உறவினர்களின் வீடுகளில் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். அவர்களுக்கென 24 வீடுகள் கட்ட ஆரம்பித்து தற்போது பாதியளவில் முடிந்த நிலையில் உள்ளன. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் தேவை உண்மையிலேயே மலையகத்தில் வாழும் மக்களுக்கு சந்தோஷமான வாழ்வைப் பெற்றுக் கொடுப்பதுதான் என்பதை நான் எதிர்க்கட்சி உறுப்பினர்களுக்குக் கூற விரும்புகின்றேன்.

மலையக மக்களுக்கு வீட்டு உரிமை, காணி உரிமை, கல்வி மற்றும் சுகாதார உரிமை என்பவற்றைப் பெற்றுக்கொடுத்து, அங்கே வாழும் இளைஞர்களுக்குச் சிறப்பானதொரு எதிர்காலத்தையும் பெற்றுக் கொடுப்பதற்காகத்தான் தேசிய மக்கள் சக்தி அரசாங்கம் 'ஹற்றன் பிரகடனத்தை' வெளியிட்டது. அது மாத்திரமல்ல, 'வளமான நாடு - அழகான வாழ்க்கை' என்ற எங்களது கொள்கைப் பிரகடனத்திலும் மலையக மக்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்கான திட்டங்கள் பற்றி சொல்லப்பட்டுள்ளன. இவற்றுக்கு எதிராகச் செயற்படாது, அனைவரும் ஒன்றிணைந்து அரசாங்கத்துக்கு உதவி செய்யுங்கள் எனக் கேட்டு, மலையக மக்களின் வாழ்க்கையை அழகான வாழ்க்கையாக மேம்படுத்துவோம் எனக் கூறி விடை பெறுகின்றேன் நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.53]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විශේෂයෙන්ම මලෛයහම් ප්‍රජාව ශක්තිමත් කිරීම උදෙසා රාධක්‍රිෂ්ණන් මැතිතුමා, මනෝ ගනේසන් මැතිතුමා, දිගම්බරම් මැතිතුමා ප්‍රමුඛ ඒ කණ්ඩායම ඒ ප්‍රජාව වෙනුවෙන් ඉදිරිපත් කරපු යෝජනාව අපි දොහොත් මුදුනින් පිළිඅරගෙන එය තවදුරටත් අනුමත කරන්නට සූදානම් වෙන මොහොතක්, මේ. අපට ඇහුණා, පසුගිය කාලය පුරාවටම දශක ගණනාවක් මුළුල්ලේ මේ මලෛයහම් ප්‍රජාවට කෙරුණු සේවා මොනවාද කියලා. මම මතක් කරන්නට කැමැතියි, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලය සහ ඊට පෙර කාලය ගැන. විශේෂයෙන්ම මේ ප්‍රජාවට පුරවැසිභාවය ලබාදීමේ ඒ දැවැන්ත ක්‍රියාවලිය ගැන. දශක ගණනාවක් මුළුල්ලේ සිදුවුණු ඒ අසාධාරණය ඉවත් කරමින් ඒ අයට මේ රටේ පුරවැසිභාවය ලබාදීම සිදුවුණු බව මා මතක් කරන්නට කැමැතියි.

විශේෂයෙන්ම වර්තමාන රජය වෙනමම ප්‍රකාශනයක් - Hatton Manifesto of the National People's Power Movement - "Power for the motherland - A dignified citizen" යන මාතෘකාව යටතේ මේ රටේ මලෛයහම් ප්‍රජාව සුරක්ෂා කරන්නට ඉදිරිපත් කළා. නමුත් මේ මොහොත වන විට වතු ක්ෂේත්‍රය තුළ සිටින මේ ප්‍රජාව දැඩි ලෙස අනාරක්ෂිතභාවයට පත් වෙමින්, ඒ අය ශාරීරික හානිවලට ලක් කරමින් දැවැන්ත පීඩනයක් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම Nilagama Estate එකේ ඒ සිදුවුණු ප්‍රහාරය නිසා ඒ මලෛයහම් ප්‍රජාවට සිද්ධ වුණා, වෙනමම නීලගම ප්‍රකාශනය නිකුත් කරන්න. ඉතින් එතැනින්ම අපට හිතා ගන්න පුළුවන් කොයිතරම් රැකවරණයක් මේ ප්‍රජාවට වර්තමාන රජය ලබා දෙනවාද, නැද්ද කියන කාරණය. සරලම දේ

වන නිදහසේ ජීවත්වීමේ අවස්ථාව, ප්‍රහාරවලට ලක් නොවී නිදහස්, නිවහල් ජීවිතයක් ගත කිරීමේ ඒ අවස්ථාව නිර්මාණය කරන්නටත් වර්තමාන රජය අපොහොසත් වෙලා තිබෙනවාය කියන එක, එක සිදුවීමක් නොවෙයි, සිදුවීම් ගණනාවක් තුළින් ඉතාම පැහැදිලි වෙනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි, මේ "දිට්වා" සුළි කුණාටුවෙන් කඳුකර ප්‍රදේශයේ ජීවත් වෙන මලෙයහම් ප්‍රජාව විශාල පිරිසක් විපතට පත් වුණු බව ඒ අය අවතැන් වුණා; සෙවණක් අහිමි වුණා. මස්කෙළියේ Fairlawn Estate එකේ පවුල් 40ක්, නිවාස 49ක් යනාදී වශයෙන් විපතට පත් වුණා. මම මේ එක උදාහරණයක් පමණයි කියන්නේ. "දිට්වා" සුළි කුණාටුව නිසා මේ ප්‍රජාව විශාල වශයෙන් විපතට පත් වුණා. නමුත් අදටත්, තවමත් ඒ අයට ලබා දිය යුතු ඒ ලක්ෂ 50 සහනය, ලක්ෂ 100 සහනය ලැබිලා නැහැ. මේ ප්‍රජාව ජීවත් වන බලප්‍රදේශයේ යටිතල පහසුකම්වලට සිදුවුණු හානියට විසඳුම් ලබා දෙන්නටත් රජය අපොහොසත් වෙලා තිබෙනවා.

මේ මොහොත වන විට මේ මලෙයහම් ප්‍රජාව කොයි තරම් අසහනයට පත් වෙලා තිබෙනවාද කිව්වොත්, 2026 ජනවාරි 15 වැනි දා "Pongal for Rights" කියලා ඒ අය මහ පාරට බැස්සා. මොනවාද ඒ අයගේ ඉල්ලීම්? ලැයිම් කාමර ප්‍රශ්නය විසඳාගෙන තමන්ගේම ඉඩමක තමන්ගේම නිවසක් ලබා ගැනීමේ වැඩ පිළිවෙළට යොමු වීම. එතැනින් නතර වුණේ නැහැ. ජනාධිපතිවරයා සමඟ 2026 මාර්තු මාසයේදී ඒකාබද්ධ ප්‍රකාශනයකුත් නිකුත් කළා, රුපියල් ලක්ෂ 50 සහනය ලබා දිය යුතු පවුල්වලට ලබා දෙන බවට. තවමත්, අදටත්, මේ මොහොත වන විටත් ඒ සහන ලබා දෙන්නට මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා.

අපි හැමෝම දන්නවා, තේ ක්ෂේත්‍රයේ සියයට 40ක පමණ ඉඩම් අයිතිය තිබෙන කුඩා තේ වතු හිමියන් රටේ ජාතික තේ නිෂ්පාදනයට සියයට 70ක දායකත්වය ලබා දෙන බව. නමුත් බහුතර ඉඩම් අයිතියක් තිබෙන ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන තේ නිෂ්පාදනයට දායකත්වය ලබා දෙන්නේ ඉතාම සුළු ප්‍රතිශතයකින්. ඉතින් එතැනින් පැහැදිලියි, වගා නොකළ ඉඩම් වගා කිරීම සඳහා, ඒ වාගේම ඒ වගා භූමිය තුළ නිවසක් සාදා ගැනීම සඳහා මේ මලෙයහම් ප්‍රජාවට උදව් කළ හැකියි. ඒ අය සදාකාලිකව කම්කරු සේවයේ තැබීම වෙනුවට, ප්‍රාග්ධන සම්පතක් හිමි කර ගත්ත, දැවැන්ත ආර්ථික, සමාජයීය සවිබලගැන්වීමකට ලක් වුණු කුඩා තේ වතු හිමියෙක් බවට පත් කිරීම තමයි ඇත්ත වශයෙන්ම අපේ ඒකායන බලාපොරොත්තුව. අපි එතැනට යනවා. අපි ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. මේ රටේ පුරවැසියන්ට මේ රටේ ඉඩමක්-කඩමක් අයිති කර ගැනීමේ අයිතිය අපි ශක්තිමත් කරන්නට ඕනෑ.

අද අධ්‍යාපන ක්ෂේත්‍රය බැලුවොත්, සෞඛ්‍ය ක්ෂේත්‍රය බැලුවොත්, බරපතළ කඩා වැටීම් ගණනාවක් තිබෙනවා විශේෂයෙන්ම මේ මලෙයහම් ප්‍රජාව ජීවත් වන බල ප්‍රදේශවල. ඒ අධ්‍යාපන ක්ෂේත්‍රය ගොඩ නඟන්නට, පාසල් පද්ධතිය ගොඩ නඟන්නට, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රෝග නිවාරණ සහ ප්‍රතිකාර ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට අනිවාර්යයෙන්ම රජය යොමු විය යුතුයි. මේ ප්‍රජාව තුළ ළමා මන්දපෝෂණය, මාතෘ මන්දපෝෂණය, ක්ෂය වීම, කුරු වීම, කෙට්ටු වීම, මිටි වීම, ශරීර ස්කන්ධ දර්ශකය පහළ මට්ටමක තිබීම, රක්තහීනතාව - නිරක්තිය -, අඩු බර දරුවන්, අඩු උපත් බර දරුවන්, stunting, wasting කියන ඒ මන්ද පෝෂණ තත්ත්වය ඉතාම ප්‍රචලිතව ඒ ප්‍රජාව තුළ තිබෙනවාය කියන එක කාටත් නොරහසක්. ඒ නිසා අපේ රටේ තිබෙන සමාජ සුබසාධන යන්ත්‍රණය තුළ ඒ ප්‍රජාව ශක්තිමත් කරන්නට, ඒ ප්‍රජාව ගොඩ නඟන්නට, ඒ ප්‍රජාවට ඒ ජීවය, ප්‍රාණය ලබා දෙන්නට කටයුතු කරන්න ඕනෑ.

ඉතාම සොච්චම් දීමනාවකට තමන්ගේ වෘත්තීය ඉෂ්ට සිද්ධ කරමින්, තමන්ගේ දහඩිය, මහන්සිය කැප කරමින් අපේ රටට බිලියන ගණන් ඩොලර් ආදායම් ලබා දෙන මේ ප්‍රජාව ගැන මීට වඩා ඉහළ සැලකිල්ලක් යොමු කරන්න ඕනෑ. ඒ අය වෙනුවෙන් ප්‍රකාශන නිකුත් කිරීම නතර කරලා තිබෙනවා. ඒ අයට ලබා දෙන සුබසාධනය, ඒ අයට ලබා දෙන ඉඩම, නිවස, ශක්තිමත් සෞඛ්‍ය පද්ධතිය, අධ්‍යාපන පද්ධතිය මහ පොළොවේ සත්‍යයක්, යථාර්ථයක් බවට පත් කිරීම තමයි වර්තමාන රජයේ යුතුකම. ඕනෑම අවස්ථාවකදී එවැනි ක්‍රියාදාමවලට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න සූදානම් කියන එක අපි ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දිනයේ ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුමත කරමින්, එය අගය කරමින් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

එතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ සාරය අපි පැහැදිලිවම පිළිගනු ලබනවා. අපේ රටේ දුප්පත්භාවයට, සමාජ අසාධාරණත්වයට පත් වෙච්ච ජනතාවගේ අරගළයකින් පසුව තමයි අපි මේ පාර්ලිමේන්තුවේ බලයට ඇවිල්ලා තිබෙන්නේ. ඒ වාගේම මලෙයහම් ජනතාව තේසීය මක්කල් ශක්ති පක්ෂය ඉතාම ඉහළින් ජයග්‍රහණය කරවලා ඔවුන්ගේ විශ්වාසයත් අප මත තබා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය නියෝජනය කරන්නේත් එවැනිම ප්‍රදේශයක්. ඒ නිසා අපි උපරිම වශයෙන්, අපේ හෘදය සාක්ෂියට එකඟව මේ කාරණය විසඳන්න කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය කථා කරනකොට මැනකදී තිරගත වුණු "මාමන්නන්"" කියන චිත්‍රපටය මට මතක් වුණා. මනෝ ගනේසන් මැතිතුමා ඒක බලලා ඇති. *[බාධා කිරීමක්]* 'මාමන්නන්' - වඩිවේලු. මොකක්ද, ඔබතුමාට හිතෙන්නේ? *[බාධා කිරීමක්]* Identical. ඉතාම ව්‍යූහාත්මක, structural - විනාශයක් නේ මේ මලෙයහම් ජනතාවට කරලා තිබෙන්නේ. වතු පාලකයින් විතරක් නොවෙයි, ඒ කාලයේ එම පක්ෂවල දේශපාලන වතු අයිතිකරුවනුත් සිටියා. එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් වැඩි ප්‍රමාණයක් හිටියා. පාලකයින්ගෙන් පීඩාවට පත්වෙලා දුප්පත්භාවයට පත් වෙච්ච පවුලක හිටපු වූටි ගැහැණු ළමයෙක් තමයි මේ චිත්‍රපටයේ ලීලා කියන්නේ. ඇය ඉගෙනගෙන, පාර්ලිමේන්තුවට ගිහිල්ලා ඇය ජීවත් වුණු ගම්මානයේ මුළු ප්‍රජාවටම විපත් ගෙනාපු පාලකයාව පරද්දනවා. අද මේ

[ගරු බිමල් රත්නායක මහතා]

පාර්ලිමේන්තුවේත් "මාමන්නන්" පිළිබඳ කථාවක් තමයි තිබෙන්නේ. මේ රටේ මිනිස්සු කොච්චර විප්ලවකාරීද? මේ රටේ මිනිස්සු 2024 සැප්තැම්බර් මාසයේ මොකක්ද කළේ? අපි හිතන්නේ නැහැ, අපි මේක තනිවම කරගත් දෙයක් කියලා. මේ රටේ ජනතාව කඳු පළාගෙන ඇවිල්ලා පොළොව සමතලා කරන්න ඕනෑ කියලා කියා තිබෙනවා; ඇති කියලා කියා තිබෙනවා. ලීලා වාගේ අය තමයි මේ ඉන්නේ.

මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඉන්දියාවෙන් plantation workersලා විධියට මිනිස්සු ගෙනිච්චේ ලංකාවට විතරක් නොවෙයි. Malaysia, Mauritius, Singapore, South Africa වාගේ ලෝකය පුරා තිබෙන රටවල් ගොඩකට ඒ මිනිස්සුන්ව ගෙනිච්චා. ඒ අයගෙන් ලංකාවට ආපු මලෙයහම් ජනතාව විතරක් ලංකාවේ දුප්පත්ම, නූගත්ම, කොන්කරපු, අන්තිම නරකම තත්ත්වයට පත් වෙච්ච ජනතාවක් බවට පත්වෙද්දී Malaysia, Singapore, Mauritius වාගේ රටවලට ගියපු අය සමාජයේ ඉහළ මට්ටමට ආවේ කොහොමද? ඒක හොයලා බලන්න ඕනෑ දෙයක් නේ. මොකද, ඉන්දියාවේ එකම colonial setup එකේ අය තමයි අනෙක් රටවලටයි මෙහෙටයි ආවේ. නමුත්, අනෙක් රටවලට ගිය මලෙයහම් ප්‍රජාව ඉහළ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඔවුන් අද ඒ රටවල ඉතාම ඉහළ මට්ටමක ඉන්නවා. මෙහෙට ආපු අය අන්තිම නරක තත්ත්වයක ඉන්නවා.

මම කරුණු එකක්, දෙකක් කියන්නම්, ඒ සම්බන්ධයෙන්. මේ document එක මම හදලා ගත්ත එකක්. ඒකේ තිබෙන්නේ මොකක්ද? The structural forces that created this reality stem from several key factors. The first one is, the 1948 Citizenship Law, which was the single-most devastating factor. When the British left in 1948, the newly formed Sri Lankan Government passed the Ceylon Citizenship Act, No.18 of 1948. කවුද අත උස්සපු කට්ටිය?*[බාධා කිරීමක්]* These people were made stateless. The new law required proof that an applicant's father was born in Sri Lanka, a near-impossible task for the poor, undocumented labourers. So, overnight, roughly 700,000 to 900,000 plantation workers were made stateless and stripped of their voting rights. මම ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තු පුස්තකාලයේ සඳමාලි මැතිනියට. එතුමිය ඇතුළු Library team එක ඉතාම හොඳ research එකක් කළා, මේ ගැන. මම බැලුවා, මේ පාපකාරී පනතට ඡන්දය දුන්නු කට්ටිය කවුද කියලා. එක්සත් ජාතික පක්ෂයේ නායකයන් ගොඩක් ඉන්නවා. අද අපට හැටන් ප්‍රකාශය කරන්න එපා කිව්වා. එහෙම අය ඉන්නවා. නරකම දේ තමයි, ප්‍රධාන දෙමළ පක්ෂවල නායකයනුත් ඉන්නවා. ඒ research එක මම වෙලාවක රාධක්‍රිෂ්ණන් මැතිතුමාට දෙන්නම්. ඒක Library එකේ සඳමාලි මැතිනියගෙන් ඔබතුමාට ලබා ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඒවා කියන්න ඕනෑ, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. මේක සරල නැහැ. ඉතිහාසය වැදගත් වෙනවා නේ, උත්තර හොයන්න. මේක තමයි පළමුවෙනි එක.

දෙවැනි එක මොකක්ද? දෙවැනි එක තමයි, geographic and social isolation - the "Enclave" system. The British colonial administration deliberately designed tea and rubber plantations as closed economies, often called "enclaves".

තුන්වැනි එක මොකක්ද? තුන්වැනි එක තමයි, line rooms. ඇත්තටම ගත්තොත්, කඳුකර ප්‍රදේශවලට යන එන එක - ප්‍රවාහනයේ ප්‍රශ්නය - විසින්ම, පිහිටීම විසින්ම විශාල අභියෝගයක් හදලා තිබෙනවා නේ.

හතරවැනි එක තමයි, intentional targeting of vulnerable castes. මෙතැන දෙපැත්තක් තිබෙනවා. ලංකාවට එච්චේ Madras Presidency එකේ හිටපු ඉතාම දුප්පත්, කුලයෙන් පහළම අය. ඒ, කංකානිවරුන්ගේ නායකත්වය යටතේ. ඒගොල්ලන් එක පැත්තකින් වතු පාලකයාගේ පීඩාවටත් ලක් වුණා, කුලයේ පීඩාවටත් ලක් වුණා. මෙහෙම තමයි මේක වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි Malaysia, Mauritius, India ඇතුළු අනෙක් රටවලට වඩා අපේ රටේ මේ මලෙයහම් ජනතාව අවුරුදු 70කට පසුවත් මේ තත්ත්වයෙන් ඉන්නේ. මේක මැජික් පොල්ලකින් වෙනස් කරන්නත් බැහැ. මොකද, මේවා structural. ගෙවල්, ඉඩම් දෙන්න ඕනෑ. ඒ ගැන කිසි විවාදයක් නැහැ.

අපි ළඟදී කැබිනට් මණ්ඩලයේදී කථා කළා, මලෙයහම් පාසල්වලට ඉගෙන ගත්ත ගුරුවරු දෙන්නේ කොහොමද කියන එක ගැන. ගුරු සේවයේ එක ව්‍යවස්ථාවක් තමයි තිබෙන්නේ. ඒකට නිශ්චිත සුදුසුකම් තිබෙනවා. හැබැයි, මේ මලෙයහම් ප්‍රදේශය තුළින් එහෙම ඉගෙන ගත්ත අතිවිශාල ප්‍රමාණයක්, ඒ පාසල් සියල්ලටම අවශ්‍ය කරන ප්‍රමාණයක් නිර්මාණය කරගන්න බැහැ. ඒ නිසා ඔබතුමන්ලා qualifications අඩු කරලා ගුරුවරු ගන්න හැදුවා. එතකොට මොකද වෙන්නේ? අඩු සුදුසුකම් තිබෙන ගුරුවරුන්ගෙන් උපදින්නේ කවුද? නියතයක් ලෙසම නොවෙයි, හැබැයි අඩු සුදුසුකම් අය තමයි උපදින්නේ. *[බාධා කිරීමක්]* කැමැත්තෙන් නොවෙයි. මම දන්නවා. අපි වුණත් ඒක හිතනවා. *[බාධා කිරීමක්]* ඒක තමයි, මමත් පිළිගන්නවා. මොකද, බාර් එක උස්සලා බැරි නම් අඩු කරලා හරි අරගෙන බලනවා. මම ඒකයි කිව්වේ. මේක තව පරම්පරාවක් විතර මහන්සි වුණත් ඉතා විශාල අභියෝගයක්. 1948දී කරපු පාපය සරල පාපයක් නොවෙයි. කිසිදා සමාව නොදිය යුතු පාපයක්. මොකද, ඒකෙන් ගොඩ එන්න බැහැ. ඒක ඉඩමක් දීලා, ගෙයක් දීලා විතරක් බේරන්න බැහැ, මනෝ මන්ත්‍රීතුමා. අපි පිළිගන්නවා. මේ කාරණය ඔබතුමා එදා මාත් එක්කත් කිව්වා. 1948දී කාටත් නොමිලේ ලැබිච්ච අධ්‍යාපන ක්‍රමය මේ දරුවන්ට ලැබුණේ නැහැ. ඒක කන්නන්ගර මැතිතුමාගේ වැරැද්දක් නොවෙයි. එහෙම වුණේ ඒගොල්ලන් පුරවැසියන් නොවුණු නිසා. අපි හිතාගෙන හිටියේ ලංකාවේ හැම දරු පැටියෙකුටම නොමිලේ අධ්‍යාපනය ලැබුණා කියලා නේ. හැබැයි, මලෙයහම් අම්මා, තාත්තාගේ දරුවන්ට ලැබුණේ නැහැ. ඉතින්, මම ඉතිහාසය ගැන පොඩ්ඩක් කිව්වේ ඒ නිසායි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
වතු පාසල් ජාතික පද්ධතියට ගෙනාවේ 1947දී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, දැන් මේ අයට සමානතාවෙන් සලකලා විතරක් හරියන්නේ නැහැ කියලා. මේ අයට සමානතාවෙන් සලකන්න බැහැ. මොකද, මලෙයහම් ජනතාව ආර්ථික, දේශපාලන හා සමාජයීය කියන හැම පැත්තෙන්ම පහළට දාලා තිබෙන්නේ. එහෙම පහළ දමපු මිනිස්සුන්ට වැඩිපුර සලකන්න ඕනෑ. එතකොට තමයි "ටයි-ටයි" වෙන්නේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Affirmative action.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්. Tailor-made solutions, නේද? ඒගොල්ලන්ට ගැළපෙන්න වෙනම දේවල් කරන්න ඕනෑ. ඒකට තමයි අපි ආණ්ඩුවක් වශයෙන් කැප වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා ඡන්ද බලාගෙන මේ වැඩ කරනවා නොවෙයි. මැතිවරණයක් නැහැ නේ. මේ වෙලාවේ එතුමා ඒ ප්‍රදේශවලට යන්න තීන්දු කරන්නේත් වෙන මොනවත් නිසා නොවෙයි. මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලාම ගෙවල් දෙන එක, ඉඩම් දෙන එක වාගේම recognition කියන එකත් වැදගත්.

මොකද, පීඩාවට ලක් වෙච්ච මිනිහාට කෑම, ආරක්ෂාව වාගේම තමන්ව පිළිගන්නවා කියන එකත් වැදගත් වෙනවා. අර කර ගැට පිරිච්ච, දලුවල කහට පිරිච්ච අත්වලින් රටේ නායකයා අල්ලන කොට ඒක political show එකක් නොවෙයි. එතැනදී ඒ අම්මාට ගැම්මක් එනවා. අපි බොරු කරන මිනිස්සු නොවෙයි. ජනාධිපතිතුමාත් ඉතාම දුප්පත් පවුලකින් ආපු කෙනෙක්. අපට show දාන්න දෙයක් නැහැ. මම මේ ටික කිව්වේ, අපට මේ පිළිබඳව අවබෝධයකුත්, වුවමනාවකුත් තිබෙනවා කියන්නයි. නමුත් අපි පිළිගන්නවා, මේ මන්ත්‍රීතුමන්ලා මතු කරන විධියටම මෙහිදී අපිත් විවිධාකාර අභියෝගයන්ට මුහුණ දුන් බව. අපි මුදල්වල අභියෝගයට මුහුණ දීලා නැහැ. අපට වතුකරයට, කඳුකරයට, උතුරට, නැඟෙනහිරට වැඩ කරන්න සල්ලි ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ ඇති තරම් සල්ලි තිබෙනවා කියන එක නොවෙයි, ඇත්තටම යමක් කරන්න තරම් සල්ලි තිබෙනවා. මේ දේවල් කරන්න ගියාට පස්සේ අපි මුහුණ දෙන ප්‍රශ්න තමයි, එක්කෝ නිලධාරි යන්ත්‍රණයේ තිබෙන දුර්වලතා, එහෙම නැත්නම් හරියටම අවශ්‍යතාව අනුව වැඩ කරන්න මැදිහත් වෙන්නේ නැති එක. මම මුල්ඔය වතුයායට ගියාම දැක්කා, ඒ වත්තේ විශාල පාසලක් තිබුණත්, ඒ ගුරුවරුන්ට ඉන්න තැනක් නැති බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු අමාත්‍යතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වත්තේ, වහලා දමපු නිලධාරින්ගේ නිල නිවාස ඕනෑ තරම් තිබෙනවා. මම අගමැතිතුමියටත් යෝජනා කළා, වත්තට අවශ්‍යතාවක් ඇති වනතෙක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒවා සල්ලි දීලා කුලියට අරගෙන මේ ගුරුවරුන්ට ලබා දෙන්න කියලා. එහෙම නැතුව ඒ ගුරුවරුන්ට ඒ කඳු ප්‍රදේශයට උදේට ඇවිල්ලා ආයේ හවසට යන්න බැහැ. මම අගමැතිතුමියටත් මේ පිළිබඳව කිව්වා, මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමාටත් කිව්වා, එතුමා නුවරඑළියේ නිසා. සමහර වෙලාවට සිද්ධ වෙලා තිබෙන දේ තමයි, ඉතාම ප්‍රායෝගික ප්‍රශ්නවලට ඉතාම සරල උත්තර සොයන්නේ නැතුව, උත්තර සොයන්න වටේ යන්න වෙලා තිබෙන එක. අපවත් යම් කිසි ප්‍රමාණයකට structured වෙලා නේ තිබෙන්නේ, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි. හැදුණු setup එකක් නේ, අපි මේ වෙනස් කරන්නේ. අපි අලුතින්ම රොබින්සන් ක්‍රූසෝගේ දූපතට බැහැලා, එතැන දේශපාලනය කරනවා නොවෙයි නේ. ඒ නිසා අපටත් අභියෝග තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ඔබතුමන්ලා, අපි antagonistic විධියට නැතුව මේ දේවල් කරමු කියලා. *[බාධා කිරීමක්]* Please, ඔබතුමාත් දන්නවා, පනාවැන්න වත්තේ සිද්ධියේදී ගැහුවා වාගේම එදාම ඒ නවදෙනාම arrest කළ බව. ඒ වත්ත කාගේද, ඒ වත්තේ අයිතිකාරයා කවුද කියලා සොයා බලන්න. මම නම කියන එක හොඳ නැහැ. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට ඉතාම ඉක්මනින් එය දැනගන්න පුළුවන්. එතුමාගේ පක්ෂයේ හිටපු ප්‍රධාන පෙළේ නායිකාවකගේ වත්තක්, ඒක. ඒ මිනිස්සුන්ට ඉන්න දෙන්නේත් නැහැ, ගහලා පන්නනවා. ඒගොල්ලන්ම තමයි, ආයෙත් ඇමතිවරු වෙන්න ඡන්දය ඉල්ලන්නේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අයිතිකරුවෝ නොවෙයි, system එක.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක හරි. මම ඒක ගැන කියන්නේ නැහැ. නමුත්, අයිතිකරුත් matter එකක් නේ. ඒ නිසා මම ඒකත් කියමින්, අපි ඔබතුමන්ලා සමඟ එකට වැඩ කරන්න කැමැති බවත් සඳහන් කරනවා. ඒක අපි ඡන්ද ප්‍රමාණය අනුව කොහෙත්ම බලන්නේ නැහැ. ඔබතුමන්ලා දිගු කාලයක් තිස්සේ මේ ප්‍රජාව එක්ක වැඩ කරන බව අපි පිළිගන්නවා. නමුත්, කරුණාකරලා ජාතිවාදී චිත්‍ර මවන්න කටයුතු කරන්න එපා. එම සිද්ධියේදී අදාළ අයව අපි අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අපට සිංහල, දෙමළ කියලා ප්‍රශ්නයක් නැහැ. අපි මේ වෙනුවෙන් වැඩ කරනවා. *[බාධා කිරීමක්]* මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කොහේවත් ඒක කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* කථාවේ වෙලාව ගන්න හොඳ නැහැ නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා නොවෙයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔබතුමන්ලා මෙහෙම කටයුතු කරන එක හොඳයි, ජාතිවාදය ඇති නොකර.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සමහර දෙමළ මන්ත්‍රීතුමන්ලා ඒකට ජාතිවාදී මුහුණුවරක් දීලා කථා කරලා තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අපි ඒවා කරන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා නොවෙයි. ඒක කියද්දි බාධාවකුත් ආවා. මේ Adjournment Motion එක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාට බොහොම ස්තුතියි. ඒ වාගේම අපිත් මහන්සි වෙනවා, මේ තත්ත්වය වෙනස් කරන්න.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.15]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින නුවරඑළිය පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමා ගෙන ආ යෝජනාව සම්බන්ධව අපේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැනත් අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දශක කිහිපය පුරාම වතුකරයේ සාම්ප්‍රදායික නායකයින් විසින් මලෙයහම් ජනතාව සලකා තිබුණේ ඒගොල්ලන්ගේ ඡන්ද බැංකුවක් හැටියටයි. සමහර වෙලාවට ඔවුන් තමන්ගේ දේශපාලන ව්‍යාපාරවල, රැළිවල, මැයි දිනවල පිරිස රැස් කර ගැනීම සඳහා වූ මෙවලමක් හැටියටයි ඒ ජනතාව පාවිච්චි කළේ. ඒ කාලය තුළ ඔවුන් වෙනුවෙන් ලොකු පොරොන්දු දුන්නා, ලිපි ලේඛන හැදුවා, අණ පනත් ගෙනාවා, එක එක සංවිධාන බිහි කළා. ඒ සියල්ල කරලාත් අදත් විපක්ෂයේ ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා, මේ මලෙයහම් ජනතාව තවදුරටත් ආණ්ඩුව විසින් රැක ගත යුතුයි කියන යෝජනා ගේන්න. පසුගිය දශක කිහිපය පුරාම පැවති ආණ්ඩු - විශේෂයෙන් ඔබතුමන්ලා - අදාළ විධියටම ඔවුන් වෙනුවෙන් මැදිහත් වුණේ නැහැ කියන එක ඔබගේ යෝජනාවෙන්ම පැහැදිලි වෙනවා කියන එකයි මගේ අදහස.

අපේ රජය බලයට පත් වුණු ගමන් අපි මේ රටේ සංස්කෘතිය ඉතාම බරපතළ විධියට යහපත් පැත්තට වෙනස් කළා. ඒ වාගේම "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරිදි ඒ යෝජනාවල සඳහන් "හැටන් ප්‍රකාශනය" අපේ ජනාධිපතිතුමා එළිදැක්වූවා. එතැන ඉඳලාම රටේ සියලු ජනතාව ආගම අනුව, ජාතිය අනුව, කුලය අනුව, ජීවත් වන ප්‍රදේශය අනුව බෙදන්නේ නැතිව අපි වැඩ කරන්න පටන්ගත්තා. අපි හිතනවා, ජනතාව විසින් මේ මාලිමා රජය පත් කර ගත් එකේ ප්‍රබලම ජයග්‍රහණය ඒක කියලා. එවැනි ජයග්‍රහණ භෞතික වශයෙන් මුදල් වියදම් කරලා ලබා ගන්න පුළුවන් දේවල් නොවෙයි. පාර්ලිමේන්තුව දිහා බැලුවාම, ආණ්ඩු පක්ෂය දිහා බැලුවාම ඒ වෙනස හොඳින් පැහැදිලි වෙනවා. ඒකත්වයක් තුළ ඉඳගෙන මේ රට ගොඩනැඟීම සඳහා වැඩ කරන හැටි ඔබට ඔබ ඉදිරිපස සිටින ආණ්ඩු පක්ෂය දිහා බැලුවාම පෙනෙනවා.

වසර ගණනාවක් පුරා මේ රටේ පැවතුණු බෙදුම්වාදී සහ වාර්ගික දේශපාලනය අපි මුළුමනින්ම පරාජය කරලා ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ වාගේම වතුකරයේ ජනතාව දෙස වතු කම්කරුවන් ලෙස බලන්න කියන පුරුද්ද, ඒ හදලා තිබුණු මතය, ආකල්පය අපි සහමුලින්ම බිඳ දැම්මා. අදත් ඔබේ යෝජනාවේ හැම තැනකම මම දැක්කේ "කඳුකරයේ ජනතාව, වතුකරයේ ජනතාව" කියලා සඳහන් වන බවක්. ඔබේ යෝජනාවේ වචනවලින්ම ඒ ජනතාව වෙනත් පහත් තලයක, පහත් තැනක, දෙවෙනි පුරවැසියන් හැටියට සලකලාම තමයි තිබෙන්නේ. එහෙම කරන්න එපා. මලෙයහම් ජනතාව කියන්නේ ගෞරවනීය ජනතාවක්. මේ මාතෘ භූමියට ඩොලර් උපයන්න ශ්‍රමය, කඳුළු, දහඩිය වගුරපු ඒ ජනතාවට ඒ ගෞරවය ඔබේ වචනයෙන් පවා ලබා දෙන්න කියා මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඔවුන් තවදුරටත් අපේ රටේ දෙවෙනි පුරවැසියන් හැටියට නොවෙයි ගෞරවනීය ශ්‍රී ලාංකිකයින් හැටියටයි සැලකිය යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විධියට අපි ඉතාම ආධ්‍යාත්මික, එහෙම නැත්නම් ආකල්පමය පැත්තෙන් හිතලා ගත්ත පියවර කිහිපයක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් ජාතිවාදය, බෙදුම්වාදය සහ ප්‍රාදේශීයවාදය කියන සියල්ලම පරාජය කරලා සමාජ ඒකාබද්ධතාව සඳහා අපි ලොකු වැඩ කොටසක් මේ වනකොට කරලා තිබෙනවා. පොදු සමාජයෙන් වෙන් කරලා, කොන් කරලා දාපු ජනතාවක්, එහෙම සලකන්න පුරුදු කළ ජනතාවක්, තමන්ගේ දේශපාලන වුවමනා සඳහා පාවිච්චි කරපු - use කරපු - ජනතාවක් එහෙම නොවන තත්ත්වයට අපි අද පත් කරගෙන තිබෙනවා. ඒක ඒ ජනතාවගේ නියෝජනයෙන්, මේ දිනවල ඒ ජනතාව කරන ප්‍රබල මැදිහත්වීම්වලින් තහවුරු වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ඉඩම් අයිතිය, ජීවත්වීමේ අයිතිය, නිවාස අයිතිය කඩදාසිවලට විතරක් අපි සීමා කරලා නැහැ. අපි මේ වනකොට නීත්‍යානුකූලවම ඔවුන්ට ඒ මූලික අයිතිවාසිකම් ලබා දීමේ කටයුත්ත කරමින් ඉන්නවා. ලැයිම් කාමර සංස්කෘතියෙන් මුදාගෙන, ලැයිම් කාමර ආකල්පයෙන් මුදාගෙන අපි ඔවුන්ටත් මේ රටේ අනෙක් පුරවැසියන් සියලුදෙනා එක්ක සමානව සලකන්න කටයුතු කරලා තිබෙනවා. ඔබතුමන්ලාට මෙවැනි යෝජනා ගෙනෙන්නවත් අවශ්‍ය නොවන මට්ටමට අපි එම ජනතාව වෙනුවෙන් අපට කළ හැකි උපරිම දේ කරමින් ඉන්නවා. ඒ වාගේම එම ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීමට සහ එම ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අපි කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැවැන්ත ආර්ථික අර්බුදයක් තිබුණු රටක වුණත් අපි ඒ දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා දීම, ගුරු හිඟය පියවීම සහ වතු රෝහල්වල පහසුකම් නැංවීම වැනි කටයුතු සඳහා රජයක් හැටියට සෘජුවම මැදිහත් වෙලා තිබෙනවා.

විපක්ෂයත් විරුද්ධ වුණු, උසාවි ගණනේත් යන්න හදපු වතු කම්කරුවන්ගේ ආර්ථික යුක්තිය සහ වැටුප් පිළිබඳව අපි කටයුතු කළා. ඔවුන්ගේ වැටුප් අයිතිය ලබා දෙන්න අපි කටයුතු කළා. මොන තරම් ආර්ථික දුෂ්කරතා සහිත රටක් ඔබ අපට භාර දුන්නා වුණත් අපි එම කටයුත්ත ඉටු කළා. සමහර අවස්ථාවල සමහර අය එම ජනතාව නවීන වහලුන් හැටියට සලකමින් කටයුතු කළා; සමහර සමාගම් එලෙස කටයුතු කළා. තවදුරටත් එසේ නොවන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

"දිට්වා" සුළි කුණාටුව ගැනත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. නුවරඑළිය, බදුල්ල හා මහනුවර දිස්ත්‍රික්කවල සහෝදර ජනතාව ගැන අපි බැලුවේ නැහැ කිව්වා. අපි ඔබතුමන්ලාට වගකීමෙන් කියනවා, ඒ සියලු ජනතාව වෙනුවෙන් කළ හැකි සියලු දේ අප කළ බව. විපතට පත් ඒ ජනතාව වෙනුවෙන් ආණ්ඩුවක් විධියට කළ හැකි සෑම දෙයම අපි මේ වනකොට ඉටු කරලා තිබෙන්නේ. ඒ වාගේම මලෙයහම් ජනතාවට තමන්ගේ දරුවන් ඇති දැඩි කරලා, උගන්වලා සමාජයේ සම අවස්ථා ලබා දී ඔවුන් ගෞරවනීය පුරවැසියෙක් කරන්න පුළුවන්. එම දරුවන් රටේ ගෞරවනීය පුරවැසියෙක් කරන්න පුළුවන් තත්ත්වය දක්වා අවශ්‍ය කටයුතු අපි සිදු කරලා තිබෙනවා. ඔබගේ බංකොලොත්භාවය වසා ගන්න සමහර වෙලාවට මෙවැනි යෝජනා ගෙනාවාට අපි හිතනවා, ඔබ මේ යෝජනාව ගෙනාවේ වැරදි අවස්ථාවක කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබට සමහර විට මුදල් වැනි භෞතික වශයෙන් සංවර්ධනය කළ හැකි දේ තිබෙන්න පුළුවන්. හැබැයි, ආධ්‍යාත්මික වශයෙන් මේ පරිවර්තනය, ආකල්පමය වශයෙන් මේ පරිවර්තනය මේ රටේ කළේ මාලිමා රජය පමණයි. මෙවැනි වෙනස්කමක් කරන්න, මේ ජාතිවාදී තුවාලය සනීප කරන්න අපි කරන කටයුත්ත ඔබතුමන්ලාට තව අවුරුදු සියයක් හිටියත් කරන්න බැහැ කියායි මම හිතන්නේ. ඔබතුමන්ලා ඒක කරන්නේ නැහැ. ඔබතුමන්ලා හැම තිස්සේම බොරුවක් සමාජගත කරන්න හදනවා, මේ ආණ්ඩුව වැඩ කරන්නේ නැහැ කියලා. ඔබතුමන්ලා තමයි ඒ බොරුව සමාජගත කරන්න හදන්නේ. හැබැයි, ඔබතුමන්ලා නිතරම සමාජගත කරන්න හදනවා, අපි හොඳ වැඩ කළේ නැහැ කියලා. මේ ආණ්ඩුව මේ තරම් ජනතාවාදී ලෙස කටයුතු කරද්දී ඔබතුමන්ලා මාධ්‍ය කිහිපයකුත් පාවිච්චි කරමින් උත්සාහ ගන්නවා, හැම වචනයකින්ම, හැම යෝජනාවකින්ම, හැම අවස්ථාවකම මේ ආණ්ඩුව වැඩ කරන්නේ නැහැ කියන්න. ඒක මේ රටේ ජනතාව දන්නවා. අපි ඒ නිසා ජනතාව කෙරෙහි විශ්වාසයෙන් මේ කාරණය කියන්නේ. මේ රටේ කිසිදු පුරවැසියෙකුට මින් මතු දෙවැනි පුරවැසියෙකු ලෙස සලකලා කටයුතු කරන්න මේ මාලිමා රජය ඉඩ දෙන්නේ නැහැ කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.24]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்தப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ உறுப்பினர் இராதாகிருஷ்ணன் அவர்களுக்கும் தமிழ் முற்போக்கு கூட்டணிக்கும் முதலில் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இது ஒரு சுவாரசியமான விவாதம்தான். இதில் யார் ஆளுங்கட்சி, யார் எதிர்க்கட்சி என்பது எதுவும் புரியாமலுள்ளது. கௌரவ பிமல் ரத்நாயக்க அவர்களே, நீங்கள் ஒரு விஷயத்தைச் சொல்லியிருந்தீர்கள். உண்மையிலேயே உங்களுடைய உரையாடல் மட்டும்தான் தீர்க்கமானது என்று நான் கூறுவேன். நீங்கள் "மாமன்னன் திரைப்படம் மிகவும் பிடித்த ஒரு திரைப்படம்" என்று சொன்னீர்கள். இன்னொரு திரைப்படமும் இருக்கிறது. அந்த திரைப்படத்தின் பெயர் 'கோ'; அது ஜீவா நடித்த திரைப்படம். அந்தத் திரைப் படத்தையும் பாருங்கள்! அந்தத் திரைப்படத்தில் ஓர் அரசியல் கட்சி, இளைஞர்களைத் தூண்டிவிட்டு, நாட்டை எரிக்கிறது. இறுதியில், அவர்கள் ஆசனத்தில் அமர்கின்றார்கள். அந்தத் திரைப்படத்தைப் பார்த்துவிட்டு, அந்தக் கதை யாருக்குப் பொருந்தும் என்பதை நீங்களே தீர்மானியுங்கள்!

நாங்கள் விஷயத்துக்கு வருவோம். ஆளுங்கட்சித் தரப்பில் இருக்கும் நீங்கள் எல்லோருமே பேசினீர்கள்; நியாயமான விஷயம்தான். ஆனால், நீங்கள் ஒரு விஷயத்தை மறந்து விட்டுப் பேசினீர்கள். இந்தப் பிரேரணையைக் கொண்டு வந்ததற்குக் காரணம், எங்களுடைய மக்களுக்குக் காணி உரிமை வழங்குவீர்களா, மாட்டீர்களா என்பதற்கு ஆளுங்கட்சி சார்பில் எங்களுக்கு ஒரு பதில் தெரிந்தேயாக வேண்டும் என்பதற்காகத்தான். நாங்கள் காணி உரிமை பற்றி கேட்டால், நீங்கள் "76 வருஷ சாபம்" என்கிறீர்கள். நாங்கள் வீட்டுப் பிரச்சினை பற்றி கேட்டால், நீங்கள் "குடும்ப அரசியல்" என்கிறீர்கள். அப்படியிருக்கும்போது, நான் வெளிப்படை யாகப் பேசுவதால் நீங்கள் என்னை எவ்வளவு வேண்டுமானாலும் திட்டுங்கள்; அதுபற்றி எனக்குப் பிரச்சினை இல்லை. நான் உங்களிடம் கேட்கும் கேள்வி என்னவென்றால், காணி உரிமைக்கும் வீட்டு உரிமைக்கும் வித்தியாசம் தெரியுமா? வீடுகளைக் கட்டி, அவற்றுக்கான உரிமைப் பத்திரங்களை வழங்குவது அரசாங்கத்தின் பொறுப்பு, கடமை. அது எங்களுக்குத் தெரியும். ஆனால், காணி உரிமை என்பது மலையக சமூகத்துக்கு வழங்குகின்ற ஒரு தீர்வு! நான் எனது சிறிய அனுபவத்திலிருந்துதான் இதைச் சொல்கின்றேன். அந்த அனுபவத்தின்படி, இதுவரை இருந்த சனாதிபதிகளாக இருக்கட்டும் அல்லது தற்போது இருக்கின்ற அரசாங்கமாக இருக்கட்டும், ஒவ்வொரு தடவையும் காணி உரிமை என்ற விஷயம் குறித்துப் பேசப்படும்போதெல்லாம் உடனே சொல்வது 'சமத்துவம்', 'அனைவரும் சமம்' என்பதுதான். ஆனால், ஒரே ஒரு சின்ன வேண்டுகோள்! சமத்துவத்தின் அடிப்படையில் மட்டும் மலையக மக்களைப் பார்க்காதீர்கள்! 'சமநிலை நீதி' - 'equity over equality' - அந்த அடிப்படையிலும் நீங்கள் அவர்களைப் பார்க்க வேண்டும்.

இன்று மலையக மக்களின் வரலாற்றை எல்லாம் இவர்கள் முன்வைத்தார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் மலையக மக்களின் வரலாறு குறித்து மிகவும் அழகாகப் பேசியிருந்தார். ஆனால், அதில் ஒரு சிறிய திருத்தம்! அவர் பேசியதுபோல் மூழ்கிய கப்பலின் பெயர் 'பாக்கியலட்சுமி' அல்ல, 'ஆதிலட்சுமி'. வரலாற்றைப் பற்றி பேசினால் மட்டும் போதாது. அதைச் சரியாகப் பேச வேண்டும். நான் ஏன் இதைச் சொல்கின்றேன் என்றால், ஹன்சாட் பதிவிலிருந்து 'பாக்கியலட்சுமி' என்ற பெயரை நீக்கிவிட்டு, 'ஆதிலட்சுமி' எனப் பதிவு செய்ய வேண்டும் என்பதற்காக அதனை ஒரு கோரிக்கையாக முன்வைக்கிறேன்.

மலையக மக்களின் வரலாற்றைப் பொறுத்தவரை, 1949 முதல் 1977ஆம் ஆண்டு வரை எங்களுக்குப் பிரஜா உரிமை கிடையாது. எங்களுக்கான அடையாளம் இல்லாது கஷ்டப்பட்டுக் கொண்டிருந்தோம். அவற்றையெல்லாம் தாண்டித்தான் நாங்கள் வந்திருக்கின்றோம். அதில் மிகப்பெரிய கொடுமை என்னவென்றால், 1964இல் சிறிமா - சாஸ்திரி ஒப்பந்தத்தின்பேரில் கொண்டுவரப்பட்ட சட்டம்! கிட்டத்தட்ட 525,000 மலையக மக்களை இந்தியாவுக்கு நாடு கடத்திவிட்டு, மிகுதி 450,000 பேரை இலங்கையில் வைத்திருக்க வேண்டும் என்பதுதான் அந்த ஒப்பந்தத்தின் அடிப்படை. அதன்படி 1964இல் இருந்து 1981 வரைக்கும் 225,000 பேர் இந்தியாவுக்குக் கொண்டு செல்லப்பட்டிருந்தார்கள். கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் கேட்ட ஒரு கேள்வி, "ஏன் இலங்கையில் வாழ்கின்ற இந்திய வம்சாவழி மக்கள் மட்டும் இப்படி இருக்கிறார்கள்? என்பது. அவர்கள் மலேசியாவில் இருக்கிறார்கள், சிங்கப்பூரில் இருக்கிறார்கள், இன்னும் பல்வேறு நாடுகளில் இருக்கிறார்கள். ஆனால், கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களிடம் வெளிப்படையாகச் சொல்கின்றேன், மலேசியாவிலும்கூட தேயிலைத் தோட்டங்கள், இறப்பர் தோட்டங்கள் இருக்கின்ற ஒரு பகுதியில் இருக்கின்ற இந்திய வம்சாவழித் தமிழர்கள் ஒதுக்கப்பட்ட சமூகமாகத்தான் வாழ்ந்து கொண்டிருக் கின்றார்கள்.

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

இன்று இந்தியாவை ஓர் உதாரணமாக எடுத்துக் கொள்ளுங்கள்! அன்று 15 வருட காலத்தில் இந்தியாவுக்கு நாடு கடத்தப்பட்ட 225,000 மக்கள் தமிழ் நாட்டில் உள்ள TANTEA என்ற நிறுவனத்தின் கீழ் கூடலூர் போன்ற பல்வேறு ஊர்களில் மிகவும் மோசமான நிலையில் வாழ்ந்து கொண்டிருக் கின்றார்கள். அவர்கள் திரும்பவும் இந்த நாட்டுக்கு வருவதற்கு ஒரு வாய்ப்பு கொடுங்கள்! நான் ஏன் இதைச் சொல்கிறேன் என்றால், இன்று இருக்கின்ற சூழ்நிலை வேறு! நான் இன்றைக்கு உங்களிடம் இதனை வெளிப்படையாகச் சொல்கின்றேன். ஒவ்வொரு வாரமும் நீங்கள் விமர்சிக்கின் றீர்கள்; நான் பதில் சொல்கின்றேன். அதனை இத்துடன் நாம் நிற்பாட்ட வேண்டும். நான் ஆலோசனையாகத்தான் இதனைச் சொல்கிறேன். உங்களுடைய வேலையைச் சுலபமாக்கவே விரும்புகின்றேன்.

கௌரவ மஞ்ஜுள சுரவீர ஆரச்சி அவர்கள், "நீங்கள் ஏன் DCC meetingக்கு வருவதில்லை?" என்று ஒரு கேள்வி கேட்டிருந்தார். கௌரவ உறுப்பினர் அவர்களுக்கு நன்றாக ஞாபகம் இருக்குமென்று நினைக்கின்றேன், கடந்த DCC meetingக்கு நான் வந்திருந்தேன்; மாண்புமிகு சனாதிபதி அவர்களிடம் கேள்வி கேட்டிருந்தேன். அதற்குப் பதில் சொல்ல GAக்கும் முடியவில்லை. மாண்புமிகு சனாதிபதி அவர்களும் தவறான ஒரு விஷயத்தை நம்பிக்கொண்டு புறப்பட்டார். உண்மையில் இங்கு நான் சனாதிபதி அவர்களைக் குற்றஞ்சொல்ல மாட்டேன். ஏனென்றால், அவர் நாட்டின் சனாதிபதி. அவரிடம் சேர்ப்பிக்கப்படும் செய்திகள் சரியான தாக இருக்க வேண்டும். இதனை ஏன் சொல்கின்றேன் என்றால், மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்கூட்டம் தொடர்பான தகவல் எங்களுக்குச் சரியான முறையில் கிடைப்பதில்லை. நான் நிறைய தடவை GAக்கும் inform பண்ணிவிட்டேன். தவறான இலக்கத்திற்கு நீங்கள் அழைப்பிதழ் கொடுத்தால் நாங்கள் எப்படி வருவது? கௌரவ உறுப்பினர் திகாம்பரம் அவர்களுக்கும் இதே பிரச்சினைதான். இது தொடர்பாக GAக்கு நிறைய தடவை கடிதங்கள் எழுதியிருக்கின்றோம். தயவுசெய்து அதைப்பற்றி பார்க்குமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

இன்றைய தினம் கொண்டுவரப்பட்ட இந்தப் பிரேரணை யைப் பொறுத்தவரையில், காணி உரிமை சம்பந்தமான விஷயத்தில் நான் உங்களிடம் வெளிப்படையாகச் சொல்கிறேன்; நேற்றும் இந்த விஷயத்தைச் சொன்னேன், இதற்கான Cabinet Paper இருக்கின்றது. அந்த Cabinet Paperஇல் உள்ளவற்றை அமுல்படுத்தினாலே நாங்கள் நினைத்ததைச் செய்ய முடியும் என்பதை. இப்போது நீங்கள் சம்பளத்தைக் கூட்டிக் கொடுத்திருக்கின்றீர்கள். அதனை மையப்படுத்தி கௌரவ உறுப்பினர் ஒருவர் எங்கள்மீது ஒரு விமர்சனத்தை முன்வைத்தார். கடந்த வாரம் உங்களுக்கு மிகவும் தெரிந்த "News 1st" நிறுவனத்தின் தொலைக்காட்சி யில், "Human Rights Commission Summons Officials Over Estate Workers' Wages Irregularity" என்ற விடயத்தைச் சொன்னார்கள். அரசாங்கத்தால் வழங்கப்படும் 1,700 ரூபாய் சம்பளம் சரியான முறையில் மக்களுக்குப் போய்க் கிடைக்கவில்லையென்று Human Rights Commission - மனித உரிமை ஆணைக்குழு - தெளிவாகச் சொல்லியிருப்பதாகக் குறிப்பிட்டுள்ளார்கள். ஆமாம், நான் இதே இடத்தில்தான் சொன்னேன், முடிந்தால் 10 ரூபாயை நிபந்தனையற்ற அதிகரிப்பாகக் கூட்டுங்கள் என்று. ஆனால், 10 ரூபாயை மட்டும் கூட்டவில்லையே! கிலோ கணக்கையும்தான் கூட்டியிருக்கிறார்கள்; வன்முறையையும்தான் கூட்டியிருக் கிறார்கள்; தோட்ட அதிகாரிகளின் அடக்குமுறையையும்தான் கூட்டியிருக்கிறார்கள். ஆனால், அதற்கு நீங்கள்தான் முழுமையான பொறுப்பு என்று அதற்கான காரணத்தை நான் சொல்லவில்லை. ஆனால், இன்று நாங்கள் எதிர்க்கட்சியில் இருக்கின்றோம், நீங்கள் ஆளும் கட்சியில் இருக்கின்றீர்கள். நீங்கள் பாராளுமன்ற உறுப்பினர், நானும் பாராளுமன்ற உறுப்பினர். நாங்கள் சேர்ந்து வந்தால் இதற்கு ஒரு தீர்வு எடுக்க முடியும் என்றுதானே நாங்கள் சொல்லிக் கொண்டிருக் கின்றோம்.

உங்களில் 159 பேர் இருக்கின்றார்கள். ஒரு வாக்கெடுப்பை நடத்துங்கள்! காணி உரிமை கொடுப்பதற்கு உங்களில் எத்தனை பேருக்கு இஷ்டம் இருக்கின்றது என்று கேட்டுப் பாருங்கள்! எதிர்த் தரப்புக்கும்தான் நான் சொல்கின்றேன். ஆனால், ஒரு விஷயத்தை நான் வெளிப்படையாகச் சொல்கின்றேன். தமிழ் முற்போக்குக் கூட்டணியாக இருக்கட்டும், தொழிலாளர் காங்கிரஸாக இருக்கட்டும், காணி உரிமை வழங்க ஆதரவாக நாங்கள் கைதூக்குவோம்; அதற்கான அமைச்சரவைப் பத்திரம் இருக்கின்றது. நீங்கள் அரசாங்கத்தின் மூலமாக 200 ரூபாய் சம்பளம் வழங்கினீர்கள்தானே? இன்றைக்கு டொலர் 357 ரூபாயை எட்டியிருக்கின்றது. பொருட்களின் விலை ஜாஸ்தியாக இருக்கின்றது. இந்த 200 ரூபாயால் என்ன பிரயோசனம் என்று நினைக்கின்றீர்கள்? இந்த 200 ரூபாயை வழங்குவதற்கு வருடத்துக்கு நீங்கள் எவ்வளவு நிதி ஒதுக்கீடு செய்திருக் கிறீர்கள்? 5 பில்லியன் - 5,000 மில்லியன் ஒதுக்கீடு செய்திருக்கின்றீர்கள். ஆனால், காணி உரிமையை வழங்கு வதற்கு 5,000 மில்லியன் ரூபாய்தான் ஆகும். நான் சொல்வது பொய் என்று நினைத்தால், Cabinet Paperஐ எடுத்துப் பாருங்கள்!

இன்னும் ஒரேயொரு விஷயத்தை நான் இந்த இடத்தில் சொல்ல விரும்புகின்றேன். நாங்கள் உங்களிடம் மலையக மக்களின் பொருளாதாரம் சார்ந்த விடயங்களைப் பேசும்பொழுது, நீங்கள் எங்களுக்கு வழங்கும் பதில், "என்னதான் பிரச்சினை இருந்தாலும் நாங்கள் 'மலையகம்' என்று பெயர் வைத்துவிட்டோம்; பிரச்சினை எல்லாம் தீர்ந்து விட்டது" என்பதுபோன்று இருக்கிறது. ஒரேயொரு சின்னத் திருத்தம்! நீங்கள் 'மலையகம்' என்று பெயர்தான் அவர்களுக்கு வைத்தீர்கள். 2024ஆம் ஆண்டு பெப்ருவரியில் நடந்த Cabinet Paperஐ முடிந்தால் நாளைக்கு நீங்கள் இங்கே சமர்ப்பித்துப் பாருங்கள்! சனத்தொகைக் கணக்கெடுப்பில் 'மலையகம்' என்று நாங்கள் குறிப்பிட்டு இருக்கின்றோம். ஆனால், இதில் இருக்கின்ற விஷயம் என்னவென்றால், நாங்கள் கொண்டுவந்தோம், நீங்கள் கொண்டுவரவில்லை; நீங்கள் கொண்டுவந்தீர்கள், நாங்கள் கொண்டுவரவில்லை என்பது பற்றி கிடையாது. இதில் இருக்கின்ற உண்மையான விஷயம், நாம் நினைத்தால் மலையக மக்களின் வாழ்க்கையை மாற்ற முடியும் என்பதுதான். ஆனால், அதை எப்படி மாற்ற வேண்டும் என்றால், ஒருவரை ஒருவர் குறை சொல்லிக்கொண்டு இருப்பதனால் அல்ல. இந்த systemஐ மாற்றியாக வேண்டும். Regional Plantation Companiesக்குக்கீழ் வரும் இந்த lease ஒப்பந்தத்துக்குள்ளாகத்தான் மலையக மக்களையும் நாங்கள் அடகு வைத்திருக்கிறோம். மலையக மக்கள் வாழும் இடத்தை நாங்கள் நிறுவனங்களின் பிடியிலிருந்து வெளியில் எடுத்தாக வேண்டும்; இதை அரசாங்கம் பொறுப்பெடுத்தாக வேண்டும். அரசாங்கம் பொறுப்பெடுத்தால் மட்டுமே நேரடியாக வேலைத்திட்டங்களைக் கொண்டுவர முடியும்.

அதேமாதிரி நுவரெலியா மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் கௌரவ உறுப்பினர்கள் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார்கள், "வீட்டுத் திட்டத்தை அங்கு நாங்கள் கொண்டுவருவோம்" என்று. கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு மரியாதையோடு நான் ஒரு விடயத்தைத் தெளிவுபடுத்த விரும்புகிறேன். உங்களது பிரதிநிதித்துவம் பலமாக இருக்க வேண்டும். நீங்கள் ஆளும் தரப்பில் இருக்கிறீர்கள்; நுவரெலியா மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்துகிறீர்கள். தற்போது ஹப்புத்தளை தொகுதிக்கு வீட்டுத் திட்டம் வந்திருக்கிறது. நுவரெலியா தொகுதிக்கு ஏன் வரவில்லை? காரணம் என்னவென்றால், கௌரவ பிரதி அமைச்சர் அவர்கள் அவருடைய தொகுதிக்கு முன்னுரிமை கொடுத்திருக்கிறார். தவறு கிடையாது. *[இடையீடு]* ஒரு நிமிடம்! நீங்கள் பேசும்போது நான் பேசவில்லை. நான் பேசும்போது நீங்கள் பேசாதீர்கள்! நான் பேசி முடித்து விடுகிறேன். Allocation இருக்கலாம். ஆனால், வீடு கட்டி முடித்திருப்பதாகச் சொல்லி இருக்கிறார்கள்தானே! அதைச் சொன்னது நான் அல்ல, உங்களது சக உறுப்பினர். கௌரவ பிரதீப் அவர்களே, இன்றைக்கு உங்களிடம் நான் ஒன்றைச் சொல்கிறேன். உங்களுக்கு நான் முழுமையான ஆதரவைத் தருகிறேன். இங்கே கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் இருக்கிறார். அவரிடம் கேட்டுப் பாருங்கள், பாராளுமன்றக் கூட்டத்தொடர் ஆரம்பிக்கும்போது நான் அவரிடம் விடுத்த வேண்டுகோள் என்னவென்று. "கௌரவ சுந்தரலிங்கம் பிரதீப் அவர்களை Cabinet Minister ஆக்குங்கள்" என்று நான் அவரிடம் வேண்டுகோள் விடுத்தேன். இது உண்மையா, இல்லையா என்று கேட்டுப் பாருங்கள்! ஏனென்றால், என்னைப்பொறுத்த வரைக்கும் நீங்கள் எதிர்க்கட்சியா, ஆளும் கட்சியா என்ற கவலையில்லை. நீங்கள் எமது சமூகத்துக்குத் தலைமைதாங்குகிறீர்கள். அப்படியிருக்கும்போது, அந்தத் தைரியத்தோடு வேலை செய்யுங்கள்! நாங்கள் உங்களுடன் நிற்கிறோம் என்றுதானே சொல்கிறோம்.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.34]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று 19ஆம் இலக்க நிலையியற் கட்டளையின்கீழ், அவசரப் பொது முக்கியத்துவம் வாய்ந்த விடயம் என்ற வகையில் கொண்டுவரப்பட்டு, விவாதிக்கப்படுகின்ற இந்த ஒத்தி வைப்புப் பிரேரணையானது மிகவும் வரவேற்கத்தக்கது. இந்தப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ உறுப்பினர் இராதாகிருஷ்ணன் அவர்களுக்கு எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது மே மாதம்! மே மாதம் என்பது உலகப் பாட்டாளி வர்க்கத்துக்கு மகுடம் சூட்டிய ஒரு மாதம். ஏன் அவ்வாறு கூறுகின்றோம்? 1838ஆம் ஆண்டில் பிரித்தானியர் உலகத்தை ஆண்டு கொண்டிருந்தபொழுது, இந்தியாவின் அசாம் மாநில தேயிலைத் தோட்டத்தில் 'கொந்தராத்' தொழிலாளர்களாக வேலை செய்த சீனத் தொழிலாளர்கள் தங்களுடைய உழைப்புக்கேற்ற ஊதியம் வேண்டும் என்று போராடியதை யொட்டி, உலகப் பாட்டாளி வர்க்கம் தங்களுக்கான உரிமைகளுக்காகப் போராட்டம் செய்து அவற்றைப் பெற்றுக்கொண்ட புனிதமான மாதம்தான் இந்த மே மாதம். இந்த மே மாதத்தில், மலையகத்தின் எல்லா இடங்களிலும் "காணி உரிமை! வீட்டு உரிமை!" என்று கோஷங்கள் எழுப்பப்படுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அந்த வகையிலே, அரச சார்பற்ற நிறுவனங்கள், அவற்றுடன் இணைந்து எதிர்க்கட்சிக் கூட்டமைப்பு, மலையக ஜம்பவான்கள், மலையகப் புத்திஜீவிகள், இந்த நாட்டின் அறிவுஜீவிகள் மற்றும் தொழிலாளர்கள் அனைவரும் இணைந்து, "காணி உரிமை வேண்டும்! வீட்டு உரிமை வேண்டும்!" என்ற கோஷத்தை எழுப்பியிருக்கின்றார்கள். ஆகவே, இந்த மே மாதம் என்பது பாட்டாளி வர்க்கத்துக்கு மகுடம் சூட்டும் ஒரு மாதமாகும்.

அத்தோடு, நம் அனைவருக்கும் தெரியும், 2023ஆம் ஆண்டிலே தேசிய மக்கள் சக்தியாகிய நாங்கள் "ஹட்டன் பிரகடனம்" என்பதை ஹட்டன் மாநாகரிலே வெளியிட்டோம் என்பது. அதிலே எங்களுடைய தலைவரும் தோழருமான அநுர குமார திஸாநாயக்க அவர்கள் பிரதானமாக மூன்று முன்மொழிவுகளைச் செய்திருந்தார். அதில் முதலாவதாக, "இந்த நாட்டிலே பெருந்தோட்டத்தில் இருக்கின்ற மலையக சமுதாயத்தை எங்களுடைய ஆட்சியில் மலையக சமூகமாக, கௌரவமான பிரஜைகளாக அடையாளப்படுத்தி மகுடம் சூட்டுவோம்" என்று கூறினார். இரண்டாவது, "எங்களுடைய ஆட்சியிலே பெருந்தோட்ட மக்களுக்கான காணி உரிமையை, வீட்டு உரிமையைப் பெற்றுக் கொடுப்போம்" என்றார். மூன்றாவது, "இந்த நாட்டிலே இருக்கின்ற ஏனைய சமூகங்களுக்குக் கிடைக்கும் அனைத்துச் சலுகைகளையும் உரிமைகளையும் மலையகச் சமூகத்துக்கும் பெற்றுக் கொடுப்போம்" என்றார். இந்த மூன்று விடயங்களையும் அந்த 'ஹட்டன் பிரகடனத்திலே' அவர் வலியுறுத்தியிருந்தார். அன்று அதற்குத் தலைமைதாங்கி அதனை ஏற்றுக்கொண்டவர்தான் இன்று இந்த நாட்டிலே அதிபராக இருக்கக்கூடிய மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள். ஆகவே, அந்த இடத்திலிருந்து எங்களுடைய வேலைத்திட்டங்களை நாங்கள் ஆரம்பிக்கின்றபொழுது, இன்று இந்தச் சபைக்கு மலையக மக்கள் தொடர்பான இந்த அருமையான பிரேரணையைக் கொண்டுவந்து, "கடந்த காலங்களிலும் நாங்கள் இதனை ஆமோதித்தோம், இவற்றை நாங்கள் ஏட்டில் எழுதி வைத்திருக்கின்றோம், எழுதித் தந்திருக்கின்றோம், அவை ஆவணங்களாக இருக்கின்றன, இதனை நடைமுறைப் படுத்துங்கள்" என்று நீங்கள் கூறும்பொழுது, ஆளுங்கட்சியில் இருக்கக்கூடிய நாங்கள் அதனை வரவேற்கின்றோம். உண்மையில் நீங்கள் விட்ட இடத்திலிருந்து மட்டுமல்ல, ஆரம்பத்திலிருந்து ஆரம்பிப்பதற்குக்கூட நாங்கள் தயாராக இருக்கின்றோம்; தேசிய மக்கள் சக்தி அரசாங்கம் தயாராக இருக்கின்றது.

அந்த வகையில், நாங்கள் கடந்த காலத்தைத் திரும்பிப் பார்க்கின்றபொழுது, மலையக சமூகம் இன்று 7 தலைமுறைகளைக் கொண்டிருக்கின்ற ஒரு சமூகம்! அவ்வாறு 7 தலைமுறைகளாக 'மலையகம்' என்ற திறந்தவெளிச் சிறைச்சாலைக்குள், லயத்துச் சிறையிலே அடைபட்டிருக்கின்ற அந்தச் சமூகம் சார்பாக 4 தலைமுறைகளாக மலையகத்தை ஆண்ட ஜாம்பவான்கள் இன்றுவரைக்கும் இந்தப் பாராளு மன்றத்திலே இருக்கின்றார்கள்; அதுதான் வேதனைக்குரிய விடயம், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அவர்களின் பெயர்களை நான் குறிப்பிட விரும்பவில்லை. 4

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

தலைமுறைகளாக இந்தப் பாராளுமன்றத்தை அலங்கரித்த ஜாம்பவான்கள் இருக்கின்றார்கள். 7 தலைமுறைகளாக உழைக்கும் வர்க்கமாக இருக்கின்றவர்களை 4 தலைமுறைகளாக ஆட்டிப்படைத்த இன்னொரு வர்க்கமாக இவர்கள் இருக்கின்றார்கள். இன்றைய உழைக்கும் வர்க்கத்தினரின் ஆட்சியிலே இவ்வாறான ஒரு பிரேரணையினை முன்வைப்பதற்கு அவர்கள் வெட்கப்பட வேண்டும், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! தாத்தா அமைச்சர், அப்பன் அமைச்சர், இன்னொரு பூட்டனும் அமைச்சர், தானும் அமைச்சராக இருந்தவர்தான், இங்கு இன்றைய இந்தப் பிரேரணைக்கு ஆதரவாகவும் எங்களுக்கு எதிராகவும் கூக்குரலிடுகின்றார், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! ஆனால், இன்று உழைக்கும் வர்க்கத்தில் இருந்து வந்தவர்களாகிய நாங்கள் இவற்றை நடைமுறைப்படுத்துவதற்குத் தயாராக இருக்கின்றோம். அதே வர்க்கத்தில் இருந்து வந்த எங்களுடைய தோழர் அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக இருப்பதில் நாங்கள் சந்தோசம் அடைகின்றோம்.

அவ்வாறாக இருக்கின்றபொழுது, இன்று மலையகக் காணி உரிமை பற்றி பேசப்படுகின்றது. மலையகத்தில் காணி உரிமை, வீட்டு உரிமையைப் பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். அன்று காணி உரிமையைப் பெறுவதற்காக வெள்ளையர்களுக்கு எதிராக மகாகவி பாரதி அவர்கள் போராட்டம் செய்தார். அதேபோல், இன்று போராட வேண்டிய அவசியம் இல்லை. காரணம், இந்த நாட்டிலே உழைக்கும் வர்க்கத்தினரின் அரசாங்கம் உருவாக்கப் பட்டிருக்கின்றது. அதனால் காணிகளைப் பெற்றுக் கொடுப்பதற்கு எங்களுடைய அரசாங்கத்தின்கீழ் சகல வேலைத்திட்டங்களையும் நாங்கள் முன்னெடுக்கின்றோம். அந்த வகையில், இந்தப் பிரேரணைக்கு மீண்டும் புத்துயிரை ஊட்டுவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். அன்று இந்தியாவில் வெள்ளையர்களால் உழைக்கும் மக்களின் காணிகள் பறிக்கப்பட்டபொழுது,

" காணி நிலம் வேண்டும் - பராசக்தி
காணி நிலம் வேண்டும்; - அங்கு,
தூணில் அழகியதாய் - நன்மாடங்கள்
துய்ய நிறத்தினவாய் - அந்தக்
காணி நிலத்தினிடையே - ஓர் மாளிகை
கட்டித் தரவேண்டும் ....."

என்று காணி உரிமைக்காக மகாகவி பாரதி பாடி, உழைக்கும் வர்க்கத்தை அணி திரட்டினார். ஆனால், இன்று இலங்கையில் பாரதிக்குச் சமமான ஒருவராக இருக்கின்ற இலங்கையின் அதிபர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள், மலையக சமூகத்துக்கும் தோட்டத் தொழிலாளர் களுக்கும், காணியையும் வீட்டையும் பெற்றுக் கொடுப்பதற்குத் தயாராக இருக்கின்றபொழுது, 7 தலைமுறையாக அந்த மலையக மக்களை அடிமையாக வைத்திருந்த, 4 தலைமுறை களாகப் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவம் செய்த ஜாம்பவான்கள், எங்களுக்குக் கூறும் கூற்றுக்களைப் பார்க்கின்றபொழுது கவலையாக இருக்கின்றது.

அந்த 4 தலைமுறையைக் கொண்ட ஆளும் வர்க்கத்தின் வீடுகளை மலையகத்திலே சென்று பாருங்கள் - மாளிகை! அதேபோல், 7 தலைமுறையினராகிய உழைக்கும் வர்க்கத்தைச் சேர்ந்த தோட்டத் தொழிலாளர்களின் வீடுகளையும் சென்று பாருங்கள் - லயத்துச் சீமை! லயத்துச் சிறை! ஆகவே, எனது அன்பார்ந்த தோட்டத் தொழிலாளர்கள் இன்று தங்களுடைய நிலைமைகளை மாற்றி, தேசிய அரசியல் களத்துக்குத் தயாராக இருக்கின்ற நேரத்தில், பிற்போக்குத்தனமான அரசியலையும், இனவாத அரசியலையும் முன்னெடுத்த மலையகத்தில் இருக்கின்ற ஜாம்பவான்கள், மலையகத்தில் உள்ள உழைக்கும் வர்க்கத்தால் ஒதுக்கப்பட்டிருக்கின்றார்கள். இந்த நேரத்திலே எங்களுடைய கௌரவத்துக்குரிய இராதாகிருஷ்ணன் அவர்கள் கொண்டுவந்திருக்கின்ற இந்தப் பிரேரணையை ஆமோதித்து, இந்தப் பிரேரணைக்கு நாங்கள் மேலும் புத்துயிரூட்டி, நடைமுறைப்படுத்துவோம் எனக் கூறுகின்றோம். இலங்கை யில் ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க என்பது வெறுமனே ஒரு பெயர் அல்ல, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அது எதிர்காலத்துக்கான வரலாறு! அந்த வரலாற்றைத் தோழர் அநுர குமார திஸாநாயக்க அவர்களின் ஆட்சியில் நடைமுறைப்படுத்துவோம் எனக்கூறி, என்னுடைய இந்தச் சிற்றுரையை முடிக்கின்றேன். நன்றி! வணக்கம்.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.42ට, 2026 මැයි 22වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.42க்கு, பாராளுமன்றம் 2026 மே 22, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.42 p.m. until 9.30 a.m. on Friday, 22nd May, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු රවී කරුණානායක මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2000/2026 - පිළිතුර දීමට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2000/2026 - விடையளிப்பதற்கு, வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ அவர்கள் இரண்டு வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Susil Ranasinghe, Minister of Housing, Construction and Water Supply has requested for two weeks' time to reply to Question No. 1 - 2000/2026 - raised by the Hon. Ravi Karunanayake appearing in today's Order Paper.

ගරු රවි කරුණානායක මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 2001/2026 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 2001/2026 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் ஒரு மாதகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation has requested for one month's time to reply to Question No. 2 - 2001/2026 - raised by the Hon. Ravi Karunanayake appearing in today's Order Paper.

## මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද වාරිමාර්ග ව්‍යාපෘති: වියදම් සහ ආදායම
## மகாவலி அதிகாரசபையால் மேற்கொள்ளப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: செலவுகள் மற்றும் வருமானம்
## IRRIGATION PROJECTS UNDERTAKEN BY MAHAWELI AUTHORITY: EXPENSES AND REVENUE

2002/2026

**3. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එහි ආරම්භයේ සිට 2025.12.31 වන දින දක්වා දරන ලද ප්‍රාග්ධන වියදමෙහි මුළු එකතුව, ප්‍රධාන යෝජනා ක්‍රම (A, B, C, D, H, L සහ R) අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහවැලි ව්‍යාපෘතිය ආරම්භ කර පසුව කඩිනම් කරන ලද්දේ කවර ජනාධිපතිවරයෙකුගේ පරිපාලනය යටතේද සහ එලෙස කඩිනම් කිරීම ආරම්භ වූ වර්ෂය කවරේද;

(iii) 2020 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ වාරිමාර්ග ගාස්තු, ජල විදුලිය අළෙවිය, ඉඩම් බද්දට දීම සහ අනෙකුත් වාණිජ කටයුතුවලින් ජනනය වී ඇති වාර්ෂික ආදායම් මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මුදල් ඒකක, පොලී අනුපාත සහ ණය කල්පිරීමේ පැතිකඩ සඳහන් කරමින්, මහවැලි ව්‍යාපෘතිවලට අදාළව පවතින හිඟ දේශීය සහ විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(v) වාරිමාර්ග නඩත්තු කටයුතු සඳහා හෙක්ටයාරයකට වැය වන වත්මන් පිරිවැය කවරේද;

(vi) එම පිරිවැය සහ සැබෑ පිරිවැය අය කර ගැනීම අතර සංසන්දනය කවරේද;

(vii) මෑතකදී කිසියම් කාර්ය සාධන හෝ චෝහාරික විගණනයක් පවත්වා තිබේද;

(viii) එසේ නම්, එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மகாவலி அதிகாரசபையால் அதன் ஆரம்பம் முதல் 2025.12.31 வரை மேற்கொள்ளப்பட்ட மொத்தத் திரண்ட மூலதனச் செலவினம், பாரிய திட்டங்களின் அடிப்படையில் (A, B, C, D, H, L மற்றும் R) வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மகாவலி கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட பின்னர் துரிதப்படுத்தப்பட்டது எந்த சனாதிபதியின் நிருவாகத்தின்கீழ் என்பதையும், அத்தகைய துரிதப்படுத்தல் எந்த ஆண்டில் ஆரம்பிக்கப்பட்டது என்பதையும்;

(iii) 2020 முதல் 2025 வரை, நீர்ப்பாசனக் கட்டணங்கள், நீர்மின் விற்பனைகள், காணிக் குத்தகைகள் மற்றும் ஏனைய வணிக செயற்பாடுகளில் இருந்து ஈட்டப்பட்ட வருடாந்த வருமான மூலங்கள் யாவை என்பதை வெவ்வேறாகவும்;

(iv) நாணயம், வட்டி விகிதங்கள் மற்றும் கடனை மீளச் செலுத்தும் அட்டவணை விபரங்களைச் சுட்டிக்காட்டி, மகாவலி கருத்திட்டங்களுடன் தொடர்புடைய நிலுவையிலுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டுப் படுகடன்கள் யாவை என்பதையும்;

(v) நீர்ப்பாசன பராமரிப்புத் தொடர்பாக ஹெக்டெயார் ஒன்றுக்கான தற்போதைய செலவு யாது என்பதையும்;

(vi) அத்தகைய செலவுக்கும் உண்மையில் மீளப் பெறப்பட்ட பணத்தொகைக்கும் இடையிலான ஒப்பீடு பற்றியும்;

(vii) அண்மையில் ஏதேனும் செயற்றிறன் அல்லது விபரமான நுண் கணக்காய்வு நடத்தப் பட்டுள்ளதா என்பதையும்;

(viii) அவ்வாறாயின், அத்தகைய அறிக்கை பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கப்படுமா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total cumulative Capital Expenditure incurred by the Mahaweli Authority of Sri Lanka from its inception to 31.12.2025, separately by major schemes (A, B, C, D, H, L and R);

(ii) the President under whose administration the Mahaweli Project was initiated and subsequently accelerated and the year in which such acceleration commenced;

(iii) the annual revenue streams generated from irrigation charges, hydropower sales, land leases and other commercial activities, separately from year 2020 to 2025;

(iv) the outstanding domestic and foreign debt attributable to Mahaweli projects, indicating currency, interest rates and maturity profile;

[ගරු රවි කරුණානායක මහතා]

(v) the current cost per hectare of irrigation maintenance;

(vi) the comparison between such cost and actual cost recovery;

(vii) whether any recent performance or forensic audit has been conducted; and

(viii) if so, whether such report will be tabled in Parliament?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත.

(ii) ජේ.ආර්. ජයවර්ධන මහතා, 1977 වර්ෂය

(iii) **ඇමුණුම 02*** මඟින් දක්වා ඇත.

(iv) මහවැලි ව්‍යාපෘතිවලට අදාළව පවතින දේශීය හා විදේශීය හිඟ ණය ප්‍රමාණය පිළිබඳ තොරතුරු මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගත යුතුය.

උදා: මොරගහකන්ද ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් ලබාගත් ණය (විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ER/CN/IW/L/01 හා 2022.11.22 දිනැති ලිපිය මඟින් මොරගහකන්ද ජල විදුලි බලාගාර ආදායම එකී ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් ලබාගත් ණය පියවීම සඳහා යොදා ගන්නා බව දන්වා ඇත.

(v) රුපියල් 1,600.00

(vi) පිරිවැය නැවත අය කිරීමක් නොකරයි. එම නිසා සංසන්දනය නොකරයි.

(vii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සම්බන්ධයෙන් කාර්ය සාධන හෝ වෝහාරික විගණනයක් පවත්වා නොමැත.

(viii) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

(ආ) කාර්ය සාධන හෝ වෝහාරික විගණනයක් පවත්වා නොමැති බැවින්, ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් නොමැත.

(அ) (i) இணைப்பு *01இல் குறிப்பிடப்பட்டுள்ளது.

(ii) திரு. ஜே. ஆர். ஜயவர்த்தன அவர்கள், 1977ஆம் ஆண்டு.

(iii) இணைப்பு *02இல் குறிப்பிடப்பட்டுள்ளது.

(iv) மகாவலி கருத்திட்டங்களுடன் தொடர்புடைய நிலுவையிலுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கடன் தொகைகள் குறித்த தகவல்களைத் திறைசேரியிடமிருந்து பெற்றுக் கொள்ள வேண்டியுள்ளது.

உதாரணம்: மொரகஹகந்த கருத்திட்டத்தை நிலைநிறுத்தும் பொருட்டு, பெறப்பட்ட கடன் தொடர்பாக (வெளிநாட்டு வளங்கள் திணைக்களத்தின் மேலதிகப் பணிப்பாளர் நாயகத்தின் இலக்கம் ER/CN/IW/L/01 மற்றும் 2022.11.22ஆம் திகதியிடப்பட்ட கடிதத்தின் மூலம்) மொரகஹகந்த நீர் மின்வலு நிலையத்தின் வருமானம், மேற்குறித்த கருத்திட்டத்தை நிறுவுவதற்காகப் பெறப்பட்ட கடனைத் திருப்பிச் செலுத்துவதற்கு பயன் படுத்தப்படுவதாக அறிவிக்கப்பட்டுள்ளது.

(v) ரூபா 1,600.00

(vi) செலவுகள் மீள அறவிடப்படுவதில்லை. எனவே, ஒப்பீடு மேற்கொள்ளப்படவில்லை.

(vii) இலங்கை மகாவலி அதிகாரசபை தொடர்பாக செயற்றிறன் அல்லது விபரமான நுண் கணக்காய்வு நடத்தப்படவில்லை.

(viii) மேற்குறித்த பதிலின் அடிப்படையில் தொடர்புபடாது.

(ஆ) செயற்றிறன் அல்லது விபரமான நுண் கணக்காய்வு மேற்கொள்ளப்படாத காரணத்தால், சமர்ப்பிப்பதற்கு எவ்வித அறிக்கையும் இல்லை.

(a) (i) Depicted in Annex 01*.

(ii) His Excellency J.R. Jayewardene, year 1977.

(iii) Depicted in Annex 02*.

(iv) Information regarding the outstanding domestic and foreign loan amounts pertaining to Mahaweli projects must be obtained from the General Treasury.

Eg: Loans acquired for the establishment of the Moragahakanda Project. (The Additional Director General of the Department of External Resources has informed by letter No. ER/CN/IW/L/01 dated 22.11.2022 that the revenue from the Moragahakanda Hydropower Station shall be utilized for the settlement of the loans obtained for the establishment of the said project.)

(v) Rs. 1,600.00

(vi) The cost is not reimbursed and therefore, no comparison is made.

(vii) No performance or forensic audit has been conducted with respect to the Mahaweli Authority of Sri Lanka.

(viii) Does not arise, as per the above answer.

(b) Since no performance or forensic audit has been conducted, there is no report available for submission.

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.